# ව්‍යාපාර අධ්‍යයනය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

වාණිජ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

# ව්‍යාපාර අධ්‍යයනය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

වාණිජ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

ව්‍යාපාර අධ්‍යයනය - 12 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

© ජාතික අධ්‍යාපන ආයතනය
ප්‍රථම මුද්‍රණය - 2017

ISBN :

වාණිජ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

මුද්‍රණය :

| පටුන | පිටුව |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | iv |
| විෂයමාලා කමිටුව | v - ix |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | x |
| ඉගෙනුම් ඵල හා ආදර්ශ ක්‍රියාකාරකම් | 1 - 238 |

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්ව ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්තිකාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබා දීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්තිකාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශය උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙ මඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මඟින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

ආචාර්ය ජයන්ති ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

අතීතයේ සිට ම අධ්‍යාපනය නිරන්තරයෙන් වෙනස් වීම්වලට භාජනය වෙමින් ඉදිරියට ගමන් කරමින් තිබුණි. මෑත යුගයේ මෙම වෙනස් වීම දැඩි ලෙස ශීඝ්‍ර වී ඇත. ඉගෙනුම් ක්‍රමවේදවල මෙන් ම තාක්ෂණික මෙවලම් භාවිතය අතින් හා දැනුම උත්පාදනය සම්බන්ධයෙන් ද ගත වූ දශක දෙක තුළ විශාල පිබිදීමක් දක්නට ලැබුණි. මේ අනුව ජාතික අධ්‍යාපන ආයතනය ද 2015 ට අදාළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා අප්‍රමාද ව සුදුසු පියවර ගනිමින් සිටී. ගෝලීය ව සිදු වන වෙනස්කම් ගැන හොඳින් අධ්‍යයනය කර දේශීය අවශ්‍යතා අනුව අනුවර්තනයට ලක් කර ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශය පාදක කර ගනිමින් නව විෂයමාලාව සැලසුම් කර පාසල් පද්ධතියේ නියමුවන් ලෙස සේවය කරන ගුරු භවතුන් වන ඔබ වෙත මෙම ගුරු මාර්ගෝපදේශය පුද කරන්නේ ඉතා සතුටිනි.

මෙවැනි නව මග පෙන්වීමේ උපදේශන සංග්‍රහයක් ඔබ වෙත ලබා දෙන්නේ ඒ මගින් ඔබට වඩා හොඳ දායකත්වයක් ලබා දිය හැකි වේය යන විශ්වාසය නිසා ය.

මෙම උපදේශන සංග්‍රහය පන්තිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඔබට මහඟු අත්වැලක් වනවාට කිසි ම සැකයක් නැත. එසේ ම මෙය ද උපයෝගී කර ගනිමින් කාලීන සම්පත් ද්‍රව්‍ය භාවිතයෙන් වඩාත් සංවර්ධනාත්මක ප්‍රවේශයක් ඔස්සේ පන්තිකාමරය හසුරුවා ගැනීමට ඔබට නිදහස ඇත.

ඔබ වෙත ලබා දෙන මෙම ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර වඩා නිර්මාණශීලි දරු පරපුරක් බිහි කර ශ්‍රී ලංකාව ආර්ථික හා සමාජීය අතින් ඉදිරියට ගෙන යාමට කැපවීමෙන් යුතු ව කටයුතු කරනු ඇතැයි මම විශ්වාස කරමි.

මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වූයේ මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ ගුරු භවතුන් හා සම්පත් පුද්ගලයින් රැසකගේ නොපසුබට උත්සාහය හා කැපවීම නිසා ය.

අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනය උදෙසා නිම වූ මෙම කාර්යය මා ඉතාමත් උසස් ලෙස අගය කරන අතර මේ සඳහා කැප වී ක්‍රියා කළ ඔබ සැමට මගේ ගෞරවාන්විත ස්තුතිය පිරිනමමි.

**එම්.එෆ්.එස්.පී. ජයවර්ධන**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**(විද්‍යා හා තාක්ෂණ පීඨය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **විෂය සම්බන්ධීකරණය** | : | ආනන්ද මද්දුමගේ මයා. කථිකාචාර්ය,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

**විෂයමාලා උපදේශක කමිටුව**

| | | | |
|---|---|---|---|
| 01. | කේ.ආර්. පත්මසිරි මයා | - | අධ්‍යක්ෂ, වාණිජ දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| 02. | එම්.ඒ. ඉන්ද්‍රා පත්මිණී පෙරේරා මිය | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>වාණිජ දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| 03. | මහාචාර්ය ඩබ්.පී. ගාමිණී ද අල්විස් මයා | - | මහාචාර්ය, කළමනාකරණ හා මූල්‍ය පීඨය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 04. | ආචාර්ය ඩබ්.එම්.සී.බී. වන්නිනායක මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය,<br>වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය,<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| 05. | ආචාර්ය ආර්. සේනාධිරාජා මිය | - | පීඨාධිපති, කළමනාකරණ හා මූල්‍ය පීඨය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 06. | ආචාර්ය එන්.ඩබ්ලිව්.කේ.ඩී.කේ.<br>දයාරත්න මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව සම්පත්<br>කළමනාකරණ අධ්‍යයනාංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 07. | ඩී. වසන්ත කුමාර මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වාණිජ හා<br>කළමනාකරණ අධ්‍යයන පීඨය,<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| 08. | එම්. කමනී පෙරේරා මිය | - | අධ්‍යාපන අධ්‍යක්ෂ, වාණිජ ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| 09. | තිලක් ගොඩමාන්න මයා | - | සභාපති, ජාතික වාණිජ මණ්ඩලය,<br>ශ්‍රී ලංකාව |
| 10. | ඩබ්ලිව්.ඒ.කේ.කේ. වියතුංග මිය | - | ගුරු සේවය 1, රත්නාවලී බාලිකා විද්‍යාලය,<br>ගම්පහ |
| 11. | ඩබ්.අයි.එම්.පී.ඩබ්. ඉලංගසිංහ මිය | - | ගුරු සේවය 1<br>සිරිමාවෝ බණ්ඩාරනායක විදුහල,<br>කොළඹ 07 |

| | | |
|---|---|---|
| ආනන්ද මද්දුමගේ මයා | - | කථිකාචාර්ය, වාණිජ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| කේ. ප්‍රභාහරන් මයා | - | කථිකාචාර්ය, වාණිජ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| ඩී.එල්.සී.ආර්. අජිත් කුමාර මයා | - | කථිකාචාර්ය, වාණිජ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| එස්.ආර්. රත්නජීව මයා | - | සහකාර කථිකාචාර්ය, වාණිජ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |
| මහාචාර්ය නෙවිල් වර්ණකුලසූරිය මයා | - | මහාචාර්ය, අලෙවිකරණ අධ්‍යයනාංශය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. |
| මහාචාර්ය එච්. සුනේත්‍රා සී. පෙරේරා මිය | - | මහාචාර්ය, කළමනාකරණ හා මූල්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය. |
| ආචාර්ය ටී.කේ. කරඳකැටිය මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය, වයඹ විශ්වවිද්‍යාලය. |
| ආචාර්ය එම්.එම්.ඩී.ආර්. දීගහවතුර මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වයඹ විශ්වවිද්‍යාලය. |
| කේ.ජී. සන්ධ්‍ය ශ්‍රියානි මිය | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කළමනාකරණ හා මූල්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය. |
| එල්.ඩී. කල්‍යාණි මිය | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය, සබරගමුව විශ්වවිද්‍යාලය. |
| ආර්.ජී.ජී. බණ්ඩාර මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගිණුම්කරණ අධ්‍යයනාංශය, සබරගමුව විශ්වවිද්‍යාලය. |
| එම්.ජී.එස්. පද්මිණී මිය | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කළමනාකරණ අධ්‍යයන පීඨය, රජරට විශ්වවිද්‍යාලය. |
| ආචාර්ය. එන්. එන්.ජේ. නවරත්න මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කළමනාකරණ හා මූල්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය. |
| කේ.එම්.ඩබ්ලිව්. කුමාර මයා | - | ගුරු සේවය, ර/කරගස්තලාව මහ විද්‍යාලය, බෙලිහුල්ඔය. |

**බාහිර සම්පත් දායකත්වය :**

- ආර්. කොඩිප්පිලිආරච්චි මිය - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, තඹුත්තේගම.
- ඩබ්.ජී. දයාරත්න මයා - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, තංගල්ල.
- කේ.සී. පුෂ්පා රංජනී මිය - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.
- ඩී.එස්. රාජපක්ෂ මයා - විදුහල්පති, ර/ඇලෝසියස් විද්‍යාලය, රත්නපුර.
- ඩබ්ලිව්.ජී.කේ.කේ. වියතුංග මිය - ගුරු සේවය 1, රත්නාවලී බාලිකා විද්‍යාලය ගම්පහ.
- ඩබ්.අයි.එම්.පී.ඩබ්ලිව්. ඉලංගසිංහ මිය - ගුරු සේවය 1 සිරිමාවෝ බණ්ඩාරනායක විදුහල, කොළඹ.
- ජේ.එච්.එම්. සුමිත්‍රා කුමාරි ජයවීර මිය - ගුරු සේවය 1, රාහුල බාලිකා විද්‍යාලය, මාලඹේ.
- ජේ.එල්. සෝමරත්න මයා - ගුරු සේවය 1, අ/මහානාම විද්‍යාලය තිරප්පනේ.
- ජෙසිකා විජයවික්‍රම මිය - විදුහල්පති, ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, මාරවිල.
- එම්.එච්.එම්. බුහාරි මයා - ගුරු උපදේශක, (විශ්‍රාමික) කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල.
- සී.එල්.එම්. නවාස් මයා - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, ඉබ්බාගමුව.

**සංස්කාරක මණ්ඩලය :**

- එම්.ජී. ඉන්ද්‍රා පත්මිණී පෙරේරා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වාණිජ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.
- ආනන්ද මද්දුමගේ මයා - කථිකාචාර්ය, වාණිජ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

- මහාචාර්ය ඩබ්. පී. ගාමිණී ද අල්විස් මයා - මහාචාර්ය, කළමනාකරණ හා මූල්‍ය පීඨය ,<br>කොළඹ විශ්වවිද්‍යාලය.

- ආචාර්ය ආර්. සේනාධිරාජා මිය - පීඨාධිපති,<br>කළමනාකරණ හා මූල්‍ය පීඨය,<br>කොළඹ විශ්වවිද්‍යාලය.

- ආචාර්ය ඩබ්ලිව්.එම්.සී.බී. වන්නිනායක මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය,<br>වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය,<br>කැලණිය විශ්වවිද්‍යාලය.

- ඩී. වසන්ත කුමාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය,<br>කැළණිය විශ්වවිද්‍යාලය.

- ආචාර්ය එන්.ඩබ්ලිව්.කේ.ඩී.කේ. දයාරත්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

**පරිගණක සැකසුම** -<br>තේජා සේපාලිකා මැණිකේ මිය

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශය, වසර අටකට වරක් ක්‍රියාත්මක වන්නා වූ විෂයමාලා නවීකරණ ප්‍රතිපත්තියට අනුව නවීකරණය කර 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. පළමුවරට 2009 වර්ෂයේ දී නිපුණතා පාදක ව හඳුන්වා දෙන ලද ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශය යාවත්කාලීන කර 12 හා 13 ශ්‍රේණි සඳහා නිපුණතා 18 ක් යටතේ පෙළ ගස්වා ඇත. 12 ශ්‍රේණිය සඳහා අදාළ වන, විෂය නිර්දේශයේ පළමුවන නිපුණතාවේ සිට 11 වන නිපුණතාව දක්වා වන නිපුණතා මට්ටම් 53 සඳහා පන්තිකාමරය තුළ ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් මෙහි යෝජනා කෙරේ.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයේ 12 ශ්‍රේණිය සඳහා වන සියලු ම නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත. මෙහි දී අදාළ නිපුණතාව, නිපුණතා මට්ටම, එම නිපුණතා මට්ටම සඳහා වෙන් කර ඇති කාලච්ඡේද ගණන හා නිපුණතා මට්ටම අවසානයේ දී ලඟා කර ගත යුතු ඉගෙනුම් ඵල පළමු ව දැක්වෙන අතර, අනතුරුව පාඩම් සැලසුම් කිරීම සඳහා යෝජනා කෙරෙන උපදෙස් හා විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් ද, අවසානයේ තක්සේරුකරණය හා ඇගැයීම සඳහා යෝජනා ද ඉදිරිපත් කර ඇත.

මෙහි යෝජිත, පාඩම් සැලසුම් කිරීම සඳහා වන උපදෙස් අනුව, ව්‍යාපාර අධ්‍යයනය විෂයට අදාළ විෂය කරුණු පිළිබඳ දැනුම පමණක් නොව ඒ පිළිබඳ සිසුන්ගේ ආකල්ප, කුසලතා හා පුරුදු ද සංවර්ධනය කෙරෙන පරිදි පන්තිකාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම මෙම ගුරු මාර්ගෝපදේශයෙන් ලැබේ යැයි ද අපේක්ෂා කෙරේ.

සෑම නිපුණතා මට්ටමක් යටතේ ම දැක්වෙන පාඩම් සැලසුම් කිරීම සඳහා වන උපදෙස් හි දැක්වෙන දකුණු පස පෙන්වන අතක සංකේතයෙන් ( ☞ ) අදාළ ක්‍රියාකාරකම අවසානයේ දී අවශ්‍ය වන විෂය කරුණු අනාවරණය කර ගැනීමට, ගුරුවරයා විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් වෙත යොමු කෙරේ. එහි දැක්වෙන විෂය කරුණු මෙන් ම ආශ්‍රිත ග්‍රන්ථ යටතේ දැක්වෙන ග්‍රන්ථ පරිශීලනයෙන් අදාළ නිපුණතා මට්ටම සඳහා අවශ්‍ය වන විෂය කරුණු සම්පාදනය කර ගැනීම ගුරුභවතුන්ගෙන් අපේක්ෂා කෙරේ. විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් යටතේ දැක්වෙන වම් පස පෙන්වන අතක සංකේතයෙන් ( ☜ ) නැවත පාඩම් සැලසුම් කිරීම සඳහා වන උපදෙස් වෙත යා යුතු බවට ගුරුවරයාට මඟ පෙන්වයි.

මෙලෙස පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් හි හා විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් හි සඳහන් කරුණු පරිශීලනයෙන් පන්තිකාමර ඉගෙනුම් - ඉගැන්වීම් කටයුතු සඳහා අවශ්‍ය පාඩම් සැලසුම් සකස් කර ප්‍රායෝගික ඉගෙනුමට සිසුන් යොමු කිරීම සෑම ගුරුභවතෙකු විසින් ම කළ යුතු වේ.

ව්‍යාපාර අධ්‍යයනය ප්‍රායෝගික විෂයයක් වන බැවින් එදිනෙදා ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදු වන වෙනස් වීම් පිළිබඳ අවධානයෙන් සිට විෂය නිර්දේශයට අදාළ විෂය කරුණුවල ඇති වන වෙනස්වීම් පිළිබඳ ව සැලකිලිමත් වී ගුරුභවතුන් විසින් පාඩම් සැලසුම් සකස් කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘති නායක

# ඉගෙනුම් ඵල

# හා

# ආදර්ශ ක්‍රියාකාරකම්

**නිපුණතාව 1.0** : ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

**නිපුණතා මට්ටම 1.1** : ව්‍යාපාර සංකල්පය විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාර සංකල්පය හඳුන්වයි.
- අවශ්‍යතා හා වුවමනා නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.
- අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් නිදසුන් දක්වමින් සසඳයි.
- නිෂ්පාදිත යන්න හඳුන්වයි.
- මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ගනුයේ නිෂ්පාදිතවලින් බව තහවුරු කරයි.
- භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් සසඳයි.
- අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීමත් වෙළෙඳපොළත් අතර පවතින සම්බන්ධතාව පෙන්වා දෙයි.
- ව්‍යාපාරවල ගති ලක්ෂණ නිදසුන් සහිත ව විස්තර කරයි.
- ව්‍යාපාර කටයුතු යන්න පැහැදිලි කරයි.
- දෙන ලද ව්‍යාපාරයක ව්‍යාපාර කටයුතු ලැයිස්තුගත කරයි.
- ව්‍යාපාර අරමුණු පැහැදිලි කරයි.
- ආර්ථිකයක පැවැත්මට ව්‍යාපාරවල දායකත්වය අගයයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පාසල් ශිෂ්‍යයෙකු ලෙස සිසුන්ට අවශ්‍ය වන දෑ සිසුන්ගෙන් විමසන්න.
- ලැබෙන පිළිතුරු හුණු පුවරුවේ සටහන් කරන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - ආහාර, ඇඳුම්, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍යය, සන්නිවේදනය, ආරක්ෂාව ආදිය සෑම පුද්ගලයෙකුට ම ජීවත්වීම සඳහා අත්‍යවශ්‍ය බවත් මෙම සියලු ම දේ සෑම දෙනෙකුට ම පොදුවේ අවශ්‍ය වන බැවින් ඒවා අවශ්‍යතා ලෙස හඳුන්වන බවත්
    - හුණු පුවරුවේ සඳහන් සිසුන්ගේ පිළිතුරුවලින් අවශ්‍යතා හඳුනා - ගැනීමට සිසුන් යොමු කරන්න.
    - එම අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සිසුන් යොදා ගන්නා දේවල් විමසන්න.
    - ලැබෙන පිළිතුරු හුණු පුවරුවේ සඳහන් කළ අවශ්‍යතා ඉදිරියෙන් දක්වන්න.
    - මෙලෙස එක් එක් පුද්ගලයා තම අවශ්‍යතා සපුරා ගන්නේ විවිධ ආකාරයට වන අතර, එම විවිධ ස්වරූප වුවමනා ලෙස හඳුන්වන්න.
    - අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා ව්‍යාපාර බිහි වී ඇති බව පෙන්වා දෙන්න.
- ව්‍යාපාර යන්න නිර්වචනය කරන්න.

- අවශ්‍යතා හා වුවමනා යන්න නිර්වචනය කර ඒවා සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

- අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් පෙන්වා දෙන්න.

☞

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

| |
|---|
| • පහත සඳහන් වන්නේ ඔබගේ අවශ්‍යතා ඉටු කරනු ලබන ව්‍යාපාර තුනකි.<br>  • බේකරි නිෂ්පාදන ව්‍යාපාරයක්<br>  • නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරයක්<br>  • රජයේ රෝහලක්<br><br>• ඔබට ලැබෙන ව්‍යාපාරය  කෙරෙහි අවධානය යොමු කරන්න.<br>• එම ව්‍යාපාරය මගින් ඉටු කරනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක් ද ?<br>• එම අවශ්‍යතාව ඉටු කර ගැනීම සඳහා එම ව්‍යාපාරය මගින් ඔබට සපයනු ලබන දෑ මොනවා ද ? |

- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගනුයේ භාණ්ඩ හා සේවාවලින් බව තහවුරු කරන්න.
- ඒවා නිෂ්පාදිත ලෙස හඳුන්වන බව ද පැහැදිලි කරන්න.
- භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් දක්වන්න.

☞

- වෙළෙඳපොළ යන්න පැහැදිලි කරන්න.
- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබා ගනුයේ වෙළෙඳපොළින් බව තහවුරු කරන්න.

☞

- ව්‍යාපාරයක ගති ලක්ෂණ සිසුන් සමග සාකච්ඡා කරමින් හුණු පුවරුවේ සටහන් කරන්න.

- පහත දැක්වෙන සිද්ධීන් සිසුන්ට ඉදිරිපත් කරන්න.
  - පුද්ගලයෙකුට අයිති ව තිබූ ඉඩමක් ඔහු විසින් වෙනත් පුද්ගලයෙකුට විකිණීම
  - මී කිරි නිෂ්පාදකයෙකු කිරි හට්ටි සිල්ලර කඩවලට විකිණීම
  - පියා විසින් තම පුතාට ඉඩමක් තෑගි ඔප්පුවකින්  පවරා දීම
  - බාබර් සාප්පුවක කරණවෑමියා විසින් පාසල් ශිෂ්‍යයෙකුගේ කොණ්ඩය කැපීම
  - මව විසින් තම දියණියගේ කොණ්ඩය කැපීම
  - මව විසින් ගෙවත්තේ වගා කරන ලද එළවළු දිනපතා ආහාරය සඳහා ගැනීම

- ඉහත එක් එක් සිද්ධිය ව්‍යාපාරික කටයුත්තක් ද නැද්ද යන්න  හේතු දක්වමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.

- ව්‍යාපාර ගති ලක්ෂණ එකිනෙක සිසුන්ට පැහැදිලි කරන්න.

- පවතින ව්‍යාපාරයක් නිදසුනක් ලෙස ගෙන එහි ගති ලක්ෂණ ඇසුරෙන් එය ව්‍යාපාරයක් බව තහවුරු කරන්න.

- ව්‍යාපාරයක ප්‍රධාන වශයෙන් සිදු වන කටයුතු දෙක පැහැදිලි කරන්න.
- ව්‍යාපාර මගින් සම්පත්වලට අගය එකතු කිරීමක් සිදු කරන බව නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

  ඇඳුමක් නිෂ්පාදනය කිරීමේ දී නූල් ලබා ගැනීම, නූල්වලින් රෙදි විවීම, රෙදිවලින් ඇඳුම් මැසීම වශයෙන් අවස්ථා කිහිපයක් පසු කරන බවත් ඒ සෑම අවස්ථාවක දී ම පවතින වටිනාකමට යම් වටිනාකමක් එකතු වන බවත් පැහැදිලි කරන්න.

- ව්‍යාපාරවලට විවිධ අරමුණු ඇති බව පෙන්වා දීමට පහත සාකච්ඡාවේ යෙදෙන්න.

  - ප්‍රදේශයේ ක්‍රියාත්මක වන සමිති සංවිධානයක්, පෞද්ගලික අංශයේ වෙළෙඳ සැලක්, රාජ්‍ය අංශයේ ව්‍යාපාරයක් සිසුන්ගේ අවධානයට ලක් කර එම ව්‍යාපාර කුමන අරමුණකින් ඒවායේ ව්‍යාපාර කටයුතු සිදු කරන්නේ ද යන්න සාකච්ඡා කරන්න. ඒ අනුව ව්‍යාපාරවලට විවිධ අරමුණු ඇති බව පෙන්වා දෙන්න.

- ආර්ථිකයක පැවැත්මට ව්‍යාපාර දක්වන දායකත්වය පැහැදිලි කරන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත සඳහන් වන්නේ මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කරනු ලබන ව්‍යාපාර තුනකි.

  1. බේකරි නිෂ්පාදන ව්‍යාපාරයක්
  2. නිමි ඇඳුම් නිෂ්පාදන ව්‍යාපාරයක්
  3. රජයේ රෝහලක්

- ඔබට ලැබුණු ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කරන්න.
- එම ව්‍යාපාර මගින් මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කරනු ලබන ආකාරය පැහැදිලි කරන්න.
- එම ව්‍යාපාරය මගින් සම්පත්වලට අගය එකතු කිරීම කරන ආකාරය පැහැදිලි කරන්න.
- එම ව්‍යාපාරයේ අරමුණ/අරමුණු දක්වන්න.
- එම ව්‍යාපාරයෙන් ආර්ථිකයට අත්වන ප්‍රතිලාභ ලැයිස්තුගත කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ලාභ ලැබීමේ අරමුණින් පවත්වාගෙන යන මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම, අලෙවිය හා අනුබද්ධ සියලු කටයුතු සාමාන්‍යයෙන් ව්‍යාපාර ලෙස අර්ථ දැක්විය හැකි ය.
- ලාභ අරමුණින් තොර ව මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා පවත්වාගෙන යන ව්‍යාපාර ද පවතී.
- ඒ අනුව ව්‍යාපාර යනු මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා ඇති ඕනෑ ම ආර්ථික කටයුත්තකි.

- මිනිසා විසින් අනිවාර්යයෙන් ම සපුරාගත යුතු කායික හා මානසික තත්ත්ව මිනිස් අවශ්‍යතා ලෙස හැඳින්වේ.
- ආහාර, ඇඳුම්, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍යය, සන්නිවේදනය, ප්‍රවාහනය, ආරක්ෂාව ආදිය අවශ්‍යතා වේ.
- මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාර වුවමනා ලෙස හැඳින්වේ.
- ආහාර අවශ්‍යතාව සපුරා ගන්නා විවිධ ආකාර වන බත්, පාන්, ඉඳි ආප්ප, තේ වුවමනාවලට නිදසුන් වේ.
- අවශ්‍යතා හා වුවමනා සඳහා නිදසුන් පහත වගුවේ දැක්වේ.

| **අවශ්‍යතා** | **වුවමනා** |
|---|---|
| • ආහාර | • බත්, පාන්, ඉඳි ආප්ප, තේ |
| • ඇඳුම් | • සාරි, කලිසම්, ගවුම්, සරම |
| • නිවාස | • තට්ටු නිවාස, යුගල නිවාස, නිල නිවාස, නේවාසිකාගාර |
| • අධ්‍යාපනය | • පාසල් අධ්‍යාපනය, පිරිවෙන් අධ්‍යාපනය, පෞද්ගලික පාසල්, පාඨමාලා, පොත්පත් |
| • සෞඛ්‍යය | • රජයේ රෝහල්, පෞද්ගලික රෝහල්, බෙහෙත්, වෛද්‍ය පරීක්ෂණ |
| • සන්නිවේදනය | • දුරකථන, ෆැක්ස්, විද්‍යුත් තැපෑල, අන්තර්ජාල පහසුකම් |
| • ආරක්ෂාව | • පොලීසිය, හමුදාව, පෞද්ගලික අංශයේ ආරක්ෂක සේවය |

- ජීවත්වීම සඳහා අත්‍යවශ්‍යයෙන් සපුරා ගත යුතු වීම, සෑම පුද්ගලයාට ම පොදු වීම, සීමිත වීම ආදිය අවශ්‍යතාවල ලක්ෂණ කිහිපයක් වේ.
- අසීමිත වීම, පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධ වීම, ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකි වීම, පුද්ගලබද්ධ වීම, වුවමනාවල ලක්ෂණ කිහිපයක් වේ.
- අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් පහත වගුවේ දැක්වේ.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| • සීමිත වේ.<br>• සෑම පුද්ගලයාට ම පොදු ය.<br>• ජීවත්වීම සඳහා අත්‍යවශ්‍යයෙන් ම සපුරාගත යුතු වේ.<br>• ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ නො හැකි ය.<br>• සමාජ බලවේග මගින් වෙනස් කළ නො හැකි ය. | • අසීමිත වේ.<br>• පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධ වේ.<br>• ජීවත්වීමට අත්‍යවශ්‍යයෙන් ම සපුරාගත යුතු නොවේ.<br>• ව්‍යාපාරිකයින්ට නිර්මාණය කළ හැකි ය.<br>• සමාජ බලවේග මගින් වෙනස් කළ හැකි ය. |

- මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කරන වෙළෙඳපොළට ඉදිරිපත් කරන ඕනෑ ම දෙයක් නිෂ්පාදිත වේ.
- නිෂ්පාදිත ප්‍රධාන වශයෙන් භාණ්ඩ හා සේවා ලෙස වර්ග කළ හැකි ය.
- භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් පහත වගුවේ දැක්වේ.

| භාණ්ඩ | සේවා |
|---|---|
| • භෞතික පැවැත්මක් ඇත. (ස්පර්ශ කළ හැකි ය ) | • භෞතික පැවැත්මක් නො මැත. (ස්පර්ශ කළ නො හැකි ය ) |
| • ගබඩා කළ හැකි ය. | • ගබඩා කළ නො හැකි ය. |
| • සමජාතීය වන පරිදි නිෂ්පාදනය කළ හැකි ය. | • සපයන්නා අනුව වෙනස් වේ. |
| • සපයන්නාගෙන් වෙන් කළ හැකි ය. | • සපයන්නාගෙන් වෙන් කළ නො හැකි ය. |

- නිෂ්පාදිතවලින් මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාගනී.

- ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණගැසෙන හෝ සම්බන්ධ වන ඕනෑ ම තත්ත්වයක් වෙළෙඳපොළ ලෙස හඳුන්වයි.
- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීමට වෙළෙඳපොළ තුළින් භාණ්ඩ හා සේවා සපයා ගනී.

- ව්‍යාපාරවල පහත ගති ලක්ෂණ පවතී.
    - විකුණුම් හෝ හුවමාරු වීම් සිදු වීම
    - භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදු වීම
    - ගනුදෙනු අඛණ්ඩ ව සිදු වීම
    - ලාභයෙන් අභිප්‍රේරණය වීම
    - අවදානමක් තිබීම
    - වුවමනා නිර්මාණය කිරීම
    - ආර්ථික කටයුත්තක් වීම

**ව්‍යාපාර ගති ලක්ෂණ**

**1. විකුණුම් හෝ හුවමාරුවීම් සිදු වීම**

සෑම ව්‍යාපාරයක් ම භාණ්ඩ හා සේවා මුදල් ම ය අගයක් මත විකිණීම හෝ හුවමාරු කිරීම සිදු කෙරේ. භාණ්ඩ හා සේවා මිලක් මත මිල දී ගැනීම හා විකිණීම ව්‍යාපාරවල අත්‍යවශ්‍ය සාධකයකි. එවැනි විකිණීමක් හෝ හුවමාරුවක් හෝ නො මැති තැන ව්‍යාපාර කටයුත්තක් සිදු නොවේ. උදාහරණයක් වශයෙන් නිවසක පවුලේ අය සඳහා ආහාර පිසීම ව්‍යාපාරයක් ලෙස නො සලකන අතර, මිලකට අන් අයට විකිණීම සඳහා ආහාර පිසීම හා විකිණීම ව්‍යාපාරයක් වේ.

**2. භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදු වීම**

සෑම ව්‍යාපාරයක් ම, අන් අයට විකිණීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සහ/හෝ මිල දී ගැනීම සිදු කරයි. ඒවා පාරිභෝගික භාණ්ඩ හෝ කාර්මික (ව්‍යාපාරික) භාණ්ඩ විය හැකි ය. පාරිභෝගික භාණ්ඩ යනුවෙන් අදහස් වන්නේ අවසාන ප්‍රයෝජනය සඳහා පාරිභෝගිකයින් මිල දී ගන්නා පාන්, ඇඳුම්, පාවහන් ආදී දේවල් ය. කාර්මික භාණ්ඩ/ව්‍යාපාරික භාණ්ඩ යනු පාරිභෝගික භාණ්ඩ නිපදවීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය, යන්ත්‍රසූත්‍ර ආදී දෑ ය. සේවා යන්නට අස්පෘශ්‍ය විදුලිබලය, රක්ෂණය, බැංකු සේවය ආදි ය නිදසුන් වේ.

**3. ගනුදෙනු අඛණ්ඩ ව සිදු වීම**

අඛණ්ඩ පදනමක් මත දිගින් දිගට ම භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදු කරයි නම් එය ව්‍යාපාරයක් ලෙස හඳුන්වයි. එක් ගනුදෙනුවක් පමණක් සිදු කිරීම ව්‍යාපාර යටතට නො ගැනේ. නිදසුනක් ලෙස පුද්ගලයෙක් තමන් පාවිච්චි කරන ලද පරණ ස්කූටරය විකිණීම ව්‍යාපාරයක් නො වේ. නමුත් ඔහු අඛණ්ඩ පදනමක් මත ස්කූටර විකිණීම සිදු කරයි නම් එය ව්‍යාපාරයකි.

**4. ලාභයෙන් /ප්‍රතිලාභයෙන් අභිප්‍රේරණය වීම**

ව්‍යාපාරයක මූලික අරමුණ මුදල් ඉපැයීම හා ධනය අත්පත් කර ගැනීමයි. ඒ අනුව සාමාන්‍යයෙන් ලාභය යන්නෙහි රුපියල් ශතවලින් ලබන ලාභය, වියදමට වඩා වැඩි ආදායම, ව්‍යාපාරික සම්බන්ධතා ගොඩනගා ගැනීම, ව්‍යාපාරික අවස්ථා උදාකර ගැනීම හා සමාජ ප්‍රතිලාභ අත්කර දීම යනාදිය අන්තර්ගත වේ. ඒ අනුව ව්‍යාපාර ක්ෂේත්‍රයේ ලාභ අරමුණ කර ගත් මෙන් ම ලාභ අරමුණ කර නො ගත් නමුත් ඉහත සඳහන් ආකාරයේ ප්‍රතිලාභ අරමුණු කර ගත් ව්‍යාපාර ද පවතී. එබැවින් ව්‍යාපාරයක වර්ධනය සහ ප්‍රසාරණය සඳහා ලාභය අත්‍යවශ්‍ය වේ.

**5. අවදානමක් තිබීම**

ලාභ ලැබීමට ඇති අවිනිශ්චිතතාව හා අලාභ සිදු වීමට ඇති හැකියාව නිසා ව්‍යාපාරවලට අවදානම් ඇති වේ. අනාගතය අවිනිශ්චිත නිසාත්, ව්‍යාපාර පරිසරයේ ඇතිවන වෙනස් වීම් නිසාත්, ලාභයට බලපාන පහත සඳහන් කරුණු ව්‍යාපාරවලට ප්‍රායෝගික ව පාලනය කළ නො හැකි නිසාත් අවදානම නැතහොත් අවිනිශ්චිතතා ඇති වේ.

- පාරිභෝගික රුචිය මෝස්තර සහ ඉල්ලුම වෙනස් වීම නිසා
- යන්ත්‍ර උපකරණ හා නිෂ්පාදන තාක්ෂණය වෙනස 'වීම නිසා
- වෙළෙඳපොළ තරඟකාරිත්වය ඉහළ යාම නිසා
- අමුද්‍රව්‍ය හිඟය , විදුලිය බිඳවැටීම හා ඉන්ධන හිඟය ඇති වීම නිසා
- ශ්‍රමිකයින්ගේ ගැටලු , වැඩ වර්ජන ආදිය නිසා
- ගිනිගැනීම්, සොර සතුරු උපද්‍රව , අනතුරු ආදී විපත් නිසා
- ව්‍යාපාරයේ සම්පත් භාවිතය පිළිබඳ වැරදි කළමනාකරණ තීරණ නිසා

ව්‍යාපාර නිරන්තරයෙන් අවදානම්වලට මුහුණ දේ. මෙවැනි අවදානම් තිබීම ව්‍යාපාරයක ලක්ෂණයකි.

**6. වුවමනා නිර්මාණය කිරීම**

මිනිස් වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිපදවීම ව්‍යාපාර විසින් සිදු කරයි. සමහර ව්‍යාපාර අමුද්‍රව්‍ය නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම මගින් මිනිස් වුවමනා තෘප්තිමත් කරයි. සමහර ව්‍යාපාර යම් භාණ්ඩයක් බහුල ස්ථානයක සිට එම භාණ්ඩය සඳහා විශාල ඉල්ලුමක් පවතින වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කිරීම මගින් මිනිස් වුවමනා තෘප්තිමත් කරයි. යම් භාණ්ඩයක් හිඟ කාලවල දී ලබා දීම සඳහා සමහර ව්‍යාපාර එම භාණ්ඩයේ අස්වැන්න ලැබෙන කාලවල දී ඒවා රැස් කර ගබඩා කර තබා ගැනීමෙන් මිනිස් වුවමනා තෘප්තිමත් කරයි. මෙලෙස සෑම ව්‍යාපාරයක් ම භාණ්ඩ නිෂ්පාදනය හා සේවා සැපයීම කිරීම තුළින් මිනිස් වුවමනා නිර්මාණය කරයි.

**7. ආර්ථික කටයුත්තක් වීම**

හිඟ සම්පත් භාවිතයෙන් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ හා බෙදාහැරීමේ කටයුතුවල නිරත වීම හේතුවෙන් ව්‍යාපාර අත්‍යවශ්‍යයෙන් ම ආර්ථික කටයුත්තක් වේ. එය මුදල් ඉපැයීමේ පරමාර්ථයෙන් සිදුවන්නකි. ව්‍යාපාර, භාණ්ඩ හා සේවා විකිණීම, හිඟ සම්පත් භාවිත කිරීම කරන බැවින් එය ආර්ථික කටයුත්තකි.

- ව්‍යාපාරයක ප්‍රධාන කටයුතු දෙකකි.
    - මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම
    - සම්පත්වලට අගය එකතු කිරීම

- භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනයේ දී යොදා ගන්නා සම්පත්වල ස්වරූපය වෙනස් කිරීම මගින් ඇති වන අගය වැඩි වීම එකතු කළ අගය ලෙස හැඳින්වේ. ව්‍යාපාර විසින් කරනුයේ සම්පත්වල ස්වරූපය වෙනස් කිරීමයි. එමගින් එම සම්පත්වල අගය වැඩි වේ. මෙලෙස සම්පත්වලට අගය එකතු කිරීම ව්‍යාපාරයක සිදු වන ප්‍රධාන කටයුත්තකි.

- ව්‍යාපාරවලට විවිධ අරමුණු තිබිය හැකි අතර ඒවායින් කිහිපයක් පහත දැක්වේ.

    - වෙළෙඳපොළේ රැඳී සිටීම
    - ලාභ උපරිම කිරීම
    - විකුණුම් උපරිම කිරීම

- වෙළෙඳපොළ කොටස වැඩි කර ගැනීම
- පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම
- කොටස්වල වෙළෙඳ අගය උපරිම කිරීම
- ව්‍යාපාරිකයන්ගේ පුද්ගලික තෘප්තිය
- සමාජ හා ප්‍රජාවගේ සුභසාධනය
- සේවක සුභ සාධනය

- ආර්ථිකයක පැවැත්මට ද ව්‍යාපාර දායක වේ.

  නිදසුන් -

  - වෙනස් වන සංකීර්ණ වුවමනා සපුරාලීම
  - නවෝත්පාදනය
  - රැකියා උත්පාදනය
  - ජාතික ආර්ථිකය සංවර්ධනය

**නිපුණතාව 1.0** : ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

**නිපුණතා මට්ටම 1.2** : ව්‍යාපාර විකාශනය හා ප්‍රවණතා අධ්‍යයනය කරයි.

**කාලච්ජේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය පැහැදිලි කරයි.
- ව්‍යාපාර විකාශනයේ අවස්ථා දක්වයි.
- සෘජු නිෂ්පාදනය හා වක්‍ර නිෂ්පාදනය අතර වෙනස පැහැදිලි කරයි.
- මුදලේ විකාශනය විස්තර කරයි.
- වෙළෙඳාමේ අතීත ස්වරූපය හා වර්තමාන ස්වරූපය සසඳයි.
- වාණිජ්‍යය හා වෙළෙඳාම අතර වෙනස පැහැදිලි කරයි.
- ව්‍යාපාර සඳහා පවතින උපකාරක සේවා හඳුන්වා දෙයි.
- විද්‍යුත් වාණිජ්‍යය පැහැදිලි කරයි.
- විද්‍යුත් වාණිජ්‍යය වර්තමානයේ ප්‍රචලිත වීමට හේතු අනාවරණය කරයි.
- ව්‍යාපාර ලෝකයේ වර්තමාන ප්‍රවණතා සහ එමඟින් ව්‍යාපාරවල සිදු වී ඇති වෙනස්කම් පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ඈත අතීතයේ දී ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් පැවැති බව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය තුළ තමාට අවශ්‍ය දේ තමා ම නිෂ්පාදනය කරන ලද බවත්, එය සෘජු නිෂ්පාදනය ලෙස හඳුන්වන බවත් තහවුරු කරන්න.
- මෙම යුගයේ දී එක් එක් පුද්ගලයා හා පුද්ගල කණ්ඩායම් ඔවුන්ට සුවිශේෂී වූ නිෂ්පාදනයක් සිදු කිරීම නිසා එම නිෂ්පාදනය පිළිබඳ විශේෂඥතාවක් ඇති වූ බවත්, එය විශේෂීකරණය ලෙස හඳුන්වන බවත්, මෙම විශේෂීකරණය නිසා අතිරික්ත නිෂ්පාදනයක් ඇති වූ බවත් සිසුන්ට තහවුරු කරන්න.
- පසුකාලීන ව අතිරික්ත නිෂ්පාදනය වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කරන අය සමග හුවමාරු කර ගත් බවත්, ඒ තුළින් වෙළෙඳාම පැන නැගුන බවත්, තහවුරු කරන්න.
- අතිරික්ත නිෂ්පාදනය වෙනත් අතිරික්ත නිෂ්පාදන සමග හුවමාරු කර ගැනීම භාණ්ඩ හුවමාරුව ලෙස හඳුන්වන බවත්, භාණ්ඩ හුවමාරු ක්‍රමයේ විවිධ දුර්වලතා පැවති බවත්, සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ව්‍යාපාර විකාශනයේ මුල් ම අවස්ථාව භාණ්ඩ හුවමාරු ක්‍රමයත් සමඟ ඇති වූ බව සිසුන්ට පහදන්න.
- භාණ්ඩ හුවමාරු ක්‍රමය නිසා වෙළෙඳාම ඇති වූ බවත් වක්‍ර නිෂ්පාදනය ඇති වූ බවත් පැහැදිලි කරන්න.

- සෘජු නිෂ්පාදනය හා වක්‍ර නිෂ්පාදනය  යන්න සිසුන්ට තහවුරු කිරීමට පහත සිද්ධි සිසුන්ට ලබා දෙන්න.
    - ගෘහණියක් තම ගෙවත්තේ වගා කරන පලා වර්ග දිනපතා නිවසේ පරිභෝජනයට  යොදා ගනී.
    - ඉතා කුඩා කුකුළු ගොවිපලක් පවත්වා ගෙන යන අයෙකු ඉන් ලැබෙන බිත්තර අසල පිහිටි සිල්ලර කඩයට ලබා දෙයි.
    - රසකැවිලි වර්ග නිෂ්පාදනයට දක්ෂතාවක් දක්වන මිහිරි, උත්සව සඳහා රසකැවිලි සැපයීමට ඇණවුම් භාර ගනී.
    - මී ගවයින් කිහිපදෙනෙකු සතු ගම්ලත් නිවසේ පරිභෝජනය සඳහා මීකිරි නිෂ්පාදනය කරයි.
    - හේන් ගොවිතැන් කරන සරණපාලගේ  බිරිඳ බඩ ඉරිඟු කරල් තම්බා නිවස ඉදිරිපිට ප්‍රධාන පාරේ තබා පාරේ ගමන් කරන්නන්ට අලෙවි කරයි.
    - ඇඳුම් මැසීමට දක්ෂ කරුණාවතී තම දරුවන් සිව්දෙනාගේ හා ස්වාමියාගේ සියලු ම ඇඳුම් ඇය විසින් මසා දෙන්නීය.

- සෘජු නිෂ්පාදනය හා වක්‍ර නිෂ්පාදනය සිදු වන අවස්ථා හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.

- භාණ්ඩ හුවමාරුවේ පැවති  දුර්වලතා මගහරවා ගැනීම සඳහා හුවමාරු මාධ්‍යය ලෙස විවිධ ද්‍රව්‍ය භාවිත කළ බවත්, එය මුදල් භාවිතයේ මුල් ම අදියර බවත්, පහදන්න.

- ඒ අනුව මුදලේ විකාශනය අද දක්වා සංවර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න.

- මේ සඳහා, අතීතයේ  දී  භාවිත  වූ  ලෝහ  කාසි හෝ ලෝහ කාසිවල පින්තූර, ශ්‍රී ලංකාවේ භාවිත කෙරෙන කාසි හා නෝට්ටු , වෙනත්  රටවල භාවිත කරන කාසි හා නෝට්ටු  හෝ ඒවායේ පින්තූර, චෙක්පත් හෝ චෙක්පත්වල පින්තූර, විද්‍යුත් මුදල් කාඩ්පත් හෝ ඒවායේ පින්තූර  සිසුන්ට ඉදිරිපත් කර අතීතයේ සිට භාවිත වූ මුදල් නිරීක්ෂණයට  යොමු  කරන්න.

- කාර්මික විප්ලවය පිළිබඳවත්, ඒ නිසා වෙළෙඳාමේ ඇති වූ දියුණුව පිළිබඳවත්, පැහැදිලි කරන්න.
- වර්තමානයේ පවතින්නේ විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර මත පදනම් වූ යුගයක් වන අතර මේ යුගයේ පවතින විශේෂත්වය වන්නේ  තොරතුරු මත ව්‍යාපාර පදනම් ව තිබීම බව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- වර්තමානයේ විද්‍යුත් වාණිජ්‍යය ප්‍රචලිත වීමට හේතු වූ කරුණු සිසුන් සමග සාකච්ඡා කරන්න.

- එදිනෙදා ජීවිතයේ දී ව්‍යාපාර කටයුතුවල දී විද්‍යුත් වාණිජ්‍යය භාවිත වන අවස්ථා පෙන්වා දීමට පහත සිද්ධි සිසුන් සමග සාකච්ඡා කරන්න.

    - විදේශ රටකින් පොතක් ගෙන්වා ගැනීමට අවශ්‍ය වූ විටෙක www.amerson.com වැනි වූ වෙබ් අඩවියකට පිවිස අවශ්‍ය පොත සොයා, එය මිල දී ගැනීමට අවශ්‍ය නම්, පොතේ මිල සහ අනෙකුත් ගාස්තු ණයපතක් හෝ හරපතක් භාවිත කර (විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිත කර) අදාළ වෙබ් අඩවිය තුළින් ගෙවීමේ පහසුකම් සලසා ගත හැකි බවත් පැහැදිලි කරන්න. එවිට විකුණුම්කරු විසින්, ගැනුම්කරු ඇණවුම් කළ පොත කුරියර් සේවය හරහා ඇණවුම් කළ පුද්ගලයාට ම ගෙනැවිත් භාර දේ.

    - ශ්‍රී ලංකාව තුළ දී වෛද්‍යවරයෙකු චැනල් කිරීමට අවශ්‍ය නම්, අදාළ රෝහලේ වෙබ් අඩවියට පිවිස, අදාළ රෝගය හා සම්බන්ධ වෛද්‍යවරුන්ගේ නාම ලේඛනය හා එම වෛද්‍යවරු හමුවිය හැකි වේලාවන් පරීක්ෂා කර, පහසු වේලාවක් වෙන් කරවා ගැනීම සඳහා අවශ්‍ය ගාස්තු ගෙවීම තමාගේ බැංකු ගිණුමින් හෝ ණයපතින් හෝ හරපතින් හෝ (විද්‍යුත් ගෙවීම් ක්‍රම මඟින් ) කරන ආකාරය පැහැදිලි කරන්න.

    - විදේශ රටවලින් වාහන ආනයනය කරන සමාගමක් විදේශ රටෙහි වාහන නිෂ්පාදනය කරන ආයතනයේ වෙබ් අඩවියට පිවිස එම ආයතනයේ නිෂ්පාදිත වාහනවල සියලු ම අංගෝපාංග වෙබ් අඩවිය තුළින් ම පරීක්ෂා කර අවශ්‍ය වර්ගයේ වාහන ඇණවුම් කිරීම හා අදාළ ගෙවීම් ද විද්‍යුත් මුදල් ගෙවීමේ ක්‍රමයක් භාවිතයෙන් සිදු කරන ආකාරය පැහැදිලි කරන්න.

    - තොරතුරු යුගයේ දී ව්‍යාපාරවල ඇති වූ ප්‍රවණතා නිදසුන් මගින් පැහැදිලි කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ඈත අතීතයේ ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් පැවතින.
- ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයේ දී තමාට අවශ්‍ය දේ තමා ම නිෂ්පාදනය කර ගන්නා ලදී.
- තමාට අවශ්‍ය දේ තමා ම නිෂ්පාදනය කර ගැනීම ඍජු නිෂ්පාදනය ලෙස හඳුන්වයි.
- ඍජු නිෂ්පාදනය තුළින් විශේෂීකරණය ඇති විය.
- පුද්ගල විශේෂීකරණයේ ප්‍රතිඵලයක් ලෙස අතිරික්ත නිෂ්පාදනය ඇති විය.
- අතිරික්ත නිෂ්පාදනය නිසා භාණ්ඩ හුවමාරුව සිදු විය.
- ව්‍යාපාර විකාශනයේ මුල් ම අවස්ථාව භාණ්ඩ හුවමාරු ක්‍රමය වේ.
- භාණ්ඩ හුවමාරුව සමඟ වෙළෙඳාම පැන නැගුණි.
- වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය කිරීම වක්‍ර නිෂ්පාදනය ලෙස හඳුන්වයි.

- භාණ්ඩ හුවමාරුවේ දුර්වලතා මගහරවා ගැනීමට හුවමාරු මාධ්‍ය ලෙස විවිධ ද්‍රව්‍ය භාවිත කරන ලදී.
    - භාණ්ඩ හුවමාරු ක්‍රමයේ සිට අද දක්වා මුදල් භාවිතයේ ඇති වූ ක්‍රමික විකාශනය පහත දැක්වෙන පරිදි පෙළගැස්විය හැකි ය.


        - **ද්‍රව්‍ය භාවිතය**
          නිදසුන් : සිප්පිකටු, දුම්කොළ
        - **ලෝහ වර්ග භාවිතය**
          නිදසුන් : රන්, රිදී, වැනි ලෝහ වර්ග
        - **ලෝහ කාසි මුදල් භාවිතය**
          විවිධ ප්‍රමාණවලින් යුත් ලෝහ කැබලිවල මුහුණත බර, පිරිසිදු බව සහ අගයක් සඳහන් කරන ලදී.  පසු කාලීන ව ඇති වූ අච්චු කාසිවලට පදනම මෙයයි.
        - **කාසි හා නෝට්ටු භාවිතය**
          වටිනා ලෝහ, මුදල් ලෙස භාවිතයට ගැනීමේ අපහසුතාවට පිළියමක් ලෙස නෛසර්ගික වටිනාකමක් නො මැති කාසි භාවිතයට ගන්නා ලදී. ඒ සමග ම නෝට්ටු මුදල් ද භාවිතයට ගන්නා ලදී. රජයේ බලයලත් අධිකාරිය විසින් නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු මෙයට අයත් ය.
          නිදසුන් : ශ්‍රී ලංකාව - රුපියල්
          මහා බ්‍රිතාන්‍ය - පවුම්
          ඇමරිකා එක්සත් ජනපදය - ඩොලර්
          යූරෝපා සංගමයේ රටවල් - යූරෝ

        - **බැංකු මුදල් භාවිතය**
          බැංකු ජංගම ගිණුම ආශ්‍රිත චෙක්පත් භාවිතය

        - **විද්‍යුත් මුදල් භාවිතය**
          තොරතුරු තාක්ෂණයේ හා ඩිජිටල් තාක්ෂණයේ දියුණුව සමග හඳුන්වා දුන් පරිගණක ජාලයක් මඟින් ගනුදෙනු සිදුවන ක්‍රමයකි.
          නිදසුන් : ණයපත්
          හරපත්
          පෙර ගෙවුම් කාඩ්පත්
          ක්ෂුද්‍රපත් (Microchips ) / Mobilecash

    - මුදල් භාවිතය ව්‍යාපාර විකාශනයේ දෙවැනි අවස්ථාව වේ.

    - යුරෝපීය රටවල ඇති වූ කාර්මික ප්‍රබෝධය සමග මෙතෙක් පැවති ගෘහ කර්මාන්ත මහා පරිමාණ කර්මාන්ත බවට පත් වූ අතර ඒ සමග වෙළෙඳාමේ ප්‍රසාරණයක් සිදු විය.
    - කාර්මික විප්ලවයත් සමඟ බැංකු, ප්‍රවාහනය, රක්ෂණය, සන්නිවේදනය, ගබඩාකරණය වැනි උපකාරක සේවාවල ද වර්ධනයක් සිදු විය.
    - කාර්මික විප්ලවය ව්‍යාපාර විකාශනයේ තුන්වන අදියර වේ.
    - වෙළෙඳාම හා උපකාරක සේවාවල එකතුව වාණිජ්‍යය ලෙස හැඳින්වේ.
      (වාණිජ්‍යය = වෙළෙඳාම + උපකාරක සේවා )




- වර්තමානයේ පවතින්නේ විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර පදනම් වූ යුගයකි.
- අන්තර්ජාලය හරහා මිල දී ගැනීමේ හා විකිණීමේ කටයුතු කිරීම විද්‍යුත් වාණිජ්‍යය ලෙස හැඳින්වේ.
- ව්‍යාපාරවලට අදාළ සියලු ම කාර්යයන් අන්තර්ජාලය හරහා සිදු කිරීම විද්‍යුත් ව්‍යාපාර ලෙස හැඳින්වේ.
- තොරතුරු යුගය ව්‍යාපාර විකාශනයේ හතරවන අදියර වේ.

- විද්‍යුත් වාණිජ්‍යය වර්තමානයේ ප්‍රචලිත වීමට බලපෑ හේතු කිහිපයක් පහත වේ.
  - ලියකියවිලිවලින් තොර ව ව්‍යාපාර තොරතුරු හුවමාරු කිරීමට හැකි වීම
  - ව්‍යාපාර කටයුතු වේගවත් වීම
  - මෙහෙයුම් පිරිවැය, තොග පිරිවැය අඩු වීම
  - ගෝලීය වූ වෙළෙඳපොළ අවකාශයක් බිහි වීම
  - භාණ්ඩ හා සේවාවල ගුණත්වය ඉහළ යාම
  - ගනුදෙනුකරුවන්ගේ කාලය හා ශ්‍රමය ඉතුරු වීම
  - පරිගණක සාක්ෂරතාව වැඩි වීම
  - යටිතල පහසුකම්වල වර්ධනය

- මේ අනුව ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථා හතර පහත දැක්වේ.
  - භාණ්ඩ හුවමාරුව
  - මුදල් භාවිතය
  - කාර්මික විප්ලවය
  - තොරතුරු ආර්ථිකය

- වර්තමානයේ තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමඟ ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදු වී ඇති ප්‍රවණතා කිහිපයක් පහත දැක්වේ.
  - ගෝලීයකරණය ව්‍යාප්ත වීම
  - විද්‍යුත් ව්‍යාපාර බිහි වීම
  - විද්‍යුත් මුදල් භාවිතයට පැමිණීම
  - පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම
  - ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳ සැලකිලිමත් වීම

**නිපුණතාව 1.0** : ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

**නිපුණතා මට්ටම 1.3** : විවිධ නිර්ණායක මත ව්‍යාපාර වර්ග කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාර වර්ග කළ හැකි විවිධ නිර්ණායක ලැයිස්තුගත කරයි.
- පාසල පිහිටි ප්‍රදේශයේ ඇති ව්‍යාපාර විවිධ නිර්ණායක මත වර්ග කරයි.
- එක ම ව්‍යාපාරය විවිධ නිර්ණායක මත වර්ග කිහිපයකට අයත් වන බව පැහැදිලි කරයි.
- දෙන ලද ව්‍යාපාරයක් එක් එක් නිර්ණායකය මත කුමන වර්ගයකට අයත් වන්නේ දැයි දක්වයි.
- ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය වර්ග කරන ආකාරය දක්වයි.
- දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් නිෂ්පාදන අංශයේ දායකත්වය ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

- ප්‍රදේශයේ පවතින ව්‍යාපාර කිහිපයක් නිදසුන් ලෙස ගෙන පහත සඳහන් ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න.
    - එම ව්‍යාපාර රාජ්‍ය අංශයට අයත් ද ? පෞද්ගලික අංශයට අයත් ද ?
    - එම ව්‍යාපාර සේවා සපයන ව්‍යාපාර ද ? භාණ්ඩ නිෂ්පාදනය කරන ව්‍යාපාර ද ?
    - එම ව්‍යාපාර ලාභ අරමුණු කරගත් ව්‍යාපාර ද ? ලාභ අරමුණු කර නො ගත් ව්‍යාපාර ද ?
    - එම ව්‍යාපාර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ද ? මහා පරිමාණ ව්‍යාපාර ද ?

- මේ අනුව එක ම ව්‍යාපාරය විවිධ ක්‍රමයට වර්ග කළ හැකි බව සිසුන්ට පැහැදිලි කරන්න.
- ව්‍යාපාර වර්ග කළ හැකි විවිධ නිර්ණායක දක්වා, ඒ අනුව ව්‍යාපාර වර්ගීකරණය සිසුන් සමග සාකච්ඡා කරන්න.

    - ප්‍රදේශයේ ඇති ව්‍යාපාර හැකිතාක් නම් කර පහත වගුව සම්පූර්ණ කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

| ව්‍යාපාරයේ නම | නිෂ්පාදනයේ ස්වභාවය අනුව | | | හිමිකාරිත්වය අනුව | | අරමුණ අනුව | | පරිමාණය අනුව | | නිෂ්පාදන අංශය අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රාථමික | ද්විතීයික | තෘතීයික | පෞද්ගලික | පොදු | ලාභ අරමුණු කරගත් | ලාභ අරමුණු කර නොගත් | සුළු හා මධ්‍ය පරිමාණ | මහා පරිමාණ | කෘෂිකාර්මික | කාර්මික | සේවා |
| | | | | | | | | | | | | |


ආසන්න ම වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ගීකරණය සිසුන්ට පරිශීලනය කිරීමට අවස්ථාව ලබා දී, දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් අංශ දායක වන ආකාරය සන්සන්දනාත්මක ව සිසුන්ට පැහැදිලි කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්:**

- ව්‍යාපාර පහත සඳහන් නිර්ණායක මත වර්ග කළ හැකි ය.
  - නිෂ්පාදනයේ ස්වභාවය අනුව
  - හිමිකාරිත්වය අනුව/අයිතිය අනුව
  - අරමුණ අනුව
  - පරිමාණය අනුව
  - නිෂ්පාදන අංශය අනුව /කර්මාන්ත මූලය අනුව

- ව්‍යාපාර වර්ගීකරණ පදනම් හා ඒ අනුව වර්ග කෙරෙන ආකාරය පහත දැක්වෙන ගැලීම් සටහනින් දැක්විය හැකි ය.

**ව්‍යාපාර වර්ගීකරණ පදනම්**



- නිෂ්පාදනයේ ස්වභාවය අනුව ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික ලෙස ව්‍යාපාර වර්ගීකරණය කළ හැකි ය.
- ඒ අනුව ස්වභාව ධර්මයෙන් ලැබී ඇති දේ ඒ ආකාරයෙන් ම ප්‍රයෝජනයට ගන්නා නිෂ්පාදන ව්‍යාපාර ප්‍රාථමික අංශයටත්, එම නිෂ්පාදන නැවත වෙනස් කිරීමට භාජනය කිරීමේ ව්‍යාපාර ද්විතීයික අංශයටත් සියලු ම සේවා සැපයීමේ ව්‍යාපාර තෘතීයික අංශයටත් අයත් වේ.

  නිෂ්පාදනයේ ස්වභාවය අනුව ප්‍රාථමික, ද්විතීයික, හා තෘතීයික ලෙස වර්ගීකරණය පහත ලෙස දැක්විය හැකි ය.

  ප්‍රාථමික අංශය -
  - කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය
  - පතල් හා කැණීම් කර්මාන්තය

  ද්විතීයික අංශය -
  - නිෂ්පාදන කර්මාන්ත
  - ඉදි කිරීම් කර්මාන්ත

  තෘතීයික අංශය -
  - විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම
  - ජලය පිරිසිදු කිරීම හා බෙදාහැරීම
  - මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය
  - වෙළෙඳාම, ප්‍රවාහන සේවා, නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීම
  - තොරතුරු සහ සන්නිවේදන කටයුතු
  - මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය හා දේපළ වෙළෙඳාම්
  - වෘත්තීය ම ය සේවා සහ වෙනත් පෞද්ගලික සේවා
  - රාජ්‍ය පරිපාලන, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ සේවා

- හිමිකාරිත්වය අනුව පෞද්ගලික අංශයේ ව්‍යාපාර හා පොදු/රාජ්‍ය අංශයේ ව්‍යාපාර ලෙස ව්‍යාපාර වර්ග කළ හැකි ය.
- අරමුණ අනුව ලාභ අරමුණු කර ගත් ව්‍යාපාර හා ලාභ අරමුණු කර නො ගත් ව්‍යාපාර ලෙස ව්‍යාපාර වර්ග කළ හැකි වේ.
- පරිමාණය අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙසත් මහා පරිමාණ ව්‍යාපාර ලෙසත් ව්‍යාපාර වර්ග කළ හැකි වේ.
- නිෂ්පාදන අංශ නැතිනම් කර්මාන්ත මූලය අනුව කෘෂිකාර්මික, කාර්මික හා සේවා ව්‍යාපාර ලෙස වර්ග කළ හැකි ය.
- ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ පල කෙරේ.
- ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2015 ට අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය පහත දැක්වේ.

**කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය**
**(2010 ස්ථාවර මිල අනුව )**

| ආර්ථික කටයුතු | ද.දේ.නි.ට දායකත්වය (%) 2015 |
|---|---|
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **7.9** |
| ධාන්‍ය වගාව (වී හැර) | 0.2 |
| වී වගාව | 0.9 |
| එළවළු වගාව | 0.8 |
| උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | 0.0 |
| පළතුරු වගාව | 0.6 |
| තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්,තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 0.8 |
| තේ වගාව | 0.8 |
| වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා, ආදී) | 0.0 |
| කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැලෑටි වගාව | 0.7 |
| රබර් වගාව | 0.3 |
| වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 0.2 |
| කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 0.6 |
| පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික (ඉහතින් සඳහන්) කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 0.1 |
| වන වගාව, ගස් කැපීම, හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 0.6 |
| ධීවර කර්මාන්තය | 1.4 |
| **කර්මාන්ත** | **26.2** |
| පතල් හා කැණීම් කර්මාන්තය | 2.3 |
| නිෂ්පාදන කර්මාන්ත | 15.7 |
| විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 1.0 |
| ජලය පිරිසිදු කිරීම හා බෙදාහැරීම | 0.1 |
| මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 0.3 |
| ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 6.8 |
| **සේවාවන්** | **56.6** |
| වෙළෙඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 23.2 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 0.6 |
| මූල්‍ය රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළෙඳාම | 12.3 |
| වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 11.8 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 8.7 |
| **මූලික මිලගණන් අනුව සමස්ත එකතු කළ අගය** | **90.7** |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර | 9..3 |
| **වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි)** | 100.0 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තාව - 2015

- නිෂ්පාදනයේ ස්වභාවය අනුව වර්ග කිරීමේ දී පතල් හා කැණීම් කර්මාන්තය ප්‍රාථමික අංශයට අයත් වන අතර කර්මාන්ත මූලය අනුව වර්ග කිරීමේ දී පතල් හා කැනීම් කර්මාන්තය කාර්මික අංශයට (කර්මාන්ත අංශයට ) අයත් වේ. එසේ ම නිෂ්පාදනයේ ස්වභාවය අනුව විදුලිය, ගෑස් වාෂ්ප හා වායු සමීකරණ සැපයීම, ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම, මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය තෘතීයික අංශයට අයත් වුව ද කර්මාන්ත මූල්‍ය අනුව ඒවා කාර්මික අංශයට අයත් වේ.

- දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් අංශයෙන් වන දායකත්වය ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කළ හැකි ය. (ආසන්න ම වර්ෂයේ මහ බැංකු වාර්තාව පරිශීලනය කරන්න. )

**නිපුණතාව 1.0** : ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

**නිපුණතා මට්ටම 1.4** : ව්‍යාපාර, යෙදවුම්-නිමැවුම් ක්‍රියාවලියක් ලෙස විගහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාරවල යෙදවුම් පැහැදිලි කරයි.
- ව්‍යාපාර කාර්යයන් පැහැදිලි කරයි.
- ව්‍යාපාරවල නිමැවුම් ලැයිස්තුගත කරයි.
- ව්‍යාපාර, යෙදවුම් - නිමැවුම් ක්‍රියාවලියක් ලෙස රූප සටහනකින් දක්වයි.
- කිසියම් නිමැවුමකට අදාළ යෙදවුම්, එක් එක් යෙදවුම් වර්ගය යටතේ වෙන් කර දක්වයි.
- ව්‍යාපාර කාර්යයන් ව්‍යාපාරවල ස්වභාවය අනුව වෙනස් වන බව නිදසුන් සහිත ව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ප්‍රදේශයේ පවතින නිෂ්පාදන ව්‍යාපාරයක් නිදසුන් ලෙස ගෙන එම ව්‍යාපාරය සඳහා යොදා ඇති සම්පත් සිසුන්ගෙන් විමසන්න.
- එම සම්පත් හුණු පුවරුවේ සටහන් කරන්න.
- නිදසුනක් ලෙස ඇඟලුම් කර්මාන්ත ශාලාවක් උපකල්පනය කරන්න. එම ව්‍යාපාරය සඳහා යොදා ගන්නා සම්පත් ලෙස, කර්මාන්තශාලා ගොඩනැගිලි, මහන මැෂින්, ඇඳුම් මසන්නන්, සුපරීක්ෂකයින් ආදී සේවකයින්, ව්‍යාපාරය පිහිටා ඇති ඉඩම, වැඩ කරන සේවා මුර ගණන (පැය ගණන), ඇඳුම් මෝස්තර නිර්මාණය, පරිගණක ගත මෝස්තර සැලසුම්කරණය, නව වෙළෙඳපොළවල් සොයා ගැනීම, නවීකරණය වූ මහන යන්ත්‍ර පිළිබඳ ව සොයා බැලීම, කළමනාකරුවන් සතු දැනුම, අවශ්‍ය නීති උපදෙස් ලබාගැනීම ආදිය සටහන් කරන්න.
- ඒවා ප්‍රධාන සම්පත් වර්ග හතට අනුව වර්ග කරන්න.

☞

- එම නිෂ්පාදන ව්‍යාපාර විසින් සිදු කරනු ලබන කාර්යයන් සිසුන්ගෙන් විමසා ඒවා හුණු පුවරුවේ සටහන් කරන්න.
- සේවකයින්ගේ පැමිණීම පිටවීම පිළිබඳ තොරතුරු තබා ගැනීම, නිවාඩු ලේඛන පවත්වා ගැනීම, සේවකයින් පුහුණු කිරීම, සේවක උසස්වීම් ලබා දීම, අවශ්‍ය වර්ගයේ රෙදි තොග ලබාගැනීම, ඒවායේ ගුණත්වය පරීක්ෂා කිරීම, අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම, නිසි පරිදි මුදල් යෙදවීම, පිරිවැය අවම කළ හැකි ක්‍රම සොයා බැලීම, නව මෝස්තර අත්හදා බැලීම, නිෂ්පාදිත ප්‍රචාරණය කිරීම, ආදිය නිදසුන් ලෙස දක්වන්න.
- ඒවා ප්‍රධාන කාර්යයන් හතට වර්ග කර ඒ පිළිබඳ ව පැහැදිලි කිරීමක් කරන්න.

☞

- ඇඟලුම් නිෂ්පාදන ආයතනයේ නිමැවුම/නිමැවුම් සිසුන්ගෙන් විමසා ඕනෑ ම ව්‍යාපාරයක නිමැවුම භාණ්ඩ හෝ සේවා විය හැකි බව සිසුන්ට පැහැදිලි කරන්න.

- ඉහත නිමැවුම/නිමැවුම් ලබා ගැනීම සඳහා එම ආයතනයේ සිදු වන ව්‍යාපාර ක්‍රියාවලිය සිසුන්ගෙන් විමසන්න.
- ලැබෙන පිළිතුර අනුව ව්‍යාපාර ක්‍රියාවලිය පිළිවෙලින් දක්වා ඉන්පසු ව්‍යාපාර ක්‍රියාවලිය, යෙදවුම් නිමැවුම් ක්‍රියාවලියට අදාළ අංග රූප සටහනක් මගින් පැහැදිලි කරන්න.
- ව්‍යාපාරවල යෙදවුම් - නිමැවුම් ක්‍රියාවලියක් සිදු වන බව තහවුරු කිරීමට සිසුන් පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදා පහත මාතෘකා ලබා දෙන්න.
  - කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන වැඩපළක්
  - ගෘහ භාණ්ඩ නිෂ්පාදන ආයතනයක්
- ඔබ කණ්ඩායමට ලැබෙන මාතෘකාව කෙරෙහි අවධානය යොමු කරන්න.
- එම මාතෘකාවට අදාළ ව්‍යාපාර ක්‍රියාවලිය රූප සටහනකින් දක්වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාර කටයුතු සඳහා භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය, තොරතුරු, කාලය, දැනුම ආදී යෙදවුම් (සම්පත්) භාවිත කරයි.

- නිමි ඇඳුම් නිෂ්පාදනය කරන ආයතනයක් නිදසුනක් ලෙස ගත්විට -

භූමිය -
- ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම
- ගොඩනැගිල්ලට ලැබෙන වාතාශ්‍රය
- හිරු එළිය (ස්වාභාවික ආලෝකය )

ශ්‍රමය -
- ඇඳුම් මසන්නාගේ කායික හා මානසික ශ්‍රමය
- සුපරීක්ෂකවරුන්ගේ කායික හා මානසික ශ්‍රමය
- කළමනාකරුවන්ගේ මානසික ශ්‍රමය
- මුරකරුවන්ගේ ශ්‍රමය

ප්‍රාග්ධනය -
- ගොඩනැගිල්ල, මහන මැෂින්, උපකරණ
- බෙදා හැරීමේ රථ
- රෙදි, නූල්, බොත්තම්
- මුදල්

ව්‍යවසායකත්වය -
- සම්පත් සංකලනය පිළිබඳ තීරණ ගන්නා (ලාභය භුක්ති විඳින්නා)
- අවදානම දරමින් තීරණ ගන්නා
- පුද්ගලයින් හෝ ආයතන

තොරතුරු -
- පාරිභෝගික රුචිය අනුව ගැලපෙන මෝස්තර
- අමුද්‍රව්‍ය පිළිබඳ නව තොරතුරු
- නව තාක්ෂණය පිළිබඳ තොරතුරු
- වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු

කාලය -
- සේවකයින් සේවයේ නිරත වන කාලය
- යන්ත්‍ර සේවයේ යොදවා ගන්නා කාලය
- තීරණ ගැනීම සඳහා ගත කරන කාලය

දැනුම -
- නව නිමැවුම් සඳහා ලැබෙන පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම
- ඇගලුම් සේවකයින්ගේ කුසලතා
- කළමනාකරුවන් සතු දැනුම
- මෝස්තර නිර්මාණ ශිල්පීන්ගේ දැනුම
- නීති උපදෙස්

- පරිපාලනය, නිෂ්පාදනය, අලෙවිකරණය, මූල්‍ය කටයුතු, මානව සම්පත් කටයුතු, පර්යේෂණ හා සංවර්ධනය යනාදිය මූලික ව්‍යාපාර කාර්යයන් ලෙස හඳුන්වයි.

- ව්‍යාපාර කාර්යයන් හා ඒ සඳහා නිදසුන් පහත දැක්වේ.

| | කාර්යයන් | නිදසුන් |
|---|---|---|
| 1. | පරිපාලනය | • ඇගළුම් සේවක ලිපිගොනු සැකසීම<br>• අදාළ උපදෙස් සැපයීම<br>• පැමිණීමේ ලේඛන පවත්වාගෙන යාම |
| 2. | නිෂ්පාදනය | • අමුද්‍රව්‍ය සපයා ගැනීම<br>• තොග පාලනය<br>• තත්ත්ව පාලනය |
| 3. | අලෙවිකරණය | • ඇගලුම් බෙදා හැරීම<br>• ප්‍රචාරණය<br>• මිල තීරණය කිරීම |
| 4. | මූල්‍ය කටයුතු | • අරමුදල් සපයා ගැනීම<br>• වැටුප් ගෙවීම<br>• අරමුදල් යෙදවීම |
| 5. | මානව සම්පත් කටයුතු | • සේවකයින් බඳවා ගැනීම<br>• පුහුණු කිරීම<br>• උසස් කිරීම |
| 6. | පර්යේෂණ හා සංවර්ධනය | • නව නිර්මාණ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම<br>• නිෂ්පාදන වැඩි දියුණු කිරීම<br>• අඩු පිරිවැය ක්‍රම සොයා බැලීම |
| 7. | තොරතුරු කළමනාකරණ කටයුතු | • තොරතුරු පද්ධති පවත්වාගෙන යාම<br>• නව තොරතුරු සම්පාදනය කර ගැනීම<br>• තොරතුරු යාවත්කාලීන කිරීම |

- ව්‍යාපාර කටයුතු හා සම්බන්ධ වූ ලියකියවිලි පවත්වාගෙන යාම, සන්නිවේදන කටයුතු පවත්වාගෙන යාම යනාදිය ව්‍යාපාරයක පරිපාලන කාර්යයන්ට ඇතුළත් වේ.
- සම්පත්, භාණ්ඩ හෝ සේවා බවට පත්කිරීමේ ක්‍රියාවලිය නිෂ්පාදනය (මෙහෙයුම්) වේ.
- ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන ඒවා තෘප්තිමත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම අලෙවිකරණය ලෙස හඳුන්වයි.
- අරමුදල් සම්පාදනය හා යෙදවීම හා ඊට අදාළ කටයුතු මූල්‍ය කටයුතු ලෙස හඳුන්වයි.
- ආකර්ෂණය, තෝරා ගැනීම, බඳවා ගැනීම, පුහුණු කිරීම, සුබ සාධනය යනාදිය සම්බන්ධයෙන් වූ කටයුතු මානව සම්පත් කටයුතු වේ.
- පර්යේෂණ හා සංවර්ධනය යන්නට නිමැවුමේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම හා නව නිමැවුම් සොයා ගැනීම ඇතුළත් වේ.

- ව්‍යාපාර ක්‍රියාවලිය යෙදවුම් - නිමැවුම් ක්‍රියාවලියක් ලෙස පහත දැක්වෙන පරිදි රූප සටහනකින් ඉදිරිපත් කළ හැකි ය.

| **යෙදවුම්/සම්පත්** | | **ව්‍යාපාර කාර්යයන්** | | **නිමැවුම්** |
|---|---|---|---|---|
| භූමිය<br>ශ්‍රමය<br>ප්‍රාග්ධනය<br>ව්‍යවසායකත්වය<br>තොරතුරු<br>කාලය<br>දැනුම | → | පරිපාලනය<br>මෙහෙයුම් (නිෂ්පාදනය)<br>අලෙවිකරණය<br>මූල්‍ය කටයුතු<br>මානව සම්පත් කටයුතු<br>පර්යේෂණ හා සංවර්ධනය<br>තොරතුරු කළමනාකරණය | → | භාණ්ඩ<br>හෝ<br>සේවා |

- **බේකරියක ව්‍යාපාර ක්‍රියාවලිය යෙදවුම් - නිමැවුම් ක්‍රියාවලියක් ලෙස පහත රූප සටහනින් දැක්වේ.**

**යෙදවුම් (සම්පත්)**

භූමිය
- බේකරිය පිහිටි ඉඩම

ශ්‍රමය
- පාන් පුළුස්සන්නන්ගේ ශ්‍රමය

ප්‍රාග්ධනය
- ගොඩනැගිල්ල
- පෝරණුව, තැටි,පිටි

ව්‍යවසායකත්වය
- බේකරිය අයිතිකරු/ සාධක සංයෝග කරන්නාගේ හැකියාව

තොරතුරු
- නව ශිල්පීය ක්‍රම
- වෙළෙඳපොළ තොරතුරු

කාලය
- සේවකයින් වැඩ කරන කාලය
- අතිකාල වැඩ

දැනුම
- සේවක කුසලතා
- නව නිෂ්පාදන පිළිබඳ දැනුම

→

**ක්‍රියාවලිය**

නිෂ්පාදනය
- ද්‍රව්‍ය සපයා ගැනීම
- ද්‍රව්‍ය මිශ්‍ර කිරීම
- පාන් සැකසීම

අලෙවිකරණය
- ප්‍රචාරණය කිරීම
- බෙදා හැරීම
- මිල නියම කිරීම

පරිපාලනය
- සේවක ලිපිගොනු සැකසීම
- සේවක පැමිණීමේ ලේඛන පවත්වා ගැනීම

මූල්‍ය කටයුතු
- අවශ්‍ය මුදල් සපයා ගැනීම
- වත්කම් මිලට ගැනීම
- වියදම් ගෙවීම්

මානව සම්පත් කටයුතු
- ශ්‍රමිකයන් බඳවා ගැනීම
- පුහුණු කිරීම
- උසස් කිරීම

පර්යේෂණ හා සංවර්ධන කටයුතු
- සමීක්ෂණ පැවැත්වීම
- නිෂ්පාදනවල ගුණත්වය වර්ධනය කිරීමට පර්යේෂණ පැවැත්වීම

→

**නිමැවුම**

පාන්, බනිස්, කේක් (බේකරි අයිතම)

**නිපුණතාව 1.0** : ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

**නිපුණතා මට්ටම 1.5** : ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **06**


**ඉගෙනුම් ඵල** :

- තෝරාගත් ව්‍යාපාරයක් ඇසුරෙන් ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව ලැයිස්තුගත කරයි.
- එක් එක් පාර්ශ්වය ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු පැහැදිලි කරයි.
- එක් එක් පාර්ශ්වය, ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට හේතු විවිධ වන බව අනාවරණය කරයි.
- ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව ව්‍යාපාරයකට වැදගත් වන ආකාරය පෙන්වා දෙයි.
- ව්‍යාපාරයක සාර්ථක පැවැත්ම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ අපේක්ෂා පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව පෙන්වා දෙයි.
- ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව, ව්‍යාපාර කෙරෙහි දක්වන ඇල්ම සහ ඔවුන් ව්‍යාපාරය කෙරෙහි බලපෑම් කිරීමට ඇති හැකියාව මත එම පාර්ශ්වයන්ගේ ප්‍රමුඛතාව තීරණය කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**


- ශිෂ්‍යයා පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්ව විමසා පහත රූප සටහන සම්පූර්ණ කරන්න.

දෙමාපියන්




- පාසල කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව සිසුන්ගෙන් විමසා පහත රූප සටහන සම්පූර්ණ කරන්න.

ශිෂ්‍යයින්



- ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව හඳුනා ගැනීමට පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - දෙමාපියන්, ගුරුවරුන්, යහලුවන්, සහෝදර සහෝදරියන්, නෑදෑයන්, රජය ආදී පාර්ශ්ව ශිෂ්‍යයා පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්ව කිහිපයක් බව පෙන්වා දෙන්න.
    - ශිෂ්‍යයින්, දෙමාපියන්, ගුරුවරුන්, ආදි ශිෂ්‍යයින්, රජය, ප්‍රජාව පාසල කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව කිහිපයක් බව පැහැදිලි කරන්න.
    - ඉහත පාර්ශ්ව අතුරෙන් රජය හා ප්‍රජාව ව්‍යාපාර කෙරෙහි ද උනන්දුවක් දක්වන පාර්ශ්ව බවත් , ඊට අමතර ව ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව දැකිය හැකි බවත් පැහැදිලි කරන්න.
- සිසුන් සදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත දැක්වෙන ව්‍යාපාර ආයතන අතුරෙන් ඔබේ කණ්ඩායමට ලැබෙන ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කරන්න.
    - ඇඳුම් මසා අලෙවි කරන ආයතනයක්
    - පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක්
    - ආපනශාලාවක්
    - පොත් හා ලිපි ද්‍රව්‍ය අලෙවි සලක්
- ඔබේ මාතෘකාවට අදාළ ව ඔබේ ප්‍රදේශයේ ඇති ව්‍යාපාරයක් හඳුනාගන්න.
- එම ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් මතුකර ගන්න.
- එම පාර්ශ්ව ව්‍යාපාරයෙන් අපේක්ෂා කරන්නේ මොනවා දැයි සාකච්ඡා කරන්න.
- එම පාර්ශ්වයන්ගේ අපේක්ෂා ඉටු වන ආකාරයට ව්‍යාපාර කටයුතු කළ යුත්තේ කෙසේ දැයි පෙන්වා දෙන්න.
- ව්‍යාපාරය, එම පාර්ශ්ව කෙරෙහි සැලකිලිමත් විය යුත්තේ මන්දැයි පැහැදිලි කරන්න.
- ඔබේ අනාවරණ සමස්ත පන්තියට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව කිහිපයක් පහත දැක්වේ.
    - අයිතිකරුවෝ /කොටස් හිමියෝ
    - කළමනාකරුවෝ
    - සේවකයෝ
    - ණයහිමියෝ
    - පාරිභෝගිකයෝ
    - සැපයුම්කරුවෝ
    - විභව ආයෝජකයෝ
    - රජය
    - ප්‍රජාව
    - වෙනත් පාර්ශ්ව

ඒ එක් එක් පාර්ශ්වය ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| අයිතිකරුවෝ | • | තමන් ආයෝජනය කළ මුදලට ප්‍රමාණවත් ලාභයක් ලැබේ දැයි දැන ගැනීමට |
| | • | ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳ ව දැන ගැනීමට |
| | • | වෙළෙඳපොළ කොටස දැන ගැනීමට |
| කළමනාකරුවෝ | • | ව්‍යාපාරයේ ලාභය උපරිම කිරීමට |
| | • | ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳ ව දැන ගැනීමට |
| | • | කළමනාකරණ තීරණවල සාර්ථක අසාර්ථක බව දැන ගැනීමට |
| සේවකයෝ | • | ඉහළ වැටුපක් ලබා ගැනීමට |
| | • | ප්‍රසාද දීමනා ලැබේ දැයි දැන ගැනීමට |
| | • | රැකියාවේ උසස්වීම් ලබා ගැනීමට |
| ණයහිමියෝ | • | සපයන ලද ණය මුදල් ආපසු ලබා ගැනීමේ හැකියාව දැන ගැනීමට |
| | • | ණය මුදලේ සුරක්ෂිත බව දැන ගැනීමට |
| | • | ඇප සුරැකුම්වල සුරක්ෂිත බව තහවුරු කර ගැනීමට |
| පාරිභෝගිකයෝ | • | ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා ගැනීමට |
| | • | වගකීම් නිසි පරිදි ඉටු කරන්නේ දැයි බැලීමට |
| | • | ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට |
| සැපයුම්කරුවෝ | • | අඛණ්ඩ ව ඇණවුම් ලබා ගැනීමට |
| | • | සපයන ලද භාණ්ඩ සඳහා මුදල් ආපසු අයකර ගැනීමට |
| විභව ආයෝජකයෝ | • | තමන් සතු සම්පත් අනාගතයේ දී එම ව්‍යාපාරයේ ආයෝජනය කිරීමට |
| රජය | • | බදු අයකර ගැනීමට/බදු සහන ලබා දීමට |
| | • | සේවා නියුක්තිය වර්ධනය කිරීමට |
| | • | ආර්ථික සංවර්ධනය පිළිබඳ මැන බැලීමට |
| ප්‍රජාව | • | පරිසරය සුරැකීම පිළිබඳ ව සොයා බැලීමට |
| | • | රැකියා අවස්ථා ලබා ගැනීමට |

- ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව, ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු කිහිපයක් පහත සඳහන් වේ.

| **පාර්ශ්වය** | **ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු** |
|---|---|
| අයිතිකරුවෝ | • ආයෝජන වැඩි කර ගැනීමට<br>• ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට |
| සේවකයෝ | • සේවක කාර්යක්ෂමතාව වැඩිකර ගැනීමට<br>• සේවකයන් රඳවා ගැනීමට<br>• සේවක ආකර්ශනය ලබා ගැනීමට |
| ණයහිමියෝ | • අඛණ්ඩ ව අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමට<br>• අඩු පිරිවැයකින් අරමුදල් සම්පාදනය කර ගැනීමට |
| රජය | • බදු සහන ලබා ගැනීමට<br>• යටිතල පහසුකම් ලබා ගැනීමට<br>• තාක්ෂණික දැනුම ලබා ගැනීමට |
| ගනුදෙනුකරුවෝ | • අදාළ භාණ්ඩ හෝ සේවා සඳහා වෙළෙඳපොළ සුරක්ෂිත කර ගැනීමට<br>• පාරිභෝගික විශ්වාසය ගොඩනගා ගැනීමට<br>• ගනුදෙනුකරුවන්ගේ පක්ෂපාතිත්වය ඇති කර ගැනීමට |

**නිපුණතාව 1.0** : ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

**නිපුණතා මට්ටම 1.6** : ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන ව්‍යාපාර පරිසරය වර්ග කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාර පරිසරය හඳුන්වයි.
- ව්‍යාපාර පරිසරය අධ්‍යයනයෙන් ව්‍යාපාරිකයෙකුට ලැබෙන ප්‍රයෝජන ලැයිස්තුගත කරයි.
- ව්‍යාපාර පරිසරය වර්ග කරයි.
- ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන විවිධ පරිසර බලවේග ලැයිස්තුගත කරයි.
- දෙන ලද ව්‍යාපාරයක අභ්‍යන්තර හා බාහිර පරිසර බලවේග සඳහා නිදසුන් දක්වයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පාසලේ කටයුතුවලට යම් යම් බලපෑම් කරන බලවේග සිසුන්ගෙන් විමසන්න.
- විදුහල්පති, ගුරුවරු, දෙමාපියන්, ආදි ශිෂ්‍යයින්, ප්‍රජාව, පාසලේ සම්පත්, රජය, පාසලේ කටයුතු සඳහා බලපෑම් කරන බලවේග වන බව පැහැදිලි කරන්න.
- මෙම බලවේග අභ්‍යන්තර හා බාහිර බලවේග ලෙස කොටස් කළ හැකි බව නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.
- විදුහල්පති, ගුරුවරුන්, ශිෂ්‍යයන්, අනධ්‍යයන කාර්ය මණ්ඩලය, පාසලේ සම්පත් අභ්‍යන්තර බලවේග වන බවත්, දෙමාපියන්, ප්‍රජාව, රජය බාහිර බලවේග වන බවත් පැහැදිලි කරන්න.
- මෙම බලවේග අධ්‍යයනයෙන් පාසලට ලබා ගත හැකි විවිධ ප්‍රයෝජන සිසුන්ගෙන් විමසමින් සාකච්ඡා කරන්න.
- ව්‍යාපාර සඳහා ද අභ්‍යන්තර හා බාහිර පරිසර බලවේග ඇති අතර ඒවා අධ්‍යයනයෙන් විවිධ ප්‍රයෝජන ව්‍යාපාරවලට අත්කර ගත හැකි බව පැහැදිලි කරන්න.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

- ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරන සාධක ක්‍රියාත්මක වන පරිසරය ව්‍යාපාර පරිසරය ලෙස හැඳින්විය හැකි ය.
- ව්‍යාපාර පරිසරය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ග කළ හැකි ය.
  1. අභ්‍යන්තර පරිසරය
  2. බාහිර පරිසරය
- සංවිධානය තුළ සිටින එයට බලපෑම් කරන කණ්ඩායම් (Forces ) හා තත්ත්ව (condition) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය ලෙස හැඳින්වේ.
- ව්‍යාපාරයට බලපෑම් කරන ව්‍යාපාර ආයතනයට පිටතින් ඇති සියලු ම දේ බාහිර පරිසරය ලෙස හැඳින්වේ.
- ව්‍යාපාර බාහිර පරිසරයට අයත් ව්‍යාපාරයට බලපෑම් ඇති කරන සුවිශේෂී සංවිධාන හෝ කණ්ඩායම් ආසන්න පරිසරය ලෙස හැඳින්වේ.
- ව්‍යාපාරයක පුළුල් වටපිටාව සහ ඒ හා බැඳුණු බලපෑම් කරන කණ්ඩායම් සාර්ව පරිසරය හෙවත් පොදු පරිසරය ලෙස හඳුන්වයි.


ව්‍යාපාර පරිසර සාධක  ගැලීම් සටහනකින් දැක්විය හැකි ය.

**ව්‍යාපාර පරිසරය**

- **අභ්‍යන්තර පරිසරය**
  - අයිතිකරුවෝ
  - කළමනාකරුවෝ
  - සේවකයෝ
  - සංවිධාන ව්‍යුහය
  - සංවිධාන ම ය සංස්කෘතිය
  - සම්පත්
- **බාහිර පරිසරය**
  - **ආසන්න  පරිසරය**
    - පාරිභෝගිකයෝ
    - සැපයුම්කරුවෝ
    - තරඟකරුවෝ
    - ආදේශන භාණ්ඩ නිෂ්පාදකයෝ
    - වෙළෙඳපොළට පිවිසීමට අපේක්ෂා කරන නව ව්‍යාපාරිකයෝ
  - **සාර්ව පරිසරය**
    - ආර්ථික පරිසරය
    - දේශපාලන පරිසරය
    - නෛතික පරිසරය
    - ප්‍රජා පරිසරය
    - තාක්ෂණික පරිසරය
    - ස්වාභාවික පරිසරය
    - සමාජ හා සංස්කෘතික පරිසරය
    - ගෝලීය පරිසරය

- ව්‍යාපාර පරිසරය අධ්‍යයනයෙන්  ව්‍යාපාරිකයෙකුට පහත ප්‍රයෝජන අත් වේ.
  - ශක්තීන් හඳුනා ගැනීම
  - දුර්වලතා  හඳුනා ගැනීම
  - ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම
  - තර්ජන හඳුනා ගැනීම

- ව්‍යාපාර පරිසරය වර්ග කිරීම පහත රූප සටහනින් ද පෙන්විය හැකි ය .



**නිපුණතාව 1.0** : ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

**නිපුණතා මට්ටම 1.7** : ව්‍යාපාර අභ්‍යන්තර පරිසර බලවේග, ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන අභ්‍යන්තර පරිසර බලවේග ලැයිස්තුගත කරයි.
- එක් එක් අභ්‍යන්තර පරිසර බලවේගය ආශ්‍රිත ශක්තීන් හා දුර්වලතා සඳහා නිදසුන් දක්වයි.
- ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයේ ශක්තීන් හා දුර්වලතා, ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් කරන ආකාරය තුලනාත්මක ව විග්‍රහ කරයි.
- ශක්තීන් ප්‍රයෝජනයට ගෙන ව්‍යාපාර සාර්ථක කර ගත හැකි ආකාරයත්, දුර්වලතා මගහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගත් පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පාසලක එදිනෙදා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා බලපෑම් කරන පාසල තුළ පවතින බලවේග සිසුන්ගෙන් විමසන්න.
- ලැබෙන පිළිතුරු හුණු පුවරුවේ සඳහන් කරන්න.
- ඒ ඒ බලවේග පාසලේ කටයුතුවලට ධනාත්මක ව හා ඍණාත්මක ව බලපාන ආකාරය පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.

  නිදසුන් :

| | බලවේගය | ධනාත්මක බලපෑම | ඍණාත්මක බලපෑම |
|---|---|---|---|
| 1. | සිසුන් | • විනයගරුක වීම<br>• කුසලතා පූර්ණ වීම | • ඉගෙනුමට ඍණ ආකල්ප දැරීම<br>• පසුගාමී බව |
| 2. | ගුරුවරු | • ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලබා තිබීම<br>• ඉගැන්වීමේ කුසලතා සහිත වීම<br>• මානව හිතවාදී වීම | • ප්‍රමාණවත් ගුරුවරු නො මැති වීම<br>• වගකීම/වගවීම නො දැරීම<br>• කැපවීම මද බව<br>• පුහුණුව අඩු වීම |
| 3. | පන්තිකාමර ඉඩකඩ | • ප්‍රසන්න පරිසරයක් පැවතීම<br>• ප්‍රමාණවත් ඉඩකඩ පැවතීම<br>• පහසුකම් සහිත වීම | • අබලන් වීම<br>• ඉඩකඩ ප්‍රමාණවත් නො වීම |
| 4. | ශිෂ්‍ය නායක/ නායිකාවන් | • මනා පෞරුෂයකින් යුක්ත වීම<br>• කුසලතා පූර්ණ වීම<br>• අභියෝගවලට මුහුණ දීමේ ශක්තිය | • නො සැලකිලිමත් වීම<br>• වගකීම් නො දැරීම |

- මෙසේ පාසලක කටයුතුවලට ධනාත්මක බලපෑම් හා සෘණාත්මක බලපෑම් ඇති කරන අභ්‍යන්තර බලවේග පවතින අතර, එම බලවේග මඟින් ඇති කරන ධනාත්මක බලපෑම් ශක්තීන් ලෙස ද, සෘණාත්මක බලපෑම් දුර්වලතා ලෙස ද හඳුන්වන බව සිසුන්ට පැහැදිලි කරන්න.

- ඒ අනුව ව්‍යාපාරවලට ද බලපෑම් ඇති කරන පරිසර බලවේග ව්‍යාපාරය තුළ ඇති බවත්, ඒවා ධනාත්මක ව හා සෘණාත්මක ව බලපෑම් කරන බවත්, එම ධනාත්මක බලපෑම් ශක්තීන් ලෙසත්, සෘණාත්මක බලපෑම් දුර්වලතා ලෙසත්, හඳුන්වන බව ද පැහැදිලි කරන්න.

- ඒ අනුව ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර බලවේග හා බැඳී ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනීමට ව්‍යාපාර අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කළ යුතු බව පෙන්වා දෙන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත දැක්වෙන්නේ ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට බලපෑම් ඇති කරන ව්‍යාපාර අභ්‍යන්තර පරිසර බලවේග යුගල තුනකි.

- අයිතිකරුවන් - සම්පත්
- කළමනාකරුවන් - සංවිධාන ව්‍යුහය
- සේවකයින් - සංවිධාන සංස්කෘතිය

- ඔබේ කණ්ඩායමට ලැබෙන අභ්‍යන්තර පරිසර බලවේග යුගලය කෙරෙහි අවදානය යොමු කරන්න.
- ඔබට හුරුපුරුදු ව්‍යාපාරයක් කෙරෙහි අවධානය යොමු කරමින් ඔබේ කණ්ඩායමට ලැබුණු අභ්‍යන්තර පරිසර බලවේග හඳුනා ගන්න.
- ව්‍යාපාරයේ සාර්ථකත්වය සඳහා ඒ ඒ බලවේගය සතු විය යුතු ශක්තීන් හඳුනා ගෙන ගොනු කරන්න.
- ව්‍යාපාරයක සාර්ථකත්වයට අහිතකර ලෙස බලපාන ඔබට ලැබුණු බලවේගය හා බැඳුණු දුර්වලතා අනාවරණය කරගන්න.
- ඔබ හඳුනාගත් ශක්තීන් ව්‍යාපාර සංවර්ධනයට යොදා ගැනීමටත්, දුර්වලතා මගහරවා ගැනීමටත් යෝජනා ඉදිරිපත් කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාර අභ්‍යන්තර පරිසර සාධක ලෙස
  - අයිතිකරුවන්
  - කළමනාකරුවන්
  - සේවකයින්
  - සංවිධාන ම ය සංස්කෘතිය
  - සංවිධාන ව්‍යුහය
  - සම්පත්

  යන පරිසර සාධක දැක්විය හැකි ය.

- ව්‍යාපාරයකට සම්පත් සැපයූ, නැතහොත් අරමුදල් ආයෝජනය කළ, ලාභ හෝ පාඩු විඳදරා ගන්නා පාර්ශ්වය අයිතිකරුවන් වේ.

- ව්‍යාපාරික සැලසුම් සකස් කිරීම හා තීරණ ගනු ලබන පාර්ශ්වය කළමනාකරුවන් වේ.

- ඉහළ කළමනාකරුවන් විසින් සකස් කරනු ලබන සැලසුම් හා ගනු ලබන තීරණ අනුව පහළ මට්ටම්වල අදාළ කාර්යයන්හි නිරත පාර්ශ්ව සේවකයින් වේ.

- ව්‍යාපාරයේ සිටින සියලු ම දෙනා අතර බෙදාහදා ගන්නා හා ඊළඟ පරම්පරාව වෙත පවරා දෙනු ලබන විශ්වාස, වටිනාකම්, ආකල්ප, ප්‍රතිමාන, පුරුදු, හැසිරීම් රටා සංවිධාන සංස්කෘතිය වේ.

- සංවිධානයේ අරමුණු පහසුවෙන් ලඟා කර ගැනීමට හැකි වන පරිදි, සංවිධානයේ කටයුතු සම්පත් හා අධිකාරිය බෙදී යන ආකාරය සංවිධාන ව්‍යුහය වේ.

- භාණ්ඩ හෝ සේවා නිපදවීම සඳහා යෙදවුම් ලෙස භාවිත කරන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය, කාලය, තොරතුරු හා දැනුම යනා දී සියල්ල සම්පත් වේ.

ඒ ඒ පරිසර බලවේගය හා බැඳුණු ශක්තීන් හා දුර්වලතා පහත ආකාරයට වගුවකින් දැක්විය හැකි ය.

| පරිසර සාධකය | ශක්තීන් | දුර්වලතා |
|---|---|---|
| අයිතිකරුවන් | • වැඩි සංඛ්‍යාවක් සිටීම<br>• ඔවුන්ගේ මූල්‍ය ශක්තිය වැඩි වීම<br>• ඔවුන්ගේ දැනුම හා පළපුරුද්ද වැඩි වීම | • සංඛ්‍යාත්මක ව කුඩා වීම<br>• මූල්‍ය ශක්තිය හීන වීම<br>• දැනුම හා කුසලතා අඩු වීම |
| කළමනාකරුවන් | • පුහුණුව හා පළපුරුද්ද වැඩි වීම<br>• නිවැරදි තීරණ ගැනීමේ හැකියාව | • පුහුණුව හා පළපුරුද්ද අඩු වීම<br>• තීරණ ගැනීමට පසුබට වීම<br>• වැරදි තීරණ ගැනීම |
| සේවකයින් | • දක්ෂ,පළපුරුදු සේවකයින් සිටීම<br>• විවිධ හැකියාවන්ගෙන් යුතු වීම<br>• යහපත් ආකල්ප දැරීම<br>• අභිප්‍රේරණය වූ සේවකයින් සිටීම | • නුපුහුණු සේවකයින් සිටීම<br>• වගකීමෙන් හා වගවීමෙන් තොර සේවකයින් සිටීම<br>• අයහපත් වැඩපුරුදු පැවතීම<br>• සෘණ ආකල්ප දැරීම<br>• අකාර්යක්ෂම සේවකයින් සිටීම |
| සංවිධාන ම ය සංස්කෘතිය | • ධනාත්මක ඇගැයීම් හා හර පද්ධතියක් පැවතීම<br>• ආවේනික, දියුණු චර්යා ධර්ම හා පුරුදු පැවතීම | • මනා හර පද්ධති, චර්යා ධර්ම පද්ධති ස්ථාපිත නො වීම<br>• ඉහළ අධීක්ෂණයක් නො තිබීම |
| සංවිධාන ව්‍යුහය | • උචිත පරිදි වැඩ බෙදා දීම<br>• උචිත පරිදි සංවිධානය ගොඩනගා තිබීම | • භූමිකා අතර ගැටුම් ඇති වීම<br>• අංශ අතර මනා සම්බන්ධීකරණයක් නො වීම |
| සම්පත් | • ප්‍රමාණාත්මක බව<br>• ගුණාත්මක බව | • යල් පනින ලද සම්පත් තිබීම<br>• සම්පත් ඌනතාව<br>• ප්‍රමාණවත් සම්පත් නො තිබීම |

**නිපුණතාව 1.0** : ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

**නිපුණතා මට්ටම 1.8** : ආසන්න පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන ආසන්න පරිසර බලවේග ලැයිස්තුගත කරයි.
- ආසන්න පරිසර බලවේග ආශ්‍රිත ව ඇති වන ව්‍යාපාර අවස්ථා ලැයිස්තුගත කරයි.
- ආසන්න පරිසර බලවේග ආශ්‍රිත ව ව්‍යාපාරවලට ඇති වන තර්ජන පෙන්වා දෙයි.
- තෝරාගත් ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේග, එම ව්‍යාපාරයට කරන බලපෑම් සඳහා නිදසුන් දක්වයි.
- ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන ඒවායින් ප්‍රයෝජන ගැනීමටත්, තර්ජනවලට මුහුණ දීමටත් යෝජනා ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

- පාසලක කටයුතු සාර්ථක ව පවත්වාගෙන යාම සඳහා පාසලට සමීප ව කටයුතු කරන පාර්ශ්ව සිසුන්ගෙන් විමසන්න.

- පහත කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න

  - පාසල් සංවර්ධන සමිතිය, දෙමාපියන්, ආදි ශිෂ්‍ය සංගමය යනාදිය පාසලට සමීප ව/ආසන්න ව සිට කටයුතු කරන පරිසර බලවේග බව පැහැදිලි කරන්න.
  - එම ආසන්න පරිසර බලවේග මගින් පාසලට ඇති වන බලපෑම විමසන්න.
  - ඒවා පාසලට හිතකර හා අහිතකර බලපෑම් වශයෙන් වෙන් කර දක්වන්න.
  - එම හිතකර බලපෑම් තුළින් පාසලට අවස්ථා උදා කරන අතර, අහිතකර බලපෑම් තුළින් පාසලට තර්ජන ඇති වන බව පැහැදිලි කරන්න.
  - ව්‍යාපාර කෙරෙහි ද ආසන්න පරිසර බලවේග බලපෑම් කරන අතර, ඒ මගින් ව්‍යාපාර අවස්ථා හා තර්ජන ඇති වන බව පෙන්වා දෙන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත සඳහන් වන්නේ ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන ආසන්න පරිසර බලවේග පහකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන පරිසර බලවේගය කෙරෙහි අවධානය යොමු කරන්න.
  - පාරිභෝගිකයෝ
  - සැපයුම්කරුවෝ
  - තරගකරුවෝ
  - වෙළෙඳපොළට පිවිසීමට අපේක්ෂා කරන නව ව්‍යාපාරිකයෝ
  - ආදේශන භාණ්ඩ නිපදවන්නෝ

- මාතෘකාවට අදාළ බලවේගය හඳුනා ගැනීමට ඔබට හුරුපුරුදු ව්‍යාපාර ආයතනයක් කෙරෙහි අවධානය යොමු කරන්න.
- ව්‍යාපාරයේ සාර්ථකත්වය සඳහා එම බලවේගයෙන් ලැබෙන සහාය සාකච්ඡාවක් මගින් හඳුනාගන්න.
- ව්‍යාපාරයේ සාර්ථකත්වයට අහිතකර ලෙස බලපෑම් කරන එම බලවේගයේ බලපෑම් හඳුනාගන්න.
- ඉහත හිතකර බලපෑම්වලින් ප්‍රයෝජන ගැනීම සඳහාත් අහිතකර බලපෑම් මගහරවා ගැනීම සඳහාත් යෝජනා ඉදිරිපත් කරන්න.

- ක්‍රියාකාරකම තුළින් සිසුන් හඳුනාගත් හිතකර බලපෑම් අවස්ථා ලෙසත්, අහිතකර බලපෑම් තර්ජන ලෙසත් පැහැදිලි කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාර ආසන්න පරිසර බලවේග පහත දැක්වේ.
  - ගනුදෙනුකරුවෝ (පාරිභෝගිකයෝ )
  - සැපයුම්කරුවෝ
  - තරගකරුවෝ
  - ආදේශන භාණ්ඩ නිපදවන්නෝ
  - වෙළඳපොළට පිවිසීමට අපේක්ෂා කරන නව ව්‍යාපාරිකයෝ

- ව්‍යාපාරයේ භාණ්ඩ හා සේවා මිලට ගන්නන්, පාරිභෝගිකයින් වේ.
- පාරිභෝගිකයින් දැනුවත් බව, පාරිභෝගිකයින්ගේ ආදායම යනා දී කරුණු සමහර ව්‍යාපාරවලට අවස්ථා උදා කරන අතර සමහර ව්‍යාපාරවලට තර්ජන ද ඇති කරයි.
- ව්‍යාපාරයකට අවශ්‍ය සම්පත් සපයන පුද්ගලයින් හා ආයතන සැපයුම්කරුවන් වේ.
- සැපයුම්කරුවන් කලට වේලාවට ගුණාත්මක ද්‍රව්‍ය සැපයීම හෝ නො සැපයීම, වට්ටම් ලැබීම හෝ නො ලැබීම යනා දී කරුණු ව්‍යාපාරවලට අවස්ථා මෙන් ම තර්ජන ද ඇති කරයි.
- ව්‍යාපාර ඉදිරිපත් කරන භාණ්ඩ හෝ සේවාවලට සමාන නිෂ්පාදිත ඉදිරිපත් කරන වෙනත් ව්‍යාපාර තරගකරුවන් වේ.
- නව තරගකරුවන් වෙළෙඳපොළට පැමිණීම, වෙළෙඳපොළේ සිටින තරගකරුවන් ඉවත් වීම, තරගකරුවන් ඔවුන්ගේ භාණ්ඩ හා සේවා සමග විවිධ පහසුකම් සැලසීම ව්‍යාපාරවලට අවස්ථා මෙන් ම තර්ජන ද උදා කරයි.
- ව්‍යාපාරය ඉදිරිපත් කරන භාණ්ඩය හෝ සේවාවට විකල්ප භාණ්ඩ හෝ සේවා ඉදිරිපත් කරන්නන් ආදේශන භාණ්ඩ නිපදවන්නන් වේ.
- ආදේශන භාණ්ඩ වෙළෙඳපොළේ බහුල වීම, ව්‍යාපාරයට තර්ජනයක් වන අතර එය වෙනත් ව්‍යාපාරික අවස්ථාවක් උදා කිරීමට ද හේතු වේ.
- වෙළෙඳපොළට පිවිසීමට අපේක්ෂාවෙන් සිටින්නන් ද පවතින ව්‍යාපාරයකට අවස්ථා හා තර්ජන ඇති කරයි.

**නිපුණතාව 1.0** : ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි.

**නිපුණතා මට්ටම 1.9** : සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **06**

**ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන සාර්ව පරිසර බලවේග ලැයිස්තුගත කරයි.
- එක් එක් සාර්ව පරිසර බලවේගය පැහැදිලි කරයි.
- එක් එක් සාර්ව පරිසර බලවේගය ව්‍යාපාරවලට ඇති වැදගත්කම පෙන්වා දෙයි.
- සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි අති කරන බලපෑම් සඳහා නිදසුන් දක්වයි.
- සාර්ව පරිසර බලවේග, ආසන්න පරිසර බලවේග කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.
- සාර්ව පරිසර බලවේග අතර අන්තර් සම්බන්ධතාවක් පවතින බව නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- " රාජ්‍ය අංශයේ සේවක වැටුප 10% කින් වැඩි වේ " සඳහන් වන පුවත්පත් දැන්වීමක් පන්තියට ඉදිරිපත් කරන්න.
- සේවක වැටුප් ඉහළ දැමීම ඕනෑ ම ව්‍යාපාරයකට බලපෑම් ඇති කරන ආර්ථික සාධකයක් වන බව සාකච්ඡාවක් තුළින් මතු කර ගන්න.
- සේවක වැටුප් වැඩි වීම තුළින් පුද්ගලයන්ගේ ආදායම වැඩි වන බවත්, ඒ තුළින් ව්‍යාපාර ක්ෂේත්‍රයට බලපෑම් ඇති කරන ආකාරයත් සාකච්ඡා කරන්න.
- ව්‍යාපාරවලට බලපෑම් ඇති කරන සාර්ව පරිසර බලවේග ලැයිස්තුවක් සිසුන් සමඟ සකස් කරන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත සඳහන් ප්‍රවෘත්ති කාණ්ඩ අතුරෙන් ඔබේ කණ්ඩායමට ලැබෙන ප්‍රවෘත්ති කාණ්ඩ කෙරෙහි අවධානය යොමු කරන්න.

ප්‍රවෘත්ති කාණ්ඩ 1

- ණය සඳහා වන පොළී අනුපාතය නැවතත් පහළට
- රටේ වැදගත් ව්‍යාපාර රජය යටතේ පවත්වාගෙන යාමට නව රජය තීරණය කරයි

ප්‍රවෘත්ති කාණ්ඩ 2

- සුළි සුළං අවදානම ශ්‍රී ලංකාවෙන් බැහැර යයි
- සූර්ය බලශක්තිය යොදා ගන්නා රථවාහන හඳුන්වා දීමට යයි

ප්‍රවෘත්ති කාණ්ඩ 3

- සාර්ක් (SAARC) කලාපීය රටවල් එක ම මුදල් ඒකකයක් භාවිත කිරීමට යෝජනා ඉදිරිපත් කර ඇත
- VAT පනත පාර්ලිමේන්තුවේ සම්මත වේ

ප්‍රවෘත්ති කාණ්ඩ 4

- ජනගහනයෙන් තුනෙන් එකක් දෛනික කටයුතු සඳහා අන්තර්ජාලය භාවිත කරයි
- දළදා පෙරහැර අති උත්කර්ශවත් අන්දමින් පැවැත්වීමට සියලු කටයුතු සම්පාදනය කර ඇත

- ඔබ කණ්ඩායමට ලැබුණු ප්‍රවෘත්ති කාණ්ඩ මගින් විස්තර වන සාර්ව පරිසර බලවේගය හඳුනාගන්න.
- ඔබට ලැබුණු සිදුවීම් නිසා ව්‍යාපාරවලට ඇති විය හැකි බලපෑම් පැහැදිලි කරන්න.
- ඔබ හඳුනාගත් සාර්ව පරිසරය තුළ සිදු විය හැකි, ව්‍යාපාරවලට බලපෑම් කරන වෙනත් සිදුවීම් සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.
- ඔබ හඳුනාගත් සාර්ව පරිසරවල සිදු වන සිදුවීම් ව්‍යාපාරයේ ආසන්න පරිසර බලවේග කෙරෙහි ඇති කරන බලපෑම් පෙන්වා දෙන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම සිසුන් සමඟ කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාරවලට බලපෑම් කරන සාර්ව පරිසර බලවේග පහත දැක්වෙන අයුරින් ලැයිස්තුගත කළ හැකි ය.
  - ආර්ථික පරිසරය
  - දේශපාලන පරිසරය
  - නෛතික පරිසරය
  - තාක්ෂණික පරිසරය
  - ප්‍රජා පරිසරය
  - ස්වාභාවික පරිසරය
  - සමාජීය හා සංස්කෘතික පරිසරය
  - ගෝලීය පරිසරය

- එක් එක් සාර්ව පරිසර බලවේගය ව්‍යාපාරවල පැවැත්මට බලපෑම් ඇති කරන ආකාරය පහත දැක්වේ.

  දේශපාලන පරිසරය

  රාජ්‍ය නියෝජිත ආයතන, පවතින රජයේ දේශපාලන ප්‍රතිපත්ති ව්‍යාපාරවලට බලපෑම් කරයි.

  නිදසුන් :
  - රජයේ දේශපාලන දර්ශනය හා ප්‍රතිපත්ති
  - විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීම

එමගින් ඇති වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණදීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතු ය.

නෛතික පරිසරය :

රජයේ අණපනත් හා පනවන නීති රීති එම රටේ ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරයි.

නිදසුන් :
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත
- කම්කරු නීති රීති
- ශ්‍රී ලංකා ප්‍රමිති පනත

මෙම නීති රීති හා අණපනත්වලට අනුකූල ව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමටත් එමගින් ඇතිවන අවස්ථා හා තර්ජනවලට මුහුණදීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතු ය.

ආර්ථික පරිසරය

ව්‍යාපාරවල පැවැත්ම සඳහා ජනතාවගේ ක්‍රය ශක්තිය බලපාන අතර ව්‍යාපාර කටයුතු සඳහා දැරීමට සිදු වන පිරිවැය ද ආර්ථික සාධක මත රඳාපවතී.

නිදසුන් :

මිල උද්ධමනය, පොළී අනුපාතය, දළ ජාතික නිෂ්පාදිතය, සේවා නියුක්තිය, ජීවන වියදම, ආදායම බෙදීයාමේ විෂමතාව, ඉතිරිකිරීම්, ආයෝජන

මෙම සාධක ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන අතර ඉන් ඇති වන අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාර කටයුතු කළ යුතු ය.

සමාජ හා සංස්කෘතික පරිසරය

පුද්ගලයින් තුළ ඇති විශ්වාස, සමාජ සාරධර්ම යනාදිය සමාජ හා සංස්කෘතික පරිසරය තුළ අන්තර්ගත වේ.

නිදසුන් :

- පුද්ගලයින් තුළ පවත්නා විශ්වාස
- පුද්ගලයින් තුළ පවත්නා වටිනාකම්
- සිරිත් විරිත්
- සිතුම් පැතුම්
- ආගමික විශ්වාස

මෙම සාධක ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන අතර ඒවාට අනුගත වෙමින් ව්‍යාපාර කර ගෙන යාමට සිදු වේ.

තාක්ෂණික පරිසරය

සන්නිවේදන තාක්ෂණයේ ප්‍රවණතා සහ කෘෂිකාර්මික, කාර්මික, වෛද්‍ය හා අනෙකුත් ක්ෂේත්‍රවල සිදු වී ඇති තාක්ෂණික වෙනස්කම් තාක්ෂණික පරිසරයට අයත් වේ.

නිදසුන් :

- නව තාක්ෂණික සොයා ගැනීම්
- තාක්ෂණය සීඝ්‍රයෙන් වෙනස් වීම
- සන්නිවේදන තාක්ෂණයේ වෙනස් වීම්
- භාණ්ඩ යල් පැනීම

තාක්ෂණික පරිසරයේ වෙනස් වීම් හේතුවෙන් ඇති වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතු ය.

## ප්‍රජා පරිසරය

ව්‍යාපාර සමග සම්බන්ධ වන ප්‍රධාන ම සාධකය ජනගහනයයි. එනම් වෙළෙඳපොළ සමන්විත වන්නේ පුද්ගලයන්ගෙනි.

නිදසුන් :

- ජනගහනයේ ප්‍රමාණය
- ජනගහන වර්ධන අනුපාතය
- ස්ත්‍රී /පුරුෂභාවය
- වයස් ව්‍යුහය
- ජනවාර්ගික මිශ්‍රය
- අධ්‍යාපන මට්ටම්
- පවුලේ සංයුතිය
- ගෘහ රටාව

ප්‍රජා පරිසරයේ ඇති වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාර උත්සාහ කළ යුතු ය.

## ස්වාභාවික පරිසරය

ස්වභාවික සම්පත්වලට සිදු වන හානිදායක තත්ත්ව ගැන අද ගෝලීය වශයෙන් අවධානය යොමු වෙමින් පවතී. ලොවේ බොහෝ රටවල ව්‍යාපාර කටයුතු නිසා වාතය, ජලය සහ පස දූෂණයට ලක් ව ඇත. ස්වාභාවික පරිසරයේ යහපත් තත්ත්ව ඇති කරමින් ව්‍යාපාර කටයුතුවලට යොමු වීම පිළිබඳ ව නීතිරීති ද පනවා තිබේ.

ස්වාභාවික පරිසරයේ ඇති වන වෙනස්කම් ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරයි.

නිදසුන් :

- ස්වාභාවික සම්පත් සොයා ගැනීම
- කාලගුණික හා දේශගුණික වෙනස්වීම්
- භූමියේ පිහිටීම
- ස්වාභාවික විපත්

ස්වාභාවික පරිසරයේ ඇති වන ව්‍යාපාරික අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාරිකයා උත්සාහ ගත යුතු ය.

## ගෝලීය පරිසරය

ගෝලීයකරණය හේතුවෙන් රටවල් අතර භාණ්ඩ හා සේවා හුවමාරු වීමට වැඩි අවස්ථාවක් සැලසී තිබේ. එසේ ම පුද්ගලයින්ගේ සංස්කෘතිය ද වෙනසකට ලක් ව තිබේ. මේ නිසා විවිධ භාණ්ඩ හා සේවා ලෝක වෙළෙඳපොළට එක් වී ඇත. දැඩි තරඟකාරිත්වයක් ද දක්නට ලැබේ.

නිදසුන් :

- වෙළෙඳ ගිවිසුම් ඇති වීම
- වෙළෙඳ හවුල් ඇති වීම
- ලෝක සංවිධාන බිහි වීම
- අන්තර්ජාතික වශයෙන් නීති රීති ඇති කිරීම

ගෝලීය පරිසරය තුළින් ඇති වන ව්‍යාපාර අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමටත් තර්ජනවලට මුහුණ දීමටත් ව්‍යාපාරිකයා උත්සාහ ගත යුතු ය.

- සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම නිදසුන් කිහිපයක් ඇසුරෙන් පහත පරිදි පැහැදිලි කළ හැකි ය.
    - ප්‍රජා පරිසරය යටතේ ජනගහනය වැඩි වීම නිසා භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම වැඩි වීමෙන් ව්‍යාපාරවලට අවස්ථාව උදා වේ.
    - එසේ ම ජනගහනය අඩු වීම නිසා භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම පහළ යාමෙන් ව්‍යාපාරවලට තර්ජන මතු වේ.
    - ආර්ථික පරිසරය යටතේ පොළී අනුපාතය අඩු වීම නිසා ණය ගැනීම් වැඩි වී ව්‍යාපාර අවස්ථා උදාවේ. එසේ ම පොළී අනුපාතය වැඩි වීමෙන් ණය ගැනීම් සීමා වන අතර ව්‍යාපාරවලට තර්ජනවලට මුහුණ දීමට සිදු වේ.
    - දේශපාලන හා නෛතික පරිසරය යටතේ ව්‍යාපාරිකයින්ට හිතකර නීති රීති පැනවීමෙන් ව්‍යාපාර අවස්ථා උදා වන අතර ව්‍යාපාරිකයින්ට අහිතකර නීති රීති පැනවීමෙන් ව්‍යාපාරවලට තර්ජනවලට මුහුණ දීමට සිදු වේ.

- බොහෝ විට සාර්ව පරිසර බලවේග, ආසන්න පරිසර බලවේග කෙරෙහි බලපෑම් ඇති කිරීම තුළින් ව්‍යාපාර කෙරෙහි අවස්ථා හෝ තර්ජන මතු කරයි.

  නිදසුන් ලෙස,
    - භාණ්ඩ හා සේවාවල මිල මට්ටම වැඩි වීම නිසා සැපයුම්කරුවන් සපයන භාණ්ඩ හා සේවාවල මිල ද වැඩි වේ.
    - එසේ ම වැටුප් මට්ටම වැඩි වීම නිසා ආසන්න පරිසර බලවේගයක් වන ගනුදෙනුකරුවන්ගේ (පාරිභෝගිකයින්ගේ )ආදායම වැඩි වී භාණ්ඩ හා සේවාවලට ඇති ඉල්ලුම වැඩි වේ.

- එක් එක් සාර්ව පරිසර බලවේග අතර ද අන්තර් සම්බන්ධතාවයක් පවතින බව පහත නිදසුන්වලින් පැහැදිලි වේ.
    - මැණික් ඉල්ලම් ස්වාභාවික පරිසරයට අයත් වේ. නමුත් එය ව්‍යාපාර කටයුත්තක් බවට පත් කිරීමේ දී නීතියේ අවසරය ලබා ගැනීමට අවශ්‍ය වේ.
    - වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ පහසුව සඳහා නවීන තාක්ෂණික උපකරණයක් වන ටෙලර් යන්ත්‍රයක් සවි කිරීමේ දී මහ බැංකුවේ අවසරය ලබා ගැනීම අවශ්‍ය වේ.

- මේ අනුව සාර්ව පරිසර බලවේග වෙන් වෙන් ව විස්තර කළ ද මේවා අතර අන්තර් සම්බන්ධතාවක් පවතින බව පැහැදිලි වේ.

**නිපුණතාව 2.0** : ව්‍යාපාර පරිසරයට අනුගත වීම සඳහා ව්‍යාපාර, සමාජයීය වගකීම් හා ආචාරධර්ම කෙරෙහි සැලකිලිමත් වන ආකාරය විමසයි.

**නිපුණතා මට්ටම 2.1** : ව්‍යාපාර විසින් සමාජයීය වගකීම් ඉටු කිරීමේ වැදගත්කම අගයයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් ඵල** :

- පිළිගත් නිර්වචන ඇසුරෙන් ව්‍යාපාර සමාජයීය වගකීම හඳුන්වයි.
- ව්‍යාපාර විසින් සමාජයීය වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- ව්‍යාපාරවලින් සමාජයීය වගකීම ඉටු විය යුතු පාර්ශ්ව ලැයිස්තුගත කරයි.
- ව්‍යාපාරයක් විසින් එක් එක් පාර්ශ්වය වෙත ඉටු කළ යුතු සමාජයීය වගකීම් වෙන වෙන ම නිදසුන් සහිත ව ඉදිරිපත් කරයි.
- ව්‍යාපාර ආයතනයක් නිදසුනක් ලෙස ගෙන එය එක් එක් පාර්ශ්වය වෙත සමාජයීය වගකීම් ඉටු කරන ආකාරය පෙන්වා දෙයි.
- සමාජයීය වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට හිමි වන ප්‍රතිලාභ ලැයිස්තු ගත කරයි.
- සියලු ම පාර්ශ්වයන්ගේ අපේක්ෂා ඉටු වන ආකාරයට සමාජයීය වගකීම් ඉටු කළ හැකි ආකාරය පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ව්‍යාපාර කටයුතු සාර්ථක ව කර ගෙන යාම සඳහා ව්‍යාපාර විසින් ඉටු කළ යුතු වගකීම් සිසුන්ගෙන් විමසන්න.
- පහත කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ව්‍යාපාර විසින් සමාජයේ විවිධ පාර්ශ්වයන්ට වගකීම් ඉටු කළ යුතු බව
  - එම වගකීම් ඉටු කළ යුතු පාර්ශ්ව හා එම පාර්ශ්වයන්ට ඉටු කළ යුතු වගකීම් විවිධ වන බව
- ව්‍යාපාර ඉටු කරන වගකීම් ඇසුරෙන් ව්‍යාපාර සමාජයීය වගකීම් යන්නට අර්ථයක් ගොඩනගන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

පහත සඳහන් වනුයේ ව්‍යාපාර සමාජයීය වගකීම් ඉටු කළ යුතු පාර්ශ්ව හතරකි. එම පාර්ශ්ව අතුරෙන් ඔබ කණ්ඩායමට ලැබුණු පාර්ශ්වය කෙරෙහි අවධානය යොමු කරන්න.

- අයිතිකරුවන්
- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- සමාජය

- ඔබගේ ප්‍රදේශයේ ඇති ව්‍යාපාරයක් ඇසුරෙන් ඔබට ලැබුණු පාර්ශ්වයට අදාළ ව එම ව්‍යාපාරය ඉටු කරන සමාජයීය වගකීම් ලැයිස්තුගත කරන්න.
- එම ව්‍යාපාරය විසින් ඔබට ලැබුණු පාර්ශ්වය වෙත තව දුරටත් ඉටු කළ යුතු යැයි ඔබ සිතන සමාජයීය වගකීම් ලැයිස්තුගත කරන්න.
- එම සමාජයීය වගකීම් ඉටු කිරීම තුළින් ඔබ තෝරාගත් ව්‍යාපාරයට ලැබෙන ප්‍රයෝජන සඳහන් කරන්න.
- ව්‍යාපාරය ඉටු කරන සමාජයීය වගකීම් ඇසුරෙන් සමාජයීය වගකීම් යන්නට අර්ථයක් ගොඩනගන්න.
- ඔබේ අනාවරණ හා නිර්මාණ පන්තියට ඉදිරිපත් කරන්න.

- ක්‍රියාකාරකම අවසානයේ දී ව්‍යාපාර විසින් එක් එක් පාර්ශ්වය වෙත ඉටු කළ යුතු සමාජයීය වගකීම් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාරය හා සම්බන්ධ සියලු ම උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට උපරිම අයුරින් සාධාරණයක් ඉටු වන ආකාරයට කටයුතු කිරීම සමාජයීය වගකීම වේ.
- ව්‍යාපාරයක සමාජ වගකීම් සංකල්පය පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇත.

  නිදසුන් :

  සමස්ත සමාජයේ සහ ප්‍රදේශයේ ජනතාවගේත්, සේවකයින්ගේ හා ඔවුන්ගේ පවුල්වලත් ජීවන තත්ත්වය නංවාලීමට සහ රටේ ආර්ථික සංවර්ධනයට දායක වන බවට හා සදාචාරාත්මක ව හැසිරෙන බවට ව්‍යාපාරවල අඛණ්ඩ කැපවීම ව්‍යාපාරයන්හි සමාජයීය වගකීමයි.

  World business council for sustainable development

  " සමාජය තුළ ධනාත්මක බලපෑමක් ජනිත කිරීමට ව්‍යාපාර ක්‍රියාවලිය කළමනාකරණය කරන්නේ කෙසේ ද ? යන්න පිළිබඳ වූ අදහසකි, සමාජයීය වගකීම"

  Mallen Baker

  ගනුදෙනුකරුවන්, සේවකයින්, සමාජය, රජය හා පරිසරය ආදී සියලු ම උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට සාධාරණ ලෙස කටයුතු කරමින් කොටස් හිමියන්ට උපරිම අගයක් බිහිකර දීම සමාජයීය වගකීම වේ.

  Narayan Murthy

- ව්‍යාපාර සමාජයීය වගකීම පිළිබඳ ව විවිධ රටවල් විසින් ද නිර්වචන ඉදිරිපත් කර ඇත.

  ඇමරිකා එක්සත් ජනපදය (USA)

  " සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳවත්, එමගින් සමාජයට ඇති වන බලපෑම් පිළිබඳවත් පෞද්ගලික ව ම ව්‍යාපාර වගකීම සමාජයීය වගකීමයි."

  පිලිපීනය


  " ව්‍යාපාර, සමාජයට ආපසු දෙන දෑ" සමාජයීය වගකීමයි.

- ව්‍යාපාර සමාජයීය වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාව පිළිබඳ දැඩි අවධානයක් වර්තමානයේ වර්ධනය වී ඇත.

- ව්‍යාපාර කෙරෙහි  උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට හා පොදුවේ සමාජයට බලපෑම් ඇති කරන බලවේග කිහිපයක් වර්ධනය වෙමින් පවතී.
  නිදසුන් ඃ
  - ව්‍යාපාර තරගය
  - ගෝලීයකරණය
  - විද්‍යුත් ව්‍යාපාර
  - පරිසර දූෂණය

- ව්‍යාපාරවලින් සමාජයීය වගකීම් ඉටු විය යුතු ප්‍රධාන පාර්ශ්ව කිහිපයකි.
  නිදසුන් -
  - ගනුදෙනුකරුවන්
  - සේවකයින්
  - අයිතිකරුවන්
  - සමාජය

- පහත සඳහන් රූප සටහනෙහි දැක්වෙන පරිදි , එක් එක් පාර්ශ්වය වෙත ව්‍යාපාර සමාජයීය වගකීම් ඉටුවිය යුතු ය.



- එම එක් එක් පාර්ශ්වය වෙත ව්‍යාපාර විසින් ඉටු කළ යුතු සමාජයීය වගකීම් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ හැකි ය.
- සියලු ම පාර්ශ්වයන්ගේ අපේක්ෂා ඉටු වන ආකාරයට සමාජයීය වගකීම් ඉටු කිරීමට පෙළඹිය යුතු ය.

  නිදසුන් :

  - ගනුදෙනුකරුවන්ට සමාජයීය වගකීම් ඉටු කිරීමේ දී එනම් හානි අවම වන ගුණාත්මක භාණ්ඩයක් හෝ සේවාවක් සාධාරණ මිලට ලබා දීමේ දී සේවකයින් ට ඔවුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් හා අනෙකුත් පහසුකම් ලබා දීම, අයිතිකරුවන්ට ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභ අත්කර දීම මෙන් ම සමාජයට පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම මගින් අනෙකුත් පාර්ශ්ව වෙත ද අවාසිදායක තත්ත්වයක් ඇති නො වී සෑම පාර්ශ්වයක ම අපේක්ෂා ඉටු කළ යුතු ය.

  - අයිතිකරුවන්ගේ සමාජයීය වගකීම් ආරක්ෂා කිරීමේ දී එනම් ඔවුන්ට සාධාරණ ඉපැයීමක් /ලාභයක් අත්කර දීමේ දී අනෙක් පාර්ශ්වවල එනම් ගනුදෙනුකරුවන්ට සාධාරණ මිලට භාණ්ඩ ලබා දීම, සමාජයට ප්‍රජා සත්කාර සේවා ලබා දීම ද සේවකයින්ගේ වෘත්තිය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා අනෙකුත් පහසුකම් සැලසීම ද මගින් ඒ ඒ පාර්ශ්වයේ සමාජයීය වගකීම් ද ආරක්ෂා විය යුතු ය.

- සමාජයීය වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට විවිධ ප්‍රතිලාභ අත් වේ.

  නිදසුන් :

  - ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම
  - ව්‍යාපාරයේ ප්‍රතිරූපය/කීර්තිනාමය වර්ධනය වීම
  - ව්‍යාපාරය පිළිබඳ විශ්වසනීයත්වය තහවුරු වීම
  - ගනුදෙනුකරුවන් තෘප්තිමත් කළ හැකි වීම
  - ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ කරා ළඟා වීමට පහසු වීම

**නිපුණතාව 2.0** : ව්‍යාපාර පරිසරයට අනුගත වීම සඳහා ව්‍යාපාර, සමාජයීය වගකීම් හා ආචාරධර්ම කෙරෙහි සැලකිලිමත් වන ආකාරය විමසයි.

**නිපුණතා මට්ටම 2.2** : පරිසර හිතකාමී ලෙස කටයුතු කරමින් තිරසර සංවර්ධනයට ව්‍යාපාර දායක වන ආකාරය අගයයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **06**

**ඉගෙනුම් ඵල** :

- තිරසර සංවර්ධනය යන්න පැහැදිලි කරයි.
- ව්‍යාපාරයකට තිරසර සංවර්ධනය සඳහා දායක විය හැකි ආකාරය පැහැදිලි කරයි.
- පවතින ව්‍යාපාරයක් නිදසුනක් ලෙස ගෙන එය තිරසර සංවර්ධනයට දායක වන ආකාරය පෙන්වා දෙයි.
- පාරිභෝගිකයාට තිරසර සංවර්ධනයට දායක විය හැකි ආකාරය පැහැදිලි කරයි.
- ව්‍යාපාර කටයුතුවල අහිතකර බලපෑම් අවම කිරීමට යෝජනා ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

- රතු ඉන්දියානු නායකයකු වූ සියැට්ල් විසින් කරන ලද පහත දැක්වෙන ප්‍රකාශය පන්තියට ඉදිරිපත් කරන්න.
  " සියලු ම වෘක්ෂලතාවෝ කපා දැමූ පසු
  සියලු ම ගංගා සිඳී ගිය පසු
  අන්තිම මාළුවා ද අල්ලා ආහාරයට ගත් පසු
  මිනිසා තේරුම් ගනීවි
  මුදල් ආහාරයට ගත නො හැකි බව "

- මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීම හා පරිසරය සම්බන්ධ ඉහත ප්‍රකාශය පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසන්න.
- වර්තමානයේ ලොව ඇති සියලු ම සම්පත් අයථා ලෙස පරිහරණය කිරීම තුළින් අනාගත පරම්පරාව සඳහා සම්පත් නො මැති වන බව සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- වර්තමාන පරම්පරාව විසින් තම අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීමේ දී, අනාගත පරම්පරාවේ අවශ්‍යතා හා වුවමනා කෙරෙහි ද අවධානය යොමු කළ යුතු බව පැහැදිලි කරන්න.
- තිරසර සංවර්ධනය යන්න අර්ථ දක්වන්න.
- තිරසර සංවර්ධනයට අදාළ ක්ෂේත්‍ර තුන හඳුන්වා ඒ එකිනෙක පැහැදිලි කරන්න.

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

පහත සඳහන් වන්නේ තිරසර සංවර්ධනය ගොඩනැගී ඇති කුළුණු තුනකි. ඒවායින් ඔබේ කණ්ඩායමට අයත් මාතෘකාව කෙරෙහි අවධානය යොමු කරන්න.

- ආර්ථික තිරසර බව
- පරිසර තිරසර බව
- සමාජ හා සංස්කෘතික තිරසර බව

- ඔබට ලැබුණු මාතෘකාව කෙරෙහි අවධානය යොමු කරන්න.
- ඔබට ලැබුණු මාතෘකාව සඳහා ව්‍යාපාරවලට දායක විය හැකි ආකාරය නිදසුන් සහිත ව පෙන්වා දෙන්න.
- ඔබට ලැබුණු මාතෘකාව යටතේ තිරසර සංවර්ධනයට බාධා වන ව්‍යාපාරික කටයුතු සඳහා නිදසුන් සාකච්ඡා කරන්න.
- එම අහිතකර බලපෑම් අවම කිරීමට යෝජනා ඉදිරිපත් කරන්න.
- ඔබේ අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් ඃ**

තිරසර සංවර්ධනය යනු ,

" Sustainable development is development which meet, the needs of the present, without compromising the ability of future generations to meet their own needs."

world commission on Environment and Development

" තිරසර සංවර්ධනය යනු , අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය උල්ලංඝනය නො කරමින් වර්තමාන අවශ්‍යතා ලඟා කර ගන්නා වූ සංවර්ධනයයි " .

තිරසර සංවර්ධනය ගොඩනැගී ඇත්තේ සමාන වැදගත්කමක් ඇති කුළුණු තුනක් මත ය. ඒවා නම් ,

1. ආර්ථික තිරසර සංවර්ධනය (Economic Sustainable Development)
2. පරිසර තිරසර ආරක්ෂණය (Environment Sustainable Protection)
3. සමාජ තිරසර සංවර්ධනය (Social Sustainable Development)

**ආර්ථික තිරසර සංවර්ධනය**

සාම්ප්‍රදායික ව ආර්ථික වර්ධනය යනු , දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයයි. තිරසර ආර්ථික සංවර්ධනයේ දී සම්පත් පරිභෝජනය අඩු කර, ජීවන තත්ත්වය උසස් කිරීම මඟින් මානව සුභ සාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. ලෝකය පුරා සිටින ජනතාවගේ දුප්පත්කම නැති කිරීම, උසස් ජීවන තත්ත්වයක් තහවුරු කිරීම මඟින් වර්තමාන හා අනාගත පරම්පරාවේ සෞභාග්‍ය හා ආරක්ෂාව සැලසීම හා ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදී ධනය උපයමින් හොඳ ජීවන තත්ත්වයක් ලැබීමට ජනතාව බලවන්ත කිරීම මෙහි දී වැදගත් වේ. තරගකාරී වෙළෙඳපොළ මේ සඳහා වැදගත් වන අතර සැම දෙනාට ම දැරිය හැකි මිලකට පරිසර හිතකාමී නිෂ්පාදන බිහි කිරීම තුළින් තිරසර ආර්ථික සංවර්ධනයක් ලඟා කර ගැනීම අපේක්ෂා කෙරේ.

**පරිසර තිරසර ආරක්ෂණය :**

පෘථිවි ගෝලය තුළ අපට ඇත්තේ සීමිත සම්පත් ප්‍රමාණයකි. පෘථිවි තලයේ ජීවත්වන සියලු දෙනාට ම පිරිසිදු වාතය, ජලය, වාසය කිරීමට සුදුසු භූමියක් මෙන් ම ප්‍රමාණවත් ආහාර නිපදවා ගැනීමට සාරවත් වූ පොළවක් ද පැවතිය යුතු ය.

මූලික මිනිස් අවශ්‍යතා වන වාතය, ජලය, ආහාර හා නිවාස යනාදිය ගුණාත්මකභාවයෙන් පැවතීම හා ඒවා ආරක්ෂා කර ගනිමින් පවත්වාගෙන යාම මගින් මූලික මිනිස් අවශ්‍යතා සපුරාලීම පරිසර තිරසර ආරක්ෂණයෙන් අපේක්ෂා කෙරේ.


පරිසර තිරසර ආරක්ෂණයේ දී ස්වභාවික පරිසරය නො නසා ඵලදායී වෙනස්කම් කිරීම කරනුයේ කෙසේ ද යන්න පිළිබඳ ව සැලකිලිමත් වී අනාගත පරපුර වෙනුවෙන් ගෝලීය පරිසරය ආරක්ෂා කිරීම සඳහා වන මානව ක්‍රියාකාරකම් අපේක්ෂා කෙරේ. එනම් වර්තමානයේ මතු ව ඇති ගෝලීය උෂ්ණත්වය වැඩි වීම, වනාන්තර විනාශය, සාගරවල සීමාව ඉක්මවා මසුන් මැරීම වැනි අහිතකර ප්‍රතිඵල ගැන අවධානය යොමු විය යුතු ය.

මිනිස් අවශ්‍යතා සපුරාලීම සඳහා ස්වභාවික සම්පත් පරිසරයෙන් උකහා ගත යුතු ය. මෙහි දී නැවත ප්‍රතිස්ථාපනය කළ නො හැකි ස්වභාවික සම්පත් නැවත ප්‍රතිස්ථාපනය කිරීමට ස්වභාව ධර්මයට ඇති හැකියාවට වඩා අඩු වේගයකින් මිනිසා විසින් පාරිභෝජනය කිරීම මගින් පාරිසරික තිරසර බව ආරක්ෂා කළ හැකි වේ.

**සමාජ තිරසර සංවර්ධනය**

තිරසර අනාගතයක් තහවුරු කිරීමට නම් ජනතාවගේ අවශ්‍යතා හා වුවමනා සමාන ව/සාධාරණ ව ඔවුන්ට සපුරා ගත හැකි විය යුතු ය. එනම් මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉහළ ප්‍රමිතියකින් යුතු ව ලඟා කර ගත හැකි විය යුතු අතර ම, අන් අයගේ එම අයිතිය දූෂ්‍ය කිරීම හෝ උල්ලංඝනය කිරීම නො විය යුතු ය. සමාජ තිරසර සංවර්ධනයේ දී මෙම තත්ත්වය තහවුරු කිරීමට සමානාත්මතාව, සමාජ ප්‍රාග්ධනය, සමාජ ඒකාබද්ධතාව ප්‍රජා සහභාගිත්වය හා සංවර්ධනය, මානව හිමිකම් , සමාජ වගකීම් , සමාජ සාධාරණත්වය සමාජයේ සෑම පුද්ගලයෙකුට ම ලබා දීම කෙරෙහි සැලකිලිමත් වීම අවධාරණය කෙරේ.

එහි දී අනාගත පරම්පරාවේ අවශ්‍යතා උල්ලංඝනය නො වන පරිදි වර්තමාන ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම මගින් මානව සංවර්ධනය ඇති කිරීම සමාජ තිරසර සංවර්ධනයෙන් අපේක්ෂා කෙරේ.




රූප සටහන 2.2.1 : තිරසර සංවර්ධන සංකල්පය

**තිරසර සංවර්ධනය සඳහා ව්‍යාපාරවලට දායක විය හැකි ආකාරය**

ව්‍යාපාර ආයතන ද තම ව්‍යාපාරයේ හා එහි පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා ලඟා කර ගැනීම සඳහා උපාය මාර්ග හා ක්‍රියාකාරකම් තේරීමේ දී අනාගත අවශ්‍යතා සඳහා අවශ්‍ය වන මානව හා ස්වභාවික සම්පත් ආරක්ෂා කරමින් හා වැඩි දියුණු කරමින් කටයුතු කළ යුතු ය. එවිට එය තිරසර ව්‍යාපාර භාවිතයක් බවට පත් වේ.

තිරසර සංවර්ධනය යථාර්ථයක් බවට පත්කර ගැනීම එක් ව්‍යාපාර ආයතනයකට පමණක් හුදකලාව කටයුතු කරමින් කළ නො හැකි වන අතර ඒ සඳහා පාරිභෝගිකයන් ද ඇතුළු ව සමස්ත ලෝක ආර්ථික ප්‍රජාව ම ක්‍රියාකාරී ව දායක විය යුතු ය.

**ආර්ථික තිරසර බව සඳහා ව්‍යාපාරවල දායකත්වය**

- ව්‍යාපාරයක් ආර්ථික තිරසර බව වෙනුවෙන් කටයුතු කරන විට අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි.
  - ආර්ථික වර්ධනය හා ස්ථායීතාව
  - කාර්යක්ෂමතාව (සම්පත් භාවිතය)
  - තරගකාරිත්වය (සාධාරණව)
  - නිෂ්පාදනය හා පරිභෝජනය
  - සේවා නියුක්තිය
  - අන්තර්ජාතික වෙළෙඳාම

- ව්‍යාපාරයකට ආර්ථික තිරසර බව තහවුරු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් වේ.
  - රැකියා නිර්මාණය
  - කුසලතා බලගැන්වීම
  - සම්පත් කාර්යක්ෂම ව භාවිතය
  - ප්‍රාග්ධනය කාර්යක්ෂම ව භාවිතය
  - අවදානම් කළමනාකරණය
  - ආර්ථික වර්ධනය බලගැන්වීම
  - පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිලාභ වර්ධනය
  - දේශීය ආර්ථිකය වර්ධනය සඳහා ආයෝජනය
  - නවෝත්පාදන හඳුන්වා දීම
  - තාක්ෂණය දියුණු කිරීම
  - ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනයට දායක වීම
  - සේවක සුභසාධනය
  - හුවමාරුව හා ගනුදෙනු ක්‍රියාවලිය දියුණු කිරීම
  - නිෂ්පාදන ක්‍රියාවලිය දිරිගැන්වීම

**පාරිසරික තිරසර බව සඳහා ව්‍යාපාරවල දායකත්වය**

- පාරිසරික තිරසර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපාර කටයුතු කරන විට විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි.

- සම්පත් පරිභෝජනය
- අමුද්‍රව්‍ය හා අපද්‍රව්‍ය කළමනාකරණය
- අවදානම් කළමනාකරණය
- ස්වභාවික හා සංස්කෘතික උරුමයන් සුරැකීම

- ව්‍යාපාරයකට පාරිසරික තිරසර බව තහවුරු කිරීමට කළ හැකි ක්‍රියාකාරකම් කිහිපයක් වේ.

  - පරිසර හිතකාමී දෑ මිලට ගැනීම
  - නිෂ්පාදන ක්‍රියාවලියේ දී අමුද්‍රව්‍ය, බල ශක්තිය, ජලය වැනි සම්පත් සුරකමින් කටයුතු කිරීම
  - අපද්‍රව්‍ය කළමනාකරණයේ දී 3R , 4R, 5R සංකල්ප භාවිතය
  - පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රම භාවිතය
  - අන්තරාකාරී ද්‍රව්‍ය සුරක්ෂිත ව භාවිත කිරීම
  - ජලය, වාතය හා පස දූෂණය අඩු කිරීම
  - ජෛව විවිධත්වය රැකීමට කටයුතු කිරීම
  - පාරිසරික නීතිරීතිවලට අනුගත ව කටයුතු කිරීම
  - පරිසරය සංරක්ෂණය/ පරිසර හිතකාමී කටයුතුවල දී රජය හා රාජ්‍ය නො වන ආයතන සමග එක් ව කටයුතු කිරීම
  - සූර්ය ශක්තිය වැනි පරිසර හිතකාමි බලශක්ති භාවිතය

**සමාජ හා සංස්කෘතික තිරසර බව සඳහා ව්‍යාපාරවල දායකත්වය**

- ව්‍යාපාර ආයතන සමාජ හා සංස්කෘතික තිරසර බව තහවුරු කිරීම සඳහා කටයුතු කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් වේ.
  - ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම
  - ජනතාවට සමාන අවස්ථා සැපයීම
  - සමාජ ඒකාග්‍රතාව ඇති කිරීම
  - ජාත්‍යන්තර සහභාගිත්වය ලබා ගැනීම
  - මානව ප්‍රාග්ධනය නඩත්තු කිරීම
  - දේශීය සංස්කෘතිය, සම්ප්‍රදායන් හා සිරිත් විරිත් ආරක්ෂා කිරීම
  - සංස්කෘතික පරිසරය සුරැකීම
  - දුගී බව අවම කිරීමට කටයුතු කිරීම (දිළිඳු ප්‍රජාව)
  - සේවක සබඳතා

- ව්‍යාපාරයකට සමාජ හා සංස්කෘතික තිරසර බව තහවුරු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් නම්,
  - මානව විවිධත්වයට ගරු කරමින් කටයුතු කිරීම
  - මානව අයිතිවාසිකම් සුරැකීමට දායක වීම
  - සමානාත්මතාවෙන් යුතු ව කටයුතු කිරීම හා සම අවස්ථා සැපයීම
  - අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහනය ආදී අත්‍යාවශ්‍ය පහසුකම් සඳහා දායක වීම
  - සමාජ රක්ෂණ කටයුතුවලට දායක වීම
  - සංස්කෘතික විවිධත්වය ගරු කිරීම හා සුරැකීමට දායක වීම
  - නීතිය හා සාමය සුරැකීමට දායක වීම

**තිරසර සංවර්ධනය සඳහා ව්‍යාපාරවල නූතන භාවිත : තිරසර බව සඳහා වූ 4R සංකල්පය**

නූතන සමාජයේ නිෂ්පාදන හා පරිභෝජන ක්‍රියාකාරකම් නිසා දිනකට දැරිය නො හැකි ප්‍රමාණයකින් අපද්‍රව්‍ය එකතු වීම ගෝලීය ප්‍රශ්නයක් බවට පත් ව ඇත. එබැවින්
නිෂ්පාදනයේ දී
පාරිභෝජනයේ දී හා
අපද්‍රව්‍ය කළමනාකරණයේ දී 4R සංකල්පය භාවිතය තුළින් තිරසර සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීමට උත්සාහ ගැනීම ලෝක මට්ටමින් අවධානයට යොමු ව ඇත. එම 4R නියෝජනය කරන්නේ,

- Recycle (ප්‍රතිචක්‍රීකරණය කිරීම)
- Reuse (නැවත නැවත භාවිත කිරීම)
- Reduce ( භාවිතය අඩු කිරීම)
- Replace (නැවත ස්ථාපිත කිරීම) යන සංකල්ප ය.

**ප්‍රතිචක්‍රීකරණය කිරීම (Recycle)**

මෙහි දී අපද්‍රව්‍ය වෙන් කොට වෙනත් භාණ්ඩයක් නිෂ්පාදනය කළ හැකි ද්‍රව්‍යයක් බවට පත් කිරීම සිදු වේ. මෙහි දී ද්‍රව්‍යවල පවතින භෞතික තත්ත්වය වෙනස් කිරීමට ලක් කෙරේ. ප්‍රතිචක්‍රීකරණය දෙආකාරයක නිමැවුම් ලැබෙන සේ සිදු කළ හැකි ය.

- අඩු වටිනාකමක් ඇති අමු ද්‍රව්‍ය ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදිත බවට පත් කිරීම ( upcycle )
  නිදසුන් : පිදුරුවලින් කඩදාසි නිෂ්පාදනය කිරීම

- ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදිත අඩු වටිනාකමක් ඇති අමුද්‍රව්‍ය බවට පත් කිරීම (Low cycle)
  නිදසුන් : ජපානය භාවිතයෙන් ඉවත් කරන වාහන තලා යකඩ බවට පත් කිරීම

**නැවත නැවත භාවිත කිරීම (Reuse)**

නිෂ්පාදන කාර්යයේ දී හෝ පරිභෝජන කාර්යයේ දී නැවත නැවත භාවිත කළ හැකි දේ යොදා ගැනීම මින් අදහස් කෙරේ.

නිදසුන් : කෑම ඔතන පොලිතීන් ෂීට් (Lunch sheets) වෙනුවට කෑම පෙට්ටි (Lunch Boxes) භාවිතය

**භාවිතය අඩු කිරීම (Reduce)**

මින් අදහස් කරන්නේ පරිසරයට මුදා හරින අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු කිරීම යි. නිෂ්පාදනය හෝ පරිභෝජනය සඳහා යොදා ගන්නා ද්‍රව්‍යවලින් ඉවත ලන ද්‍රව්‍ය ප්‍රමාණය අඩු කිරීමෙන් මෙම කාර්ය පහසු වේ. එසේ ම පරිසරයට අහිතකර දේ භාවිතයෙන් ඉවත් කිරීම, භාවිතය ප්‍රතික්ෂේප කිරීම, භාවිත නොකර සිටීම මගින් තිරසර සංවර්ධනයට දායක විය හැකි ය.

නිදසුන් : භාණ්ඩයක ඇසුරුම සඳහා දිරාපත් නො වන පොලිතීන් භාවිත නො කර සිටීම.
පානීය ජලය ප්ලාස්ටික් ඇසුරුම්වල නො දැමීම

**නැවත ස්ථාපිත කිරීම (Replace)**

නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කරන ස්වභාවික සම්පත්වලින් නැවත ස්ථාපිත කළ හැකි සම්පත් නැවත පරිසරය තුළ ස්ථාපිත කිරීම මෙයින් අදහස් වේ.

නිදසුන් : වනයේ දැව අමුද්‍රව්‍ය ලෙස භාවිත කරන ආයතනයක් වන වගා ව්‍යාපෘති ඇරඹීම

මත්ස්‍ය කර්මාන්තයේ යෙදෙන ව්‍යාපාර මත්ස්‍ය සංවර්ධනය කිරීම.

- ව්‍යාපාර කටයුතුවල අහිතකර බලපෑම්
    - වැඩි ලාභ අපේක්ෂාවෙන් ගුණත්වයෙන් අඩු භාණ්ඩ අපනයනය කිරීම
    - දැඩි තරඟකාරිත්වය තුළ පාරිභෝගිකයින් රැවටීම
    - සේවක සුභසාධනය පිළිබඳ නැඹුරුව අඩු වීම
    - ස්වාභාවික සම්පත් අපතේ යන පරිදි නිෂ්පාදන කටයුතු කිරීම
    - පරිසරය දූෂණය වන පරිදි අපද්‍රව්‍ය මුදාහැරීම
    - අප රටේ සමාජ සංස්කෘතියට නො ගැලපෙන වෙළෙඳ දැන්වීම් නිර්මාණය කිරීම
    - සමාජ සංස්කෘතියට නො ගැලපෙන ඇඳුම් මෝස්තර නිර්මාණය කිරීම

**නිපුණතාව 2.0 :** ව්‍යාපාර පරිසරයට අනුගත වීම සඳහා ව්‍යාපාර, සමාජයීය වගකීම් හා ආචාරධර්ම කෙරෙහි සැලකිලිමත් වන ආකාරය විමසයි.

**නිපුණතා මට්ටම 2.3 :** ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ආචාරධර්ම පද්ධතියක අවශ්‍යතාව තහවුරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව : 06**

**ඉගෙනුම් ඵල :**

- ව්‍යාපාර ආචාරධර්ම සංකල්පය පැහැදිලි කරයි.
- ව්‍යාපාරවලින් සිදු වන හොඳ හා නරක දෑ සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
- ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු සාධක ලැයිස්තුගත කරයි.
- එක් එක් සාධකය සඳහා සුදුසු වන ව්‍යාපාර ආචාරධර්ම තම අත්දැකීම් ඇසුරෙන් යෝජනා කරයි.
- පවත්නා ව්‍යාපාරයක් සැලකිල්ලට ගෙන එම ආයතනය පිළිපදින ආචාරධර්ම සාකච්ඡා කරයි.
- උපකල්පනය කරන ලද ව්‍යාපාරයකට ගැලපෙන ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනගයි.
- ව්‍යාපාර ආචාරධර්ම හා සමාජයීය වගකීම් අතර වෙනස පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- හොඳ පුරවැසියකු වශයෙන් නිවසේ දී, පාසලේ දී, ආගමික ස්ථානයක දී හා වෙනත් පොදු ස්ථානයක දී කළ යුතු හා නො කළ යුතු දෑ විමසන්න.

- පහත කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - වැඩිහිටියන්ට සැලකීම, වැඩිහිටියන්ට උපකාර කිරීම, නිවසේ දී කළ යුතු හොඳ කටයුතු බව සිසුන්ට පැහැදිලි කර දෙන්න.
  - ගුරුවරුන්ට ආචාර කිරීම, නිසි වේලාවට පාසලට පැමිණීම, පාසලේ දී සිදු කළ යුතු හොඳ පුරුදු බව පෙන්වා දෙන්න.
  - ආගමික ස්ථානවල දී හිස්වැසුම්, පාවහන් ගලවා ආගමික ස්ථානයට ඇතුල්වීම, නිසි පරිදි ආගමික වතාවත්වල නියැලීම පිළිපැදිය යුතු හොඳ පුරුදු බව පෙන්වා දෙන්න.
  - පොදු දේපල සුරැකීම, අන්‍යයන්ට ගරු කිරීම, පොදු ස්ථානවල දී පිළිපැදිය යුතු බවත් පෙන්වා දෙන්න.
  - මෙලෙස යහපත් දේ කිරීමත් අයහපත් දේ නො කිරීමත් ආචාරධර්ම බව සිසුන්ට පැහැදිලි කරන්න.
  - ව්‍යාපාර ආයතන ද මෙලෙස පාරිභෝගිකයන් සමග කටයුතු කිරීමේ දී ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදිය යුතු බව පැහැදිලි කරන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

පහත සඳහන් වන්නේ භාණ්ඩ හා සේවා සපයන ආයතන තුනකි.

- මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ආයතනයක්
- පෞද්ගලික ප්‍රවාහන සේවා සපයන ආයතනයක්
- ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක්

- ඔබට ලැබුණු ආයතනයේ කටයුතු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඔබට ලැබුණු ආයතනය මගින් සිදු විය හැකි හොඳ හා නරක ක්‍රියාකාරකම් ලැයිස්තුගත කරන්න.
- එම ආයතනය සඳහා සුදුසු ආචාරධර්ම ලැයිස්තුවක් සකස් කරන්න.
- එවැනි ආචාරධර්ම ක්‍රියාත්මක කිරීමෙන් ආයතනයට අත් වන වාසි පෙන්වා දෙන්න.
- එම ආචාරධර්ම ගොඩනැගීමේ දී ඔබ විසින් සැලකිල්ලට ගනු ලැබූ සාධක පෙළගස්වන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාර තමන් සමග කටුයුතු කරන සියලු පාර්ශ්වවලට යහපතක් සිදු වන ආකාරයට හොඳ නරක පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම, ව්‍යාපාර ආචාර ධර්ම ලෙස හැඳින්විය හැකි ය.

- ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීම ව්‍යාපාරවලට වැදගත් වේ.
  නිදසුන් :
  - ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීම තුළින් ගනුදෙනුකරුවන්ට සාධාරණය ඉටු වන අතර එමගින් ව්‍යාපාර පිළිබඳ ඔවුන්ගේ විශ්වාසය ඉහළ යාම
  - අලෙවිකරණයට අදාළ ආචාරධර්ම පිළිපැදීම තුළින් ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම සහ තරගකාරිත්වයට සාර්ථක ලෙස මුහුණ දිය හැකි වීම
  - ගිණුම්කරණ කටයුතුවලට අදාළ ආචාරධර්ම පිළිපැදීමෙන් ව්‍යාපාරය තුළ සිදු විය හැකි මූල්‍ය අක්‍රමිකතා, විෂමාචාර පිටු දැකීම තුළින් විශ්වාසය තහවුරු වීම
  - සේව්‍ය සේවක අයිතීන් හා යුතුකම් සුරකින ආචාරධර්ම තුළින් සේවකයින්ට ජාති, කුල, ආගම් හෝ ස්ත්‍රී/පුරුෂ ආදී වශයෙන් සිදු වන අසාධාරණකම් සිදු නො වීමෙන් මනා මානව සම්පත් කළමනාකරණයක් සිදු වීම

- ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දි පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.
  - ව්‍යාපාරය
  - ගනුදෙනුකරු
  - සේවකයා
  - තරගකරුවන්
  - සමාජ සංස්කෘතිය
  - සංවිධාන සංස්කෘතිය
  - ප්‍රායෝගික බව

**නිදසුන් :**

| | |
|---|---|
| ව්‍යාපාරය : | ව්‍යාපාරයේ ස්වභාවය කුමක් ද ? භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් ද ? සේවා සපයන ව්‍යාපාරයක් ද ? කුඩා පරිමාණ ව්‍යාපාරයක් ද ? මහා පරිමාණ ව්‍යාපාරයක් ද? ආදිය සැලකිල්ලට ගැනීම |
| ගනුදෙනුකරු : | ගනුදෙනුකරුගේ ඉල්ලුම් රටා, සන්නිවේදනය, ආගමික සමාජ හා සංස්කෘතීන්ට අදාළ කරුණු පිළිබඳ ව සැලකිල්මත් වීම |
| සේවකයා : | කුමන මට්ටමේ සේවකයෙක් ද ? ඔවුන්ගේ පරිසරය, අවශ්‍යතා හා වුවමනා පිළිබඳ සැලකිලිමත් වීම |
| තරඟකරුවන් : | තරඟකරුවන් සිටී ද ? ඔවුන් අනුගමනය කරන ආචාරධර්ම මොනවා ද ? ආදිය පිළිබඳ ව සැලකිලිමත් වීම |
| සමාජ සංස්කෘතිය : | ජනවර්ගය තුළ මුල් බැසගත් සංස්කෘතික සාරධර්ම හා අගනාකම් උප සංස්කෘතීන් ගැන සැලකිලිමත් වී ආචාර ධර්ම පද්ධතිය සැකසීම |
| සංවිධාන සංස්කෘතිය : | ව්‍යාපාරය තුළ පවතින චාරිත්‍ර වාරිත්‍ර, වටිනාකම්, පුරුදු, ආකල්ප යනාදිය පිළිබඳ ව සැලකිලිමත් වීම |
| ප්‍රායෝගික බව : | ආචාරධර්ම පද්ධති සකස් කිරීමේ දී එම ආචාරධර්ම ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත් ද යන්න පිළිබඳ ව සැලකිලිමත් වීම |

- ව්‍යාපාරය සඳහා සකස් කරන ලද ආචාරධර්ම ලිඛිත ව දැක් වූ විට එය ආචාරධර්ම පද්ධතිය /ආචාර ධර්ම සංග්‍රහය ලෙස හඳුන්වයි.

**නිපුණතාව 3.0** : රජය සමග සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කරගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 3.1** : රජය, ව්‍යාපාරවලට මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **04**

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවලට රජයේ බලපෑම මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන හරහා සිදු වන බව පෙන්වා දෙයි.
- තෝරාගත් ව්‍යාපාර ආයතනයක් නිදසුනක් ලෙස ගෙන එයට මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන මැදිහත් වන ආකාරය වෙන වෙන ම පැහැදිලි කරයි.
- රජය ව්‍යාපාරවලට මැදිහත් වන විවිධ ආකාර පැහැදිලි කරයි.
- රජය ව්‍යාපාරවලට මැදිහත් වන එක් එක් ආකාරය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- රජයෙන් ව්‍යාපාරවලට ලැබෙන සහාය හා මග පෙන්වීම ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට රජයෙන් සිසුන්ට ලැබෙන පහසුකම් සිසුන්ගෙන් විමසන්න.
- පහත කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - රජය සිසුන්ට නිල ඇඳුම්, පෙළ පොත්, පාසල් ගොඩනැගිලි, ශිෂ්‍යාධාර, සහන මිලට වාර ප්‍රවේශ පත්‍ර, ක්‍රීඩා උපකරණ, අපද්‍රව්‍ය ඉවත් කිරීම මගින් සහාය වන ආකාරය පහදන්න.

- නිල ඇඳුම් ලබා දීම, පෙළ පොත් ලබා දීම මධ්‍යම රජයෙන් සිදු කෙරෙන බවත්, ගොඩනැගිලි ඉදිකිරීම, ක්‍රීඩා උපකරණ ලබා දීම අදාළ පළාත් සභාවෙන් සිදු කෙරෙන බවත්, පාසලේ කුණු ඉවත් කිරීම අදාළ පළාත් පාලන ආයතන මගින් සිදු කෙරෙන බවත් පහදන්න.

- මීට අමතර ව විෂය නිර්දේශ හා ගුරු අත්පොත් ලබා දීම, ක්‍රීඩා පුහුණු කිරීම, ගුරුවරු පුහුණු කිරීම්, පාසල් ගොඩනැගිලි ප්‍රමිතියකට අනුව ඉදිකිරීම සිදුවනවා දැයි පරීක්ෂා කිරීම වැනි විවිධ මගපෙන්වීම් රජය මගින් සිදු කරන බව සිසුන්ට පහදා දෙන්න.

- ඒ අනුව මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන විසින් ව්‍යාපාර සඳහා සහාය හා මගපෙන්වීම ලබා දෙන බව තහවුරු කරන්න.

- එ ලෙස ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගැනීම සඳහා විවිධ සහාය හා මග පෙන්වීම් රජය විසින් සපයන ආකාරය සාකච්ඡා කරන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත දැක්වෙන ව්‍යාපාරවලින් ඔබ කණ්ඩායමට ලැබුණු ව්‍යාපාර ආයතනය කෙරෙහි අවධානය යොමු කරන්න.

    - වී වගා කරන ගොවිපළක්
    - ඇගලුම් අපනයනය කරන ආයතනයක්
    - මගී ප්‍රවාහන සේවා සපයන ආයතනයක්

- ඔබට ලැබුණු ව්‍යාපාරය ඔබ විසින් ම පවත්වා ගෙන යන බවට උපකල්පනය කරන්න.
- අදාළ ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා රජයෙන් ලබාගත හැකි සහායයන් සඳහන් කරන්න.
- අදාළ ව්‍යාපාර ආයතනය නිවැරදි මාර්ගයේ ගමන් කරවීම සඳහා රජය ලබා දෙන්නා වූ මග පෙන්වීම් දක්වන්න.
- එම එක් එක් සහායයන් හා මග පෙන්වීම් ලබා දෙන රජයේ ආයතන ලැයිස්තුගත කරන්න.
- එම ආයතන මධ්‍යම රජය, පළාත් සභා, සහ පළාත් පාලන ආයතන යටතේ වර්ග කරන්න.
- රජය එම සහායයන් සහ මග පෙන්වීම් සැපයීම වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

- ක්‍රියාකාරකමෙහි යෙදවීමෙන් අනතුරුව රජය ව්‍යාපාරවලට මැදිහත් වන ආකාරයත් එය ව්‍යාපාරවලට වැදගත් වන ආකාරයත් සාකච්ඡා කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කෙරෙහි රාජ්‍ය බලපෑම පහත ආකාරවලින් සිදු වේ.
    - මධ්‍යම රජය
    - පළාත් සභා
    - පළාත් පාලන ආයතන (මහ නගර සභා/නගර සභා/ප්‍රාදේශීය සභා)

- රජය ව්‍යාපාරවලට මැදිහත් වන ආකාර සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.
    - යටිතල පහසුකම් සැපයීම

| | | | |
|---|---|---|---|
| නිදසුන් : | මධ්‍යම රජය | - | විදුලි බලය සැපයීම |
| | පළාත් සභා | - | මාර්ග නඩත්තුව |
| | පළාත් පාලන ආයතන | - | අපද්‍රව්‍ය ඉවත් කිරීම |

    - තරගකරුවෙකු වීම

| | | | |
|---|---|---|---|
| නිදසුන් : | මධ්‍යම රජය | - | පෞද්ගලික අංශයේ රූපවාහිනී නාලිකා සමග තරගකාරී ව රාජ්‍ය අංශයේ රූපවාහිනි නාලිකා ක්‍රියාත්මක කිරීම |

පළාත් සභා - ඒ ඒ පළාත් සභා යටතේ පෞද්ගලික අංශය හා තරගකාරී ව ව්‍යාපාර පවත්වා ගෙන යාම

පළාත් පාලන ආයතන - පෞද්ගලික අංශය හා සමාන ව වෙළෙඳසැල් ඉදිකර කුලියට දීම

- ගනුදෙනුකරුවෙකු වීම

  නිදසුන් : මධ්‍යම රජය - වී මිල දී ගැනීම, විවිධ කාර්යාලීය උපකරණ මිල දී ගැනීම, ලක් සතොස හරහා භාණ්ඩ විකිණීම

  පළාත් සභා - ආරක්ෂක සේවා ලබා ගැනීම හා ලබා දීම

  පළාත් පාලන ආයතන - ආදාහනාගාර පවත්වා ගෙන යාම

- ප්‍රතිපත්ති සම්පාදනය කිරීම

  නිදසුන් : මධ්‍යම රජය - මූල්‍ය ප්‍රතිපත්ති හා පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

  පළාත් සභා - ව්‍යාපාර නාම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම

  පළාත් පාලන ආයතන - පරිසර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

- නීති රීති පැනවීම

  නිදසුන් : මධ්‍යම රජය - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, ප්‍රමිති පනත

  පළාත් සභා - පෞද්ගලික බස් රථ සඳහා නීතිරීති පැනවීම

  පළාත් පාලන ආයතන - ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම හා නීති රීති පැනවීම

- බදු අයකරන්නෙකු වීම

  නිදසුන් : මධ්‍යම රජය - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරහා බදු අය කිරීම

  පළාත් සභා - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින් බදු අය කිරීම

  පළාත් පාලන ආයතන - වරිපනම් බදු අය කිරීම

- රජයෙන් ව්‍යාපාරවලට ලැබෙන සහාය හා මගපෙන්වීම වැදගත් වන ආකාරය
  - ව්‍යාපාර ලියාපදිංචියට යොමු වීම
  - කීර්තිනාමය වර්ධනය වීම
  - රටේ සංවර්ධනයට දායක වීම
  - රජයේ හා මහජනයාගේ පිළිගැනීම ලැබීම

**නිපුණතාව 3.0** : රජය සමග සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කර ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 3.2** : රජයක ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා ව්‍යාපාර දායක වන ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **04**

**ඉගෙනුම් ඵල** :

- රජයක ආර්ථික අරමුණු විස්තර කරයි.
- රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට ව්‍යාපාර දායක වන ආකාරය පැහැදිලි කරයි.
- තෝරාගත් ව්‍යාපාරයක් නිදසුන් ලෙස ගෙන එය රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට දායක වන ආකාරය පෙන්වා දෙයි.
- රජයත් ව්‍යාපාරත් අතර අන්‍යොන්‍ය සම්බන්ධතාව තුළින් දෙපාර්ශ්වයේ ම අරමුණු ඉටුකර ගත හැකි බව පෙන්වා දෙයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ව්‍යාපාරයක් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු සිසුන්ගෙන් විමසන්න.
  - වෙළෙඳපොළේ රැඳී සිටීම
  - ලාභය උපරිම කිරීම
  - විකුණුම් උපරිම කිරීම
  - කොටස්වල වෙළෙඳ අගය උපරිම කිරීම ආදිය ව්‍යාපාරයක අරමුණු බව සාකච්ඡා කරන්න.

- ව්‍යාපාරයකට මෙන් ම රජයට ද විවිධ අරමුණු පවතී. එම අරමුණු පැහැදිලි කරන්න.

☞

- එම අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපාර ද විවිධාකාරයෙන් දායක වන ආකාරය පැහැදිලි කරන්න.

☞

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත සඳහන් කියවීම් ද්‍රව්‍ය සපයා පහත ක්‍රියාකාරකමේ නිරත කරවන්න.
  - අදාළ ආසන්න ම වර්ෂයේ මහ බැංකු වාර්තාව
  - අදාළ ආසන්න ම වර්ෂයේ අයවැය කතාවේ උපුටන
  - අදාළ සටහන සඟරාවල උපුටන

- පහත දැක්වෙන්නේ රජයක ආර්ථික අරමුණු කිහිපයකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබුණු ආර්ථික අරමුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
    - ආර්ථික වර්ධනය හා සංවර්ධනය
    - පූර්ණ සේවා නියුක්තිය හා සාධාරණ ආදායම් ව්‍යාප්තිය
    - අන්තර් ජාතික වෙළෙඳාම හා ආර්ථික ස්ථායිතාව
  - ඔබට ලැබුණු කියවීම් ද්‍රව්‍ය (මහ බැංකු වාර්තාව, සඟරා, පුවත්පත් ) හොඳින් පරිශීලනය කරන්න.
  - ඔබට ලැබුණු ආර්ථික අරමුණු කෙටියෙන් පැහැදිලි කරන්න.
  - ඔබ ප්‍රදේශයේ පවතින ව්‍යාපාරයක් නිදසුන් ලෙස ගෙන ඔබ කණ්ඩායමට ලැබුණු ආර්ථික අරමුණු ඉටු කිරීමට එම ව්‍යාපාරය දායක වන ආකාරය පෙන්වා දෙන්න.
  - ඔබ ප්‍රදේශයේ පවතින ව්‍යාපාරයක් තෝරා ගෙන රජයේ අනෙකුත් ආර්ථික අරමුණු ඉටු වන ආකාරයෙන් එම ව්‍යාපාරය කටයුතු කරන ආකාරය පෙන්වා දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- රජයක් පහත දැක්වෙන ආර්ථික අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කරයි.

**ආර්ථික වර්ධනය හා සංවර්ධනය**

නිෂ්පාදන ක්‍රියාවලියේ අඛණ්ඩ වර්ධනය තුළින් ආර්ථික වර්ධනයක් සිදු වන අතර ඊට අමතර ව මානව හා සමාජ දර්ශකවල දිගුකාලීන වර්ධනය සංවර්ධනය ලෙස හඳුන්වයි.

**පූර්ණ සේවා නියුක්තිය**

ශ්‍රමය සැපයීමට බලාපොරොත්තුවෙන් සිටින සියලු දෙනා යම් සේවාවක නියුක්ත වී සිටීම මෙන් ම ආර්ථිකය සතු සියලු ම නිෂ්පාදන සම්පත් ඵලදායී නිෂ්පාදන කටයුත්තක යොදවා තිබීම

**සාධාරණ ආදායම් ව්‍යාප්තිය**

රටක සමස්ත නිෂ්පාදිතය එ රටෙහි වෙසෙන සමස්ත ජනතාව අතර සමාන ව බෙදා හැරීම

**ආර්ථික ස්ථායිතාව**

ආර්ථිකයේ දේශීය හා විදේශීය වශයෙන් අර්බුදයක් ඇති නො වීමට ඔරොත්තු දීමේ හැකියාව ආර්ථික ස්ථායිතාවයි.

ආර්ථික ස්ථායිතාව කොටස් දෙකකින් යුක්ත වේ.

1. අභ්‍යන්තර මිල ස්ථායිතාව
2. බාහිර මිල ස්ථායිතාව

- අභ්‍යන්තර මිල ස්ථායිතාව තුළින් උද්ධමනය පාලනය, මිල මට්ටම ස්ථාවර ව පවත්වා ගැනීම, පොලී අනුපාතය පාලනය කිරීම සිදු කෙරෙන අතර,

- බාහිර මිල ස්ථායිතාව තුළින් විදේශ විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සිදු කෙරේ.

**යහපත් අන්තර් ජාතික වෙළෙඳාම**

විදේශ වෙළෙඳ කටයුතු සතුටුදායක අන්දමින් පවත්වා ගෙන යාම තුළින් ගෙවුම් ශේෂ තත්ත්වය ආරක්ෂා කර ගැනීම මින් අපේක්ෂා කෙරේ.

- රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට ව්‍යාපාර විවිධාකාරයෙන් දායක වේ.
    - **බදු ගෙවීම**
      රජයට ගෙවිය යුතු බදු පැහැර හැරීමකින් තොර ව තමා උපයාගත් ලාභය හා ආදායම් මත නියමිත පරිදි  බදු ගෙවීම
    - **දේශීය සම්පත් භාවිතය**
      හැකිතාක් උපරිමයෙන් තම නිෂ්පාදන සඳහා දේශීය සම්පත් යොදා ගැනීම
    - **රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම**
      රජය ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා පිළිපැදීම
    - **නීති රීති පිළිපැදීම**
      ව්‍යාපාර සඳහා  පනවා ඇති නීති රීති ඒ ආකාරයෙන් ඉටු කරමින් යහපත් ව්‍යාපාරික පරිසරයක් ගොඩනැගීමට දායක වීම
    - **සේවා නියුක්තියට දායක වීම**
      ඵලදායී ලෙස නිෂ්පාදන කටයුතු කිරීමේ දී ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ඇතුළු සියලු සම්පත් කාර්යක්ෂම ව භාවිතයට ගැනීම
    - **පරිසරයට වන හානිය අවම කිරීම**
      සියලු ව්‍යාපාර පරිසර හිතකාමී ලෙස ඒවායේ  ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම

- රජය හා ව්‍යාපාර අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවක් පවත්වා ගැනීම වැදගත් වේ. රජය ව්‍යාපාරවලට අවශ්‍ය  පහසුකම් සැපයීම තුළින් ව්‍යාපාර දිරිමත් වේ. ව්‍යාපාර වර්ධනය තුළින් රජයේ අරමුණු ඉටු වේ. එසේ ම ව්‍යාපාර වර්ධනය නිසා රජයට බදු ආදායමක් ලබා ගත හැකි ය. එම ආදායම් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා හා අනෙකුත් කාර්යයන් සඳහා යොදාගත හැකි ය.  මේ  නිසා රජයත් ව්‍යාපාරත් අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම අවශ්‍ය වේ.

**නිපුණතාව 3.0** : රජය සමග සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කර ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 3.3** : රජයේ පිස්කල් ප්‍රතිපත්තිවලට අනුකූල ව ව්‍යාපාර පවත්වාගෙන යාමේ වැදගත්කම අගයයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **06**

**ඉගෙනුම් ඵල** :

- රජයේ පිස්කල් ප්‍රතිපත්තිය යන්න පැහැදිලි කරයි.
- රජයේ පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
- රජයේ ආදායම් හා වියදම් ව්‍යුහය රූප සටහනකින් දක්වයි.
- බදු වර්ග කොට එක් එක් බදු වර්ගය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- රජයේ බදු නො වන ආදායම් සඳහා නිදසුන් දක්වයි.
- ආසන්න ම වර්ෂයේ අය වැය යෝජනා සැලකිල්ලට ගෙන ඒවා ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම විග්‍රහ කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- රජයේ ආදායම් හා වියදම්වලට අදාළව ආසන්නම වර්ෂයේ මහ බැංකු වාර්තාවේ අදාළ තොරතුරු සිසුන්ට පරිශීලනය කිරීමට ලබා දී පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගන්න.
    - රජයට ආදායම් ලැබෙන මාර්ග මොනවා ද ?
    - රජයේ වියදම් වර්ග මොනවා ද ?
    - වැඩි ම ආදායම් ලැබෙන ප්‍රභවය කුමක් ද ?
    - විවිධ වියදම් වර්ග සඳහා නිදසුන් සපයන්න.
    - රජය පනවා ඇති විවිධ බදු වර්ග මොනවා ද ?
- ඉහත ප්‍රශ්නවලට ලැබෙන පිළිතුරු ඇසුරෙන් පිස්කල් ප්‍රතිපත්තිය පැහැදිලි කරන්න
- ආසන්න වර්ෂයක මහ බැංකු වාර්තාව පරිශීලනය කරමින් ආදායම් හා වියදම් වර්ග කරන ආකාරය රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.
- ආසන්න වර්ෂයේ අයවැය යෝජනා සැලකිල්ලට ගෙන ඒවා ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම සාකච්ඡා කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- රජයේ ආදායම් හා වියදම් සම්බන්ධව රජය සිදු කරන කටයුතු පිස්කල් ප්‍රතිපත්තිය ලෙස හැඳින්වේ.
- රජයේ පිස්කල් ප්‍රතිපත්තියේ අරමුණ, සාර්ව ආර්ථික ස්ථායීතාව ආරක්ෂා කර ගැනීම වේ.
- යම් ආර්ථිකයක මුදල් වර්ෂයක් තුළ බදු හා බදු නො වන මාර්ගවලින් ලැබෙන ආදායම රාජ්‍ය ආදායම වේ.
- රජයක ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා වර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වර්ෂයක් තුළ දී කරනු ලබන මුළු වියදම රාජ්‍ය වියදම වේ.

- රාජ්‍ය අයවැය ලේඛනය මගින් රජයේ පිස්කල් ප්‍රතිපත්තිය පිළිබිඹු වේ.
- රාජ්‍ය ආදායම පහත පරිදි වර්ග කෙරේ.

**රාජ්‍ය ආදායම**

බදු ආදායම | බදු නො වන ආදායම

- රජයේ බදු ආදායම පහත පරිදි වර්ග කළ හැකි ය.

**බදු ආදායම**

ආදායම් බදු | එකතුකල අගය මත බදු | නිෂ්පාදන බදු | ආනයන බදු | අනෙකුත් බදු

- බද්දක් යනු යම් පුද්ගලයකු හෝ ආයතනයක් විසින් අනිවාර්යයෙන් ම ගෙවිය යුතු යැයි රජය හෝ රජයේ බලාධිකාරී ආයතනයක් විසින් නියම කරනු ලබන ගෙවීමකි.

ආදායම් බදු : පුද්ගලයින්ගේ හා ආයතනවල ආදායම මත අය කරනු ලබන බද්දකි.
නිදසුන් : සමාගම් බදු, උපයන විට ගෙවීම් බදු

එකතු කළ අගය මත බදු : භාණ්ඩ හා සේවා මත එකතු කළ වටිනාකමට අය කරන බදු එකතු කළ මත බදු අගය මත බදු වේ.
නිදසුන් : තොග හා සිල්ලර වෙළෙඳාම මත එකතු කළ අගය මත බදු
ආනයන මත එකතු කළ අගය මත බදු

නිෂ්පාදන බදු/ දේශීය භාණ්ඩ බදු : දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ඇතැම් භාණ්ඩ මත අය කරන බදු
නිදසුන් : සිගරට් හා දුම්කොල නිෂ්පාදන මත බදු, සුරා බදු

ආනයන මත බදු : විදේශීය රටවල්වලින් ආනයනය කරන භාණ්ඩ සඳහා රේගුවේ දී අය කරන බදු වේ.
නිදසුන් : මෝටර් රථ ආනයන මත බදු

අනෙකුත් බදු : ඉහත බදු වර්ගවලට අයත් නො වන එහෙත් අනෙකුත් පාර්ශ්වවලින් අයකරන බදු වර්ග ය.
නිදසුන් : වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු
සෙස් බද්ද, විදුලි සංදේශ බදු

.

- බදු ආදායම සෘජු බදු හා වක්‍ර බදු ලෙස ද වර්ග කළ හැකි ය.

**රජයේ බදු ආදායම**

- සෘජු බදු
  - පුද්ගල ආදායම් බදු
  - සමාගම් බදු
  - රඳවා ගැනීමේ බදු
  - ප්‍රාග්ධන ලාභ මත බදු
- වක්‍ර බදු
  - එකතු කළ අගය මත බදු
  - රේගු බදු
  - නිෂ්පාදන බදු

- පුද්ගලයන්ගේ හෝ ව්‍යාපාරවල ආදායම මත හෝ වත්කම් මත අය කරනු ලබන, ගෙවන පුද්ගලයා විසින් ම දැරිය යුතු බදු සෘජු බදු වේ.
- භාණ්ඩ හා සේවා මත අය කරනු ලබන, ගෙවන ලද බද්ද වෙනත් පාර්ශ්වයකට විතැන් කළ හැකි බදු වක්‍ර බදු වේ.

- රජයේ බදු නො වන ආදායම් පහත පරිදි දැක්විය හැකි ය.

**බදු නො වන ආදායම**

- ලාභ හා ලාභාංශ
  නිදසුන් : රජයේ ආයතනවලින් ලද ලාභ හා ලාභාංශ
- ගාස්තු හා අයකිරීම්
  නිදසුන් : මෝටර් රථ සඳහා ආදායම් බලපත්‍ර ගාස්තු හා අයකිරීම්
- පොලී ආදායම්
- වෙනත්
  නිදසුන් : ලොතරැයි ආදායම

- රාජ්‍ය වියදම් පහත පරිදි වර්ග කෙරේ.

**රාජ්‍ය වියදම**

- වර්තන වියදම්
- ප්‍රාග්ධන වියදම්

- වර්තන වියදම් : රාජ්‍ය සේවා අඛණ්ඩ ව පවත්වා ගැනීම සඳහා වසරක් තුළ නැවත නැවත සිදු කළ යුතු වියදම් ය. මේවා පුනරාවර්තන වියදම් ලෙස ද හඳුන්වයි.
  නිදසුන් : වැටුප් හා වේතන, පොලී ගෙවීම්

- ප්‍රාග්ධන වියදම් ෑ රජයක් විසින් දිගුකාලීන ආයෝජන සඳහා දරන වියදම් ප්‍රාග්ධන වියදම් වේ.

  නිදසුන් ෑ මහාමාර්ග ඉදිකිරීම
  පාලම් ඉදිකිරීම

  (රජයේ ආදායම් හා වියදම් සංයුතිය අයවැය යෝජනා ඉදිරිපත් කිරීමත් සමග වෙනස් විය හැකි ය).

- ආසන්න ම වර්ෂයේ මහ බැංකු වාර්තාව පරිශීලනය කරමින් රජයේ ආදායම් හා වියදම් වර්ගීකරණය කරන්න.

- රජය විවිධ අවස්ථාවල දී විවිධ බදු වර්ග පනවන අතර විවිධ බදු වර්ග අහෝසි කිරීම ද කරනු ලැබේ. බදුවලින් ලබන ආදායම රජයේ විවිධ ව්‍යාපෘති සඳහා වැය කරයි.

  නිදසුන් ෑ මාර්ග ඉදිකිරීම, ගුවන් තොටුපොල ඉදිකිරීම හා සංවර්ධනය, වරාය සංවර්ධනය

- රජයේ පිස්කල් ප්‍රතිපත්තිය ව්‍යාපාරවලට බලපාන ආකාරය සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

  - ආනයනික භාණ්ඩ සඳහා රේගු බදු අය කිරීමෙන් ආනයන සීමා වන අතර ම දේශීය නිෂ්පාදනය වර්ධනය කර ගත හැකි ය. /දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගත හැකි වේ.

  - දේශීය නිෂ්පාදිත මත බදු අය කිරීමෙන් භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම සිදු විය හැකි ය.

  - රජය, යටිතල පහසුකම් මත වියදම් දැරීම නිසා ව්‍යාපාරික කටයුතු පහසු කෙරේ.

**නිපුණතාව 3.0** : රජය සමග සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කර ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 3.4** : රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල ව ව්‍යාපාර පවත්වා ගෙන යාමේ වැදගත්කම අගයයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **06**

**ඉගෙනුම් ඵල** :

- රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය පැහැදිලි කරයි.
- රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවල අරමුණු විස්තර කරයි.
- රටක මූල්‍ය කටයුතු පාලනය සඳහා රජයකට අනුගමනය කළ හැකි උපාය මාර්ග පෙන්වා දෙයි.
- රජය අනුගමනය කරනු ලබන එක් එක් මූල්‍ය පාලන උපකරණය (උපක්‍රමය) පැහැදිලි කරයි.
- රජය අනුගමනය කරන මූල්‍ය පාලන උපක්‍රම ව්‍යාපාරවලට බලපාන ආකාරය විග්‍රහ කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පහත සඳහන් වගන්ති ඇතුළත් සැණපත් කිහිපයක් සකස් කර පන්තියේ සිසුන්ට ඉදිරිපත් කරන්න.
  - වාණිජ බැංකු පොළී අනුපාතය පහළට
  - වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තැන්පත් කළ යුතු සංචිත ප්‍රමාණය ඉහළ නංවයි
  - මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරයි
  - අල ගොවීන් සඳහා වැඩිපුර ණය පහසුකම් සපයයි

- එක් එක් වගන්තියෙන් දැක්වෙන අදහස සිසුන්ගෙන් විමසමින් සාකච්ඡා කරන්න.
  නිදසුන් : වාණිජ බැංකු පොළී අනුපාතය පහළට යන්න සැලකිල්ලට ගත් විට, මහජනයා විසින් වාණිජ බැංකුවල තැන්පත් කරන මුදල් සඳහා ගෙවන පොළිය අඩු බවත්, වාණිජ බැංකුවලින් ලබා ගන්නා ණය සඳහා අය කරන පොළිය අඩු බවත්, මෙයින් අදහස් වේ.

- එකී වගන්ති වාණිජ බැංකුවලට බලපාන ආකාරය සාකච්ඡා කරන්න.
  නිදසුන් : වාණිජ බැංකු පොළී අනුපාතය පහළට යන්න සැලකිල්ලට ගත් විට, වාණිජ බැංකු තැන්පත් සඳහා ගෙවන පොළිය අඩු කළ විට මහජනතාව බැංකුවේ තැන්පත් කරන මුදල් ප්‍රමාණය අඩු වන අතර, වාණිජ බැංකු ණය දීමේ දී අය කරන පොළිය අඩු වූ විට ණය ඉල්ලුම් කරන ප්‍රමාණය වැඩි වේ.

- එම වගන්ති ව්‍යාපාරවලට බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

නිදසුන් : වාණිජ බැංකු පොළී අනුපාතය පහළට යන්න සැලකිල්ලට ගත් විට, වාණිජ බැංකු විසින් ණය සඳහා අය කරන පොළිය අඩු වීම නිසා ව්‍යාපාරිකයින් අඩු පොළියට පහසුවෙන් ණය ලබා ගැනීම නිසා ව්‍යාපාරවල ආයෝජන වැඩි වී නිෂ්පාදනය වැඩි කර ගත හැකි වීමෙන් ව්‍යාපාර පුළුල් කර ගත හැකි වේ.

- ඉහත ආකාරයට අනෙකුත් සැණපත්වල ඇතුළත් වගන්තිවල බලපෑම ද පැහැදිලි කරන්න.
- ඒ අනුසාරයෙන් රටක මූල්‍ය කටයුතු පාලනය සඳහා රජයක් විවිධ උපාය මාර්ග අනුගමනය කරන බව පැහැදිලි කර දෙන්න.
- ඒ අනුව, රටක මුදල් සැපයුම කෙරෙහි බලපෑම් කිරීම සඳහා රජය මූල්‍ය ප්‍රතිපත්තිය අනුගමනය කරන බවත්, මූල්‍ය ප්‍රතිපත්තියේ අරමුණත් පැහැදිලි කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- රටක මුදල් සැපයුම පාලනය කිරීම සඳහා රජය අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තයයි. රජය වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවයි.

- රජයේ මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ දේශීය ආර්ථිකය තුළ මිල ස්ථායිතාව පවත්වා ගැනීමයි. නැතහොත් උද්ධමනය පාලනය කිරීමයි. එහි දී දිගු කාලයක් පුරා මිල මට්ටම් ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යාම අපේක්ෂා කෙරේ.

- මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහත උපකරණ භාවිත කෙරේ.

  - **පොලී අනුපාතිකය**
    රජයේ මුදල් පාලනය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන උපකරණය පොලී අනුපාතිකය වේ. මෙය නිත්‍ය පහසුකම් අනුපාතිකය ලෙස ද මහ බැංකුව හඳුන්වයි. නිත්‍ය පහසුකම් අනුපාතිකයේ (Standing Facility Rate ) ප්‍රධාන කොටස් තුනකි.

    - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය Standing Deposit Facility Rate (SDFR)
    - නිත්‍ය ණය පහසුකම් අනුපාතය Standing Lending Facility Rate (SLFR)
    - බැංකු පොලී අනුපාතිකය

    නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය
    වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් ඔවුන්ගේ අතිරික්ත අරමුදල් මහ බැංකුවේ ඇති රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ දී ගෙවනු ලබන පොලී අනුපාතිකයයි.

    නිත්‍ය ණය පහසුකම් අනුපාතය
    වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් රජයේ සුරැකුම්පත් ඇපයට තබා මහ බැංකුවෙන් අරමුදල් ලබා ගැනීමේ දී අය කරනු ලබන පොලී අනුපාතයයි.

බැංකු පොලී අනුපාතිකය
ද්‍රවශීලතා දුෂ්කරතා වලට මුහුණ දෙන වාණිජ බැංකුවලට ශ්‍රී ලංකා මහ බැංකුව අවසාන ණය දෙන්නා ලෙස සපයනු ලබන ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතයයි.

- **සංචිත අවශ්‍යතා වෙනස් කිරීම**

  වාණිජ බැංකුවල පවතින තැන්පතුවලට අදාළ ව මහ බැංකුවේ පවත්වා ගත යුතු තැන්පතු ප්‍රමාණය ව්‍යවස්ථාපිත සංචිතය වේ. මෙය වෙනස් කිරීම නිසා මුදල් සැපයුමේ අඩු වැඩි වීම් සිදු වේ. සංචිත අවශ්‍යතා අඩු කිරීම මුදල් සැපයුම වැඩි වීමට හේතු වේ. සංචිත අවශ්‍යතා වැඩි කිරීම මුදල් සැපයුම් අඩු වීමට හේතු වේ.

- **විවෘත වෙළෙඳපොළ කටයුතු (විවට වෙළෙඳපොළ කටයුතු )**

  මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් මිලට ගැනීම හා විකිණීම විවෘත වෙළෙඳපොළ කටයුතු වේ.
  මහ බැංකුව සැරැකුම්පත් මිලට ගැනීමේ දී මුදල් සැපයුම ප්‍රසාරණය වන අතර විකිණීමේ දී මුදල් සැපයුම සංකෝචනය වේ.

- **වට්ටම් අනුපාත වෙනස් කිරීම**

  මහ බැංකුව විසින් නිකුත් කරන සුරැකුම්පත් මිල දී ගත් පාර්ශ්ව ඒවා කල් පිරීමට පෙර වාණිජ බැංකුවලට ඉදිරිපත් කර වට්ටම් කරවා ගැනීමේ දී අය කරන වට්ටම් අනුපාතිකය වෙනස් කිරීම තුළින් ආර්ථිකයේ මුදල් සැපයුම පාලනය කළ හැකි වේ.

- **ණය සීමා පැනවීම**

  ණය සීමා පැනවීම දෙයාකාරයකට සිදු වේ.

  **ප්‍රමාණාත්මක ණය සීමා පැනවීම**

  රටේ සමස්ථ මුදල් සැපයුමට බලපෑමක් ඇති කරන බැංකු ණය ප්‍රමාණය අඩු හා වැඩි කරමින් සමස්ථ ණය ප්‍රමාණය පාලනය කිරීම ප්‍රමාණාත්මක ණය පාලනය වේ.
  නිදසුන් ෑ

  - වාණිජ බැංකුවල ප්‍රාග්ධනය හා වත්කම් අතර අවම අනුපාත නියම කිරීම
  - ණයවර ලිපි නිකුත් කිරීමේ දී තැන්පත් කළ යුතු අවම මුදල් ප්‍රමාණය නියම කිරීම

  **ගුණාත්මක ණය සීමා පැනවීම**

  ආර්ථිකයක ණය ගලා යන දිශාව පාලනය කිරීම නැතහොත් ආර්ථිකයේ දිරි ගැන්විය යුතු යයි තෝරා ගත් අංශ සඳහා ණය ගලා යාම දිරිමත් කිරීමත්, අධෛර්යමත් විය යුතු අංශ කෙරෙහි ණය ගලා යාම සීමා කිරීමත් අරමුණු කොට ගෙන ක්‍රියාත්මක වන ක්‍රමය ගුණාත්මක ණය පාලනයයි.

නිදසුන් ඃ

- ණය ලබා දෙන ක්ෂේත්‍ර නිර්දේශ කිරීම
  - කෘෂිකර්මාන්තය සඳහා ද? කර්මාන්ත සඳහා ද ?
  - ව්‍යාවසායකයන් සඳහා ද ? ආදී වශයෙන්.
- අක්‍රීය ණය සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දැක්වීම

- මූල්‍ය ප්‍රතිපත්ති උපකරණයක් වශයෙන් ණය පාලනය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ සෘජු ක්‍රියා මාර්ගයකි. මෙහි දී බැංකු ක්‍රමය මගින් සැපයෙන ණය ප්‍රමාණය, ණය ආපසු ගෙවීමේ කාලය සහ ණය සඳහා ලබා ගන්නා සුරකුම් යනා දී අංශ සම්බන්ධ ව ප්‍රමාණාත්මක හා ගුණාත්මක පාලනයන් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ලැබී ඇත.

  ණය ප්‍රමාණය පාලනය කිරීමේ දී යම් බැංකුවක, යම් දිනක හෝ කාලයක ලබා දී ඇති උපරිම ණය ප්‍රමාණය පිළිබඳ සීමා පැනවීම හෝ ණය වර්ධන අනුපාත නියම කිරීම කළ හැකි ය. තව ද, ආර්ථිකයේ ප්‍රමුඛ අංශවලට සැපයෙන ණය ප්‍රමාණය ධෛර්යමත් කිරීමට විවිධ නිෂ්පාදන අංශවලට දිය යුතු අවම ණය ප්‍රමාණ නියම කිරීම හෝ උද්ධමනකාරී අවධියක දී පරිභෝජන ණය වර්ධනය සීමා කිරීමට පරිභෝජන ණය පිළිබඳ උපරිම සීමා නියම කිරීම කළ හැකි ය.

  ණය අය කිරීමේ උපරිම කාලය සහ එම ණය සඳහා බැංකු ලබා ගත යුතු සැරකුම්වල ස්වභාවය හා වටිනාකම පිළිබඳ නියෝග පැනවීම ද කළ හැකි ය. උද්ධමනකාරී අවස්ථාවක උද්ධමනය පාලනය කිරීම සඳහා පරිභෝජන ණය අධෛර්යමත් කිරීමට, පරිභෝජන ණය සඳහා ඉතා කෙටි ආපසු ගෙවීමේ කාල නියම කිරීම හා ඉහළ වටිනාකම් සහිත සුරකුම් තබා ගැනීමට නියම කළ හැකි ය.

- රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ඒවා ව්‍යාපාරවලට විවිධ ස්වරූපයෙන් බලපෑම් කරයි.
  නිදසුන් ඃ
  මහ බැංකු පොලී අනුපාතිකය අඩු කිරීමත් සමග වාණිජ බැංකු පොලී අනුපාතිකය ද අඩු වේ. එවිට ආයෝජකයින් වාණිජ බැංකු මගින් ලබාගන්නා ණය ප්‍රමාණය වැඩි වීමත් සමඟ ආයෝජන ද වැඩි වේ. ඒ තුළින් නිෂ්පාදනය වැඩි වී භාණ්ඩ මිල අඩු වේ. මිල අඩු වීම නිසා ව්‍යාපාරවල පිරිවැටුම වැඩි වී ලාභ වැඩි වේ.

  මහ බැංකු පොලී අනුපාතිකය වැඩි කිරීමත් සමග වාණිජ බැංකු පොලී අනුපාතිකය ද වැඩි වේ. එවිට ආයෝජකයින් වාණිජ බැංකු මගින් ලබා ගන්නා ණය ප්‍රමාණය අඩු වීමත් සමග ආයෝජනය ද අඩු වේ. එවිට නිෂ්පාදනය අඩු වී භාණ්ඩ මිල වැඩි වේ. මිල වැඩි වීම නිසා ව්‍යාපාරවල පිරිවැටුම අඩු වී ලාභ අඩු වේ.

**නිපුණතාව 3.0** : රජය සමග සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කර ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 3.5** : පාරිභෝගික ආරක්ෂණය සඳහා රජය ගන්නා ක්‍රියාමාර්ගවලට අනුගත වෙමින් ව්‍යාපාර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **05**

**ඉගෙනුම් ඵල** :

- පාරිභෝගික ආරක්ෂණය යන සංකල්පය පහැදිලි කරයි.
- පාරිභෝගික ආරක්ෂණය වඩාත් වැදගත් වීමට හේතු දක්වයි.
- පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට ඇති වන වාසි වෙන වෙන ම ලැයිස්තුගත කරයි.
- පාරිභෝගික අයිතිවාසිකම් පැහැදිලි කරයි.
- පාරිභෝගික වගකීම් පැහැදිලි කරයි.
- පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් මත තාර්කික පාරිභෝගිකයෙකුගේ හැසිරීම විස්තර කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

- ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සිසුන් තිදෙනෙකු ලවා පහත දැක්වෙන භූමිකා රංගනය පන්තියට ඉදිරිපත් කරවන්න.

භූමිකා රංගනය

පාරිභෝගිකයා : මුදලාලි මට හොඳ ජෑම් බෝතලයක් දෙන්න.

පොතේ ගුරු : රාක්කවල අසුරා තිබූ ජෑම් බෝතලයක් රැගෙන පොලිතින් බෑගයකට දමා දෙයි.

ව්‍යාපාරිකයා : ආ මෙන්න. රු. 150/- ක් දෙන්න. මේ බිලත් අරගන්න.

පොතේ ගුරු : ජෑම් බෝතලය දමාගත් පොලිතින් බෑගය මහමග දමා ජෑම් බෝතලය ගෙදර රැගෙන ආ විට දරුවා එය පරීක්ෂා කර බලයි. කල් ඉකුත් වී ඇති බව හා මිල වෙනස් කර ඇති බව ද දරුවා දකියි.

පියා නැවත ජෑම් බෝතලය රැගෙන ව්‍යාපාරයට යයි.

පාරිභෝගිකයා : මේ ජෑම් බෝතලේ මිලත් වෙනස් කරලා. කාලයත් ඉකුත් වෙලා. මේ ජෑම් බෝතලය මට එපා. මට මුදල්

- භූමිකා රංගනයට අනුව සිදු ව ඇති පහත සඳහන් වෙළෙඳ විෂමාචාර පිළිබඳ සාකච්ඡාවක් කරන්න.

  නිදසුන් :
  - මිල වෙනස් කර තිබීම
  - කල් ඉකුත් වූ භාණ්ඩ විකිණීම
  - විකුණූ භාණ්ඩ නැවත භාර නො ගන්නා බවට කොන්දේසි ඉදිරිපත් කිරීම

- පහත දැක්වෙන්නේ පුවත්පත් කිහිපයකින් උපුටා ගත් ප්‍රකාශ කිහිපයකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන ප්‍රකාශය කෙරෙහි අවධානය යොමු කරන්න.

  **ප්‍රකාශ අංක 1**
  පාන් පිටි මිශ්‍ර කරන ලද තුනපහ පැකට් තොගයක් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට සූදානම් කරමින් සිටි පිරිසක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

  **ප්‍රකාශ අංක 2**
  භාණ්ඩ මිල දී ගැනීමෙන් පසු ඉතිරි මුදල් ආපසු නො දී ඒ වෙනුවට ගිණිපෙට්ටි, ටොෆී වැනි වෙනත් භාණ්ඩයක් පාරිභෝගිකයාට ලබා දෙන බවට පැමිණිලි ලැබී ඇත.

  **ප්‍රකාශ අංක 3**
  SLS සහතිකය නො මැති ව පානීය ජලය ඇසුරුම් කිරීමට භාවිත කරනු ලබන බඳුන් හා බෝතල් වෙළෙඳපොළේ පවතින බවට සිදු කරන ලද විමර්ශනයක දී සොයා ගෙන ඇත.

  **ප්‍රකාශ අංක 4**
  කෘමිනාශක හා රසායනික පොහොර යොදා වගා කර අලෙවිය සඳහා වෙළෙඳපොළට ඉදිරිපත් කර තිබූ දොඩම් ගෙඩිවල අලවා තිබූ ස්ටිකරයේ අංකය ව්‍යාජ ලෙස වෙනස් කර අලෙවි කළ පුද්ගලයෙක් අත්අඩංගුවට ගෙන ඇත.

- ඔබගේ කණ්ඩායමට ලැබුණු සිද්ධිය පිළිබඳ ව කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- එම සිද්ධිවල ඇතුළත්, ව්‍යාපාරිකයින් විසින් සිදු කරන ලද වෙළෙඳ විෂමාචාර හඳුනාගන්න.

- එම විෂමාචාරවලට අමතර ව ඔබ දන්නා වෙනත් වෙළෙඳ විෂමාචාර මොනවා ද ?

- එවැනි විෂමාචාර පිළිබඳ ව පැමිණිලි කළ හැකි ආයතන හා පුද්ගලයන් නම් කරන්න.

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කරවන්න.
- පාරිභෝගික ආරක්ෂණය හා එහි අවශ්‍යතාව පැහැදිලි කරන්න.

- පහත දැක්වෙන්නේ පාසල් සිසුන් තිදෙනෙකු අතර ඇති වූ කතාබහකි.

සුරේශ් - මම අලුත් බෑග් එකක් ගත්තා.

සචින්ද - කෝ බලන්න. හොඳයි වගේ . ගාන කීය ද ?

සුරේශ් - ඔය ගහලා තියෙන්නේ. රුපියල් එක්දහස් පන්සීයක්.

සචින්ද - මේකෙ මිල වෙනස් කරලනෙ. උඩින් වෙන මිලක් අලවලානෙ.
ඔයා මුදලාලිගෙන් ඇහුවෙ නැද්ද ?

සුරේශ් - අනේ නෑ. මම බෑග් තෝරනකොටත් මට බැන්නා. විස්තර ඇහුවට කිව්වෙත් නෑ.

බුද්ධික - මම නම් ඔය වගේ භාණ්ඩ ගන්නෙ නෑ.
අපි ගෙවන මිලට අපට ඕනෑ භාණ්ඩ තෝරා ගන්න අපිට අයිතියක් තියෙනවා. අනිත් එක අපි ගන්න භාණ්ඩය ගැන විස්තර දැනගන්නත් අපිට අයිතියක් තියෙනවා.

- ඉහත කතාබහ තුළින් මතුවන පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ ව විමසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පාරිභෝගිකයා ගෙවන මිලට ප්‍රමාණවත් තෘප්තියක් ලබා දීම සහතික කිරීමට පාරිභෝගික අයිතිවාසිකම් ඇති බව
  - එම අයිතිවාසිකම් ජාත්‍යන්තර ව පිළිගත් අයිතිවාසිකම් බව
  - පාරිභෝගික අයිතිවාසිකම් මෙන් ම පාරිභෝගික වගකීම් ද ඇති බව හා
  - පාරිභෝගිකයා වගකීමෙන් කටයුතු කිරීමෙන් අයිතිවාසිකම් ආරක්ෂා කර ගත හැකි බව

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබා දීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය පාරිභෝගික ආරක්ෂණය වේ.

- පාරිභෝගික ආරක්ෂණය මෑත කාලයේ අතීතයටත් වඩා අවශ්‍ය වීමට බලපා ඇති හේතු කිහිපයක් පහත දැක්වේ.
  - වෙළෙඳපොළ තුළ භාණ්ඩ හා සේවා බහුල වීම
  - තරඟකාරිත්වය වැඩි වීම නිසා වෙළෙඳපොළ තුළ විෂමාචාර ඇති වීමට ඉඩ වැඩි වීම
  - නිදහස් වෙළෙඳාම සමඟ වෙළෙඳපොළ සංකීර්ණ වීම
  - ගෝලීයකරණය සමග ඇති විය හැකි සමාජ හා සංස්කෘතික පිරිහීම
  - පරිසරය දූෂණය වීම වැළැක්වීම සඳහා පාරිභෝගිකයින් දැනුවත් කිරීම අවශ්‍ය විම
- පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට අත් වන වාසි කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| | | දෙන්න නැත්නම් වෙන එකක් දෙන්න. |
| ව්‍යාපාරිකයා | : | විකුණූ භාණ්ඩ නැවත භාර ගන්නත් බෑ. මුදල් දෙන්නත් බෑ. |

**පාරිභෝගිකයාට** -

- ගෙවන මුදලට සරිලන වටිනාකමක් ලැබෙන භාණ්ඩ පාරිභෝජනයට අවස්ථාව ලැබීම
- වෙළෙඳ විෂමාචාරවලින් ආරක්ෂා වීම
- ගුණාත්මක භාණ්ඩ හා සේවා පාරිභෝජනය නිසා පාරිභෝගික සෞඛ්‍යය හා ආරක්ෂාව තහවුරු වීම
- අවශ්‍ය අවස්ථාවල දී පාරිභෝගික ආරක්ෂණය නිසා නීතිමය රැකවරණ ලබා ගත හැකි වීම
- පාරිභෝගිකයාට ජීවත් වීමට සුදුසු පරිසර තත්ත්වයන් උදා වීම

**ව්‍යාපාරිකයාට**

- ගුණාත්මක තත්ත්වයෙන් යුක්ත භාණ්ඩ සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම
- ව්‍යාපාරිකයාගේ පිරිවැටුම වැඩි වීම තුළින් ලාභය ඉහළ යාම
- ප්‍රමිතියකට අනුව නිෂ්පාදනය කිරීම නිසා අපතය අඩු වීම
- අයථාවත් තරඟ විරෝධී ක්‍රියා නො මැති වීමෙන් යහපත් ව්‍යාපාර පරිසරයක් ඇති වීම

- අන්තර්ජාතික වශයෙන් පිළිගත් පාරිභෝගික අයිතිවාසිකම් කිහිපයක් වර්තමානයේ ක්‍රියාත්මක වේ.

- ඇමරිකා එක්සත් ජනපදයයේ හිටපු ජනාධිපතිවරයෙකු වූ ජෝන් එෆ්. කෙනඩි විසින් පාරිභෝගික අයිතිවාසිකම් හතරක් ප්‍රකාශයට පත්කර ඇත.

  - ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය
  - තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය
  - තෝරා ගැනීමට ඇති අයිතිය
  - සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය

- මීට අමතර ව පාරිභෝගික ජාත්‍යන්තරය විසින් පහත සඳහන් පාරිභෝගික අයිතිවාසිකම් ප්‍රකාශයට පත්කර ඇත.

  - මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය
  - වන්දි ලබා ගැනීමට ඇති අයිතිය
  - පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය
  - සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත් වීමට ඇති අයිතිය

- ඉහත සඳහන් පාරිභෝගික අයිතිවාසිකම් අට අන්තර්ජාතික වශයෙන් පිළිගත් පාරිභෝගික අයිතිවාසිකම් වේ.

- පාරිභෝගික අයිතිවාසිකම් මෙන් ම පාරිභෝගික වගකීම් ද පාරිභෝගිකයා සතු වේ.
    - විචාරාත්මක දැනුවත්භාවය
    - සක්‍රීය සහභාගිත්වය
    - සමාජය ගැන සැලකිලිමත් වීම
    - පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම
    - සහයෝගීතාව

- දැනුවත්භාවකින් යුත් පාරිභෝගිකයා ගෙවන මුදලට සරිලන වටිනාකමකින් යුත්, ප්‍රමිතියෙන් ඉහළ භාණ්ඩ තෝරා ගැනීමට පෙළඹේ. එසේ ම වෙළෙඳ විෂමාචාර හා පාරිභෝගික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ ව අදාළ බලධාරීන් දැනුවත් කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරයි. තව ද, තමා ජීවත්වන පරිසරය ආරක්ෂා කර ගනිමින් , සමාජය පිළිබඳ සැලකිලිමත් වෙමින්, සහයෝගයන් කටයුතු කරමින්, තාර්කික පාරිභෝගිකයෙකු ලෙස වෙළෙඳපොළේ හැසිරෙයි.

**නිපුණතාව 3.0** : රජය සමග සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කර ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 3.6** : පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනවල කාර්යභාරය විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **05**

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන ලැයිස්තුගත කරයි.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු හා කාර්ය විස්තර කරයි.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු හා කාර්ය විස්තර කරයි.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය පෙන්වා දෙයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

- කල් ඉකුත් වීමේ දිනය ඉක්මවා ඇති/කල් ඉකුත් වීමේ දිනය සඳහන් නො වන, මිල වෙනස් කරන ලද හා ප්‍රමිති ලාංඡන සහිත (SLS ,ISO) භාණ්ඩ ඇසුරුම් කිහිපයක් පන්තියේ සිසුන්ට නිරීක්ෂණය කිරීමට ලබා දෙන්න.
- එම ඇසුරුම්වලින්, එම භාණ්ඩය පිළිබඳ ව පාරිභෝගිකයින්ට ලබා ගත හැකි තොරතුරු සිසුන්ගෙන් විමසන්න.
- එම ඇසුරුම්වල සඳහන් තොරතුරුවලින් උල්ලංඝනය වී ඇති පාරිභෝගික අයිතිවාසිකම් මොනවා දැයි විමසන්න.
  (තොරතුරු දැන ගැනීමේ අයිතිය, ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය )
- නිෂ්පාදකයින්/වෙළෙන්ඳන් විසින් සිදු කර ඇති වෙළෙඳ විෂමාචාර මොනවා දැයි විමසන්න.
  (මිල වෙනස් කර තිබීම, කල් ඉකුත් වීමේ දිනය ඉක්මවා ඇති භාණ්ඩ විකිණීම, කල් ඉකුත් වීමේ දිනය සඳහන් නො වීම)
- එවැනි වෙළෙඳ විෂමාචාර පිළිබඳ ව දැනුම් දිය හැකි ආයතන සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පාරිභෝගික ආරක්ෂාව සඳහා කටයුතු කරන ආයතන පවතින බව සාකච්ඡා කරන්න.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු හා කාර්යයන් හඳුන්වා දෙන්න.

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු හා කාර්යයන් පැහැදිලි කරන්න.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය සාකච්ඡා කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන කිහිපයක් පහත දැක්වේ.
    - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
    - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
    - මිණුම් ඒකක හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව
    - මධ්‍යම පරිසර අධිකාරිය
    - ප්‍රාදේශීය සෞඛ්‍යය වෛද්‍ය නිලධාරී කාර්යාලය
    - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා පිහිටුවා ඇත.

    - පාරිභෝගිකයින්ගේ ජීවිත හා දේපළවලට උපද්‍රවයක් සිදු වන භාණ්ඩ අලෙවිය හා සේවා සැපයීමට එරෙහි ව ඔවුන් ආරක්ෂා කිරීම
    - අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීම සහතික වීම
    - හැකි සෑම විට ම පාරිභෝගිකයින්ට තරගකාරී මිලට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබා දීමට සහතික වීම
    - අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදු කරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට සහනයක් ලබා දීම

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.
    - ව්‍යවසායන් අතර සීමාකාරී ගිවිසුම් පාලනය කිරීම හෝ ඉවත් කිරීම
    - වෙළෙඳපොළ ඇතුළත හෝ වෙළෙඳපොළේ සැලකිය යුතු කොටසක දේශීය වෙළෙඳාමේ හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම නැති කිරීම
    - දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරඟකාරිත්වය පිළිබඳ අවහිරතා නැති කිරීම
    - තරඟ විරෝධී චර්යා හා ආධිපත්‍ය තත්ත්ව අනිසි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂා කිරීම
    - භාණ්ඩ හා සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරඟකාරිත්වය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම
    - භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබා ගැනීමට හැකි වීම සහ ඒවායෙහි තත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් හා සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ව්‍යාපාරවලට පහත සඳහන් ආකාරයෙන්

වැදගත් වේ.

- අධිකාරිය විසින් නියම කර ඇති ප්‍රමිතියට අනුව නිෂ්පාදනය, සැපයීම, ගබඩා කිරීම, ප්‍රවාහනය හා විකිණීම සිදු කිරීම නිසා නාස්තිය අවම වී ලාභය වර්ධනය වීම

- පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යොමු වීම නිසා පාරිභෝගික විශ්වාසය දිනා ගැනීමට හැකි වීම
- වෙළෙඳ විෂමාචාරවලින් වැළකී කටයුතු කිරීමෙන් ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වීම
- ව්‍යාපාරිකයාට මුහුණ දීමට සිදු වන නෛතික තතත්වයන් අවම වීම
- ව්‍යාපාර අතර ඇති වන අනවශ්‍ය තරඟකාරීත්වය අවම වීම
- ඒකාධිකාරී තත්ත්වයන් ඇති නො වීම නිසා සාධාරණ ව තරඟ කළ හැකි වීම

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු ඃ

    - නිෂ්පාදන ක්‍රියාවලිය හා සැකසීම පිළිබඳ ව ජාතික හා අන්තර්ජාතික පදනම මත ප්‍රමිති පිළියෙල කිරීම
    - කාර්මික හා වාණිජ ක්ෂේත්‍රවල ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා රසායනාගාර හා පුස්තකාල සේවා පිහිටුවා පවත්වා ගෙන යාම
    - දේශීය නිෂ්පාදිත මෙන් ම ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රමිතිවලට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම
    - ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලන කටයුතු සඳහා පර්යේෂණ පහසුකම් සැපයීම
    - ප්‍රමිති සහතික සලකුණු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
    - ජාත්‍යන්තර ප්‍රමිති ආයතන හා ඒ සමාන කටයුතුවල යෙදෙන සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම
    - අධ්‍යාපනය, උපදේශනය හා වෙනත් මාර්ගවලින් ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන කටයුතු දිරිගැන්වීම

- **ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යයන්**
    - ප්‍රමිති පිළියෙල කිරීම
    - ප්‍රමිති ක්‍රියාත්මක කිරීම
        - ස්වේච්ඡාවෙන්
        - SLS සහතික ලාංඡන ක්‍රමය මගින්
        - පූර්ව අපනයන පරීක්ෂාව මගින්
        - ආනයන පරීක්ෂාව මගින්
        - අපනයන පිළිබඳ පිළියෙල කළ මුහුදු ආහාර පරීක්ෂාව මගින්
    - ISO ප්‍රමිති ක්‍රියාත්මක කිරීම
    - ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම

- ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන ප්‍රවර්ධන කටයුතු
- උපකරණ ක්‍රමාංකන සේවා
- පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම
- පුස්තකාල සේවාව, දේශීය විදේශීය ප්‍රමිති අලෙවිය සහ තොරතුරු සේවා
- තත්ත්ව පද්ධති පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පහත සඳහන් ආකාරයෙන් ව්‍යාපාරවලට වැදගත් වේ.
  - SLS ලකුණ සහිත නිෂ්පාදිත අලෙවි කිරීම තුළින් තරඟකාරිත්වයට සාර්ථක ව මුහුණ දිය හැකි වීම
  - SLS ලකුණ නො මැති නිෂ්පාදන ආයතන අභිබවා නියම වශයෙන් වාසිදායක තත්ත්වයක් ලැබිය හැකි වීම
  - පාරිභෝගික පැමිණිලි අවම කර ගත හැකි වීම
  - රාජ්‍ය අංශය SLS සලකුණ සහිත භාණ්ඩ මිල දී ගැනීමට ප්‍රමුඛත්වයක් දෙන බැවින් වෙළෙඳපොළ කොටස පුළුල් කර ගත හැකි වීම
  - විදේශ සහතික කිරීමේ සලකුණු (ISO) ලබා ගැනීම තුළින් විදේශ වෙළෙඳපොළේ දී සාර්ථක වීමට ඉඩ ලැබීම
  - ප්‍රමිතීන් තුළ පාරිභෝගික අවශ්‍යතා හා නෛතික අවශ්‍යතා ඇතුළත් වන බැවින් නිෂ්පාදිත පිළිබඳ පිළිගත හැකි මට්ටම ඉහළ යාම
  - නාස්තිය අවම වී ඵලදායීතාව වර්ධනය වීම
  - ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වී සේවක චිත්ත ධෛර්ය වර්ධනය වීම

**නිපුණතාව 4 :** විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා විධිමත් ව ආරම්භ කර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 4.1 :** සංවිධාන සංකල්පය හඳුන්වා, හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව : 02**

**ඉගෙනුම් ඵල :**

- සංවිධානයක් යන්න හඳුන්වා නිදසුන් දක්වයි.
- විධිමත් සංවිධානයක දැකිය හැකි ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- ව්‍යාපාර සංවිධාන යන්න අර්ථ දක්වයි.
- ව්‍යාපාර සංවිධාන ඒවායේ හිමිකාරත්වය මත වර්ග කරයි.
- පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර සංවිධාන ලැයිස්තුගත කරයි.
- පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන ලැයිස්තුගත කරයි.
- හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කොට රූප සටහනකින් දක්වයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සිසුන් දන්නා සංවිධානවල නම් විමසන්න.
- ඒවා සංවිධාන ලෙස නම් කිරීමට හේතු විමසන්න.
- සංවිධානයක් යනු කුමක් දැයි නිවැරදි ව තහවුරු කර දෙන්න.

- පාසල විධිමත් සංවිධානයක් වන්නේ දැයි සිසුන්ගෙන් විමසන්න.
- පාසල විධිමත් සංවිධානයක් වන ආකාරය පැහැදිලි කර දෙන්න.
- පාසල අවට ඇති ව්‍යාපාර ඇසුරෙන් සංවිධානයක් යනු කුමක් දැයි තව දුරටත් තහවුරු කරන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

  - ඔබ පාසල අවට ඇති, ඔබට හුරු පුරුදු, ඔබ දන්නා ව්‍යාපාරවල නාම හැකිතාක් ලැයිස්තුගත කරන්න.
  - එම ව්‍යාපාර පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය යටතේ වර්ග කිරීමට

උත්සාහ ගන්න.
- සිසු අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්**

- පොදු අරමුණක් ඉටුකර ගැනීම සඳහා ඒකරාශී වී සිටින පුද්ගල කණ්ඩායමකින් සැදුම්ලත් සමාජ ඒකකයක් සංවිධානයක් වේ.
  නිදසුන් : පාසල, පන්සල, පල්ලිය, වෙළෙඳ සැල

- විධිමත් සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
  - අරමුණක් තිබීම
  - පුද්ගලයින් සිටීම
  - සංවිධාන ව්‍යුහයක් පැවතීම

- ලාභ ඉපයීම හෝ සමාජ සුභසාධනය අරමුණු කර ගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම හා අලෙවි කිරීමේ නිරත ව්‍යවසායන් ව්‍යාපාර සංවිධාන වේ.

- හිමිකාරත්වය මත පෞද්ගලික අංශයේ ව්‍යාපාර හා රාජ්‍ය අංශයේ ව්‍යාපාර වශයෙන් ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය කළ හැකි ය.
- හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය පහත පරිදි ගැලීම් සටහනකින් ඉදිරිපත් කළ හැකි ය.

**ව්‍යාපාර සංවිධාන**

- **පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන**
  - කේවල ස්වාමි ව්‍යාපාර
  - හවුල් ව්‍යාපාර
  - සංස්ථාපිත සමාගම්
  - සමුපකාර
- **රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන**
  - මධ්‍යම රජය යටතේ පවතින ව්‍යාපාර
    - දෙපාර්තමේන්තු
    - රාජ්‍ය සංස්ථා
    - රාජ්‍ය සමාගම්
  - පළාත් සභා යටතේ පවතින ව්‍යාපාර
  - පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාර

**නිපුණතාව 4 :** විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා විධිමත් ව ආරම්භ කර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 4.2 :** කේවල ස්වාමි ව්‍යාපාරවල ලක්ෂණ විමසමින් එම ව්‍යාපාර සංවිධානවල වාසි හා සීමා විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 04

**ඉගෙනුම් ඵල**

- කේවල ස්වාමි ව්‍යාපාර යන්න පැහැදිලි කරයි.
- කේවල ස්වාමි ව්‍යාපාරයක සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- කේවල ස්වාමි ව්‍යාපාරවල වාසි හා සීමා ලැයිස්තුගත කරයි.
- කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී බලපාන නීති රීති පැහැදිලි කරයි.
- කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය විස්තර කරයි.

**ඉගෙනුම් ආධාරක :**

- ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය
- ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා වූ ග්‍රාම නිලධාරී ඉල්ලුම් පත්‍රය

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය කළ ආකාරය පිළිබඳ ව පෙර දැනුම පිරික්සමින් පාඩමට පිවිසෙන්න.
- අවට පරිසරයේ වැඩි වශයෙන් දක්නට ඇති ව්‍යාපාර සංවිධාන වර්ග පිළිබඳ විමසන්න.
- එම ව්‍යාපාර සංවිධානවලින් වැඩි ප්‍රමාණයක අයිතිය තනි පුද්ගලයකු සතු වන බව ව්‍යාපාරයේ නමින් පැහැදිලි වන අයුරු පෙන්වා දෙන්න.
- එම ව්‍යාපාරයේ සිසුන් දකින ලක්ෂණ සාකච්ඡා කරමින් හුණු පුවරුවේ ලැයිස්තුගත කරන්න.
- හුණු පුවරුවේ ගොඩනගන ලද පිළිතුරු ඇසුරෙන් කේවල ස්වාමි ව්‍යාපාරයක් යනු කුමක් දැයි පැහැදිලි කර දෙන්න.
- කේවල ස්වාමි ව්‍යාපාරයක දැකිය හැකි විශේෂ ලක්ෂණ පෙන්වා දෙන්න.

- සිසුන් ලවා පහත තොරතුරු ගොනු කරවන්න.
    - කේවල ස්වාමි ව්‍යාපාරයක වාසි
    - කේවල ස්වාමි ව්‍යාපාරයක අවාසි

- සිසුන්ගේ අනාවරණ සැලකිල්ලට ගෙන කේවල ස්වාමි ව්‍යාපාරයක වාසි හා සීමා පෙන්වා දෙන්න.

- කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය පැහැදිලි කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- හිමිකාරත්වය තනි පුද්ගලයකු සතු වන ව්‍යාපාර කේවල ස්වාමි ව්‍යාපාර වේ.
  නිදසුන් : චනුලි සුපර් සෙන්ටර්
  දසත පොත් හල
  ඉමල්කා සැලුන්

- පහත සඳහන් විශේෂ ලක්ෂණ කේවල ස්වාමි ව්‍යාපාරවල දැකිය හැකි ය.
  - අයිතිකරු විසින් තනි ව ප්‍රාග්ධනය සපයා ගැනීම
  - කළමනාකරණ තීරණ ගනු ලබනුයේ අයිතිකරු විසින් වීම
  - අයිතිකරුගේ අසීමිත වගකීම
  - ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් නො මැති වීම
  - ලියාපදිංචිය අනිවාර්ය නො වීම
  - ලාභ හෝ අලාභ තනි ව භුක්ති විඳීම
  - අවදානමට තනි ව මුහුණ දීම
  - අඛණ්ඩ පැවැත්මක් නො මැති වීම
  - ගිණුම් තැබීම අනිවාර්ය නො වීම
  - ව්‍යාපාරය නමින් බදු ගෙවීමක් සිදු නො වීම

- කේවල ස්වාමි ව්‍යාපරවල දැකිය හැකි වාසි කිහිපයක් පහත දැක්වේ.
  - පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
  - සියලු ලාභ අයිතිකරු සතු වීම
  - ස්වාධීන තීරණ ගත හැකි වීම
  - බලපවත්වනු ලබන නීතිරීති හා රෙගුලාසි අවම වීම
  - ව්‍යාපාරික තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා වීම
  - ව්‍යාපාරය පහසුවෙන් අවසන් කළ හැකි වීම
  - ගනුදෙනුකරුවන් සමග ඍජු සම්බන්ධතා පවත්වාගත හැකි වීම
  - පාලනය පහසු වීම

- කේවල ස්වාමි ව්‍යාපාරවල දක්නට ඇති සීමා කිහිපයක් පහත දැක්වේ.
  - අයිතිකරුගේ අසීමිත වගකීම
  - ප්‍රාග්ධනය සපයා ගැනීමේ දී දුෂ්කරතා මතු වීම

- අයිතිකරු විසින් ම තීරණ ගනු ලබන නිසා ඒවා අසාර්ථක විය හැකි වීම
- නෛතික පුද්ගලභාවයක් නො මැති වීම
- අඛණ්ඩ පැවැත්මක් නො මැති වීම
- ව්‍යාපාරය පුළුල් වන විට කළමනාකරණය අපහසු වීම
- අලාභ තනි ව භුක්ති විඳීමට සිදු වීම

- කේවල ස්වාමි ව්‍යාපාරයක් එහි අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වා ගෙන යන්නේ නම් 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත පදනම් කොට ගෙන ව්‍යාපාරය අයත් පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය අනුව පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතු ය. ප්‍රායෝගික ව මෙම ලියාපදිංචිය අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සිදු කර ගත හැකි ය.

- එසේ ලියාපදිංචි කරන්නේ නම් පහත ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතු ය.
    - ව්‍යාපාරය ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කේවල ස්වාමි ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය ලබා ගැනීම

    - අදාළ ප්‍රදේශයේ (ග්‍රාම සේවා වසමේ) ග්‍රාම නිලධාරීගෙන් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා වූ වාර්තාව ලබා ගැනීම

    - ග්‍රාම නිලධාරි සහතික කළ වාර්තාව සහ සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රය ලියාපදිංචියට අදාළ ගාස්තු ද සමග ප්‍රාදේශීය ලේකම් වෙත භාර දීම

    - ප්‍රාදේශීය ලේකම් විසින් ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරු ව ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම

**නිපුණතාව 4 :** විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා විධිමත් ව ආරම්භ කර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 4.3 :** හවුල් ව්‍යාපාරයක ලක්ෂණ විමසමින් හවුල් ව්‍යාපාරවල වාසි හා සීමා විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 08

**ඉගෙනුම් ඵල :**

- හවුල් ආඥා පනතට අනුව හවුල් ව්‍යාපාරයක් යන්න අර්ථ දක්වයි.
- හවුල් ව්‍යාපාරයක සුවිශේෂී ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- හවුල් ගිවිසුම යන්න පැහැදිලි කරයි.
- හවුල් ගිවිසුමක් ඇති විය හැකි ආකාර විස්තර කරයි.
- හවුල් ඔප්පුවක වැදගත්කම අගයයි.
- හවුල් ඔප්පුවක සාමාන්‍යයෙන් ඇතුළත් වන කරුණු අනාවරණය කරයි.
- 1890 හවුල් ආඥා පනතේ 24 වැනි වගන්තියේ විධිවිධාන පැහැදිලි කරයි.
- හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරයි.
- හවුල් ව්‍යාපාරයක වාසි හා සීමා ලැයිස්තුගත කරයි.
- කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර තුලනාත්මක ව සසඳයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- කේවල ස්වාමි ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමේ දී ඔවුන් මුහුණ දෙන ගැටලු පිළිබඳ සිහිපත් කරන්න.
- ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සිසුන්ගෙන් විමසන්න.
- අලාභ තනි ව භුක්ති විඳීමට සිදු වීම, ප්‍රාග්ධනය වැඩි කර ගත නො හැකි වීම යන අවාසි සඳහා විසඳුම් ලෙස තවත් පුද්ගලයින් ව්‍යාපාරයට සම්බන්ධ කර ගත හැකි බව පෙන්වා දෙන්න.
- එවිට එම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් වන බව තහවුරු කරන්න.
- හවුල් ව්‍යාපාරයක් යනු කුමක් දැයි හවුල් ආඥාපනත අනුව නිර්වචනය කරන්න.

- හවුල් ව්‍යාපාරයක අනිවාර්යයෙන් ම තිබිය යුතු ලක්ෂණ පැහැදිලි කර දෙන්න.
- හවුල් ව්‍යාපාරයක සුවිශේෂ වූ ලක්ෂණ පැහැදිලි කරන්න.

- හවුල් ගිවිසුම හා හවුල් ඔප්පුව යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

- හවුල් ඔප්පුවක වැදගත්කම පෙන්වා දී සාමාන්‍යයෙන් හවුල් ඔප්පුවක ඇතුළත් වන කරුණු පෙන්වා දෙන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමේ යොදවන්න.

  - ඔබේ කණ්ඩායම හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන්නේ යැයි සිතන්න.
  - පහත මූලික තොරතුරු ඇතුළත් වන සේ එම හවුල් ව්‍යාපාරය සඳහා හවුල් ඔප්පුවක් සකස් කරන්න.

    - හවුල් ව්‍යාපාරය සඳහා නාමයක්
    - හවුල්කරුවන්ගේ නම් හා ලිපිනයන්
    - ප්‍රාග්ධනය යෙදීම පිළිබඳ විස්තර
    - ලාභාලාභ බෙදා ගන්නා ආකාරය
    - හවුල් ව්‍යාපාරයේ පරමාර්ථ
    - හවුල්කරුවන්ගේ ගැනිලි පිළිබඳ සීමා
    - ප්‍රාග්ධන පොළී හා ගැනිලි පොළී පිළිබඳ තොරතුරු
    - නව හවුල්කරුවෙකු බඳවා ගැනීම
    - සිටින හවුල්කරුවෙක් ඉවත් කිරීම
    - අමතර ප්‍රාග්ධනය යෙදීම සම්බන්ධ කොන්දේසි
    - හවුල් ව්‍යාපාරය අවසන් කිරීම පිළිබඳ කොන්දේසි

  - සිසු නිර්මාණ පන්තියට ඉදිරිපත් කරවන්න.

- එක් එක් කණ්ඩායමේ අනාවරණ ඇගැයීමකට ලක් කරන්න.

- ලිඛිත ගිවිසුමක් නො මැති විටක හෝ ගිවිසුමේ සඳහන් නොවූ කරුණක් සම්බන්ධයෙන් ගැටලුවක් මතු වූ අවස්ථාවක 1890 හවුල් ආඥා පනතේ 24 වැනි වගන්තියට අනුව කටයුතු කරන ආකාරය පැහැදිලි කරන්න.

- හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටියට සමාන බව පැහැදිලි කරන්න.

- ඉහත සාකච්ඡා කරන ලද හවුල් ව්‍යාපාරයක ලක්ෂණ ඇසුරෙන් සිසුන් පහත ක්‍රියාකාරකමේ යොදවන්න.

- දි ඇති නිර්ණායක අනුව කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර තුලනාත්මක ව සසඳන්න.

| | | |
|---|---|---|
| | | |
| | | |
| | | |
| නිර්ණායකය | කේවල ස්වාමි ව්‍යාපාර | හවුල් ව්‍යාපාර |
| 1. සාමාජික සංඛ්‍යාව | | |
| 2. ප්‍රාග්ධනය යෙදවීම | | |
| 3. පරිපාලනය | | |
| 4. වගකීම | | |
| 5. ලාභාලාභ භුක්ති විඳීම | | |
| 6. තීරණ ගැනීම | | |
| 7. ව්‍යාපාරය අවසන් කිරීම | | |

- හවුල් ව්‍යාපාරයක වාසි හා සීමා පැහැදිලි කරන්න.
- කේවල ස්වාමි ව්‍යාපාරයකට සාපේක්ෂව හවුල් ව්‍යාපාරයක වාසි සාකච්ඡා කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

- 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ හවුල් ව්‍යාපාරයක් පහත පරිදි නිර්වචනය කර ඇත.
    - ලාභ ඉපැයීමේ අරමුණින් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන පුද්ගලයින් අතර පවත්නා සම්බන්ධය හවුල් ව්‍යාපාරයක් වේ.

- ඉහත නිර්වචනයට අනුව හවුල් ව්‍යාපාරයක පහත ලක්ෂණ අනිවාර්යයෙන් ම තිබිය යුතු වේ.
    - ලාභ ලැබීමේ අරමුණක් තිබීම
    - ව්‍යාපාර කටයුත්තක් පැවතීම
    - පුද්ගලයින් සිටීම
    - අන්‍යොන්‍ය සම්බන්ධතාවක් (එකඟතාවක් ) තිබීම

  නිදසුන් : ගුණවර්ධන සහ පුත්‍රයෝ
  දොන් කරෝලිස් සහ පුත්‍රයෝ

- හවුල් ව්‍යාපාරයකට සුවිශේෂී වූ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
    - හවුල්කරුවන් අවම සංඛ්‍යාව දෙදෙනෙකු සිටිය යුතු අතර උපරිමය 20 ට සීමා වීම
    - හවුල්කරුවන් අතර ගිවිසුමක් පැවතිය යුතු වීම
    - ලාභ බෙදා ගැනීම සඳහා වූ යම් එකඟතාවක් දැකිය හැකි වීම
    - සෑම හවුල්කරුවෙකු ම තමාගේ හා සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු

හා ප්‍රධානියෙකු වශයෙන් සැලකීම (අන්‍යොන්‍ය නියෝජිතත්වය)
- කිසියම් ව්‍යාපාර කටයුත්තක් පැවතීම

- හවුල් ව්‍යාපාරයේ කටයුතු ආරම්භ කොට පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් හවුල්කරුවන් අතර ඇති කර ගනු ලබන එකඟතාව හවුල් ගිවිසුම ලෙස හඳුන්වයි.
- හවුල් ගිවිසුමක් වාචික ව, ලිඛිත ව හෝ ව්‍යංගයෙන් ඇති විය හැකි ය.
- හවුල්කරුවන් අතර ඇති කර ගන්නා ලිඛිත ගිවිසුම, හවුල් ඔප්පුව හෙවත් හවුල් ව්‍යවස්ථාවලිය ලෙස හඳුන්වයි.

- පහත කරුණු නිසා හවුල් ඔප්පුවක් වැදගත් වේ.
  - හවුල්කරුවන් අතර මතභේද හා ආරවුල් බොහෝ දුරට විසඳා ගත හැකි වීම
  - හවුල් ව්‍යාපාරයේ කටයුතු පවත්වා ගෙන යාමේ දී පහසුවක් වීම

- හවුල් ඔප්පුවක සාමාන්‍යයෙන් ඇතුළත් කරන කරුණු කිහිපයක් පහත දැක්වේ.
  - ව්‍යාපාරය පිළිබඳ මූලික තොරතුරු
    නිදසුන් : ව්‍යාපාරයේ නම, හවුල්කරුවන්ගේ නම් හා ලිපින, ව්‍යාපාරයේ ස්වභාවය, හවුල් ව්‍යාපාරයේ කාල සීමාව
  - ප්‍රාග්ධනය යෙදීම පිළිබඳ විස්තර
  - ලාභාලාභ බෙදා ගන්නා ආකාරය පිළිබඳ තොරතුරු
  - හවුල් ව්‍යාපාරයේ පරමාර්ථ
  - හවුල්කරුවන්ගේ ගැනිලි පිළිබඳ සීමා
  - ප්‍රාග්ධන පොළී හා ගැනිලි පොළී පිළිබඳ තොරතුරු
  - හවුල් ව්‍යාපාරය අවසන් කිරීම පිළිබඳ කොන්දේසි
  - අමතර ප්‍රාග්ධනය යෙදීම සම්බන්ධ කොන්දේසි
  - නව හවුල්කරුවෙකු බඳවා ගැනීමේ දී, සිටින හවුල්කරුවෙකු ඉවත් ව යාමේ දී, හවුල්කරුවෙකුගේ මරණයේ දී කටයුතු කරන ආකාරය

- හවුල් ව්‍යාපාරයක ලිඛිත ගිවිසුමක් නො මැති විටක හෝ ගිවිසුමේ සඳහන් නොවූ කරුණක් සම්බන්ධයෙන් ගැටලුවක් මතු වූ අවස්ථාවක 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර ව කටයුතු කළ යුතු වේ.

- හවුල් ආඥා පනතේ 24 වන වගන්තියේ පහත සඳහන් කරුණු ඇතුළත් වේ.
  - හවුල් ව්‍යාපාරයේ ලාභ හා අලාභ හවුල්කරුවන් සමාන ව බෙදා ගත යුතු අතර හවුල් ව්‍යාපාරය අවසන් කරන විට ප්‍රාග්ධනය සමාන ව බෙදා ගැනීමට හවුල්කරුවන්ට හිමිකමක් ඇත.
  - ව්‍යාපාරය වෙනුවෙන් හවුකරුවන් පෞද්ගලික ව දරන ලද වියදම් ව්‍යාපාරය විසින් ඔවුන්ට ආපසු ගෙවිය යුතු ය.
  - ගිවිසගත් ප්‍රාග්ධනයට අමතර ව හවුල්කරුවන් විසින් සපයා ඇති මුදල් සඳහා 5% ක වාර්ෂික පොළියක් හිමි වේ.
  - ප්‍රාග්ධනය වෙනුවෙන් පොළියක් කිසි ම හවුල්කරුවෙකුට හිමි නොවේ.
  - ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සඳහා සහභාගී වීමට සෑම හවුල්කරුවෙකුට ම අයිතිය ඇත.
  - කිසි ම හවුල්කරුවෙකුට තම සේවය වෙනුවෙන් වේතනයක් හවුල්

ව්‍යාපාරයෙන් ලැබිය නො හැකි ය.

- සියලු ම හවුල්කරුවන්ගේ කැමැත්ත නැති ව නව හවුල්කරුවෙකු බඳවා ගත නො හැකි ය.
- හවුල් ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් පැන නගින සාමාන්‍ය ගැටලුවක දී හවුල්කරුවන්ගේ වැඩි ඡන්දයෙන් තීරණයක් ගත හැකි අතර, හවුල් ව්‍යාපාර කටයුතුවල ස්වභාවය වෙනස් කෙරෙන කිසිවක් සියලු ම හවුල්කරුවන්ගේ කැමැත්තෙන් තොර ව කළ නො හැකි ය.
- හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත් ප්‍රධාන කාර්යාලයේ තැබිය යුතු අතර, ඕනෑ ම අවස්ථාවක දී ඒවා පරීක්ෂා කිරීමට, පිටපත් කර ගැනීමට සියලු ම හවුල්කරුවන්ට අවසර තිබිය යුතු ය.

- හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටියට සමාන වේ.

- හවුල් ව්‍යාපාරයක වාසි කිහිපයක් පහත දැක්වේ.
  - පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
  - පහසුවෙන් විසුරුවා හැරිය හැකි වීම
  - වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි වීම
  - කිහිපදෙනෙකුගේ හැකියා හා දක්ෂතා ඒකරාශී කර ගත හැකි වීම
  - වගකීම කිහිපදෙනෙකු අතර බෙදී යාම
  - සාමූහික වගකීම නිසා ඇති වන උනන්දුව හා කාර්යක්ෂමතාව

- හවුල් ව්‍යාපාරයක සීමා කිහිපයක් පහත දැක්වේ.
  - හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වීම
  - හවුල්කරුවන් අතර ඇති විය හැකි මතභේද හවුල් ව්‍යාපාරයට අහිතකර ලෙස බලපෑම
  - එක් හවුල්කරුවෙකුගේ ක්‍රියා කලාපය නිසා සියලු ම හවුල්කරුවන් වගකීමට බැඳීම
  - අඛණ්ඩ පැවැත්මක් නො මැති වීම

- කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර පහත පරිදි තුලනාත්මක ව සැසැඳිය හැකි ය.

| නිර්ණායකය | කේවල ස්වාමි ව්‍යාපාර | හවුල් ව්‍යාපාර |
|---|---|---|
| සාමාජික සංඛ්‍යාව | එක් පුද්ගලයෙකි | අවමය 2 යි, උපරිමය 20 |
| ප්‍රාග්ධනය යෙදවීම | අයිතිකරු විසින් යොදවයි | හවුල්කරුවන් විසින් යොදවයි |
| පරිපාලනය | අයිතිකරු විසින් සිදු කරයි | හවුල්කරුවන් විසින් සිදු කරයි |
| වගකීම | තනි ව වගකියයි | සාමූහික ව වගකියයි |
| ලාභපාඩු භුක්ති විඳීම | තනි ව භුක්ති විඳියි | හවුලේ භුක්ති විඳියි. |
| තීරණ ගැනීම | ස්වාධීන ව සිදු කරයි | සාමූහික ව තීරණ ගනියි. |
| විසුරුවා හැරීම | විසුරුවා හැරීමක් සිදු නොවේ. අභිමත පරිදි ව්‍යාපාරය අවසන් කළ හැකි ය. | ස්වේච්ඡාවෙන් හෝ අධිකරණය මගින් විසුරුවා හැරේ. |

**නිපුණතාව 4** : විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා විධිමත් ව ආරම්භ කර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 4.4** : විවිධ වර්ගයේ සංස්ථාපිත සමාගම් හා ඒවායේ සුවිශේෂ ලක්ෂණ සන්සන්දනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 10

**ඉගෙනුම් ඵල**

- සංස්ථාපිත සමාගම් අර්ථ දක්වයි.
- සංස්ථාපිත සමාගම්වල සුවිශේෂී ලක්ෂණ විස්තර කරයි.
- සීමාසහිත සමාගම්වල වාසි හා සීමා ලැයිස්තුගත කරයි.
- සමාගමක් සංස්ථාපනය කිරීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරයි.
- සමාගමක් ලියාපදිංචි කිරීමේ දී භාවිත වන ලියවිලි පැහැදිලි කරයි.
- සංස්ථාපිත සමාගම් වර්ග කරයි.
- එක් එක් සමාගම් වර්ගයේ ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- එක් එක් සමාගම් වර්ගය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- සංස්ථාපිත සමාගම් වර්ග සැසඳීමේ නිර්ණායක පැහැදිලි කරයි.
- නිර්ණායක පදනම් කරගෙන සංස්ථාපිත සමාගම් වර්ග සසඳයි.
- දෙන ලද ව්‍යාපාරවල නාමය අනුව එය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය නිවැරදි ව ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සංස්ථාපිත සමාගමක් යන්න උදාහරණ සහිත ව පැහැදිලි කර දෙන්න.
- සංස්ථාපිත සමාගම්වල සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කර දෙන්න.
- සමාගමක් සංස්ථාපනය කිරීමේ ක්‍රියාපටිපාටිය හා ඒ සඳහා අවශ්‍ය වන ලියවිලි පැහැදිලි කර දෙන්න.
- සංස්ථාපිත සමාගම් වර්ග කරන ආකාරය ගැලීම් සටහනක් ඇසුරෙන් පෙන්වා දෙන්න.
- එක් එක් සමාගම් වර්ගය හඳුන්වා, ඒවායේ සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න.

- සමාගම් වර්ග සැසැඳීමේ දී භාවිත කරන නිර්ණායක පෙන්වා දෙන්න.

- සිසුන්ට පහත මාතෘකා ලබා දෙන්න.

    - සීමිත පෞද්ගලික සමාගම්
    - සීමිත පොදු සමාගම්

- සමාගම් වර්ග සැසැඳීමේ නිර්ණායක භාවිත කර එම සමාගම් වර්ග දෙක සසඳන ලෙසට සිසුන්ට උපදෙස් දෙන්න.
- නිර්ණායක පදනම් කර ගෙන සීමිත පෞද්ගලික සමාගමක් හා සීමිත පොදු සමාගමක් සන්සන්දනය කළ හැකි ආකාරය සිසු ක්‍රියාකාරකම් ද සැලකිල්ලට ගෙන පැහැදිලි කර දෙන්න.

- සංස්ථාපිත සමාගම්වල සුවිශේෂ ලක්ෂණ ඇසුරෙන් සිසුන් පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.
    - ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සිසුන් 10 දෙනෙකු කණ්ඩායම් දෙකකට බෙදන්න.
    - " සංස්ථාපිත සමාගම්වල අවාසිවලට වඩා ඇත්තේ වාසි වේ." යන මාතෘකාව යටතේ විවාදයක් පැවැත්වීමට උපදෙස් දෙන්න.
    - එක් සිසුවෙකුට විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.
    - අනෙක් සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කර, විවාදය තුළින් මතු වන වාසි හා අවාසි ලැයිස්තුගත කිරීමට එම කණ්ඩායම් දෙකට පවරන්න.
    - අහඹු ලෙස මාතෘකාව තෝරා ගැනීමට අවස්ථාව ලබා දී විවාදය ආරම්භ කරන්න.
    - විවාදය අවසානයේ ලැයිස්තුගත කළ වාසි හා අවාසි පන්තියට ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.
    - සිසුන්ගේ ක්‍රියාකාරකම් ඇගැයීමට ලක් කර අඩුපාඩු සම්පූර්ණ කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද පුද්ගලයින්ගේ එකතුවක් සමාගමක් ලෙස හැඳින්විය හැකි ය.
  නිදසුන් : සී/ස අරලිය සමාගම
  සී/ස ප්‍රතිභා (පෞද්) සමාගම

- **සංස්ථාපිත සමාගම්වල සුවිශේෂී ලක්ෂණ කිහිපයක් පහත දක්වා ඇත.**

    - සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද ස්වාධීන ආයතනයක් වීම
    - සමාගමක් එහි සාමාජිකයන්ගෙන් වෙන් වූ නීතිමය ඒකකයක් වීම
    - අඛණ්ඩ පැවැත්මක් හෙවත් නිත්‍ය සන්තතික හැකියාව තිබීම
    - අයිතිකරුවන්ගේ වගකීම සීමාසහිත වීම
    - කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීම
    - කොටස් පැවරීමේ හැකියාව

- **සීමාසහිත සමාගම්වල වාසි කිහිපයක් පහත දැක්වේ.**
  - විශාල ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම
  - මහා පරිමාණ ව්‍යාපාර ආරම්භ කළ හැකි වීම
  - දක්ෂ කළමනාකරුවන් බඳවා ගෙන ව්‍යාපාර කටයුතු කර ගෙන යා හැකි වීම
  - කොටස්කරුවන්ගේ වගකීම සීමාසහිත වීම නිසා ආයෝජකයින් ආකර්ශනය කර ගත හැකි වීම
  - කොටස්කරුවකුගේ මරණය හෝ ඉවත් වීම ව්‍යාපාරයේ පැවැත්මට හානියක් නො වීම
  - ඉහළ මට්ටමක මානව සම්පත් ඒකරාශී කරගත හැකි වීම
  - ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් තිබීම

- **සීමාසහිත සමාගම්වල සීමා කිහිපයක් පහත දැක්වේ.**
  - නීතිමය බලපෑම දැඩි වීම
  - ආරම්භ කිරීමට සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කළ යුතු වීම හා ඒ සඳහා පිරිවැයක් දරිය යුතු වීම
  - කොටස් සංඛ්‍යාව මත ඡන්ද බලය හිමි වීම (one vote for one share) නිසා සුළු කොටස්කරුවන්ට වැඩි බලයක් හිමි නො වීම
  - සමාගමේ ලාභය මත මෙන් ම කොටස්කරුවන්ට හිමි වන ලාභාංශ මත ද බදු ගෙවීමට සිදු වීම නිසා ලාභ ද්විත්ව බදු ගණනයකට හසු වීම
  - විසුරුවා හැරීමක දී වුව ද සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට සිදු වීම

- සමාගමක් සංස්ථාපනය කිරීම අදාළ රටේ සමාගම් පනතට අනුව කළ යුතු අතර ශ්‍රී ලංකාවේ සමාගමක් සංස්ථාපනය කිරීම, 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත සිදු කළ යුතු ය.

- සමාගමක් සංස්ථාපනය කිරීමේ දී පහත සඳහන් ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතු වේ.
  - සමාගමේ නාමය ලියාපදිංචි කිරීම
  - සමාගමේ යෝජිත නාමය දැනට පවත්නා සමාගමක නාමයට අනුරූප නො වන හෝ සමාන නො වන බවට තීරණය වූ පසු, පහත ලියවිලි ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

    - සමාගම ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය
    - සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය
    - සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ක්‍රියා කිරීමට එක් එක් ආරම්භක


අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශය

- සමාගමේ ලේකම්වරයා ලෙස ක්‍රියා කිරීමට කැමති බවට ආරම්භක ලේකම්වරයාගේ ප්‍රකාශය

- සමාගමේ පරමාර්ථ, සමාගමේ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්, සමාගම් කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධ කරුණු ඇතුළත් කර සමාගම සංස්ථාගත කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්වයා වෙත යැවිය යුතු වැදගත් ම ලියවිල්ල සාංගමික ව්‍යවස්ථාවලිය වේ.

- අදාළ සියලු ලියවිලි නිවැරදි බවට තහවුරු වූ පසු හා නියමිත ගාස්තු ගෙවීමෙන් පසු සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සංස්ථාපන සහතිකය නිකුත් කරයි.

- 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව පහත සටහනේ දැක්වෙන සමාගම් වර්ග සංස්ථාගත කළ හැකි ය.




- ඉහත එක් එක් සමාගම් වර්ගයේ ලක්ෂණ පහත පරිදි ලැයිස්තුගත කළ හැකි ය.

**සීමා සහිත සමාගම්**

කොටස්කරුවන් මිල දී ගත් කොටස් වෙනුවෙන් ගෙවූ හෝ ගෙවීමට බැඳී සිටින වටිනාකමට පමණක් ඔවුන්ගේ වගකීම සීමා වන සමාගම් සීමාසහිත සමාගම් ලෙස හැඳින්විය හැකි ය. සීමාසහිත සමාගම් වර්ග තුනකි.

- **සී/ස පෞද්ගලික සමාගම්**

  කොටස් හෝ වෙනත් සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට අවසර නො මැති,

අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් හා උපරිම සංඛ්‍යාව 50 ක් වන සමාගම් සීමිත පෞද්ගලික සමාගම් ලෙස හැඳින්වේ.

- සීමාසහිත පෞද්ගලික සමාගමක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
    - අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් වන අතර උපරිම සංඛ්‍යාව 50 ක් වේ. මෙම උපරිම ප්‍රමාණයට සමාගමේ සේවකයින් වන කොටස්කරුවන් අයත් නොවේ.
    - අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව එකකි.
    - සමාගමේ කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කිරීම කළ නො හැකි ය.
    - ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරික්ෂණයකින් තොර ව සියලු ම කොටස්කරුවන්ගේ කැමැත්ත මත ලාභාංශ බෙදාහැරිය හැකි ය.

    - සීමාසහිත පෞද්ගලික සමාගම් සඳහා නිදසුන්
        - සීමා සහිත මධ්‍යම තැන්පතු ක්‍රම (පෞද්ගලික) සමාගම
        - Lanka Clear (Pvt) LTD
        - ශ්‍රී ලංකා විදුලි (පෞද්ගලික) සමාගම

- **සිමාසහිත පොදු සමාගම්**

  කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ මහජනයාට නිකුත් කිරීමට අවසර ඇති, අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් හා උපරිමය සීමාවක් නො මැති සමාගම් සීමිත පොදු සමාගම් ලෙස හැඳින්විය හැකි ය.

- සිමාසහිත පොදු සමාගමක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
    - අවම කොටස්කරුවන් සංඛ්‍යාව එක් අයෙකු වීම හා උපරිමය පිළිබඳ සීමාවක් නො මැති වීම
    - අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව දෙදෙනෙකු වීම
    - කොටස් හෝ වෙනත් සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි විම
    - කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් කළ යුතු වීම

**ලැයිස්තුගත පොදු සමාගම් (මිල කළ සමාගම්)**

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වූ පොදු සමාගම් මිල කළ (ලැයිස්තුගත) සමාගම් ලෙස හැඳින්වේ.

නිදසුන් ඃ DFCC bank PLC
සෙලින්කෝ පී එල් සී

**ලැයිස්තුගත නොවු සමාගම් (මිළ නො කළ සමාගම්)**

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නොවූ සමාගම් මිල ලැයිස්තුගත නොවූ සමාගම් ලෙස හැඳින්වේ.

නිදසුන් ඃ සිලෝන් බිස්කට් කම්පැනි ලිමිටඩ්
සිමාසහිත මැලිබන් බිස්කට් සමාගම

- **අක්වෙරළ සමාගම්**
  යම් රටක සමාගමක් ලෙස සංස්ථාපනය කර, එම රටින් පිටත ව්‍යාපාරික කටයුතු සිදු කරන සමාගම් අක්වෙරළ සමාගම් ලෙස හැඳින්වේ. එම සමාගම් ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන රටේ සමාගම් පනතට අනුව ද ලියාපදිංචි කළ යුතු වේ.

  නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ සමාගමක් සිංගප්පූරුවේ ව්‍යාපාරික කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ දී සංස්ථාපනය කිරීම හා සිංගප්පූරුවේ දී ලියාපදිංචි කර ව්‍යාපාරික කටයුතු කළ යුතු ය.

  නිදසුන් : සන්රෙකෝ මැරීන් සමාගම
  ඒෂියා ෆැසිපික් සමාගම

- **සීමාරහිත සමාගම් :**
  කොටස්කරුවන්ගේ වගකීම අසීමිත වන එනම් සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් පරිදි කොටස්කරුවන්ට නිකුත් කරන ලද කොටස්වල වටිනාකමට ඔවුන්ගේ වගකීම සීමා නො වන සමාගම් සීමා රහිත සමාගම් වේ.

- **ඇපයෙන් සීමිත සමාගම්**
  කොටස් නිකුත් කිරීමක් සිදු නො කරන, සාමාජිකයින්ගේ වගකීම සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් කර ඇති ඇප වටිනාකමට සීමා වන සමාගම් වේ.

  නිදසුන් : කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරු (ඇපකාර සමාගම)

- ඇපයෙන් සීමිත සමාගමක පහත සඳහන් ලක්ෂණ දක්නට ඇත.
  - කොටස් නිකුත් කිරීමක් සිදු නො කිරීම
  - සාංගමික ව්‍යවස්ථාවලියේ එක් එක් සාමාජිකයා විසින් සමාගම ඈවර කිරීමක දී දායක විය යුතු ප්‍රමාණය සඳහන් කළ යුතු වීම
  - අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකුවත් සිටිය යුතු වීම හා උපරිමය පිළිබඳ සීමාවක් නො වීම
  - පොදු පරමාර්ථ පෙරදැරි කර ගෙන ආරම්භ කිරීම
  - සමාගමේ ලාභ බෙදාහැරීමක් නො කිරීම

- **විදේශීය සමාගම්**
  - ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් පිහිටුවා ඇති නමුත් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කර ඇති සමාගමක් විදේශීය සමාගමක් වේ.

  - විදේශීය සමාගමක් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් ස්ථාපිත කර මසක් තුළ දී සමාගම පිළිබඳ විස්තරයක් ශ්‍රී ලංකාවේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

  - සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සමාගම පිළිබඳ ව පරීක්ෂා කර බලා එම විදේශීය සමාගම ලියාපදිංචි කළ විදේශීය සමාගමක් සේ විදේශීය සමාගම්

නිදසුන් : හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකින් කෝපරේෂන් (HSBC)

- එකිනෙක සමාගම් වර්ග සැසඳීමේ දී පහත දැක්වෙන නිර්ණායක යොදා ගනී.
    - සාමාජික සංඛ්‍යාව
    - වගකීම
    - ප්‍රාග්ධන සම්පාදනය
    - පරිපාලනය හා කළමනාකරණය

- නිර්ණායක පදනම් කර ගෙන සීමිත පෞද්ගලික සමාගමක් , සීමිත පොදු සමාගමක් සමග පහත පරිදි සැසඳිය හැකි ය.

| නිර්ණායකය | සීමිත පෞද්ගලික සමාගම් | සීමිත පොදු සමාගම් |
| --- | --- | --- |
| සාමාජික සංඛ්‍යාව | අවමය 01 උපරිමය 50 | අවමය 01 උපරිමය සීමාවක් නැත |
| වගකීම | මිල දී ගත් කොටස්වල වටිනාකමට සීමා වේ. | මිල දී ගත් කොටස්වල වටිනාකමට සීමා වේ. |
| ප්‍රාග්ධන සම්පාදනය | ප්‍රසිද්ධියේ මහජනතාවට කොටස් හෝ සුරැකුම්පත් නිකුත් කළ නො හැකි ය. | ප්‍රසිද්ධියේ මහජනයාට කොටස් හෝ සුරැකුම්පත් නිකුත් කළ හැකි ය. |
| පරිපාලනය හා කළමනාකරණය | අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදු වේ. අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව 01 කි. | අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදු වේ. අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව 02 කි. |

**තක්සේරුකරණය හා ඇගැයීම :**

- සිසුන් පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- පාසලට එන අතරතුර දි හමු වන ව්‍යාපාරවල නාම හැකිතාක් ලියන ලෙසට සිසුන්ට දන්වන්න. (පෙර දිනක දි දන්වා තිබීම පහසුවක් වේ. )
- ව්‍යාපාර නාමය අනුව එම ව්‍යාපාර අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය උපකල්පනය කරන ලෙසට දන්වන්න.
- ව්‍යාපාරවල නාමය අනුව එය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය ප්‍රකාශ කළ හැකි බව නිදසුන් ඇසුරෙන් පෙන්වා දෙන්න.

**නිපුණතාව 4** : විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා විධිමත් ව ආරම්භ කර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 4.5** : සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂ ලක්ෂණ විමසමින් එහි ප්‍රවණතා විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් ඵල :**

- සමුපකාර ව්‍යාපාරය අර්ථ දක්වයි.
- සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂ ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- සමුපකාර ප්‍රතිපත්ති අනාවරණය කරයි.
- සමුපකාර ව්‍යාපාරයේ වාසි හා සීමා ලැයිස්තුගත කරයි.
- සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරයි.
- සමුපකාර ව්‍යාපාරයේ ප්‍රවණතා ලැයිස්තුගත කරයි.
- සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය සඳහා යෝජනා ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පෙර සාකච්ඡා කළ ව්‍යාපාර සංවිධාන වර්ග පිළිබඳ දැනුම පිරික්සමින් පෞද්ගලික අංශයේ බොහෝ ව්‍යාපාරවල මූලික අරමුණ
විමසන්න.
- සිසුන්ගේ පිළිතුරු ඇසුරෙන් ලාභ අරමුණු කර නො ගත් ව්‍යාපාර ද පවතින බව මතුකර ගෙන ඒවාට උදාහරණ විමසන්න.
- සිසුන්ගේ පිළිතුරු ඇසුරෙන් සමුපකාර ව්‍යාපාර ද පෞද්ගලික අංශයේ ලාභ අරමුණු කර නො ගත් ව්‍යාපාර සංවිධාන බව මතු කර ගන්න.
- ජාත්‍යන්තර සමුපකාර සංවිධානය විසින් සමුපකාර ව්‍යාපාරය හඳුන්වා දී ඇති ආකාරය පැහැදිලි කර දෙන්න.

☞

- සමුපකාර ව්‍යාපාරය සඳහා ප්‍රදේශයේ ඇති සමුපකාර සමිති ඇසුරෙන් නිදසුන් කිහිපයක් ඉදිරිපත් කරන්න.
- සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කර දෙන්න.

☞

- සමුපකාර ප්‍රතිපත්ති පැහැදිලි කර දෙන්න.

☞

- සමුපකාර ව්‍යාපාරය පිළිබඳ මෙතෙක් ලබාගත් දැනුම උපයෝගී කර ගෙන එහි වාසි හා සීමා සිසුන්ගෙන් විමසා ඒවා හුණු පුවරුවේ ලියන්න.

☞

- සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය පැහැදිලි කර දෙන්න.

☞

- සමුපකාර ව්‍යාපාරයේ ප්‍රවණතා සාකච්ඡා කරන්න.
- ඒ සඳහා නිදසුන් සිසුන්ගෙන් විමසන්න.

- සිසුන් පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

> - ඔබ ප්‍රදේශයේ විවිධ ක්ෂේත්‍රවල ඇති සමුපකාර ව්‍යාපාර ලැයිස්තුවක් ලියන්න.
> - එම සමුපකාර ව්‍යාපාරවලින් සැපයෙන භාණ්ඩ හෝ සේවා හඳුනාගෙන ලියන්න.
> - එම ව්‍යාපාරවල උන්නතිය සඳහා යෝජනා ඉදිරිපත් කරන්න.

- සිසුන්ගේ පිළිතුරු ඇගැයීමට ලක් කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ජාත්‍යන්තර සමුපකාර සංවිධානය, සමුපකාර ව්‍යාපාරය පහත පරිදි හඳුන්වා දී ඇත.

  " සිය ආර්ථික, සාමාජීය හා සංස්කෘතික ම ය අවශ්‍යතා හා අපේක්ෂා ඉටු කර ගැනීම උදෙසා ස්වේච්ඡාවෙන් එක්සත් වූ පුද්ගලයින්ගේ ස්වාධීන සංගමයක් මෙන් ම, සාමූහික අයිතිය සහිත ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පාලනය වන ව්‍යාපාරයකි."

  නිදසුන් :
  - සීමාසහිත මහරගම විවිධ සේවා සමුපකාර සමිතිය
  - සීමාසහිත පේෂකාර්මිකයින්ගේ සමුපකාර සමිතිය
  - සීමාසහිත ධීවර සමුපකාර සමිතිය

- සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂී ලක්ෂණ පහත දැක්වේ.
  - ස්වාධීන සංවිධානයක් වීම
  - ස්වේඡාවෙන් එක් වූ පුද්ගල සමූහයක් සිටීම
  - සාමාජිකයින්ගේ සාමූහික අයිතිය
  - පොදු අවශ්‍යතා හා අපේක්ෂාවලින් යුතු වීම
  - ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහිත ව්‍යාපාරයක් වීම
  - කොටස්වල අගය වෙනස් නොවී පැවතීම (කොටසක අගය රු. 100)
  - එක් සාමාජිකයෙකුට එක් ඡන්දයක් පමණක් හිමිවීම (one man one vote)
  - උපයන අතිරික්තය සාමාජිකයා සමිතිය සමග කළ ගනුදෙනුවල වටිනාකම අනුව සාමාජිකයින්ට ලබා දීම
  - ලාභය මූලික අරමුණ නො වීම

- 1995 මැන්චෙස්ටර් සමුළු සංවිධානය විසින් සමුපකාර ප්‍රතිපත්ති පහත පරිදි ප්‍රකාශ කර තිබේ.
    - ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය
    - ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය
    - සාමාජික ආර්ථික සහභාගිත්වය
    - ස්වෛරීභාවය හා නිදහස
    - සමුපකාර අධ්‍යාපනය පුහුණුව හා තොරතුරු ලබා දීම
    - ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමුපකාර සමිති අතර සහයෝගීතාව
    - සමාජය පිළිබඳ සැලකිලිමත් වීම

- සමුපකාර ව්‍යාපාරයේ වාසි කිහිපයක් පහත දැක්වේ.
    - සමුපකාර සමිතියක් ඇරඹීම පහසු වීම, 10 දෙනෙකු එකතු වී පහසුවෙන් හා අඩු මුදලකින් ඇරඹිය හැකි වීම
    - ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම
    - අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සාධාරණ මිලට සැපයීම
    - විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාරික කටයුතු කළ හැකි වීම
    - අන්‍යෝන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීම
    - සමිතිය උපයන අතිරික්තය සාමාජිකයින් සතු කිරීම හෙවත් අනුග්‍රාහක ප්‍රතිලාභ ගෙවීම

- සමුපකාර ව්‍යාපාරයේ සීමා කිහිපයක් පහත දැක්වේ.
    - මූල්‍ය සම්පාදන මාර්ග සීමිත වීම
    - සමුපකාර ප්‍රතිපත්ති මත ම පිහිටා කටයුතු කිරීමට සිදු වීම
    - සීමිත කාලයක් පමණක් විවෘත ව පැවතීම
    - රාජ්‍ය අංශයේ මැදිහත් වීම සිදු වීම
    - ණයට භාණ්ඩ අලෙවි කිරීමක් සිදු නො වීම
    - කළමනාකරණ මණ්ඩලය ඡන්දයෙන් තෝරා පත්වන නිසා බොහෝ විට කාර්යක්ෂම නො වීම

- සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය පහත දැක්වේ.

    - ශ්‍රී ලංකාවේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම, 1972 අංක 5 දරණ සමුපකාර සමිති පනත යටතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ, සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා මගින් අදාළ පළාත් සභාවේ සමුපකාර සංවර්ධන කොමසාරිස් යටතේ සිදු කෙරේ.

    - සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ දී වයස අවුරුදු 18 ට වැඩි ඕනෑ ම පුද්ගලයින් 10 දෙනෙකු විසින් පහත දැක්වෙන ලියවිලි සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

        - අයදුම් පත්‍රය
        - අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක්
        - යෝජිත ආර්ථික කටයුතුවල යෝග්‍යතාව දැක්වෙන වාර්තාවක්
        - සමුපකාර සමිතිය ලියාපදිංචිය සඳහා වූ යෝජනාව සම්මත වූ මහ සභා රැස්වීමේ වාර්තාව
        - ඉල්ලුම් පත්‍රයට අත්සන් තැබූ සාමාජිකයින් සාමාජික ගාස්තු ගෙවන ලද බවටත්, එකී මුදල් කාරක සභාවේ භාරකාරිත්වයෙහි පවතින බවටත් කාරක සභාවේ සහතිකයක්
        - සමිතිය පිහිටි ලිපිනයට ළඟා විය හැකි මාර්ගය දක්වන සටහනක්

    - ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ ලියවිලි සමුපකාර පනතට අනුකූල බව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා පරීක්ෂා කිරීමෙන් අනතුරු ව ලියාපදිංචි සහතිකය නිකුත් කෙරේ.

- සමුපකාර ව්‍යාපාරයේ ප්‍රවණතා කිහිපයක් පහත පරිදි දැක්විය හැකි ය.

    - ස්වයංසේවා වෙළෙඳසැල් ආරම්භ හා වෙළෙඳසැල් නවීකරණය කිරීම
      නිදසුන් : කෝප් සිටි, කෝප් සුපර්

    - නව ව්‍යාපාර ක්ෂේත්‍රවලට පිවිසීම
      නිදසුන් : සමුපකාර රක්ෂණය, ඉන්ධන පිරවුම්හල්

    - ජංගම වෙළෙඳපොළවල් ඇරඹීම

    - විද්‍යුත් ගෙවීමේ ක්‍රම භාවිත කිරීම

- සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය සඳහා යෝජනා කිහිපයක් පහත පරිදි දැක්විය හැකි ය.

        - සමුපකාර විවෘත ව තබන වේලාවන් දීර්ඝ කිරීම
        - ණයට භාණ්ඩ අලෙවි කිරීම සම්බන්ධ ව අවධානය යොමු කිරීම
        - කළමනාකරණ මණ්ඩලය සඳහා දක්ෂ පළපුරුදු, කාර්යක්ෂම පිරිසක් තෝරා ගැනීම
        - විවිධ ප්‍රවර්ධන උපක්‍රම භාවිත කිරීම
        - ස්වයංසේවා වෙළෙඳසැල් තවදුරටත් ව්‍යාප්ත කිරීම
        - පාරිභෝගික ආකර්ෂණය සඳහා වෙළෙඳසැල දර්ශනීය ලෙස සකස් කිරීම
        - සාමාජික ප්‍රතිලාභ වැඩි කිරීම
        - නව සාමාජිකයන් බඳවා ගැනීමට වැඩපිළිවෙලක් සැකසීම
        - පාරිභෝගික සේවා සැපයීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම භාවිත කිරීම

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | **4** | : | විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා විධිමත් ව ආරම්භ කර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි. |
| **නිපුණතා මට්ටම 4.6** | | : | විශේෂිත ව්‍යාපාරවල සුවිශේෂ ලක්ෂණ විමසමින් ඒවායේ වාසි හා සීමා විමර්ශනය කරයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | | : | 08 |

**ඉගෙනුම් ඵල** :

- වරලත් ව්‍යාපාර හඳුන්වයි.
- වරලත් ව්‍යාපාරයකට සම්බන්ධ පාර්ශ්ව පෙන්වා දෙයි.
- වරලත්හිමියා හා වරලත්ලාභියා අතර පවත්නා අන්තර් සම්බන්ධතාව විස්තර කරයි.
- වරලත්හිමියා වරලත්ලාභියාට සපයන පහසුකම් ලැයිස්තුගත කරයි.
- වරලත් ව්‍යාපාර වර්ග කරයි.
- වරලත් ව්‍යාපාරවල වාසි හා සීමා පෙන්වා දෙයි.
- වරලත් ව්‍යාපාර සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- ව්‍යාපාර සංයෝජනය වන ආකාරය පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- වරලත් ව්‍යාපාර යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

☞

- වරලත් ව්‍යාපාරයකට සම්බන්ධ වන පාර්ශ්ව හඳුන්වා දෙන්න.

☞

- වරලත්හිමියා හා වරලත්ලාභියා අතර පවත්නා සම්බන්ධතාව වරලත් ගිවිසුම ඇසුරෙන් පෙන්වන්න.

☞

- වරලත්හිමියා විසින් වරලත්ලාභියාට සපයන පහසුකම් හා වරලත්ලාභියා විසින් ඉටු කළ යුතු කාර්යයන් පැහැදිලි කරන්න.

☞

- වරලත් ව්‍යාපාර වර්ග කර උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

☞

- වරලත් ව්‍යාපාර ක්‍රමයේ වාසි හා සීමා වරලත්ලාභියාට හා වරලත්හිමියාට ලෙස වෙන් වෙන් ව පැහැදිලි කරන්න.

- ව්‍යාපාර සංයෝජන යනු මොනවා දැයි හඳුන්වන්න.
- ව්‍යාපාර සංයෝජනය වන ආකාර උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

පහත දැක්වෙන්නේ ව්‍යාපාර සංයෝජන සම්බන්ධ සිද්ධීන් තුනකි.

**සිද්ධිය 1**

- මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතන දෙකක් වන " සීමා සහිත සිංහ ෆිනෑන්ස් සමාගම" සහ " සීමා සහිත කාශ්‍යප ෆිනෑන්ස් සමාගම " ඒකාබද්ධ ව "සීමාසහිත කාශ්‍යප සිංහ ෆිනෑන්ස් "නමින් නවත ම සමාගමක් ඇරඹීමට සැලසුම් කර ඇත.

**සිද්ධිය 2**

- "රන්රස සමාගම" ජෑම් හා කෝඩියල් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පෙළේ ශක්තිමත් ආයතනයකි. එම ආයතනය ව්‍යාපාර ක්ෂේත්‍රයට නවකයකු වූ " අජන්ත ග්ලාස් මැනුෆැක්චරීස් " නැමති වීදුරු බෝතල් නිෂ්පාදන ආයතනය මිල දී ගැනීමට සැලසුම් කර ඇත.

**සිද්ධිය 3**

- වෘත්තීය පුහුණු ආයතනයක ස්වයං රැකියා පාඨමාලාවක් හැදෑරූ සුරූපිකා හා වයනිකා ධෛර්යමත් ව්‍යවසායිකාවන් දෙදෙනෙකි. සුරූපිකා " සුරූපා" නාමය යටතේ කාන්තා පාවහන් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යන අතර, වයනිකා " මිල්කා" නමින් යෝගට් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යයි. නුදුරු අනාගතයේ දී දෙදෙනා එක් ව වඩාත් ශක්තිමත් ව්‍යාපාරයක් ලෙස " සමගි ප්‍රඩක්ට්ස් " නමින් නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

    - ඔබේ කණ්ඩායමට ලැබුණු සිද්ධිය හොඳින් අධ්‍යයනය කරන්න.
    - එම සිද්ධියේ සඳහන් ව්‍යාපාර සංයෝජන ක්‍රමය කුමක්දැයි හඳුනා ගන්න.
    - ඔබ හඳුනාගත් ව්‍යාපාර සංයෝජන ක්‍රමය මගින් අත්කර ගත හැකි ප්‍රතිලාභ ලැයිස්තුගත කරන්න.
    - සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කරවන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් ඃ**

- වරලත් ව්‍යාපාර - Franchises

  කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සපයන ව්‍යාපාර ආයතනයක්, එම භාණ්ඩය හෝ සේවාව නිශ්චිත වෙළෙඳපොළ ප්‍රදේශයක අලෙවි කිරීමට තවත් ව්‍යාපාර ආයතනයකට අවස්ථාව ලබා දෙයි නම්, එම ව්‍යාපාර සංවිධාන ක්‍රමය වරලත් ව්‍යාපාර (Franchises ) ලෙස හඳුන්වයි.

- වරලත් ව්‍යාපාරයකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව දෙකක් දැකිය හැකි ය.

  - වරලත්හිමියා (Franchiser) - වරලත් සමාගමේ වෙළෙඳ නාමය යටතේ භාණ්ඩ විකිණීමට වෙනත් ව්‍යාපාරවලට අවසර දෙන වරලත් සමාගම

  - වරලත්ලාභියා (Franchisee) - වරලත් සමාගමෙන් අවසර ලබාගත් ආයතනය

නිදසුන් ඃ

| වරලත්හිමියා | වරලත්ලාභියා |
|---|---|
| Mc Donalds | සී/ස අබාන්ස් රෙස්ටුරන්ස් (පෞද්.) සමාගම |
| KFC | කාර්ගිල්ස් සිලෝන් ලිමිටඩ් |
| pitzza hut | ගැමා පීසාක්‍රාෆ්ට් ලංකා (පෞද්.) සමාගම |

- වරලත් ව්‍යාපාර ආරම්භ කිරීමේ දී වරලත්ලාභියා හා වරලත්හිමියා අතර ඇති වන ගිවිසුම වරලත් ගිවිසුම (Franchise Agreement) වේ.

- මෙම ගිවිසුම යටතේ වරලත්හිමියාගේ ව්‍යාපාර නාමය, වෙළෙඳ ලකුණ සහ ලාංඡනය භාවිත කිරීමට වරලත්ලාභියාට අවසර ලැබෙන අතර, ගිවිසුම තුළ ව්‍යාපාරය පවත්වා ගෙන යාමට අදාළ නීතිරීති, වරලත්හිමියා විසින් සපයන සේවා සහ මූල්‍ය කොන්දේසි, වරලත්ලාභියා විසින් ගෙවිය යුතු මූලික ගාස්තුව හා මාසික ව ගෙවිය යුතු පුරස්කාර සඳහන් වේ.

- වරලත් ගිවිසුම අනුව වරලත්හිමියා විසින් වරලත්ලාභියාට පහත පහසුකම් සපයයි.
  - සිය වෙළෙඳ නාමය භාවිතයට අවසර දීම
  - කළමනාකරණ පුහුණුව ලබා දීම
  - අලෙවිකරණ සහාය ලබා දීම
  - මූල්‍ය පහසුකම් ලබා දීම
  - වෙළෙඳසැලේ නිමාව සකස් කර දීම
  - නිෂ්පාදිතය හෙවත් භාණ්ඩ හා උපකරණ සැපයීම
  - ශිල්පීය ඥානය ලබා දීම

- වරලත් ගිවිසුම අනුව වරලත්ලාභියා විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කළ යුතු වේ.
    - වරලත්හිමියා පනවන කොන්දේසි අනුව කටයුතු කිරීමට එකඟ වීම
    - ප්‍රාග්ධනය ආයෝජනය කිරීම
    - වරලත්හිමියාගෙන් හෝ ඔහු විසින් නිර්දේශ කරන ලද සැපයුම්කරුවන්ගෙන් පමණක් භාණ්ඩ මිල දී ගැනීම
    - වරලත්හිමියාට ගිවිසගත් පරිදි ගාස්තු ගෙවීම

- වරලත් ව්‍යාපාර පහත පරිදි වර්ග කළ හැකි ය.

    - නිෂ්පාදිත වරලත් ව්‍යාපාර ( Product Franchises )
    - නිෂ්පාදන වරලත් ව්‍යාපාර ( Manufacturing Franchises )
    - ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර (Business Format Franchises )

**නිෂ්පාදිත වරලත් ව්‍යාපාර**

වරලත්හිමියාගේ වෙළෙඳ ලකුණු සහිත භාණ්ඩ ඔහුගෙන් මිලට ගෙන නැවත විකිණීමට වරලත්ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර නිෂ්පාදිත වරලත් ව්‍යාපාර වේ.

නිදසුන් : බණිජ තෙල් විකිණීමේ අලෙවිසැල්
( IOC ඉන්ධන පිරවුම්හල් )

**නිෂ්පාදන වරලත් ව්‍යාපාර**

වරලත්හිමියාගේ වෙළෙඳ ලකුණු යටතේ භාණ්ඩ නිෂ්පාදනය කර බෙදාහැරීමට වරලත්ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර නිෂ්පාදන වරලත් ව්‍යාපාර වේ.

නිදසුන් : කොකා කෝලා, පෙප්සිකෝලා, වැනි සිසිල් බීම බෝතල් කිරීම හා බෙදාහැරීම සිදු කරන ආයතන

**ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර**

වරලත්හිමියාගේ නමින් හා ක්‍රමය යටතේ ව්‍යාපාරය පවත්වා ගෙන යාමට වරලත්ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර වේ.

නිදසුන් : Mc Donalds . KFC, Pittza Hut වැනි නිෂ්පාදිත ආහාර සපයන වෙළෙඳ ආයතන

- වරලත් ව්‍යාපාර ක්‍රමයේ වාසි කිහිපයක් පහත දැක්වේ.

    **වරලත්හිමියාට**

    - ඔහුගේ ම ආයෝජනයකින් තොර ව ව්‍යාපාරය පුළුල් කිරීමට හැකියාව ලැබීම
    - ප්‍රචාරණ වියදම් වරලත්ලාභියා සමග බෙදාගත හැකි වීම
    - වරලත්ලාභියාගේ ආයෝජනයෙන් ප්‍රතිලාභ ලැබිය හැකි වීම
    - වරලත්ලාභියාගේ කාර්යක්ෂමතාව මත නිරායාසයෙන් ම ප්‍රතිලාභ ලැබිය හැකි වීම
    - වරලත්ලාභියා මගින් පෝෂණය වීම

වරලත්ලාභියාට

- වරලත්හිමියාගේ කීර්තිනාමය මත විශාල වෙළෙඳපොළක් ලබා ගත හැකි වීම
- අසාර්ථක වීමේ ප්‍රවණතාව අඩු වීම
- ජනප්‍රිය වෙළෙඳනාම නිසා ප්‍රචාරණය පහසු වීම
- වරලත්හිමියාගේ කළමනාකරණ පුහුණුව ලැබීම
- වරලත්හිමියාගේ මූල්‍ය පහසුකම් ලැබීම
- අමුද්‍රව්‍ය අවම මිලකට ලබා ගත හැකි වීම

- වරලත් ව්‍යාපාරවල සීමා කිහිපයක් පහත දැක්වේ.

**වරලත්හිමියාට**

- වරලත්ලාභීන් අසාර්ථක වීමෙන් මොහුට ද ලාභ අඩු විය හැකි වීම
- වරලත්ලාභියාගේ අහිතකර ක්‍රියාකලාප වරලත්හිමියාගේ කීර්තිනාමය කෙරෙහි බලපෑ හැකි වීම
- වරලත්ලාභීන් උපයන ලාභයෙන් වැඩි කොටසක් ඔවුන් විසින් ම රඳවා ගැනීම

වරලත්ලාභියාට

- වරලත්හිමියාගේ පාලනයක් ඇති නිසා වරලත්ලාභියාට පූර්ණ ස්වාධීනත්වයක් හිමි නොවීම
- වරලත් ව්‍යාපාර ක්‍රමය ලබා ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වීම
- ලාභය පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් පැවතිය හැකි වීම
- වරලත්හිමියාගේ කීර්තිනාමය මත රැඳෙන නිසා ආයෝජන පිළිබඳ අවදානමක් පැවතීම
- වරලත් ගිවිසුමට අනුව කටයුතු කිරීමට සිදු වන නිසා වරලත්ලාභියා දැඩි පීඩනයකට හසු වීම

- **ව්‍යාපාර සංයෝජන** (Business Combinations )

- ව්‍යාපාර සංයෝජනය වී කටයුතු කිරීම ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රවණතාවකි.
- සමාගම් දෙකක් හෝ කිහිපයක් එකට එකතු වී කටයුතු කිරීම ව්‍යාපාර සංයෝජනය ලෙස හැඳින්විය හැකි ය.

- ව්‍යාපාර සංයෝජනය වීම දෙයාකාරයකින් සිදු කළ හැකි ය.
  - ඒකාබද්ධ වීම (Mergers /Amalgamation)
  - අත්පත් කර ගැනීම (Acquisition )

**ඒකාබද්ධ වීම**

- ඒකාබද්ධවීමක දී වෙන් වෙන් ව පැවති සමාගම් දෙකක් හෝ කිහිපයක් තනි ව්‍යාපාරයක් බවට පරිවර්ථනය වේ.
- එය එක් සමාගමක් අනෙක් සමාගමේ වත්කම් හා වගකීම් මිලට ගැනීමෙන් හෝ සංයෝජනය වන සමාගම්වල පැවති ව්‍යාපාර කටයුතු නිම කර ඒ අනුව නව සමාගමක් පිහිටුවීමෙන් කළ හැකි ය.

**අත්පත්කර ගැනීම**

- අත්පත්කර ගැනීමක දී එක් සමාගමක් විසින් අනෙක් සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් වැඩි ප්‍රමාණයක් මිලට ගැනීම සිදු වේ. කොටස් මිලට ගන්නා සමාගමට පාලන බලය හිමි වේ.

- ඒකාබද්ධ වීම් හෝ අත්පත් කර ගැනීම් මගින් සිදු වන සංයෝජන ප්‍රධාන ආකාර තුනක ට සිදු වේ.

    - තිරස් සංයෝජන (Horizontal combination)
    - සිරස් සංයෝජන (Vertical combination)
    - විෂම සංයෝජන (Conglomerate combination)

- එක සමාන ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින සමාගම් දෙකක් හෝ කිහිපයක් ඒකාබද්ධ වීම තිරස් සංයෝජන වේ.

  නිදසුන් :

    - සපත්තු නිෂ්පාදන ආයතන දෙකක් සංයෝජනය වීම
    - එම්බීඑස්එල් සේවිංග්ස් බැන්ක් ලිමිටඩ්, මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී හා එම්බීඑස්එල් ෆයිනෑන්ෂල් සර්විස් ලිමිටඩ් ඒකාබද්ධව 2015.01.01 සිට මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආරම්භ කිරීම
    - මෘදුකාංග සංවර්ධන ආයතනයක් වන මයික්‍රොසොෆ්ට් ආයතනය විසින් නොකියා (Nokia ) සමාගමේ පරිගණක මෘදුකාංග ඒකකය මිල දී ගැනීම
    - යූනියන් ඇෂුවරන්ස් ජෙනරල් සමාගම සහ ඒෂියන් එලායන්ස් ජෙනරල් සමාගම ඒකාබද්ධ වී "ෆෙයාෆාස්ට් ඉන්ෂුවරන්ස් සමාගම" නමින් 2017 පෙබරවාරි 28 දින සිට ව්‍යාපාර කටයුතු සිදු කිරීම
    - DFCC බැංකුව හා DFCC වර්ධන බැංකුව ඒකාබද්ධ වී DFCC Bank PLC ඇරඹීම

- කිසියම් නිෂ්පාදිතයක විවිධ අවස්ථාවල යෙදී සිටින සමාගම් කිහිපයක් ඒකාබද්ධ වීම සිරස් සංයෝජනය වේ.

  නිදසුන් :


    - සපත්තු නිෂ්පාදන සමාගමක්, හම් නිෂ්පාදනය කරන සමාගමක් හා සපත්තු අලෙවිකරණ සමාගමක්, සමග සංයෝජනය වීම

- එක සමාන නො වන වෙනස් වර්ගවල ව්‍යාපාර, සංයෝජනය වීම විෂම සංයෝජනය වේ.

  නිදසුන් :

    - සපත්තු නිෂ්පාදන සමාගමක්, බිස්කට් නිෂ්පාදන සමාගමක් සමග සංයෝජනය වීම

- ව්‍යාපාර සංයෝජනය වන ආකාරය පහත සටහනින් දැක්විය හැකි ය.




(1) සිරස් සංයෝජනය
(2) තිරස් සංයෝජනය
(3) විෂම සංයෝජනය

**නිපුණතාව 4 :** විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා විධිමත් ව ආරම්භ කර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 4.7 :** රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ විමසමින් එම ව්‍යාපාරවල වැදගත්කම පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 04

**ඉගෙනුම් ඵල :**

- ව්‍යාපාර කටයුතු රජය යටතේ පවත්වා ගෙන යාමට හේතු විමසයි.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග කරයි.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ විමසයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- රජය මගින් කර ගෙන යනු ලබන ව්‍යාපාර පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර යනු මොනවා දැයි පැහැදිලි කරන්න.
- පොදු අංශය මගින් ව්‍යාපාර පවත්වා ගෙන යාමට හේතු පැහැදිලි කරන්න.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග කර දක්වන්න.
- එක් එක් රාජ්‍ය අංශයේ ව්‍යාපාරවල ලක්ෂණ පෙන්වා දී නිදසුන් ඉදිරිපත් කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

- රජය හෝ පළාත් පාලන ආයතනයක් විසින් පවත්වා ගෙන යන හා පාලනය කෙරෙන සියලු ම ව්‍යාපාර රාජ්‍ය අංශයේ නැතහොත් පොදු අංශයේ ව්‍යාපාර ලෙස සැලකේ.

- පොදු අංශය මගින් ව්‍යාපාර පවත්වා ගෙන යනු ලබන්නේ පොදු ජනතාවගේ සුභසිද්ධිය උදෙසා ය.

- පහත සඳහන් හේතු මත රජය ව්‍යාපාර කටයුතු කර ගෙන යනු ලැබේ.

  - පෞද්ගලික අංශය විසින් අහිතකර ලෙස ලාභ ඉපයීම වැනි වෙළෙඳපොළ තත්ත්ව පාලනය කිරීමට
  - ඒකාධිකාරී ආයතන බිහි වීම වැළැක්වීමට
  - ජාතියේ ආරක්ෂාව වෙනුවෙන් පවතින යම් යම් ව්‍යාපාර ක්ෂේත්‍ර පවත්වා ගෙන යාමට
  - පොදු ජනතාවට සාධාරණ මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට
  - රජයේ සැලැස්මක් හා පාලනයක් යටතේ ව්‍යාපාර කටයුතු සිදු වන බැවින් සම්පත් නාස්තිය අවම කර ගැනීමට
  - ලාභ නො මැති, පෞද්ගලික අංශය අත නො ගසන වැදගත් මහා පරිමාණ සංවර්ධන යෝජනා ක්‍රම පවත්වා ගෙන යාමට

- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග පහත දැක්වේ.
    - රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල
    - රජයේ දෙපාර්තමේන්තු
    - රාජ්‍ය සමාගම්
    - පළාත් සභා හා පළාත් පාලන ආයතන යටතේ ඇති ව්‍යාපාර

- රාජ්‍ය සංස්ථාවක පහත ලක්ෂණ දැකිය හැකි ය .
    - විශේෂ හෝ පොදු පනතක් යටතේ සංස්ථාපනය කිරීම
    - නෛතික පුද්ගලභාවයක් හිමි වීම
    - පූර්ණ අයිතිය හෝ වැඩි අයිතියක් රජය සතු වීම
    - රජය විසින් පත් කරන අධ්‍යක්ෂ මණ්ඩලයකින් පාලනය කිරීම
    - රාජ්‍ය ණය, ලාභාංශ ප්‍රති ආයෝජන, මහජනතාව ණය ප්‍රාග්ධනයට දායක කර ගැනීම ආදියෙන් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීම
    - අවම මිලකට ජනතාවට කාර්යක්ෂම සේවාවක් සැපයීම ප්‍රධාන අරමුණ වීම

    නිදසුන් ඃ
        - ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
        - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
        - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
        - ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව

- රාජ්‍ය සංස්ථා මණ්ඩල, අධිකාරිය, ආයතනය, සභාව, කාර්යාංශය ආදී විවිධ නම්වලින් හැඳින්වේ.

- රාජ්‍ය දෙපාර්තමේන්තුවක පහත ලක්ෂණ දැකිය හැකි ය.
    - අමාත්‍යාංශයක් යටතේ රජයේ ඍජු පාලනයට යටත් වීම
    - ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි ආදී රජයේ ප්‍රතිපත්තිවලට අනුව ම කටයුතු කළ යුතු වීම
    - බොහෝ විට සේවා සැපයීමේ නිරත ආයතන වීම
    - දෙපාර්තමේන්තුවක් නීතිය ඉදිරියේ පුද්ගලයෙකු වශයෙන් පිළිනොගන්නා නමුත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල නාමයෙන් නීතිය ඉදිරියේ පෙනී සිටිය යුතු වීම
    - රජයේ වාර්ෂික අයවැය ලේඛනය මගින් අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කිරීම

    නිදසුන් ඃ
        - අධ්‍යාපන දෙපාර්තමේන්තුව
        - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
        - සෞඛ්‍යය දෙපාර්තමේන්තුව
        - දුම්රිය දෙපාර්තමේන්තුව

- රාජ්‍ය සමාගමක පහත ලක්ෂණ දැකිය හැකි ය.

  - සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇති සීමිත පොදු සමාගමක් වීම
  - සමාගමේ මුළු ප්‍රාග්ධනයෙන් 51% ට වඩා වැඩි ප්‍රමාණයක් රජය හෝ රජයේ ආයතන සතු වීම

    නිදසුන් :
    - ශ්‍රී ලංකා රක්ෂණ සමාගම
    - සීමාසහිත ලංකා පොස්පේට් සමාගම
    - ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම
    - සී/ස ලිට්‍රෝ ගෑස් සමාගම
    - State Trading Company

- පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාරවල පහත ලක්ෂණ පවතී.

  - පළාත් සභා, නගර සභා, ප්‍රාදේශීය සභා යටතේ පවත්වා ගෙන යාම
  - අයිතිය ඒ ඒ පළාත් පාලන ආයතනයට හිමි වීම
  - අවශ්‍ය අරමුදල් පළාත් පාලන ආයතන විසින් හෝ මධ්‍යම රජයෙන් සපයනු ලැබීම
  - පරිපාලනය පළාත් පාලන අධිකාරීන් විසින් සිදු කිරීම

**නිපුණතාව 5** : සමාජ, ආර්ථික හා පුද්ගල සංවර්ධනය සඳහා ව්‍යවසායකත්වයෙහි දායකත්වය අගයයි.

**නිපුණතා මට්ටම 5.1** : ව්‍යවසායකත්වයේ වැදගත්කම හා ප්‍රතිලාභ අධ්‍යයනයෙන් ව්‍යවසායකයෙකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- පිළිගත් නිර්වචන අධ්‍යයනයෙන් ව්‍යවසායකත්වය සඳහා අර්ථකථනයක් ගොඩ නගයි.
- ව්‍යවසායකත්වයේ වැදගත්කම අගයයි.
- ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර සම්බන්ධතාව පැහැදිලි කරයි.
- ව්‍යවසායකත්වයෙන් ලැබෙන පුද්ගල, ආයතනික, සමාජ හා ආර්ථික ප්‍රතිලාභ ලැයිස්තුගත කරයි.
- තෝරාගත් ව්‍යවසායක් සැලකිල්ලට ගෙන, ඉන් ව්‍යවසායකයාට, ආයතනයට, සමාජයට හා ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ වෙන් වෙන් ව ගොනු කරයි.
- ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පහත සඳහන් ප්‍රකාශ පන්තියේ සිසුන්ට ඉදිරිපත් කරන්න.

    - " ගයාන් තම පියා විසින් පවත්වා ගෙන ගිය සිල්ලර වෙළෙඳසැල සුපිරි වෙළෙඳසැලක් බවට පරිවර්තනය කර පවත්වා ගෙන යයි."
    - " සුජීව ඩෙංගු රෝගය මර්ධනය සඳහා තමන්ගේ ම වට්ටෝරුවක් අනුව ශාඛසාර ඖෂධයක් නිපදවා වෙළෙඳපොළට ඉදිරිපත් කර ඇත."
    - " නාලක අලාභ ලබමින් ධාවනය කළ බස් රථයක් බද්දට ගෙන නව අංග එක්කර එම මාර්ගයේ ම ධාවනය කරයි.

- ඉහත ප්‍රකාශවල සඳහන් පුද්ගලයින් තුළ ඇති විශේෂ ලක්ෂණ සිසුන්ගෙන් විමසන්න.

- නවීකරණය කිරීම, නව්‍යතා සම්පාදනය කිරීම, අවදානම් කළමනාකරණය කිරීම යන ලක්ෂණ එම පුද්ගලයින් තුළ පවතින බව සාකච්ඡාවක් තුළින් මතුකර ගන්න.

- එවැනි ලක්ෂණ ව්‍යවසායකත්ව සංකල්පය තුළ අන්තර්ගත විය යුතු බවත් , ව්‍යවසායකත්වය සම්බන්ධව විවිධ පුද්ගලයින් විසින් විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇති බවත් පැහැදිලි කරන්න.

- එකී නිර්වචන ඇසුරෙන් සිසුන් ලවා පොදු අර්ථකථනයක් ගොඩනගන්න.

- ව්‍යවසායකත්වයේ වැදගත්කම පැහැදිලි කරන්න.

- ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න.

- ඔබ ප්‍රදේශයේ සිටින ව්‍යවසායකයෙකු සැලකිල්ලට ගෙන ඔහුගෙන්
    - ව්‍යවසායකයාට,
    - සමාජයට
    - ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ සිසුන්ගෙන් විමසමින් සාකච්ඡා කරන්න.
- ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න.
- ව්‍යවසායකත්වයේ ප්‍රවණතා පැහැදිලි කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යවසායකත්වය පිළිබඳ ව ඉදිරිපත් කර ඇති නිර්වචන කිහිපයක් පහත දැක්වේ.
    - "අවස්ථාවක් උදාකර ගෙන ඉන් ප්‍රයෝජන ගැනීමට සංවිධානයක් නිර්මාණය කරන්නා ව්‍යවසායකයෙකි. අවස්ථා උදාකර ගෙන ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධාන නිර්මාණය කිරීමේ දී සම්බන්ධ වන සියලු කටයුතු සහ කාර්ය ව්‍යවසායකත්ව ක්‍රියවලියට ඇතුළත් වේ."

      විලියම් ඩී. බයිග්‍රේව්

    - "නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීමෙන් හෝ නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් හෝ නව අමුද්‍රව්‍ය භාවිත කිරීමෙන් හෝ පවත්නා අර්ථ ක්‍රමය වෙනස් කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි."

      ජෝෂප් ෂුම් පීටර්

    - "ප්‍රාග්ධනය හා ශ්‍රමය අතර අතරමැදියෙකු ලෙස කටයුතු කිරීම ව්‍යවසායකත්වයයි.

      ඔක්ස්පර්ඩ් ශබ්දකෝෂය "

    - අවිනිශ්චිතතාවලට මුහුණ දීම ව්‍යවසායකත්වයයි.

      රිචඩ් නැන්ටිනට්

    - "නව ව්‍යාපාරයක් දියත් කොට සාර්ථක ව පවත්වාගෙන යාමට ඇති හැකියාව ව්‍යවසායකත්වයයි."

      අන්තර්ජාතික කම්කරු සංවිධානය

- ඉහත නිර්වචන ඇසුරෙන් ව්‍යවසායකත්වය පිළිබඳ ව අර්ථකථනයක් පහත පරිදි ගොඩනගා ගත හැකි ය.

  පරිසර අවස්ථා නිර්මාණශීලී ව උකහා ගනිමින්, අවදානමක් දරා නවෝත්පාදන බිහි කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි.

  හෝ

  මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුනා ගෙන ඒවා තෘප්තිමත් කිරීම සඳහා ව්‍යාපාර අවස්ථා මතු කරමින් අවදානම් කළමනාකරණය කරමින් කෙරෙන නව්‍යතා සම්පාදන ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි.

**ව්‍යවසායකත්වයේ වැදගත්කම**

- වේගයෙන් වෙනස් වන ලෝකයේ වෙනස්වීම්වලට ප්‍රතික්‍රියා දැක්විය හැකි, නව්‍යතා සෙවිය හැකි ව්‍යවසායකයින්ගේ දැඩි අවශ්‍යතාවක් පැවතීම
- තරගකාරී ව්‍යාපාරික ලෝකය තුළ රැඳී සිටීම සඳහා නවෝත්පාදන බිහි කිරීමේ අවශ්‍යතාව පැවතීම
- වෙනස් වන ලෝකයට නායකත්වය දිය හැක්කේ ව්‍යවසායකයින්ට බැවින් සෑම සංවිධානයකට ම ව්‍යවසායකයින් අවශ්‍ය වීම
- පුද්ගල අවශ්‍යතා හා වුවමනා උසස් මට්ටමින් තෘප්තිමත් කිරීම තුළින් ජීවන තත්වය උසස් කිරීම සඳහා නවෝත්පාදන බිහි කිරීමේ අවශ්‍යතාව පැවතීම
- දිනෙන් දින වෙනස් වන නව තාක්ෂණය හමුවේ ව්‍යාපාර කටයුතු දියුණු කර ගැනීමේ අවශ්‍යතාව
- නව ව්‍යාපාර ඇරඹීම හරහා රැකියා නිර්මාණය කළ හැකි වීම

**ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර ඇති සම්බන්ධතාව**

මිනිස් අවශ්‍යතා හා වුවමනා හඳුනා ගෙන ඒවා තෘප්තිමත් කිරීම සඳහා අවදානම් කළමනාකරණය හා නව්‍යතා සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වය ලෙස හැඳින්වේ.

මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම හා ඊට අනුබද්ධ කටයුතු ව්‍යාපාර ලෙස පුළුල් ව විග්‍රහ කළ හැකි ය.

මේ අනුව ව්‍යවසායකත්වය තුළින් ද, ව්‍යාපාර විසින් ද මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිපදවීම හා ඒ ආශ්‍රිත සේවාවල නිරත වේ. නමුත් ව්‍යාපාරවලට සාපේක්ෂව ව්‍යවසායකත්වය විසින් ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම, අවදානම් කළමනාකරණය හා නව්‍යතා සම්පාදනය යන කටයුතුවල ද නිරත වේ.

මේ අනුව සියලු ව්‍යවසාය ව්‍යාපාර වන අතර සියලු ව්‍යාපාර ව්‍යවසායන් නො වන බව ද පැහැදිලි වේ.

එසේ ම ව්‍යවසායකත්වයේ අවසාන ප්‍රතිඵලය ව්‍යාපාර ලෙස හැඳින්විය හැකි ය.

**ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ**

ව්‍යවසායකත්වය තුළින් පුද්ගල, ආයතනික, සමාජ හා ආර්ථික ප්‍රතිලාභ අත් වේ.
නිදසුන් ඃ

- **පුද්ගල ප්‍රතිලාභ**
    - පුද්ගල හැකියාවලින් ප්‍රයෝජන ගැනීමට ඉඩ ප්‍රස්ථා ලැබීම
    - ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකි වීම
    - සමාජ තත්වය හා පිළිගැනීම ඇති වීම
    - ආත්ම තෘප්තිය ලැබීම
    - පෞද්ගලික මූල්‍යමය ලාභ ලැබීම

- **ආයතනික ප්‍රතිලාභ**
    - තරඟකාරිත්වයට මුහුණ දීමට පහසු වීම
    - ව්‍යාපාර කටයුතු පුළුල් වීම
    - අඛණ්ඩ ව වර්ධනය වීම
    - වෙළෙඳපොළ කොටස පුළුල් වීම
    - කර්මාන්තය තුළ විශිෂ්ඨයින් බවට පත්වීම

- **සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ**
    - නව රැකියා අවස්ථා උත්පාදනය වීම
    - ආදායම් අවස්ථා බිහි වීම
    - නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා උදා වීම
    - ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාම
    - ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම
    - නව වෙළෙඳපොළවල් සංවර්ධනය වීම

**ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය**

- ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව පහත දැක්වෙන කරුණු මගින් පැහැදිලි කළ හැකි ය.

    - ව්‍යවසායකත්වය නිසා නව්‍යතා බිහි වීමෙන් ජාතික නිෂ්පාදිතය ඉහළ යාම
    - නව රැකියා අවස්ථා බිහි වීමෙන් සේවා නියුක්ති මට්ටම ඉහළ යාම
    - නව රැකියා සම්පාදනයෙන් ආර්ථික සංවර්ධනය වේගවත් වීම

නව රැකියා අවස්ථා → ආදායම් මට්ටම ඉහළ යාම → ක්‍රය ශක්තිය ඉහළ යාම

← භාණ්ඩ ඉල්ලුම වැඩි වීම ← නිෂ්පාදනය වැඩි වීම ↑

- වෙළෙඳපොළ කටයුතු පුළුල්වීමත්, නව තරඟකාරී වෙළෙඳපොළවල් බිහිවීමත් මගින් ආර්ථික සංවර්ධනය ඉහළ යාම
- ප්‍රාදේශීය සම්පත් භාවිතයට ගැනීමෙන් ඒවාට ඉහළ ඉල්ලුමක් ඇති වීම
- නව ව්‍යාපාර බිහි වීම නිසා ආර්ථික සංවර්ධනය ඇති වීම

**ව්‍යවසායකත්වයේ ප්‍රවණතා**

- ගෝලීය ව්‍යවසායකත්වය - (Global Entrepreneurship)
- සමාජයීය ව්‍යවසායකත්වය - (Social Entrepreneurship)
- හරිත ව්‍යවසායකත්වය - (Green Entrepreneurship)
- අභ්‍යන්තර ව්‍යවසායකත්වය - (Intra Entrepreneurship)

**ගෝලීය ව්‍යවසායකත්වය**

ගෝලීය වශයෙන් වෙළෙඳාමේ යෙදීමයි. එනම්, ලෝකයේ කුමන ස්ථානයක සිටිය ද, තාක්ෂණය භාවිතයෙන් ලෝකයේ වෙනත් ඕනෑ ම රටක් හෝ ස්ථානයක් සමඟ සන්නිවේදනයේ යෙදී දේශ සීමා මායිම්වලින් බැහැර ව කටයුතු කිරීමේ හැකියාවයි. එක් ස්ථානයක සිට ලෝකය පුරා තමාගේ නිෂ්පාදන සාර්ථක ව බෙදා හැරීම සඳහා ඒ ඒ රටවල පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන එම අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට තම නිෂ්පාදිත ලබා දීම ගෝලීය වශයෙන් ව්‍යවසායකත්වයේ ඵල නෙලා ගැනීම යි.

මෙහි දී අනෙකුත් සංස්කෘතීන් පිළිබඳ ව දැන සිටීම ඉතා අත්‍යවශ්‍ය කරුණක් වේ. මේ සඳහා වෙනත් රටවල් සමග, ජාතීන් සමග හොඳ සම්බන්ධතා පවත්වා ගැනීම අවශ්‍ය වේ. ජාතීන් අතර, සංස්කෘතීන් අතර පවතින වෙනස්කම් හඳුනාගැනීම මඟින් අවස්ථා සම්පාදනය කර ගැනීම සිදු වේ.

**සමාජීය ව්‍යවසායකත්වය**

සමාජීය මෙහෙවරක් කිරීමේ චේතනාවෙන් සමාජීය ගැටලුවලට පිළියම් යෙදීමට නවෝත්පාදනයේ යෙදීම මින් අදහස් කෙරේ. මානසික තෘප්තිය, පිළිගැනීම, ප්‍රසංසාව, පරෝකාරය යනා දී ප්‍රතිලාභ සමාජීය ව්‍යවසායකත්වය තුළින් අපේක්ෂා කෙරේ. සමාජීය ව්‍යවසායකයින්ගේ අරමුණ වන්නේ ලෝකය යහපත් ස්ථානයක් බවට පත් කිරීමයි.

**හරිත ව්‍යවසායකත්වය**

හරිත ව්‍යවසායකත්වය යනු පාරිසරික හා සමාජීය ගැටලු හෝ අවශ්‍යතා සඳහා ඉතා ඉහළ අවදානමකින් යුතු ව ස්වභාවික පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කිරීමට ව්‍යාවසායකත්ව අදහස් මගින් දැනුවත් භාවයකින් යුතු ව කරනු ලබන ක්‍රියාකාරකම් ය.

හරිත ව්‍යවසායකයින් පරිසරය සුරැකීම ඔවුන් ගේ හර සංකල්පය ලෙස සලකයි. පරිසර ගැටලුවලට ඉතා සංවේදී අය වේ. මෙම ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර කටයුතුවලින් ස්වභාවික පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කරයි.

**අභ්‍යන්තර ව්‍යවසායකත්වය**

සංවිධානවල විවිධ තනතුරුවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයින් එම ආයතනවල නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රමවල වෙනස්කම් සිදු කරයි. ඉහළ කළමනාකරුවන් එම නිර්මාණශීලී කටයුතු කිරීම සඳහා එවැනි පුද්ගලයන් දිරිගන්වයි. මෙසේ සංවිධානයක වෙනස්කම් හඳුන්වා දෙන, ආයතනයක් තුළ ක්‍රියාත්මක වන ව්‍යවසායකත්වය අභ්‍යන්තර ව්‍යවසායකත්වය ලෙස හැඳින්වේ.

**නිපුණතාව 5** : සමාජ, ආර්ථික හා පුද්ගල සංවර්ධනය සඳහා ව්‍යවසායකත්වයෙහි දායකත්වය අගයයි.

**නිපුණතා මට්ටම 5.2** : ව්‍යවසායකත්ව ක්‍රියාවලිය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- ව්‍යවසායකත්වය ක්‍රියාවලියක් බව තහවුරු කරයි.
- ව්‍යවසායකත්ව ක්‍රියාවලිය හඳුන්වයි.
- ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර පෙළගස්වයි.
- ව්‍යවසායකත්ව ක්‍රියාවලිය රූප සටහනකින් දක්වයි.
- ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ එක් එක් පියවර විස්තර කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පරිසර අධ්‍යයනය තුළින් ව්‍යාපාරිකයෙකුට අවස්ථා මතු කර ගත හැකි ආකාරය පිළිබඳ පෙර දැනුම සිහිපත් කරන්න.
- ව්‍යවසායකයෙකු එම අවස්ථා යථාර්ථයක් බවට පත් කර ගැනීමට පියවරෙන් පියවර කටයුතු කරන බව පවසන්න.
- ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර තහවුරු කිරීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සිසුවෙකු ලවා පහත කථාව පන්තියට කියවීමට සලස්වන්න.

"පුංචි කාලේ අපේ අම්මා හැමදා ම අපට පලා වර්ගයක් කන්න දෙනවා. ඒත් දැන් ඉන්න අම්මලාගේ කාර්ය බහුලත්වය නිසා දරුවන්ට දෙන්න පලා වර්ග වවන්න, හදන්න, කපන්න වේලාවක් නැහැ. මම මේකට විසඳුමක් සැහෙන කාලයක් තිස්සේ කල්පනා කළා. තොරතුරු එකතු කළා. පර්යේෂණ කළා. ඒ කැපවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සකස් කළ පලා පැකට් වෙළෙඳපොළට ගෙන එන්න මම සැලසුම් කළා. කාබනික පොහොර යොදා මගේ ම ඉඩමක වගා කළ පලා වර්ග ගෙන ඒවා කපලා සකස් කරලා සෞඛ්‍යාරක්ෂිත ව පැකට් කරලා වෙළෙඳපොළට ඉදිරිපත් කළා. මට ගොඩක් බාධක ආවා. නමුත් මම සැලුනේ නැහැ. අද මම ඉතා සාර්ථක ව මගේ ව්‍යාපාරය කරනවා. "

- මෙම කතාවේ ඇතුළත් වන ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.
  - ඔබේ කණ්ඩායම නව නිෂ්පාදිතයක් නිපදවීමට අදහස් කරන්නේ යැයි සිතන්න.
  - ඔබ කණ්ඩායම නිපදවීමට අදහස් කළ නිෂ්පාදිතය හඳුන්වන්න.
  - එම නිෂ්පාදිතය පිළිබඳ අදහස මතුකර ගත් ආකාරය පැහැදිලි කරන්න
  - ඔබට එම නිෂ්පාදිතය නිපදවීමට අවශ්‍ය සම්පත් ලැයිස්තුවක් ලියන්න.
  - එම සම්පත් සපයා ගන්නා ආකාරය සාකච්ඡා කරන්න.
  - ඔබ එම අදහස යථාර්ථයක් බවට පත්කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.
  - ඉහත ව්‍යාපාර අදහස ක්‍රියාවට නැංවීමෙන් ඔබ අපේක්ෂා කරන ප්‍රතිලාභ මොනවා ද ?

- සිසු නිර්මාණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.

- ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙලින් දක්වා එක් එක් පියවර කෙටියෙන් පැහැදිලි කර දෙන්න.


**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාරික අවස්ථා උදාකර ගැනීමත්, ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධාන නිර්මාණය කිරීමත් යනා දී කටයුතුවල දී සිදු කරන්නට යෙදෙන සියලු ම ක්‍රියාවන් ව්‍යවසායකත්ව ක්‍රියාවලිය ලෙස හැඳින්වේ.

- ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර පහත දැක්වේ.

  - නව්‍යතා සොයා ගැනීම (Discovery)
  - සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම (Concept development & preparing business plan )
  - අවශ්‍ය සම්පත් සම්පාදනය (Resourcing )
  - යථාර්ථයක් බවට පත් කිරීම (Actualization )
  - ප්‍රතිලාභ ලැබීම ( Harvesting )

ව්‍යවසායකත්ව ක්‍රියාවලිය පහත රූප සටහනින් ද දැක්විය හැකි ය.



**1 පියවර - නව්‍යතා සම්පාදනය**

ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ ප්‍රථම අදියරේ දී ව්‍යවසායකයා විසින් අදහස් ජනනය කර ගැනීමත්, පරිසර අධ්‍යයනය තුළින් අවස්ථා හඳුනා ගැනීමත්, වෙළෙඳපොළ අධ්‍යයනය කිරීමත් සිදු කරයි.

**2 පියවර - සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම**

මෙම අදියරේ දී ව්‍යාපාර සැලැස්මක් සකස් කෙරේ. එමගින් ව්‍යාපාර අදහස පැහැදිලි කෙරෙන විස්තරාත්මක වැඩපිළිවෙලක් ඉදිරිපත් කෙරේ.

**3 පියවර - අවශ්‍ය සම්පත් සම්පාදනය**

මෙම අදියරේ දී ව්‍යවසායකයා විසින් ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය, මානව සහ භෞතික සම්පත් හඳුනා ගන්නා අතර, ඒවා අත්කර ගැනීමට කටයුතු කරයි.

**4 පියවර - යථාර්ථයක් බවට පත් කිරීම**

මෙම අදියරේ දී ව්‍යවසායකයා ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සිදු කරන අතර,ව්‍යාපාර අරමුණු ඉටු කර ගැනීම සඳහා සම්පත් උපයෝගී කරගනී.

**5 පියවර - ප්‍රතිලාභ ලැබීම**

ව්‍යාපාරයේ අනාගත වර්ධනය හා සංවර්ධනය පිළිබඳ තීරණ ගැනීම ව්‍යවසායකයා සිදු කරන්නේ මෙම අදියරේ දී ය.

**නිපුණතාව 5** : සමාජ, ආර්ථික හා පුද්ගල සංවර්ධනය සඳහා ව්‍යවසායකත්වයෙහි දායකත්වය අගයයි.

**නිපුණතා මට්ටම 5.3** : ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා සංවර්ධනය කර ගනිමින් ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් ඵල** :

- ව්‍යවසායකයා යන්න හඳුන්වයි.
- ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස පැහැදිලි කරයි.
- ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා ලැයිස්තුගත කරයි.
- ව්‍යවසායකයින්ගේ චරිත කතා අධ්‍යයනයෙන් ඔවුන් තුළ දක්නට ඇති ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා මතුකර දක්වයි.
- සාර්ථක ව්‍යවසායකයෙකු වීම සඳහා ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතාවල වැදගත්කම පැහැදිලි කරයි.
- දෙන ලද තත්ත්වයක් තුළ ව්‍යවසායකත්ව ගති ලක්ෂණ ප්‍රදර්ශනය කරයි.
- ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා සංවර්ධනය කර ගත හැකි මාර්ග විමසයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ව්‍යවසායකයෙකු යනු කවරෙකු දැයි හඳුන්වා දීමට පහත ප්‍රකාශ සිසුන්ට ඉදිරිපත් කරන්න.

  **පළමුවන ප්‍රකාශය :**
  රූපිකා තම මව පවත්වා ගෙන ගිය රූපලාවන්‍යාගාරය නවීන පහසුකම්වලින් යුක්ත නව ගොඩනැගිල්ලක පවත්වා ගෙන යයි.

  **දෙවන ප්‍රකාශය**
  සංජය වකුගඩු රෝගයට ඉවහල් වන ජලයේ පවතින අහිතකර ද්‍රව්‍ය ඉවත් කළ හැකි ආකාරයේ විශේෂිත ජල පිරිසිදු කිරීමේ උපකරණයක් නිපදවා සාධාරණ මිලකට වෙළෙඳපොළට ඉදිරිපත් කරයි.

- මෙම ප්‍රකාශ දෙක පිළිබඳ ව සිසුන්ගේ අවධානය යොමු කරවන්න.
- මෙම පුද්ගලයින් දෙදෙනාගෙන් ව්‍යවසායකයෙකු ලෙස නම් කළ හැක්කේ කවරෙක් දැයි විමසන්න.
- ඔහු ව්‍යවසායකයෙකු ලෙස නම් කිරීමට හේතු විමසන්න.
- අනෙක් පුද්ගලයා හැඳින්විය හැක්කේ කවරෙකු ලෙස දැයි විමසා ඊට හේතු විමසන්න.
- සිසුන්ගේ පිළිතුරු ඇසුරෙන් ව්‍යවසායකයා යනු කවරෙක් දැයි හඳුන්වා ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස පැහැදිලි කර දෙන්න.

- ප්‍රදේශයේ හෝ සිසුන් දන්නා ව්‍යවසායකයෙකු නිදසුන් වශයෙන් ගෙන, ඔහු සතු ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- සිසුන්ගේ පිළිතුරු ඇසුරෙන් ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා ව්‍යවසායකත්ව කුසලතා පැහැදිලි කර දී, එම ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කර ගත හැකි ආකාර ද පෙන්වා දෙන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රීඩාවෙහි යොදවන්න.

- සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- ක්‍රීඩාව කිරීමට පහත උපදෙස් ලබා දෙන්න.

  - ඔබ ඉදිරියේ ඇත්තේ රත් වූ ලාවා ගොඩකි.
  - ඔබගේ කණ්ඩායම එම ලාවා ගොඩ මතින් අනෙක් පැත්තට මාරු විය යුතු ය.
  - පාද තැබීම සඳහා ඇත්තේ ලෑලි කැබලි කිහිපයක් පමණි. (සිසුන් සංඛ්‍යාවට වඩා ලෑලි කැබලි සංඛ්‍යාව අඩු විය යුතු ය. ලෑලි කැබලි වෙනුවට කඩදාසි කැබලි භාවිත කළ හැකි ය )
  - එම ලෑලි කැබලි කිහිපය කණ්ඩායමේ මුල් ම සිසුවා අතට දී එක බැගින් ලාවා මත තබමින් ඒ මත පා තබමින් කණ්ඩායම අනෙක් පැත්තට රැගෙන යාමට උපදෙස් දෙන්න. (අඩි 10 කපමණ දුරක් ප්‍රමාණවත් වේ)
  - සිසුවෙකුගේ පාදයක් ස්පර්ශ නො වූ ලෑලි කැබැල්ලක් (කඩදාසි කැබැල්ලක් ) ලාවා මත තිබිය නො හැකි ය.
  - මේ අතර අනෙක් කණ්ඩායම්වල සාමාජිකයින් විසින් පාදයක් පතිත නො වූ ලෑලි කැබැල්ලක් ලාවා මත තිබුණහොත් එය ක්ෂණික ව ඉවත් කළ යුතු බවට උපදෙස් දෙන්න.

- සියලු ම කණ්ඩායම්වලට මෙම ක්‍රීඩාව කිරීමට අවස්ථාව ලබා දී පහත කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සාර්ථක ව එගොඩ වූ කණ්ඩායම්වල සාර්ථකත්වයට හේතු මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.
- අසාර්ථක වූ කණ්ඩායම්වල අසාර්ථකත්වයට හේතු මොනවා දැයි විමසන්න.
- කණ්ඩායම එගොඩ වීමට පෙර සියලු දෙනා සාකච්ඡා නො කිරීම, නායකයෙකු පත්කර නො ගැනීම, ගමන් කරන අතරතුර හොඳ සන්නිවේදනයක් නො තිබීම ආදී කරුණු මතුකර ගන්න.
- එගොඩ වීමට දැඩි උත්සාහයක් ගන්නා අවස්ථාවේ තමන්ට ඇති වූ බාධා පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- මේ ආකාරයට ම ව්‍යවසායකයෙකුට ද තමන්ගේ අරමුණු කරා යන ගමන ඉතා දුෂ්කර, දැඩි කැපවීමකින් සිදු කළ යුතු බවත්, එහි දී පැමිණෙන බාධා උපක්‍රමශීලී ව ජයග්‍රහණය කළ යුතු බවත් තහවුරු කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- පරිසර අවස්ථා නිර්මාණශීලී ව උකහා ගෙන අවදානමක් දරමින් නවෝත්පාදන බිහි කිරීමේ නිරත වන්නා ව්‍යවසායකයෙකු ලෙස සරල ව හැඳින්විය හැකි ය.

- ව්‍යවසායකයා යනු කවරෙක් දැයි හැඳින්වීමට නිශ්චිත ව පිළිගත් නිර්වචනයක් නොමැත. ව්‍යවසායකයා සම්බන්ධ ව පහත නිර්වචන ඉදිරිපත් කළ හැකි ය.

    - " වෙළෙඳපොළෙහි ඇති වන වෙනස්කම් ව්‍යාපාර සඳහා ඇති අවස්ථාවක් ලෙස සලකන පුද්ගලයා ව්‍යවසායකයා ය. ඔහුගේ අයුධය වන්නේ නව්‍යතා සම්පාදනයයි. "

පීටර් එෆ්. ඩකර්

ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස පහත පරිදි දැක්විය හැකි ය.

| ව්‍යවසායකයා | ව්‍යාපාරිකයා |
|---|---|
| • තමාගේ ම අදහසක් හෝ නව සංකල්පයක් අනුව ව්‍යාපාරයක් අරඹයි. | • පවතින අදහසක් හෝ සංකල්පයක් අනුව ව්‍යාපාරයක් අරඹයි. |
| • ව්‍යවසායකයාගේ ව්‍යාපාරික ප්‍රතිවාදියා වන්නේ තමා ම ය. | • තවත් ව්‍යාපාරික ප්‍රතිවාදීන් ඇත. |
| • ව්‍යවසායකයා නව ව්‍යාපාර අවස්ථා කෙරෙහි සූදානම් වෙයි. | • ව්‍යාපාරිකයා නිතර ම තමන්ගේ ව්‍යාපාර කටයුතුවල නිරත වෙයි. |
| • නවෝත්පාදකයෙකි. | • සාම්ප්‍රදායිකයෙකි. |
| • අවදානමට මුහුණ දේ. | • ආරක්ෂාකාරී ව කටයුතු කරයි. |
| • ගැටලු ඇති වූ විට ඒවා පිටු දැකීමට ධෛර්යමත් ව කටයුතු කරයි. | • ගැටලු ඇති වූ විට අධෛර්යයට පත් වේ. |

- ව්‍යවසායකත්ව ගති ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

    - අවදානම් දැරීමට ඇති කැමැත්ත (Willingness to take risks)
      අවදානම්වලින් මගහැරීමට වඩා අවදානම්වලට මුහුණ දීමට කැමැත්තක් දක්වයි. නමුත් ඕනෑ ම අවදානමකට මුහුණදීමක් මින් අදහස් නො කෙරේ.

    - නිර්මාණශීලී බව (Creativity)
      වෙනස් ආකාරයකට දැකීම, සිතීම හා ක්‍රියාකිරීම

    - කැපවීම (Commitment)
      තම අරමුණු ඉටු වන තෙක් තමන් කරන කාර්ය දැඩි උනන්දුවකින් යුතු ව සිදු කිරීම

- ආත්ම විශ්වාසය (Self Confidence)
  ව්‍යවසායකයෙකුට විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වන අතර, ඒවාට සාර්ථකව මුහුණ දී එම ගැටලු පිටු දැකීමට හැකි ය යන විශ්වාසයයි

- ස්වාධීන බව - (Self reliant)
  වෙනත් අයගේ අදහස් මත යැපෙන්නකු නො වී තමන්ගේ අදහස් හා හැකියා හැකිතරම් දුරට ක්‍රියාත්මක කිරීමට ඇති කැමැත්තයි

- ව්‍යවසායකත්ව කුසලතා කිහිපයක් පහත දැක්වේ.

  - නායකත්ව කුසලතා (Leadership Skills)
    තමාගේ ව්‍යාපාරයේ නායකයා තමා ය. තම අනුගාමිකයින් ලවා කාර්ය ඉටු කරවා ගැනීම සඳහා ඔවුන් ධෛර්යමත් කරමින් විධිමත් ව මෙහෙයවයි.

  - අන්තර්පුද්ගල හැකියා (Interpersonal Skills)
    බාහිර හා අභ්‍යන්තර පාර්ශ්ව සමග මනා සම්බන්ධතාවක් පවත්වා ගෙන යයි.

  - සන්නිවේදන කුසලතා (Communication Skills)
    තොරතුරු ඔහුට සම්පතකි. අරමුණු ඉටු කර ගැනීමට මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යයි.

  - මූලික කළමනාකරණ කුසලතා (Basic Management Skills)
    සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීමේ හා පාලනය යන මූලික කළමනාකරණ කුසලතාවලින් යුක්ත වීම

- ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කර ගත හැකි ආකාර පහත දැක්වේ.
  - ස්වයං ඇගැයීම -
    පළමු ව ව්‍යවසායකත්ව නිපුණතා නිශ්චිත ව හඳුනා ගෙන, එම නිපුණතා තමා තුළ කොතෙක් දුරට පවතී ද ? තමා තුළ නැති නිපුණතා මොනවා ද ? තවදුරටත් සංවර්ධනය කර ගත යුතු නිපුණතා මොනවා ද ? යන්න ස්වයං ඇගැයීමක් කිරීම

  - පුහුණුව -
    ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඇති විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම

  - අධ්‍යාපනය -
    සාමාන්‍ය අධ්‍යාපනයට අමතර ව, ව්‍යවසායකත්වය පිළිබඳ ව ලබන අධ්‍යාපනය

  - අත්දැකීම්වලින් ඵල ලැබීම -
    වෙනත් ව්‍යවසායවල කටයුතු කිරීමෙන් හෝ තමා ම ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමෙන් ලබන අත්දැකීම්

**නිපුණතාව 6** : සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික සංවර්ධනයට දක්වන දායකත්වය අගයයි.

**නිපුණතා මට්ටම 6.1** : සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණ විමසමින් ඒවායේ වැදගත්කම අගයයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් ඵල** :

- පිළිගත් නිර්ණායක සලකා බලමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අර්ථ දක්වයි.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සුවිශේෂී ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් ලැබෙන දායකත්වය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ව්‍යවසායකත්වය වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේ දී හා පවත්වා ගෙන යාමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ලැයිස්තුගත කරයි.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට හෝ අසාර්ථක වීමට හේතු විග්‍රහ කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

- ප්‍රදේශයේ පවතින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට අදාළ ව්‍යාපාර කිහිපයක නම් සිසුන්ගෙන් අසා හුණු පුවරුවේ ලියන්න.
- එම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල රැකියා නිරත ප්‍රමාණය, ප්‍රයෝජනයට ගන්නා අමුද්‍රව්‍ය, යොදා ගන්නා තාක්ෂණය, එම නිෂ්පාදනයට ඇති වෙළෙඳපොළ, ප්‍රදේශයට සපයන සේවා යනා දී තොරතුරු සාකච්ඡා කරන්න.
- එම තොරතුරු ඇසුරෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණ පැහැදිලි කරන්න.
- මහා පරිමාණ ව්‍යාපාරයක් නිදසුන් ලෙස ගෙන එය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාරවලින් වෙනස් වන සාධක ලැයිස්තුගත කරන්න.
- එම සාධක (නිර්ණායක) පදනම් කර ගෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙන් කර හඳුනාගත හැකි බව පැහැදිලි කරන්න.
- ඉහත ලක්ෂණ හා නිර්ණායක පදනම් කර ගෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ අර්ථකථනයක් ගොඩනගන්න.

☞

- ඉහත සාකච්ඡා කළ කරුණු ඇසුරෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරය පැහැදිලි කරන්න.

☞

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට ප්‍රථමයෙන් අවධානය යොමු කළ යුතු කරුණු මොනවා දැයි ලැයිස්තුගත කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

- සිසුන් ඉදිරිපත් කරන ලද කරුණු පදනම් කර ගෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාමේ දී සලකා බැලිය යුතු කරුණු සාකච්ඡා කරන්න.

- ප්‍රදේශයේ අසාර්ථකත්වයට පත් වූ ව්‍යාපාරයක් ද සිහිපත් කරමින් එම ව්‍යාපාරය අසාර්ථක වීමට හේතු සාකච්ඡා කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කිරීම සඳහා ජාතික මෙන් ම ජාත්‍යන්තර වශයෙන් විවිධ නිර්ණායක භාවිත කරයි. එම නිර්ණායක පදනම් වී ඇත්තේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක සාධක මත ය.

- ප්‍රමාණාත්මක සාධක වශයෙන් අදහස් කරන්නේ සංඛ්‍යාත්මක ව ගණනය කළ හැකි සාධක ය.
  නිදසුන් : ආයෝජිත ප්‍රාග්ධන ප්‍රමාණය, යොදා ගන්නා සේවක සංඛ්‍යාව, භාවිතයට ගන්නා බල ශක්තිය, වාර්ෂික පිරිවැටුම

- ගුණාත්මක සාධක යන්නෙන් අදහස් කරන්නේ සංඛ්‍යාත්මක වශයෙන් මැනිය නො හැකි සාධක ය.
  නිදසුන් : ව්‍යාපාර සංවිධාන ක්‍රමය, භාවිත කරන තාක්ෂණය, වෙළෙඳපොළ ස්වභාවය

- ඉහත නිර්ණායක පදනම් කර ගෙන දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත.
  නිදසුන් :
  ස්වාධීන ව අයිති හා ස්වාධීන ව ක්‍රියාත්මක වන එසේ ම ක්ෂේත්‍රය තුළ බලයක් හිමි නො වූ ව්‍යාපාර කුඩා ව්‍යාපාර වේ.
  ඇමරිකා එක්සත් ජනපදයේ ස්මෝල් බිස්නස් ඇඩ්මිනිස්ට්‍රේෂන් ආයතනය (Small Business Administration Institute - USA)

- කුඩා ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ද විවිධ ආයතන විවිධ නිර්ණායක භාවිත කරයි.

නිදසුන් :

| ආයතනය | නිර්ණායකය |
| --- | --- |
| 1. කාර්මික සංවර්ධන මණ්ඩලය | 1. යොදවා ඇති ප්‍රාග්ධනය රුපියල් මිලියන 4 නො ඉක්මවන ව්‍යාපාර |
| 2. කාර්මික තාක්ෂණික ආයතනය | 2. යොදවා ඇති ප්‍රාග්ධනය රුපියල් මිලියන 4 නො ඉක්මවන ව්‍යාපාර |
| 3. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | 3. යොදවා ඇති ප්‍රාග්ධනය රුපියල් මිලියන 4 නො ඉක්මවන ව්‍යාපාර |
| 4. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | 4. ආයෝජිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 20 නො ඉක්මවන ව්‍යාපාර |
| 5. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 5. සේවක සංඛ්‍යාව 25 ට අඩු ව්‍යාපාර |
| 6. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | 6. ස්ථිර සේවක සංඛ්‍යාව 50 ට අඩු ව්‍යාපාර |
| 7. ශ්‍රී ලංකා මහ බැංකුව | 7. භාවිත කරන විදුලිබල ධාරිතාව කිලෝවොට් ඇම්පියර් 50 ට අඩු ව්‍යාපාර |

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණ පහත දැක්වේ.
  - වෙළෙඳපොළ කුඩා වීම
  - ආයෝජිත ප්‍රාග්ධනය කුඩා වීම
  - සේවක සංඛ්‍යාව අඩු වීම
  - පවුලේ ශ්‍රමය වැඩි වශයෙන් භාවිත කිරීම
  - තීරණ ගැනීම තමන් සතු තොරතුරු මත පමණක් සිදු වීම
  - ව්‍යාපාරයේ කළමනාකරණය ස්වාධීන වීම හා බොහෝ විට අයිතිකරු ප්‍රධාන කළමනාකරු වීම
  - වෙළෙඳපොළ බොහෝ විට දේශීය වීම (නමුත් සමහර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විදේශීය වෙළෙඳපොළට ද නිෂ්පාදිත සපයයි.)
  - විශාල ව්‍යාපාරවලට සාපේක්ෂව මේවායේ මූල්‍ය බැඳීම් අඩු වීම
  - නවීන තාක්ෂණය භාවිතය අඩු වීම

- රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විවිධ ආකාරයෙන් දායකත්වය ලබා දෙයි.
  නිදසුන් :
  - මෙම ව්‍යාපාර ශ්‍රම සුක්ෂම කර්මාන්ත නිසා වැඩි රැකියා ප්‍රමාණයක් සැපයිය හැකි වීම
  - ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට දායක වීම
  - දේශීය සම්පත් භාවිත කිරීම
  - ප්‍රාදේශීය සංවර්ධනය හේතුවෙන් නාගරීකරණය නිසා ඇති වන ගැටලු අවම වීම
  - ආදායම් ව්‍යාප්තියේ විෂමතා අවම වීම
  - මහා පරිමාණ ව්‍යාපාරවලට අවශ්‍ය අමුද්‍රව්‍ය හා නිමිද්‍රව්‍ය ලබා දීම
  - මහා පරිමාණ ව්‍යාපාර ඉටු නො කරන ව්‍යාපාර කටයුතුවල නිරත වීම

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේ දී හා පවත්වා ගෙන යාමේ දී පහත කරුණු පිළිබඳ ව සැලකිළිමත් විය යුතු ය.

  නිදසුන් :

  - තම හැකියා හා කුසලතා පිළිබඳ ව අධ්‍යයනය කිරීම හා ඇගැයීම
  - නිෂ්පාදිතයට ඇති වෙළෙඳපොළ හා එම වෙළෙඳපොළට ළගාවිය හැකි ද යන්න
  - ආරම්භක ප්‍රාග්ධනය හා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය පිළිබඳ ව අධ්‍යයනය කිරීම
  - ව්‍යාපාර සංවිධාන ක්‍රමය පිළිබඳ ව අධ්‍යයනය
  - ව්‍යාපාර සංවිධාන ක්‍රමය හා පවතින නීති රීති
  - පවතින තරගකාරිත්වය

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට හෝ අසාර්ථක වීමට විවිධ හේතු බලපා ඇත.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට බලපා ඇති හේතු

  - ප්‍රමාණවත් යටිතල පහසුකම් තිබීම
  - මූල්‍ය හා බදු සහන වැනි දිරිගැන්වීම්
  - පුළුල් වෙළෙඳපොළක් පැවතීම
  - විවිධ ආයතනික හා අලෙවි පහසුකම් ලබා දීම
  - දක්ෂ කළමනාකරණයක් තිබීම
  - ව්‍යාපාරිකයින්ගේ උනන්දුව හා කැපවීම

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු
  - මූල්‍ය ගැටලු
  - වෙළෙඳපොළ තරගකාරිත්වයට මුහුණ දීමට අපහසු වීම
  - කළමනාකරණයේ දූර්වලතා
  - ව්‍යවසායකත්ව හැකියා අඩු වීම
  - යටිතල පහසුකම් ප්‍රමාණවත් නො වීම
  - නව තාක්ෂණික දැනුම අඩුකම හා නව තාක්ෂණය යොදා නො ගැනීම

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ව්‍යවසායකත්වය වැදගත් වන අතර ඊට හේතු කිහිපයකි.
  - ව්‍යාපාර ඇරඹීම අවදානම් සහගත වීම, එහෙත් ව්‍යවසායකයා තුළ ඇති අවදානම් කළමනාකරණය කිරීමේ හැකියාව තුළින් එය අවම කර ගත හැකි ය.
  - ව්‍යවසායකයාගේ කැපවීම හා උනන්දුව මත බොහෝ දුරට ව්‍යාපාරය සාර්ථක වේ.
  - ව්‍යවසායකයා තුළ ඇති ආත්ම විශ්වාසය හා අධිෂ්ඨානය ද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට බලපායි.
  - එසේ ම ව්‍යවසායකයා තුළ ඇති ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කර ගැනීමට කටයුතු කිරීමෙන් ව්‍යාපාර සාර්ථක කර ගත හැකි වේ.

**නිපුණතාව 6** : සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික සංවර්ධනයට දක්වන දායකත්වය අගයයි.

**නිපුණතා මට්ටම 6.2** : සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීම සඳහා ඇති දිරිගැන්වීම් සොයා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 07

**ඉගෙනුම් ඵල** :

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරයි.
- රජය ලබා දෙන දිරි ගැන්වීම් මූල්‍යමය හා මූල්‍යමය නො වන වශයෙන් වර්ග කර දක්වයි.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන හා ඒවායින් ලබා දෙන දිරිගැන්වීම් වගු ගත කරයි.
- තෝරා ගත් ව්‍යාපාරයක් ඇසුරෙන් ඊට ලබා දී ඇති දිරිගැන්වීම් හඳුනා ගෙන ඒවා මූල්‍යමය හා මූල්‍යමය නො වන ලෙස වර්ග කරයි.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට දිරි ගැන්වීම් ලබා දෙන වර්තමානයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ලැයිස්තුගත කරයි.
- තෝරා ගත් ව්‍යාපාරයකට දිරි ගැන්වීම් ලබා දෙන ව්‍යාපෘති හා ඒවා මගින් ලබා දෙන දිරිගැන්වීම් වගු ගත කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- කුඩා දරුවෙකුට නැගිටීමට අත දෙන මවකගේ පින්තූරයක් පන්තියට ප්‍රදර්ශනය කරන්න.

- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක නිරතවන්න.
  - ළමයාට ඇවිදීමට හුරු වන තුරු අත දීම අවශ්‍ය බවත්, තනි ව ඇවිදීමට හැකි වූ විට අත දීම අනවශ්‍ය බවත්,
  - එලෙස ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ට ද තනි ව ම නැගී සිටීම අපහසු බවත්,
  - ඒ සඳහා විවිධාකාර අත දීම්, දිරිගැන්වීම් අවශ්‍ය බවත්,
  - ව්‍යාපාරිකයින් නැගී සිටිය පසු අත දීම් අනවශ්‍ය බවත්, ඉන්පසු ඔවුන් ව්‍යාපාරය සාර්ථක කර ගන්නා බවත්.
  - කුඩා දරුවකුට අත දීමට මවක් උනන්දු වන්නා සේ ම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජයක් විවිධ පියවර ගන්නා බවත්, ඒ සඳහා රාජ්‍ය ආයතන මෙන් ම රාජ්‍ය නො වන වෙනත් ආයතන ද පවතින බවත් සාකච්ඡා කරන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත දැක්වෙන්නේ පළාත් වාණිජ මණ්ඩල සම්මේලනයක දී තේ විවේකය තුළ මුණ ගැසුණු ව්‍යාපාරික මිතුරන් කිහිපදෙනෙකු අතර ඇති වූ තකා බහකි. එම කතාව ඇසුරෙන් ඔබේ කණ්ඩායමට ලැබෙන ව්‍යාපාරිකයාගේ ප්‍රකාශයට අවධානය යොමු කරන්න.

| | | |
|---|---|---|
| ධනවර්ධන | - | මගේ බිස්නස් එකට දාන්න තව ලක්ෂ විසිපහක් තිබුණ නම් පළාතෙ ම මාර්කට් එක අල්ල ගන්න තිබුණා. |
| විපුලසේන | - | මගේ ප්‍රශ්නය ඕක නොවේ. හදාගත්ත බඩු ටික විකුණ ගන්න විදියක් නැති එක ගැනයි. බඩු ටික විකුණ ගත්තා නම් මම ගොඩ. |
| කීර්තිසේන | - | මම දැනට භාවිත කරන යන්ත්‍ර සූත්‍ර හා ක්‍රම එක්ක මාර්කට් එක අල්ල ගන්න බැහැ. අලුත් මැෂින් ටිකක් හොයාගත්ත නම් ෆොරින් මාර්කට් එකටත් යන්න පුලුවන්. |
| කාලිංග | - | මම හිතනවා මම යොදවන මුදල්වලට ඉපැයුම් මදි කියල. සමහර අය මේ තරම් සල්ලි යට කරන්නේ නැති ව හොඳට බිස්නස් කර ගෙන යනවා. මම හිතන්නේ මම නිවැරදි ව මුදල් යොදවලා නැහැ. |

- ඔබේ කණ්ඩායමට ලැබුණු ව්‍යාපාරිකයාගේ ප්‍රකාශය අධ්‍යයනය කොට ඔහුගේ අවශ්‍යතාව (ගැටලුව) හඳුනා ගන්න.
- එය මූල්‍යමය අවශ්‍යතාවක් ද, මූල්‍යමය නො වන අවශ්‍යතාවක් ද යන්න වෙන්කර ගන්න.
- එම අවශ්‍යතාව සැපයීම සඳහා අප රටේ පවතින ආයතන හෝ පුද්ගලයින් ලැයිස්තුවක් සකස් කරන්න.
- ඒවා රාජ්‍ය ආයතන ද, වෙනත් ආයතනයක් ද යන්න හඳුනා ගන්න.
- එම ආයතනවලින් ලබා දෙන සේවා ලැයිස්තුවක් සකස් කරන්න.

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කර සාකච්ඡා කරන්න.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති පියවර මූල්‍යමය හා මූල්‍යමය නොවන ලෙස වර්ග කර දක්වන්න.
- එකී දිරිගැන්වීම් ලබා දෙන ආයතන රාජ්‍ය ආයතන හා වෙනත් ආයතතන ලෙස වර්ග කර දක්වන්න.
- ඔබ ප්‍රදේශයේ පවතින ඔබ දන්නා ව්‍යාපාරයක් තෝරාගෙන එම ව්‍යාපාරයට දිරිගැන්වීම් ලබා දී ඇති ව්‍යාපෘති හා ඒ මගින් ලබා දෙන දිරිගැන්වීම් වගු ගත කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති පියවර ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.
  - මූල්‍යමය දිරිගැන්වීම්
  - මුල්‍යමය නො වන දිරිගැන්වීම්

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති මූල්‍යමය දිරිගැන්වීම් සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.
  - කෙටිකාලීන හා දිගුකාලීන ණය
  - මූල්‍යමය ආධාර
  - බදු සහන
  - ප්‍රතිමූල්‍ය පහසුකම්

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති මූල්‍යමය නො වන දිරි ගැන්වීම් සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.
    - උපදේශන සේවා
    - ව්‍යවසායක සංවර්ධන වැඩ සටහන්
    - පර්යේෂණ හා තාක්ෂණික සේවා
    - යටිතල පහසුකම් සැපයීම
    - වෙළෙඳපොළ පහසුකම් ලබා දීම/අලෙවි පහසුකම්
    - විශිෂ්ටතා හා සම්මාන ලබා දීම

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන කොටස් දෙකකට බෙදේ.
    - රාජ්‍ය ආයතන
    - වෙනත් ආයතන

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන රාජ්‍ය ආයතන කිහිපයකට නිදසුන් පහත දැක්වේ.

    - කාර්මික සංවර්ධන මණ්ඩලය
    - අපනයන සංවර්ධන මණ්ඩලය
    - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
    - ජාතික සංවර්ධන බැංකුව
    - කාර්මික තාක්ෂණ ආයතනය

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන වෙනත් ආයතන හා සංවිධාන කිහිපයකට නිදසුන් පහත දැක්වේ.
    - සර්වෝදය
    - ජයිකා (ජපන් අන්තර්ජාතික සහයෝගිතා සංවිධානය )
    - බදු වාර්තා සකස් කර දෙන පෞද්ගලික ආයතන
    - සණස (සකසුරුවම් හා ණය දෙන සමිති )
    - පෞද්ගලික බැංකු සහ මූල්‍ය ආයතන

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන හා ඒවායින් ලබා දෙන දිරිගැන්වීම් කිහිපයක් පහත දැක්වේ.

| ආයතනය | ලබා දෙන දිරි ගැන්වීම් |
|---|---|
| • ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA ) | • මූල්‍යමය පහසුකම් ලබා දීම<br>• ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම |
| • කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව මණ්ඩලය | • විදේශ වෙළෙඳපොළ පහසුකම් සපයා දීම |
| • කාර්මික සංවර්ධන මණ්ඩලය | • උපදේශන සේවා<br>• තාක්ෂණික දැනුම ලබා දීම<br>• යටිතල පහසුකම් |
| • අපනයන සංවර්ධන මණ්ඩලය | • අලෙවි පහසුකම්<br>• උපදේශන සේවා |
| • ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | • උපදේශන සේවා |
| • ජාතික සංවර්ධන බැංකුව | • මූල්‍ය පහසුකම් ලබා දීම |
| • කාර්මික තාක්ෂණ ආයතනය | • තාක්ෂණික දැනුම ලබා දීම<br>• උපදේශන සේවා සැපයීම |
| • ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය (SLCSMI) | • මූල්‍ය පහසුකම්<br>• විශිෂ්ටතා සම්මාන ලබා දීම |

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට දිරිගැන්වීම් ලබා දෙන වර්තමානයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති කිහිපයක් පහත දැක්වේ.
    - කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසාය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය (ලිය ඉසුර) කාරක ප්‍රාග්ධන සහාය සැපයීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකු හරහා සුරැකුම් අවශ්‍ය නො වන කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසාය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත.

(2014 මහ බැංකු වාර්තාව)

- සුවන
  අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුවේ (JBIC) මූල්‍ය අනුග්‍රාහකත්වයෙන්, ජාතික සංවර්ධන බැංකුව ප්‍රතිමූල්‍ය පහසුකම් සපයමින් සුළු කර්මාන්ත ව්‍යවසායකයින් නංවාලීම සඳහා ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමයකි. මෙය SMILE (Small & Micro Industries Leader & Entrepreneur promotion project ) ලෙස ද හඳුන්වයි. වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ මෙහි III වන අදියර ය.

- සහන්‍යා
  සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ට ණය සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමයකි. මේ සඳහා DFCC බැංකුව හා අනෙකුත් වාණිජ බැංකු සම්බන්ධ වී ඇත.

- සණස ණය ව්‍යාපෘතිය
  කෘෂි, සත්ව, කුඩා කර්මාන්ත, වෙළෙඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සපයන යෝජනා ක්‍රමයකි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදවා ගන්නා අතර සණස මහා සංවර්ධන සංගමය පරිපාලන කටයුතු සිදු කරයි.

- සමුපකාර ග්‍රාමීය බැංකු ණය
  කෘෂි, ධීවර, සත්ව පාලනය, වෙළෙඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සැපයීම මෙ මගින් සිදු කරයි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගැනේ. මේ සඳහා විවිධ සේවා සමුපකාර සමිති හා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පරිපාලන දායකත්වය ලබා දෙයි.

- සමෘද්ධි/දිවිනැගුම සංවර්ධන ණය යෝජනා ක්‍රමය
  සමෘද්ධිය/දිවිනැගුම බැංකු සංගම් හරහා සමෘද්ධිලාභීන් වෙත ණය දීම හා අනෙකුත් සේවා සැපයීම සිදු කිරීම සඳහා මෙම යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත. මේ සඳහා අවශ්‍ය මුදල් රජයේ ප්‍රධානයන්ගෙන් හා සාමාජිකයින්ගේ තැන්පතු මගින් රැස් කළ ඉතුරුම් මුදල් තුළින් ලබා ගනියි.

  මෙහි පාලනය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. (සමෘද්ධි/දිවිනැගුම බැංකු ප්‍රාදේශීය සංවර්ධන බැංකු සමග ඒකාබද්ධ කරනු ලබන බව රජය නිවේදනය කර ඇත )
  (2014 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව )

- ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය
  (කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ ඇති ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතියකි. වගා කටයුතු සඳහා ගොවීන්ට කෙටි කාලීන ණය හා දිගුකාලීන ණය ලබා දෙයි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ගොවීන්ගේ භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගැනේ.

  (කාලීන ව්‍යාපෘති ගැන අවධානය යොමු කරන්න )

**නිපුණතාව 7** : ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතන දක්වන දායකත්වය අගයයි.

**නිපුණතා මට්ටම 7.1** : ගනුදෙනු පහසුකර ගැනීම සඳහා මුදල් භාවිතයේ වැදගත්කම තහවුරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් ඵල** :

- මුදල් යන්න අර්ථ දක්වයි.
- හුවමාරුව සඳහා මුදලේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
- මුදලේ කාර්යයන් හඳුන්වා ඒවායේ වැදගත්කම නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- හොඳ මුදලක ලක්ෂණ පෙන්වා දෙයි.
- හුවමාරුවේ දී භාවිත වන විවිධ මුදල් වර්ග පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වන සිසුන් ලවා පහත සඳහන් රංගන පන්තියට ඉදිරිපත් කරවන්න.

**භූමිකා රංගනය 1 - චරිත 2 යි**

- වළං නිපදවන්නෙක් සහ වී වගා කරන්නෙක්

  **චරිතවල හැසිරීම**

  - වළං නිපදවන්නා වී වගා කරන්නා ළගට පැමිණෙයි.
  - වළං දී වී ඉල්ලයි.
  - හුවමාරුව සිදු වේ.
  - දෙදෙනා තෘප්තිමත් ව පිට ව යයි.

**භූමිකා රංගනය 2 - චරිත 2 යි**

- වළං නිපදවන්නෙක් සහ වඩු කාර්මිකයෙක්

  **චරිතවල හැසිරීම**

  - වළං නිපදවන්නා වළං රැගෙන වඩු කාර්මිකයා ළගට යයි.
  - වළං දී පුටුවක් ඉල්ලයි.
  - වළං අවශ්‍ය නැති බවත්, පුටුව දීමට සහල් අවශ්‍ය බවත් පවසයි.
  - ගනුදෙනුව සිදු නො වේ.
  - දෙදෙනා අතෘප්තිමත් ව පිට ව යයි.

**භූමිකා රංගනය 3 - චරිත 2 යි**

- සිල්ලර වෙළෙඳසැල් හිමියෙක් හා ගනුදෙනුකරුවෙක්
  **චරිතවල හැසිරීම**
  - ගනුදෙනුකරු භාණ්ඩ තෝරා ගෙන මුදල් ගෙවීමට මුදල් නෝට්ටුවක් ඉදිරිපත් කරයි.
  - මුදල් නෝට්ටුව ලාච්චුවට දමා ඉතුරු මුදල් ලබා දෙයි.
  - ගනුදෙනුකරු තෘප්තිමත් ව පිට ව යයි.

**භූමිකා රංගනය 4 - චරිත 2 යි**

- සුපිරි වෙළෙඳසැල් හිමියෙක් හා ගනුදෙනුකරුවෙක්
  **චරිතවල හැසිරීම**
  - ගනුදෙනුකරු භාණ්ඩ තෝරා ගෙන මුදල් ගෙවීම සඳහා වෙළෙඳසැල් හිමියාට ප්ලාස්ටික් කාඩ්පතක් ඉදිරිපත් කරයි.
  - කාඩ්පත යන්ත්‍රයකට ඇතුල් කරන බව හඟවා බිලක් නිකුත් කරයි. එය ගනුදෙනුකරු අත්සන් කරයි.
  - ගනුදෙනුකරු තෘප්තිමත් ව පිට ව යයි.

- භූමිකා රංගන අවසානයේ පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පළමු භූමිකා රංගනයෙන් භාණ්ඩයකට භාණ්ඩයක් හුවමාරු වූ බව
  - දෙවන භූමිකා රංගනයෙන් භාණ්ඩ හුවමාරුව සම්පූර්ණ නො වූ බව හා ඒ සඳහා බලපෑ හේතු ඇති බව
  - තුන්වෙනි භූමිකා රංගනයෙන් ව්‍යවහාර මුදල් භාවිතයෙන් ගනුදෙනුව සම්පූර්ණ වූ බව
  - හතරවෙනි භූමිකා රංගනයෙන් ගනුදෙනුව සම්පූර්ණ වූ අයුරු හා ගෙවීම් උපකරණය ලෙස ණයපත/හරපත භාවිත කළ බව
  - වර්තමානයේ ගනුදෙනු පියවීම සඳහා විවිධ ගෙවීම් උපකරණ භාවිත කරන බව

- භාණ්ඩ හා සේවා හුවමාරුව සඳහා මුදලේ අවශ්‍යතාව පැහැදිලි ව පෙන්වා දෙන්න.

- මුදලේ කාර්යයන් මතු කර ගැනීමට සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

විරාජ් තම මෝටර් රථය රු. මිලියන 3.0 කට ළහිරුට අලෙවි කළේ ය. ළහිරු එම අවස්ථාවේ දී රු. මිලියන 2.0 ක් විරාජ්ට ගෙවූ අතර, ඔහු එම මුදල් බැංකුවේ තැන්පත් කළේ ය. ඉතිරි මිලියනයක මුදල මාස දෙකින් ගෙවීමට ළහිරු එකඟ විය.

- ඔබට ලැබුණු සිද්ධිය හොඳින් අධ්‍යයනය කරන්න.
- එම සිද්ධියේ දී මුදල් භාවිත කර සිදු කර ඇති කාර්යයන් මොනවා දැයි හඳුනා ගන්න.
- සිසු අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න

- මුදලේ කාර්යයන් හඳුන්වා ඒවායේ වැදගත්කම නිදසුන් සහිත ව පැහැදිලි කර දෙන්න.
- හොඳ මුදලක ලක්ෂණ පෙන්වා දෙන්න.
- හුවමාරුවේ දී භාවිත වන විවිධ මුදල් වර්ග පැහැදිලි කර දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී පොදුවේ පිළිගනු ලබන ඕනෑ ම දෙයක් මුදල් වශයෙන් සලකයි.
- හුවමාරුව සඳහා මුදලේ අවශ්‍යතාව පහත පරිදි පෙන්වා දිය හැකි ය.

    - අතීතයේ මුදල් නො මැති ව සිදු වූ සෘජු හුවමාරුව භාණ්ඩ හුවමාරුව නම් විය.
    - භාණ්ඩ හුවමාරුවේ දී විවිධ දුෂ්කරතා පැවතිණි.
    - එබැවින් භාණ්ඩ හුවමාරුව වෙනුවට සෑම දෙනා ම පිළිගන්නා පොදු මාධ්‍යයක අවශ්‍යතාව දැණුනි.
    - එම හුවමාරු මාධ්‍ය මුදල් ලෙස හැඳින්විය.
    - ඒ අනුව හුවමාරුව සඳහා මුදල් අවශ්‍ය බව පැහැදිලි වේ.

- මුදලේ කාර්යයන් පහත පරිදි දැක්විය හැකි ය.

    - විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම (A medium of exchange)
    - වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම (standard of value)
    - වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම (store of value)
    - විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම (Defferred payments)

- **විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම**
  භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී අතරමැදියෙකු වශයෙන් කටයුතු කිරීමයි. නැතහොත් භාණ්ඩ හා සේවාවල මිල ගෙවනුයේ මුදල් මගිනි.
  නිදසුන් : රු. 30,000 ක ජංගම දුරකථනයක් මිල දී ගැනීම

- **වටිනාකම මැනීමේ මිනුම් දණ්ඩක් ලෙස කටයුතු කිරීම**
  භාණ්ඩ හා සේවාවන්හි වටිනාකම හෙවත් අගය මැනීම සඳහා මුදල් භාවිත කිරීමයි. මෙය මිල ( price) නම් වේ. මෙ මගින් ගිණුම් තැබීම පහසු වී ඇති නිසා මෙය ගිණුම් ඒකකයක් ( unit of Account) ලෙස ද හඳුන්වයි.
  නිදසුන් : සපත්තු ජෝඩුවක් රු. 1999.90 ක් ලෙස මිල කිරීම

- **වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම**
  මුදල් රැස් කර තබා ගත හැකි ය. කාසි හා නෝට්ටු යල් පැනීමකින් තොර ව ක්ෂය වීමකින් තොර ව රැස් කර තබා ගනිමින් අනාගතයේ දි භාණ්ඩ හා සේවා මිලට ගැනීමට භාවිත කළ හැකි ය.
  නිදසුන් : රු. 10,000 ක මුදලක් ඉතිරි කිරීම

- **විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම**
  අනාගත මුදල් ගෙවීමක් සඳහා වර්තමානයේ ගිවිස ගත හැකි ය.
  එනම් ඉදිරි දිනයක දී මුදල් ගෙවීමේ කොන්දේසි යටතේ භාණ්ඩ හා සේවා මිල දී ගත හැකි විමයි.
  නිදසුන් : 2016 ජනවාරි මස රු.5000 කට මිලට ගත් භාණ්ඩ තොගයක් සඳහා 2016 මාර්තු මස මුදල් ගෙවීමට ගිවිස ගැනීම.

- හොඳ මුදලක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
  - පොදු පිළිගැනීමක් තිබීම
  - කල්පැවැත්මක් තිබීම
  - අනුකරණයේ දුෂ්කරතාව
  - පහසුවෙන් ගෙන යා හැකි වීම
  - පහසුවෙන් හඳුනාගත හැකි වීම හෙවත් සමජාතීය බව
  - කුඩා කොටස්වලට බෙදිය හැකි වීම

- පහත දැක්වෙන පරිදි මුදල් වර්ග කළ හැකි ය.

වාවහාර මුදල් ( currency)
මූල්‍ය අධිකාරියේ නියෝග මත නිකුත් කරන කාසි හා නෝට්ටු මෙලෙස හඳුන්වයි.
ව්‍යවහාර මුදල් වලංගු මුදල් ලෙස ද හඳුන්වන අතර මේවායේ ද්‍රවශීලතාව 100% කි.
නිදසුන් : කාසි හා නෝට්ටු

බැංකු මුදල් (Bank Money)
වාණිජ බැංකු පවත්වා ගෙන යන ඉල්ලුම් තැන්පතු හෙවත් ජංගම ගිණුම්වල ශේෂ බැංකු මුදල් වේ. මෙම මුදල් ගෙවීම් කටයුතු කරන්නේ චෙක්පත් හරහා ය. ව්‍යවහාර මුදල් මෙන් ද්‍රවශීලතාව 100% ක් ම නැතත් ආසන්න මුදල්වලට වඩා ද්‍රවශීලතාවෙන් යුක්ත වේ.
නිදසුන් : වාණිජ බැංකුවල ඇති ජංගම ගිණුම් තැන්පතු

ආසන්න මුදල් (Near Money)
ව්‍යවහාර මුදල් මෙන් 100% ක් ද්‍රවශීලතාවෙන් යුක්ත නොවූ එහෙත් වටිනාකමේ සන්නිධියක කාර්ය ඉටු කරනු ලබන පහසුවෙන් මුදල් බවට පත් කළ හැකි වත්කම් ය.
නිදසුන් : වාණිජ බැංකුවල ඇති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් , වාණිජ පත්‍රිකා

**විද්‍යුත් මුදල්** (E-money)
තොරතුරු හා ඩිජිටල් තාක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස බිහි වී ඇති දේශීය මෙන් ම ජාත්‍යන්තර ගනුදෙනුවල දී ද ගෙවීම් කිරීමට යොදා ගනු ලබන මුදල් ය.
නිදසුන් :

හර කාඩ්පත් (debit card)
ගෙවනු ලබන මුදල් ප්‍රමාණය විද්‍යුත් ලෙස ගිණුමට හර වන, බැංකු ගිණුමේ මුදල් තිබෙන අයට පමණක් ලබා ගත හැකි කාඩ්පත් ය.

ණය කාඩ්පත් (credit card )
බැංකු ගිණුමක් නො මැති වුව ද ණය වශයෙන් භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා මෙන් ම මුදල් ලබා ගැනීම සඳහා ද භාවිත කරන කාඩ්පත් විශේෂයකි.

පෙර ගෙවුම් කාඩ්පත් (prepaid card )
කලින් මුදල් ගෙවා ලබා ගත හැකි කාඩ්පත් ය.

- මෙම කාඩ්පත් මගින් ගෙවීම් කිරීම පහසු කිරීම සඳහා පහත සේවාවන් (පහසුකම්) යොදා ගනී.
  - ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර -(ATM යන්ත්‍ර - Automatic Teller Machines)
  - ස්වයංක්‍රීය තැන්පතු යන්ත්‍ර ( ADM යන්ත්‍ර - Automatic Deposits Machines )
  - චෙක්පත් තැන්පතු යන්ත්‍ර ( CDM යන්ත්‍ර - Cheques Deposits Machines )
  - වෙළෙඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල - ( Electronic funds transfer point of sales )
  - ටෙලි බැංකු පහසුකම් - Tele banking
  - අන්තර්ජාල බැංකු කටයුතු - Internet banking / Online banking
  - ටෙලිවිෂන් බැංකු පහසුකම් - Televission banking

**නිපුණතාව 7** : ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතන දක්වන දායකත්වය අගයයි.

**නිපුණතා මට්ටම 7.2** : ශ්‍රී ලංකාවේ ව්‍යාපාර වර්ධනයට සහාය වන මූල්‍ය ආයතන පද්ධතිය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පද්ධතිය වර්ග කරයි.
- දෙන ලද මූල්‍ය ආයතන සමූහයක් එක් එක් වර්ගය යටතේ වෙන් කර දක්වයි.
- එක් එක් වර්ගයට අයත් මූල්‍ය ආයතන නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- එක් එක් වර්ගයට අයත් මූල්‍ය ආයතන ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට දායක වන ආකාරය පෙන්වා දෙයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ආසන්න ම වර්ෂයේ මහ බැංකු වාර්ෂික වාර්තාව පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා වේ මූල්‍ය ආයතන පද්ධතිය වර්ග කරන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

---

- පහත දැක්වෙන්නේ මූල්‍ය ආයතන සමූහයකි.

  මහජන බැංකුව, සීමාසහිත සෙලින්කෝ ෆිනෑන්ස් සමාගම, සීමා සහිත සම්පත් ලීසිං සමාගම, ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් ලිමිටඩ්, ශ්‍රී ලංකා මහ බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, කැපිටල් එලායන්ස් ලිමිටඩ්, නාමල් සුරක්ෂිත අරමුදල, සී/ස සෙන්ට්‍රල් ෆිනෑන්ස්, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සී/ස එල් බී ෆිනෑන්ස්, ජේ.බී සෙකියුරිටීස් (පෞද් ) සමාගම, සීබැන්ක් සුරක්ෂිත අරමුදල, ආශා පිලිප්ස් සුරැකුම්පත් සමාගම, DFCC PLC , ලංකා ඔරික්ස් ලීසිං සමාගම

  ඒවා පහත ශීර්ෂ යටතේ ලැයිස්තුගත කරන්න.

  - මහ බැංකුව
  - බලපත්‍රලාභී වාණිජ බැංකු
  - බලපත්‍රලාභී විශේෂිත බැංකු
  - බලපත්‍රලාභී මුදල් සමාගම්
  - විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
  - ප්‍රාථමික අලෙවිකරුවන්
  - කොටස් තැරැව්කරුවන්
  - ඒකක භාර
  - එක් එක් වර්ගයට අයත් මූල්‍ය ආයතන, ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට දායක වන ආකාරය පෙන්වා දෙන්න.

---

- එක් එක් වර්ගයට අයත් මූල්‍ය ආයතන නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පහත සඳහන් ආකාරයට වර්ග කරයි.
  - බැංකු අංශය
    - ශ්‍රී ලංකා මහ බැංකුව
    - බලපත්‍රලාභී වාණිජ බැංකු
    - බලපත්‍රලාභී විශේෂිත බැංකු
  - තැන්පතු භාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන
    - බලපත්‍රලාභී මුදල් සමාගම්
    - සමුපකාර ග්‍රාමීය බැංකු
    - සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති
  - විශේෂිත මූල්‍ය ආයතන
    - විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
    - ප්‍රාථමික අලෙවිකරුවන්
    - කොටස් තැරැව්කරුවන්
    - ඒකක භාර/ ඒකක භාර කළමනාකරණ සමාගම්
    - වෙළෙඳපොළ අතරමැදියන්
    - ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
  - ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන
    - රක්ෂණ සමාගම්
    - සේවක අර්ථසාධක අරමුදල
    - සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල
    - අනුමත විශ්‍රාම හා අර්සාධක අරමුදල්
    - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල්

      (2015 මහ බැංකු වාර්ෂික වාර්තාව අනුව )

- මූල්‍ය ආයතන ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට දායක වන ආකාරය
  - ශ්‍රී ලංකා මහ බැංකුව (Central Bank of Sri Lanka )

    ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ නියෝජිතයකු ලෙස ක්‍රියා කරන කේන්ද්‍රීය ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවයි. (ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවාවන් පිළිබඳ ව 7.3 නිපුණතා මට්ටමේ දී සාකච්ඡා කෙරේ.

  - බලපත්‍රලාභී වාණිජ බැංකු ( Licensed Commercial Banks )

    ජංගම ගිණුම් ඇතුළු අනෙකුත් තැන්පත් ගිණුම් පවත්වා ගෙන යාම හා මුදල් මැවීමට හැකියාව ඇති මූල්‍ය ආයතන විශේෂයයි.
    ශ්‍රී ලංකා මහ බැංකුවේ හා මුදල් මණ්ඩලයේ ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකු රාශියක් ඇති අතර මේවායින් කිහිපයක් රාජ්‍ය අංශයට ද බහුතරයක් පෞද්ගලික අංශයට ද අයත් වේ.

නිදසුන් ෘ
රාජ්‍ය අංශයේ වාණිජ බැංකු - ලංකා බැංකුව
මහජන බැංකුව

පෞද්ගලික අංශයේ වාණිජ බැංකු - සම්පත් බැංකුව, කොමර්ෂල් බැංකුව,
හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව

(බලපත්‍රලාභී වාණිජ බැංකුවල සේවා පිළිබඳ ව 7.4 හා 7.5 නිපුණතා මට්ටම්වල දී සාකච්ඡා කෙරේ. )

- බලපත්‍රලාභී විශේෂිත බැංකු ( Licensed Specialized Banks)

  බැංකු පනත යටතේ විශේෂිත බැංකුවක් ලෙස ව්‍යාපාර කටයුතු කර ගෙන යාමට මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගෙන ඇති ආයතන විශේෂයකි. මෙහි ඇති විශේෂත්වය නම් ජංගම ගිණුම් පවත්වා ගෙන යාමට අවසර නො මැති වීමයි. එහෙත් ඉතිරි කිරීමේ ගිණුම් හා කාලීන තැන්පත් ගිණුම් වශයෙන් මහජනතාවගෙන් මුදල් තැන්පත් භාර ගැනීමට අවසර ඇත.

  නිදසුන් ෘ ජාතික ඉතිරි කිරීමේ බැංකුව
  ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව
  ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
  රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

  බලපත්‍රලාභී විශේෂිත බැංකු ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට දායක වන ආකාරය
  - කාලීන හා ඉතිරි කිරීමේ තැන්පත් භාර ගැනීම
  - විවිධ ක්ෂේත්‍රවල ව්‍යවසායකයින්ට ණය සැපයීම
  - සමාගම්වල කොටස් ප්‍රාරක්ෂණ කටයුතු කිරීම
  - කල්බදු පහසුකම් සැපයීම
  - කළමනාකරණ උපදේශන සේවා සැපයීම

- බලපත්‍රලාභී මුදල් සමාගම් (Finance Companies )
  කාලීන තැන්පතු භාර ගැනීම හා එම මුදල් මත ණය දීම සහ ආයෝජනයට පහසුකම් සලසන, මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගෙන ඇති පොදු සමාගම් විශේෂයකි.

  නිදසුන් ෘ
  එල්.බී. ෆිනෑන්ස් පී.එල්.සී.
  සිංහ පුත්‍ර ෆිනෑන්ස් පී.එල්.සී.
  ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී.
  සිංගර් ෆිනෑන්ස් පී.එල්.සී.

බලපත්‍රලාභී මුදල් සමාගම්වල කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

- කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම
- දේපළ හා ඉඩම් වෙළෙඳාම් කිරීම
- කල්බදු මූල්‍යකරණය
- කෙටිකාලීන ණය සැපයීම
- රජයේ සුරැකුම්පත්වල ආයෝජනය
- කාලීන තැන්පතු භාර ගැනීම

- සමුපකාර ග්‍රාමීය බැංකු ( Co-operative Rural Banks)

සාමාජික හා සාමාජික නො වන්නන්ගෙන් කාලීන හා ස්ථාවර තැන්පත් ලබා ගැනීම සහ සිය සාමාජිකයින්ට ණය සැපයීම ප්‍රධාන කාර්යය කොටගත් ආයතනයකි. මෙය විවිධ සේවා සමුපකාර සමිතිවල බැංකු ව්‍යාපාරික අංශයයි.
නිදසුන් : මහරගම විවිධ සේවා සමුපකාර සමිතියේ සමුපකාර ග්‍රාමීය බැංකුව

සමුපකාර ග්‍රාමීය බැංකුවල කාර්යයන්

- සාමාජික හා සාමාජික නො වන්නන්ගෙන් තැන්පත් ලබා ගැනීම
- උකස් කටයුතු කිරීම
- ඉතිරි කිරීමේ හා ස්ථාවර තැන්පත් ගිණුම් පවත්වා ගැනීම
- සාමාජිකයින්ට කෘෂිකර්මය, නිෂ්පාදනය, කර්මාන්ත හා අලෙවි කටයුතු සඳහා ණය පහසුකම් සැලසීම
- සමුපකාර ජීවන ක්‍රමය ගැමි ජනතාව අතර ප්‍රචලිත කිරීම

- සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිතිය (සණස)

ඉතිරි කිරීම් දිරිමත් කිරීමත්, සාමාජිකයින්ට ණය සැපයීමත් අරමුණු කර ගෙන සාමාජිකයින්ගේ ඉතුරුම් ලෙස හා සාමාජික කොටස් ලෙස මුදල් ලබා ගෙන සාමාජිකයින්ට පමණක් ණය සපයන, සමුපකාර පනත යටතේ සමුපකාර කොමසාරිස් වෙත ලියාපදිංචි කළ යුතු ආයතන විශේෂයකි.

නිදසුන් : නෙලුම්කුළම සණස සමිතිය
අත්තනගල්ල සණස සමිතිය

සණස සමිති පහත කාර්යයන් ඉටු කරයි.

- සාමාජිකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි මධ්‍යස්ථාන පවත්වා ගෙන යාම
- සමිතිය නියැලි ක්ෂේත්‍රයේ උපකරණ සහන මිලට අලෙවි කිරීම
  නිදසුන් : ධීවර සමුපකාර සමිති ධීවර ආම්පන්න අලෙවි කිරීම
- තැන්පත් භාර ගැනීම හා සාමාජිකයින්ට ණය සැපයීම

- විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (Special Leasing Companies)
  කල්බදුකරණය සඳහා ම මහ බැංකුවේ ලියාපදිංචි වූ සමාගම් විශේෂයකි. ව්‍යාපාරිකයින්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා වෙනත් වත්කම් පාවිච්චි කිරීම පිණිස ව්‍යාපාරිකයින්ගේ ඉල්ලීම පරිදි බද්දට ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත කරගත් මූල්‍ය ආයතන විශේෂයකි. අදාළ වත්කම් බද්දට දීමෙන් ලැබෙන කුලී ආදායම මෙම ආයතනවල ප්‍රධාන ආදායම වේ.
  නිදසුන් : ඇසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ්
  එල්ඕඑල්සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
  එස්.එම්.බී.ලීසිං පීඑල්සී
  ඉසුරු ලීසිං කම්පැනි ලිමිටඩ්

  කල්බදු සමාගම් මගින් ව්‍යාපාරිකයෙකුට අත්වන වාසි
  - විශාල වටිනාකමකින් යුත් වත්කම්, මුළු මුදල ම නොගෙවා භාවිතයට ඉඩකඩ ලැබීම
  - කල්බදු සඳහා ගෙවන කුලිය ආදායම් බද්දෙන් නිදහස් වීම
  - යන්ත්‍ර යල්පැනීම නිසා සිදු වන පාඩු හා ප්‍රාග්ධන අලාභ මගහැරීම
  - විශාල මුදලක් ආයෝජනය නොකර වැඩි ආදායමක් ඉපැයීමේ හැකියාව

- ප්‍රාථමික අලෙවිකරුවන් (Primary Dealers )
  රජයේ සුරැකුම්පත් ප්‍රථම වතාවට අලෙවි කොට මුදල් ලබා ගන්නා වෙළෙඳපොළ ප්‍රාථමික වෙළෙඳපොළයි. මෙම ප්‍රාථමික වෙළෙඳපොළට සහභාගී වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබා දී ඇති ආයතන ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස හැඳින්වේ.

  ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මූලික කාර්යභාරය වන්නේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ප්‍රාථමික වෙන්දේසිවලට සහභාගී වීමත්, භාණ්ඩාගාර සුකුම්පත් සම්බන්ධයෙන් ද්විතීයික වෙළෙඳපොළේ ගනුදෙනු කිරීමත් ය.
  නිදසුන් : කැපිටල් එලායන්ස් සමාගම
  සෙලින්කෝ ශ්‍රීරාම් සුරැකුම්පත් සමාගම
  ලංකා බැංකුව
  සම්පත් සුරැකුම්පත් සමාගම

- කොටස් තැරැව්කාර සමාගම් (Share Brokers )
  සංස්ථාපිත සමාගම්වල කොටස් හෝ ණයකර විකිණීම හා මිලට ගැනීම සම්බන්ධ කටයුතු කිරීමට අතරමැදියන් ලෙස කටයුතු කරන ආයතන තැරැව්කාර සමාගම් ලෙස හැඳින්වේ. කොටස් තැරැව්කරුවන් ලෙස ව්‍යාපාරික කටයුතු කිරීම සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගත යුතු ය.
  නිදසුන් : ආශා පීපල්ස් සුරැකුම්පත් සමාගම
  ඒෂියා සුරැකුම්පත් (පෞද්ගලික) සමාගම
  ජෝන් කීල්ස් කොටස් තැරැව්කාර (පෞද්ගලික) සමාගම
  ජේ.බී. සෙකියුරිටීස් (පෞද්ගලික) සමාගම

කොටස් තැරැව්කාර සමාගම්වල කාර්යයන්

- ආයෝජකයින්ගේ ගැනුම් ඇණවුම් හා විකුණුම් ඇණවුම් භාර ගැනීම
- ආයෝජකයින් වෙනුවෙන් මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම් විවෘත කිරීම
- කොටස් හා ණයකරවල ආයෝජනය සම්බන්ධ උපදෙස් ආයෝජකයින්ට සැපයීම
- කොටස් වෙළෙඳපොළ විශ්ලේෂණය කිරීම හා වෙළෙඳපොළ සමීක්ෂණ වාර්තා සැකසීම මගින් ආයෝජකයින්ගේ ප්‍රතිලාභ උපරිම කිරීම සහතික කිරීම
- සමාගම් ලැයිස්තුගත කිරීමට අනුග්‍රහය දැක්වීම
- සීමාසහිත පොදු සමාගම්වලට ප්‍රාග්ධන සම්පාදනය සඳහා සහාය වීම


- ඒකක භාර /ඒකකභාර කළමනාකරණ සමාගම් (Unit Trust / Unit Trust Management Companies)

ඒකක භාරයක් යනු ආයෝජකයින්ට ඒකක (Units) විකිණීමෙන් රැස් කර ගන්නා මුදල්වලින් සමන්විත ආයෝජන අරමුදලකි. මෙහි රැස් කර ගත් මුදල් වෘත්තීය අරමුදල් කළමනාකරුවන් විසින් ආයෝජන කළඹක යොදවනු ලැබේ. එහි ප්‍රතිලාභ ඒකක භාරයේ ඒකක මිල දී ගත් ආයෝජකයින් අතරේ බෙදා හරිනු ලැබේ.

ඒකක භාරයක් පාර්ශ්ව තුනකින් සමන්විත වේ.

1. ඒකක භාරකරු
2. අරමුදල් කළමනාකරණ සමාගම
3. ඒකක හිමියන් හෙවත් ආයෝජකයින්

එම පාර්ශ්ව අතර සම්බන්ධතාව පහත සටහන මගින් දැක්විය හැකි ය.



නිදසුන් ඃ

| | |
|---|---|
| ඒකක භාරකරු | අරමුදල් කළමනාකරණ සමාගම |
| නාමල් ඒකක භාරය | නැෂනල් වත්කම් කළමනාකරණ සමාගම |
| සී බැන්ක් ඒකක භාරය | ද යුනිට්ට්‍රස්ට් කළමනාකරණ (පෞද්.)සමාගම |
| සිලෝන් ඉතුරුම් අරමුදල | සිලෝන් වත්කම් මැනේජ්මන්ට් සමාගම |

ඒකක භාරවල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ

- විවිධාංගීකරණය වූ ආයෝජනවල මුදල් යෙදවීම නිසා අවදානම අඩු වීම
- ආයෝජන කළමනාකරණය සඳහා වෘත්තීය කළමනාකරුවන්ගේ සේවය ලබා ගත හැකි වීම

- වෙළෙඳපොළ අතරමැදියන් ඃ ( Market Intermidieries)
  ප්‍රාරක්ෂකයින් , ආයෝජන කළමනාකරුවන් සහ ආන්තික සැපයුම්කරුවන් මෙයට ඇතුළත් වන අතර මූල්‍ය උපකරණ වෙළෙඳාම් කිරීමේ අතරමැදියන් ලෙස මොවුන් කටයුතු කරයි. මූල්‍ය උපකරණ විකුණා දීමේ සේවය සඳහා සේවා ගාස්තු, මිල දී ගන්නන්ගෙන් සහ විකුණන්නන්ගෙන් අයකර ගනී.

  ප්‍රාරක්ෂකයන් (Underwriters)
  සමාගමක් මහජනයාට කරනු ලබන සුරැකුම් නිකුතුවක දී නියමිත කාලය තුළ සැලසුම් කළ අරමුදල් ප්‍රමාණය සපයා ගත නො හැකි වූ විට ආයෝජකයින් විසින් මිල දී නො ගෙන ඉතිරි වූ සුරැකුම් මිල දී ගැනීමට ගිවිස ගන්නා ආයතනයි.

  ආයෝජන කළමනාකරුවන් යනු මහජනයාට කරනු ලබන සුරැකුම් නිකුතුවක දී ඒ සඳහා විවිධ සේවා සපයන ආයතන ය. එම ආයතන සපයන සේවා නම්,
  - නිකුතුව පිළිබඳ ආයෝජන ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීම
  - ආයෝජන ඉල්ලුම් පත්‍ර භාර ගැනීම
  - ආයෝජකයින්ට සුරැකුම් බෙදා දීම
  - නිකුතුව පිළිබඳ මුදල් කළමනාකරණය
  - ප්‍රචාරක කටයුතු

  ආන්තික සැපයුම්කරුවන් යනු වෙළෙඳ ආයතන ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති වෙළෙඳ ණය අය කිරීම සහ ණය මිල දී ගැනීම (factoring) සිදු කරනු ලබන ආයතන ය. සාධ්‍යකරණ ආයතන ලෙස ද මේවා හඳුන්වයි.

- ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් (Venture Capital Companies )
  නව ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් කටයුතු කරන ආයතන විශේෂයකි. නව ව්‍යාපාර ආරම්භ කිරීම, පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීම, ව්‍යාපාර පවරා ගැනීම හා මිල දී ගැනීම වැනි කටයුතුවල දී අරමුදල් සපයයි. මීට අමතර ව කොටස් ප්‍රාරක්ෂණය හා ණය සම්මේලය කිරීම ආදියෙහි ද යෙදේ.

  නිදසුන් ඃ සෙන්ට්‍රල් ෆිනෑන්ස් වෙන්චර් ෆන්ඩ් ලිමිටඩ්
  ලංකා වෙන්චර්ස් ලිමිටඩ්
  එන්ඩීබී වෙන්චර් ඉන්වෙස්ට්මන්ට් (පෞද්.) සමාගම

- රක්ෂණ සමාගම් (Insurance Companies)

  රක්ෂණ සමාගම්වල විවිධ රක්ෂණ ඔප්පු නිකුත් කිරීම මගින් ගොඩනැගෙන අරමුදල් මූල්‍ය වෙළෙඳපොළ ණය දීම හා ආයෝජනය කිරීම මගින් මූල්‍ය අතරමැදිකරණයක නිරත වන ආයතන වේ.

  නිදසුන් : සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
  සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම
  සීමාසහිත ජනශක්ති රක්ෂණ සමාගම

- අර්ථසාධක හා විශ්‍රාම අරමුදල්
  රාජ්‍ය කළමනාකාරිත්වයෙන් හා පෞද්ගලික කළමනාකාරිත්වයෙන් යුත් විශ්‍රාම අරමුදල් හා අර්ථසාධක අරමුදල් පවතී.

  නිදසුන් :
  - රාජ්‍ය කළමනාකාරිත්වයෙන් යුත් අරමුදල්
    සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල - මෙය ප්‍රතිපත්ති සම්පාදන,ආර්ථික කටයුතු, ළමා හා තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මගින් පරිපාලනය කෙරේ.

    රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
    මෙම අරමුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් කළමනාකරණය කරනු ලබයි.

    සේවක අර්ථසාධක අරමුදල
    ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය සඳහා පවතින විශාලත ම විශ්‍රාම අරමුදල වන මෙය කම්කරු කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබයි. අරමුදල කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

  - පෞද්ගලික කළමනාකාරිත්වයෙන් යුත් අරමුදල්
    අනුමත විශ්‍රාම හා අර්ථසාධක අරමුදල් කම්කරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

**නිපුණතාව 7** : ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතන දක්වන දායකත්වය අගයයි.

**නිපුණතා මට්ටම 7.3** : ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් ඵල** :

- ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ හැඳින්වීමක් කරයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් ලැයිස්තුගත කරයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ ව හැඳින්වීමක් කරන්න.

  ☞

- ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු පැහැදිලි කරන්න.

  ☞

- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් පැහැදිලි කරන්න.

  ☞

- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

  ☞

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත දැක්වෙන ප්‍රවෘත්ති කාණ්ඩ කෙරෙහි අවධානය යොමු කරන්න.

  **ප්‍රවෘත්ති කාණ්ඩය** - 1
  මහ බැංකුව පහත මුදල් අගයන් ප්‍රකාශයට පත් කර ඇත.
  ඇමරිකන් ඩොලරය රු. 134
  යුරෝ රු. 143
  ස්ටර්ලින් පවුම රු. 208

  **ප්‍රවෘත්ති කාණ්ඩය** - 2
  ශ්‍රී ලංකාවේ විවිධ පළාත් නියෝජනය වන පරිදි රු. 10 කාසි නිකුත් කරයි.

  **ප්‍රවෘත්ති කාණ්ඩය** - 3
  වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාව අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරයි.

**ප්‍රවෘත්ති කාණ්ඩය - 4**
වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වා ගත යුතු සංචිත අනුපාත ඉහළ දමයි.

**ප්‍රවෘත්ති කාණ්ඩය - 5**
පෞද්ගලික අංශයේ සේවකයින්ගේ අර්ථ සාධක අරමුදල් ශේෂය මත 30% ක මුදලක් සේවකයාට ලබා දෙයි.

- ඉහත එක් එක් ප්‍රවෘත්ති කාණ්ඩය තුළ අන්තර්ගත වී ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය හඳුනාගන්න.
- ඉහත එක් එක් කාර්යය ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

- සිසු අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- 1949 අංක 58 දරණ මුදල් නීති පනත යටතේ 1950 අගෝස්තු මස 28 වෙනි දින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ නියෝජිතයකු ලෙස ක්‍රියා කරනු ලබන කේන්ද්‍රීය ආයතනය වේ. එහි ආරම්භක අධිපතිවරයා වූයේ ජෝන් එක්ස්ටර් මහතා ය.

- පස් දෙනෙකුගෙන් සමන්විත මුදල් මණ්ඩලයක් මගින් මහ බැංකුවේ සංවිධාන කටයුතු සිදු කෙරෙන අතර, එම මුදල් මණ්ඩලය, මහ බැංකු අධිපති, මුදල් විෂය භාර අමාත්‍යාංශ ලේකම් හා පත්කළ සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

- ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රධාන අරමුණු දෙකක් පෙරදැරි ව කටයුතු කරයි.
  - ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගෙන යාම
  - මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙන යාම

**ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වා ගෙන යාම**
දේශීය මුදලේ අගය ස්ථාවර ව පවත්වා ගැනීම හෙවත් සුරක්ෂිත කිරීම මිල ස්ථායීතාව වේ. මේ තුළින් උද්ධමන හා අවධමන තත්ත්වයන්ගෙන් තොර ව ආර්ථිකය පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ. උද්ධමනය අඩු මට්ටමක පවතින විට ආර්ථිකය හොඳින් ක්‍රියාත්මක වේ. තිරසර ආර්ථික වර්ධනයක් හා ඉහළ සේවා නියුක්තියක් ඇති කිරීමට මෙය ඉවහල් වේ.

**මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙන යාම**
ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ලෙස හැඳින්වේ. එනම් මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතතාව ඇති කිරීම, ස්ථායීතාවට එල්ල විය හැකි තර්ජන හඳුනා ගැනීම සහ ඒවා අවම කිරීම තුළින් මූල්‍ය ක්‍රමය ශක්තිමත් කිරීමේ හැකියාව ඇත. මෙ මගින් තැන්පත්කරුවන්ට හා ආයෝජකයින්ට යන දෙපාර්ශ්වයට ම හිතකර වාතාවරණයක් උදා කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණ ඉටු කර ගැනීම සඳහා පහත කාර්යයන්හි නියැලේ.

- මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන්
    - මුදල් ප්‍රතිපත්ති මෙහෙය වීම
    - විනිමය අනුපාතික ප්‍රතිපත්ති මෙහෙය වීම
    - ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය
    - ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බෙදා හැරීම
    - බැංකු හා බැංකු නො වන ආයතනවල අධීක්ෂක ලෙස කටයුතු කිරීම
    - රජයේ ආර්ථික උපදේශක, බැංකුකරු සහ මූල්‍ය නියෝජිතයා වශයෙන් කටයුතු කිරීම
    - මහ බැංකුවේ පියවීම් ගිණුම් පවත්වා ගෙන යන වාණිජ බැංකුවලට හා ප්‍රාථමික වෙළෙඳුන්ට නිෂ්කාශන සහ පියවීමේ පහසුකම් සැපයීම

- මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයන්
    - රාජ්‍ය ණය කළමනාකරණය
    - විදේශ විනිමය පාලනය
    - කුඩා පරිමාණ මූල්‍යකරණ වැඩසටහන් සඳහා ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම
    - සේවක අර්ථ සාධක අරමුදල කළමනාකරණය

- ව්‍යාපාරවල සාර්ථකත්වයට මහ බැංකුවේ කටයුතු ඉවහල් වන ආකාරය පහත පරිදි පැහැදිලි කළ හැකි ය.
    - ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය - ස්ලිප්ස්
      (Sri Lanka Inter - Bank Payment System - SLIPS)

        - පරිගණක භාවිත කරමින් බැංකු අතර සිදු වන ගනුදෙනු පියවීම සඳහා භාවිත කරනු ලබන ක්‍රමයකි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යනු ලැබූ මෙම අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය, ශ්‍රී ලංකා මහ බැංකුවට හා වාණිජ බැංකුවලට හවුල් අයිතියක් ඇති සීමා සහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම වෙත පවරා දෙන ලදී.

        - සීමාසහිත ලංකා ක්ලියර් (පෞද්.) සමාගම විසින් පහත නිෂ්කාශන සේවා ඉටු කරයි.
            - චෙක්පත් හා අණකර හුවමාරුව හා ශුද්ධ ශේෂය ගණනය කිරීම
            - එම ශුද්ධ ශේෂ මහ බැංකුව හා අනෙකුත් වාණිජ බැංකු වෙත දැනුම් දීම
        - ලංකා ක්ලියර් පුද්ගලික සමාගම විසින් "ලංකාපේ " (Lankapay)යන සන්නම් නාමය යටතේ ගනුදෙනු සඳහා පොදු කාඩ්පතක් හඳුන්වා දී ඇත.

- ජගත් අන්තර්බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන ජාලය -
  ස්විෆ්ට් සන්නිවේදන ජාලය - (SWIFT - Sri Lanka Worldwide Inter Bank Financial Telecommuncaition )

  නවීනත ම තාක්ෂණය මත පදනම් වූ ලොව පුරා මූල්‍ය වෙළෙඳපොළවල් ආවරණය කෙරෙන සන්නිවේදන ජාලයකි. මෙ මගින් ජාත්‍යන්තර වශයෙන් බැංකු අතර සිදු වන මුදල් පැවරුම් පිළිබඳ ව කටයුතු කරයි.

- තත්කාලීන දළ පියවීම් පද්ධතිය - (RTGS - Real Time Gross Settlement system)

  ශ්‍රී ලංකාවේ බැංකු අතර වටිනාකම් අධික ගෙවීම් කාල පමාවකින් තොර ව උසස් තාක්ෂණය හා ප්‍රමිතීන් යොදා ගනිමින් පියවීම සඳහා පිහිටුවා ඇති පරිගණක ගෙවුම් ක්‍රමයයි. ඉතා සුළු කාලයකින් පියවිය හැකි විම නිසා මෙම ක්‍රමය වැදගත් වේ. මෙය රට තුළ ඇති එක ම විශාල වටිනාකම් සහිත ජාතික ගෙවීම් පද්ධතියයි.

- ලේඛන රහිත සුරැකුම් තැන්පතු පද්ධතිය - (SSDS - Scriptless Securites Depository System)

  මුද්‍රණය කරන ලද සුරැකුම්පත් සහතික භාවිතය වෙනුවට සුරැකුම්පත් මිල දී ගැනීමට හෝ විකිණීමට අදාළ ගනුදෙනුවක් කිරීම සඳහා ලේඛන රහිත ව භාවිත වන ක්‍රමයයි. මෙය ලංකා සෙක්‍යු (Secure) යන නමින් ද හඳුන්වයි.
  මුද්‍රිත සුරැකුම්පත් ළඟ තබා ගැනීමේ දී හා විකිණීමේ දී ආයෝජකයාට දැරීමට සිදු වන අවදානම මෙ මගින් අහෝසි වේ.

ඉහත පද්ධති දෙක එක් ව ගත් විට ලංකා සෙට්ල් පද්ධතිය ලෙස හඳුන්වයි.
(RTGS + SSDS = Lanka settle system )

- මේ අනුව ව්‍යාපාරවල ආයෝජනය කිරීම පිළිබඳ ව සුරක්ෂිතතාව ඇති වීම, මූල්‍ය ගනුදෙනු පහසු වීම හා කාර්යක්ෂම වීම සිදු වන බැවින් ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය හා දිගුකාලීන පැවැත්ම සඳහා මහ බැංකුවේ කාර්යයන් දායක වේ.

**නිපුණතාව 7** : ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතන දක්වන දායකත්වය අගයයි.

**නිපුණතා මට්ටම 7.4** : වාණිජ බැංකු පවත්වා ගෙන යන විවිධ තැන්පතු හා සපයන ණය ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට හා වර්ධනයට කරන බලපෑම පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- වාණිජ බැංකු පවත්වා ගෙන යනු ලබන විවිධ තැන්පතු වර්ග හඳුන්වයි.
- වාණිජ බැංකු පවත්වා ගෙන යන විවිධ තැන්පතු අතර සමාන අසමානකම් සන්සන්දනය කරයි.
- වාණිජ බැංකු පවත්වා ගෙන යන විවිධ තැන්පතු වර්ග ව්‍යාපාරිකයෙකුට වැදගත් වන ආකාරය පෙන්වා දෙයි.
- වාණිජ බැංකු සපයන ණය වර්ගීකරණය කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- වාණිජ බැංකු සපයන ප්‍රධාන සේවා සිසුන්ගෙන් විමසන්න.
- ප්‍රධාන සේවා වන්නේ තැන්පතු ආශ්‍රිත සේවා සහ ණය ආශ්‍රිත සේවා බව පැහැදිලි කරන්න.
- වාණිජ බැංකු පවත්වා ගෙන යන තැන්පතු වර්ග සිසුන්ගෙන් විමසා එම එක් එක් තැන්පතු වර්ගයේ විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.
- විවිධ තැන්පතු වර්ග ව්‍යාපාරිකයින්ට වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න.

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

> - පහත දැක්වෙන්නේ වාණිජ බැංකු පවත්වා ගෙන යන තැන්පතු වර්ග යුගල තුන කි.
>     - ජංගම ගිණුම් හා ඉතිරි කිරීමේ තැන්පතු
>     - ඉතිරි කිරීමේ තැන්පතු හා ස්ථාවර තැන්පතු
>     - ජංගම ගිණුම් හා ස්ථාවර තැන්පතු
>
> - ඔබේ කණ්ඩායමට ලැබුණු තැන්පතු වර්ග යුගලය අතර සමානකම් හා අසමානකම් සන්සන්දනය කරන්න.

- සිසු අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.

- වාණිජ බැංකු සපයන ණය වර්ග කර, එක් එක් වර්ගය පැහැදිලි කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- වාණිජ බැංකු සපයන ප්‍රධාන සේවාවන් දෙකකි.
  - තැන්පතු ආශ්‍රිත සේවා
  - ණය ආශ්‍රිත සේවා

**තැන්පතු ආශ්‍රිත සේවා :**
ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු), ඉතිරි කිරීමේ තැන්පතු හා ස්ථාවර තැන්පතු පවත්වා ගෙන යාම වාණිජ බැංකු විසින් පවත්වා ගෙන යන තැන්පතු ආශ්‍රිත සේවා වේ.

- **ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු):** (Current Accounts)
  චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ පහසුකම් ඇති, ශේෂය මත පොළී හිමි නො වන ගිණුම් වර්ගයකි. බැංකු අයිරා පහසුකම් සැලසෙන අතර ටෙලර්පත් භාවිතයෙන් ගනුදෙනු කළ හැකි ය.

- **ඉතිරි කිරීමේ තැන්පතු :** (Savings Accounts )
  ඉතිරි කිරීමේ පරමාර්ථයෙන් හඳුන්වා දී ඇති මෙම ගිණුම් වර්ගයට ශේෂය මත පොළියක් හිමි වේ. තැන්පත්කරුගේ අභිමතය පරිදි මුදල් තැන්පත් කිරීම හා ආපසු ගැනීම කළ හැකි ය. ටෙලර්පත් මගින් ද ගනුදෙනු කළ හැකි ය.

- **ස්ථාවර තැන්පතු:** (Fixed Deposits )
  නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා නිශ්චිත මුදල් ප්‍රමාණයක්, නිශ්චිත පොළියක් යටතේ තැන්පත් කිරීමකි. ඉතිරි කිරීමේ තැන්පතුවලට සාපේක්ෂ ව ඉහළ පොළියක් හිමි වේ.

- ඉහත තැන්පතු වර්ග අතුරෙන් ජංගම ගිණුම් පවත්වා ගෙන යාමෙන් ව්‍යාපාරිකයින්ට ලබා ගත හැකි පහසුකම් කිහිපයක් පහත දැක් වේ.

  - චෙක්පත් මගින් ගෙවීම් කළ හැකි වීම
  - ප්‍රේෂණ පහසුකම් ලබා ගත හැකි වීම
  - නිත්‍ය නියෝග මත ගෙවීම් කළ හැකි වීම
  - අයිරා පහසුකම් ලබා ගත හැකි වීම
  - බැංකුව සමග කළ ගනුදෙනුවල වාර්තාවක් ලබා ගත හැකි වීම (බැංකු ගිණුම් ප්‍රකාශය )

**ණය ආශ්‍රිත සේවා :**
- අයිරා පහසුකම්
- ණය
  - ව්‍යාපාරික ණය
  - පාරිභෝගික ණය

**අයිරා පහසුකම්**

- බැංකු අයිරා පහසුකම් යනු බැංකු ජංගම ගිණුමේ ඇති ශේෂය ඉක්මවා කිසියම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් දක්වා චෙක්පත් නිකුත් කිරීමට වාණිජ බැංකු මගින් ලබා දෙන අනුමැතියකි. මේවා තාවකාලික අයිරා පහසුකම් හා ස්ථාවර අයිරා පහසුකම් ලෙස වර්ග දෙකකි.

- අයිරා පහසුකමක් දී ඇති විටක එම ප්‍රමාණය දක්වා ගනුදෙනුකරුවන්ගේ චෙක්පත් ගෙවීම බැංකු විසින් කරනු ලැබේ. එසේ ජංගම ගිණුම්හිමියා (ගනුදෙනුකරු ) ජංගම ගිණුමේ ශේෂය ඉක්මවා නිකුත් කරන ලද චෙක්පත්වල වටිනාකම බැංකු අයිරාව ලෙස හැඳින්වේ. අයිරා සඳහා සාමාන්‍යයෙන් ඉහළ පොළියක් අය කෙරේ.

    - ස්ථාවර අයිරා පහසුකම් යනු අඛණ්ඩ ව කිසියම් අයිරා පහසුකමක් ලබා දීමයි. ස්ථාවර අයිරා ලබා ගැනීමේ දී වත්කම් ඇප තැබීම අවශ්‍ය වේ.

    - තාවකාලික අයිරා පහසුකම් යනු ස්ථාවර අයිරාවක් නො මැති ව ශේෂයට වඩා චෙක්පත් නිකුත් වී ඇති විට බැංකුව ඒ සඳහා මුදල් ගෙවීමයි.

- බැංකු ණය යනු කිසියම් පොළී ප්‍රතිශතයක් යටතේ ලබා ගන්නා ණය මුදල හා ඊට අදාළ පොළිය ආපසු ගෙවීමට යටත් ව ගිවිසගත් කොන්දේසි යටතේ බැංකුවක් විසින් දෙනු ලබන මුදලකි.

- බැංකු ණය වර්ග දෙකකි.
    - ව්‍යාපාරික ණය
    - පාරිභෝගික ණය

    - ව්‍යාපාරික ණය යනු පුද්ගලයෙකුට හෝ ආයතනයකට තම ව්‍යාපාරික කටයුතු සඳහා කෙටි කාලීන ව, මධ්‍ය කාලීන ව හා දිගු කාලීන ව අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම වේ.

    - පාරිභෝගික ණය යනු වත්කම් මිලට ගැනීමට හා හදිසි ආපදාවල දී පිරිමසා ගැනීමට පාරිභෝගිකයින්ට බැංකුව විසින් සපයන ණය වේ.

- බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමට ජංගම ගිණුමක් අත්‍යවශ්‍ය වන අතර බැංකු ණය ලබා ගැනීමට ජංගම ගිණුමක් අවශ්‍ය නො වේ.

**නිපුණතාව 7** : ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතන දක්වන දායකත්වය අගයයි.

**නිපුණතා මට්ටම 7.5** : වාණිජ බැංකු සපයන සේවා ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට ඇති කරන බලපෑම පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- වාණිජ බැංකු සපයන සේවා ලැයිස්තුගත කරයි.
- වාණිජ බැංකු සපයන එක් එක් සේවාව වෙන වෙන ම පැහැදිලි කරයි.
- එම සේවා ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරයි.
- තෝරාගත් ව්‍යාපාර ආයතනයක් වාණිජ බැංකුවලින් ලබා ගෙන ඇති සේවා විමසා ලැයිස්තුගත කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස්** :

- තැන්පතු පවත්වා ගෙන යාම හා ණය සැපයීම යන ප්‍රධාන සේවාවලට අමතර ව ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට අදාළ ව වාණිජ බැංකු සපයන අනෙකුත් සේවා සිසුන්ගෙන් විමසන්න.
- සිසුන් දක්වූ ප්‍රතිචාර කිහිපයක් සාකච්ඡා කර සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

> - ඔබ ප්‍රදේශයේ ඇති ව්‍යාපාර ආයතනයක් තෝරා ගන්න.
> - එම ආයතනය වාණිජ බැංකුවලින් ලබා ගෙන ඇති සේවා පහත ශීර්ෂ යටතේ ලැයිස්තුගත කරන්න.
>   - තැන්පතු වර්ග
>   - ණය වර්ග
>   - අනෙක් සේවා
> - සිසු අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.

- වාණිජ බැංකු සපයන අනෙකුත් සේවා ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :

- තැන්පතු භාර ගැනීම හා ණය සැපයීමට අමතර ව වාණිජ බැංකු විසින් ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට බලපාන පහත සඳහන් සේවා ද සපයනු ලබයි.

- **නියෝජිත සේවා** :
  වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවල දී ගනුදෙනුකරුවන් වෙනුවෙන් නියෝජිතයෙකු ලෙස කටයුතු කරයි.
  නිදසුන් :
  - සුරැකුම්පත් මිලයට ගැනීම හා විකිණීම
  - ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම
  - විදුලි බිල්පත් හා ජල බිල්පත් ගෙවීම

- **කල්බදු සේවා**

  (7.2 නිපුණතා මට්ටමේ දී විස්තර කර ඇත)

- **විද්‍යුත් බැංකු සේවා ( E- Banking)**

  අන්තර්ජාලය හරහා බැංකු කටයුතු සිදු කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන්ට සපයා ඇති පහසුකම විද්‍යුත් බැංකු සේවා ලෙස හඳුන්වයි. එවැනි පහසුකම් කිහිපයක් පහත දැක්වේ.

  - **හෝම් බෑංකින් : ( Home Banking)**

    තම පෞද්ගලික පරිගණකය මගින් අන්තර්ජාලය හරහා බැංකුවේ වෙබ් අඩවියට පිවිස රහස් අංකය භාවිත කොට ස්වයංක්‍රීය ව බැංකු පහසුකම් ලබා ගැනීම මෙහි අදහසයි.

  - **දුරකථන බැංකු සේවා (Tele Banking)**

    ගනුදෙනුකරු බැංකුව වෙත නො ගොස් තම දුරකථනය භාවිත කිරීමෙන් වාණිජ බැංකු කටයුතු සිදු කර ගැනීමයි.

- **උකස් සේවා :**

  ස්වර්ණාභරණ ඇපයට ගෙන හදිසි මුදල් අවශ්‍යතා සඳහා ණය ලබා දීම වාණිජ බැංකු විසින් සිදු කරන වැදගත් සේවාවකි.

- **සුරක්ෂිතාගාර පහසුකම් :**

  පුද්ගලයින්ගේ රන්, රිදී, මුතු, මැණික් ආභරණ, ඔප්පු වැනි වටිනා භාණ්ඩ හා වැදගත් ලියවිලි ආරක්ෂා කර දීම වාණිජ බැංකු විසින් සිදු කරයි. මේ සඳහා වාණිජ බැංකුවල විශේෂිත සේප්පු වෙන් කර ඇත.

- **විදේශ විනිමය මිල දී ගැනීම හා විකිණීම**

  විනිමය පාලන නියමයන් යටතේ ගනුදෙනුකරුවන්ගේ විදේශ මුදල් මිලට ගැනීමත්, ඔවුන්ට අවශ්‍ය විදේශ මුදල් විකිණීමත් වාණිජ බැංකු විසින් සිදු කරයි.

- **ණයපත් සේවාව :**

  කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත ආයතනවලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ බැංකු හෝ බලයලත් ආයතන විසින් නිකුත් කරන කාඩ්පත් විශේෂයකි. ණයපත් මගින් යම් සීමාවක් දක්වා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් මුදල් ලබා ගැනීමේ හැකියාව ද ඇත.

  නිදසුන් :

  - වීසා කාඩ්
  - මාස්ටර් කාඩ්
  - ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ්

- **මුදල් ප්‍රේෂණ කටයුතු :**

  ගිණුම් හිමියා වෙනුවෙන් ඔහුට ලැබීමට ඇති මුදල් ඔහුගේ ගිණුමට රැස් කිරීම මින් අදහස් වේ. විදේශයක සිටින පුද්ගලයෙකුට මුදල් පැවරීම මෙන් ම, විදේශයක සිටින පුද්ගලයින්ගෙන් ලැබෙන මුදල් රැස් කිරීම ද මේ යටතේ සිදු කෙරේ.

- **සංචාරක චෙක්පත් නිකුත් කිරීම :**
  දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ගනුදෙනු පහසුවෙන් හා ආරක්ෂාකාරී ව සිදු කිරීම සඳහා භාවිත කෙරෙන චෙක්පත් විශේෂයකි. සංචාරක චෙක්පත් , පොදුවේ පිළිගන්නා මුදල් වර්ගවලින්, විවිධ වටිනාකම් යටතේ නිකුත් කරයි. තමන් සතු මුදල් බැංකුවට ලබා දී එම වටිනාකමට බැංකුවෙන් සංචාරක චෙක්පත් ලබා ගන්නා අතර, සංචාරයේ යෙදෙන අතරතුර දී එම ප්‍රදේශයේ වාණිජ බැංකුවකට එම සංරචක චෙක්පත් ලබා දී නැවත මුදල් ලබා ගැනීමට හැකියාව ඇත. නිකුත් කිරීමේ දී බැංකුව විසින් සේවා ගාස්තුවක් අය කරනු ලබයි.

- **ස්වයංක්‍රීය බැංකු සේවා :**
  බැංකු ගිණුම් හිමියන්ට තම බැංකුවෙන් ලබා දී ඇති පහසුකම් බොහොමයක් බැංකුවට නො ගොස් දවසේ ඕනෑ ම වේලාවක ලබා ගැනීමට හැකි වන සේ හඳුන්වා දී ඇති විද්‍යුත් අරමුදල් හුවමාරු ක්‍රමයකි. මෙ මගින් ගනුදෙනුකරුවන්ට බැංකුවලින් පහත සේවා ලබා ගත හැකි ය.

  - **ස්වයංක්‍රීය බැංකු සේවා නිසා ගනුදෙනුකරුවන්ට අත්වන වාසි :**
    - ටෙලර් කාඩ්පත් භාවිතයෙන් ගිණුමෙන් මුදල් ආපසු ගැනීම
    - ගිණුමට මුදල් තැන්පත් කිරීම
    - ගිණුමකින් ගිණුමකට මුදල් මාරු කිරීම
    - ගිණුමේ ශේෂය දැන ගත හැකි වීම
    - බිල්පත් ගෙවීමේ පහසුකම් තිබීම

  - **ස්වයංක්‍රීය බැංකු සේවා නිසා බැංකුවලට අත්වන වාසි :**
    - පිරිවැය අඩු වීම
    - තදබදය අඩු වීම
    - නිරවද්‍යතාව ඉහළ වීම
    - කාර්ය මණ්ඩලය අඩු කර ගත හැකි වීම
    - බැංකු සේවා පුළුල් වී බැංකුවල ලාභදායිත්වය වැඩි වීම

- **ණයවර ලිපි නිකුත් කිරීම**
  ආනයනකරුගේ ඉල්ලීම මත ආනයනකරුගේ බැංකුව විසින් ආනයනකරු වෙනුවෙන් මුදල් ගෙවන බවට එකග වෙමින් අපනයනකරුගේ බැංකුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල ණයවර ලිපියයි.

- **වෙනත් සේවා :**
  උදා :
    - රක්ෂණ සේවා -
      වාණිජ බැංකු විසින් රක්ෂණ සමාගමක් සමග සම්බන්ධ වී තම බැංකුවේ ගිණුම් හිමියන් රක්ෂණය කිරීම
    - වෛද්‍ය සේවා සැපයීම (E- channalling - E- Billing)
    - ජනාකීර්ණ ස්ථානවල ATM යන්ත්‍ර ස්ථාපිත කර තිබීම
    - චෙක්පත් හා මුදල් තැන්පත් කිරීම සඳහා ම සුවිශේෂී වූ ATM යන්ත්‍ර ස්ථාපිත කර තිබීම

**නිපුණතාව 7** : ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතන දක්වන දායකත්වය අගයයි.

**නිපුණතා මට්ටම 7.6** : චෙක්පත් භාවිතයෙන් ගනුදෙනු පහසු කර ගත හැකි ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් ඵල** :

- චෙක්පත යන්න නිර්වචනය කරයි.
- චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව හඳුන්වයි.
- චෙක්පත් අධ්‍යයනයෙන් චෙක්පතක මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
- චෙක්පත් වර්ග කරයි.
- ධාරක චෙක්පත් හා විධාන චෙක්පත් අතර වෙනස පැහැදිලි කරයි.
- චෙක්පත් ලිවීමේ දී සැලකිළිමත් විය යුතු කරුණු ඉදිරිපත් කරයි.
- චෙක්පත් රේඛනය හඳුන්වා එහි අවශ්‍යතාව පැහැදිලි කරයි.
- දෙන ලද රේඛිත චෙක්පත් අධ්‍යයනයෙන් ඒවායේ ඇති රේඛන වර්ග කරයි.
- සාමාන්‍ය රේඛනය හා විශේෂ රේඛනය කළ හැකි ආකාර පැහැදිලි කරයි.
- චෙක්පත් පිටසන් කිරීම හඳුන්වයි.
- චෙක්පත් අගරු වීම හඳුන්වා, අගරු වන අවස්ථා පැහැදිලි කරයි.
- දෙන ලද තොරතුරු මත කිසියම් ගෙවීමක් සඳහා චෙක්පතක ආකෘතියක් ගොඩනගයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- චෙක්පතක් සිසුන්ට පෙන්වා ඒ පිළිබඳ ව ඔවුන් දන්නා දේ විමසන්න.
- සිසු ප්‍රතිචාර හුණු පුවරුවේ සටහන් කර, චෙක්පත යන්න නිර්වචනය කරන්න.
- චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව පෙන්වා දෙන්න.

☞

- චෙක්පතක ඡායා පිටපතක් බැගින් සිසු කණ්ඩායම්වලට ලබා දී පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

> - චෙක්පත හොඳින් අධ්‍යයනය කරන්න.
> - චෙක්පතෙහි ඔබ හඳුනාගත් තොරතුරු ලැයිස්තුගත කරන්න.
> - සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කරවන්න.

- චෙක්පතක මූලික ලක්ෂණ පැහැදිලි කරන්න.
- චෙක්පතක ආකෘතියක් ඇඳ එහි චෙක්පතක මූලිකාංග ලකුණු කරවන්න.

☞

- චෙක්පත් වර්ග පැහැදිලි කරන්න.

- චෙක්පතක් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරන්න.

- චෙක්පත් රේඛනය හඳුන්වා එහි අවශ්‍යතාව පැහැදිලි කරන්න.

- විවිධ රේඛන සහිත චෙක්පත්වල ඡායා පිටපත් හෝ ආකෘති පන්තියට ප්‍රදර්ශනය කර සිසුන් පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

> - ඔබට ලැබුණු චෙක්පත් හොඳින් අධ්‍යයනය කරන්න.
> - ඒවායේ ඇති රේඛන කෙරෙහි අවධානය යොමු කරන්න.
> - එම රේඛනවලින් අදහස් කෙරෙන දේ පැහැදිලි කරන්න.
> - එම රේඛනවල ඔබ දුටු වෙනස්කම් ලැයිස්තුගත කරන්න.

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කරවන්න.

- සිසුන්ගේ අනාවරණ ඇසුරෙන් රේඛන වර්ග පැහැදිලි කරන්න.
- සාමාන්‍ය රේඛනය හා විශේෂ රේඛනය කළ හැකි ආකාර පැහැදිලි කරන්න.
- චෙක්පත් රේඛනයේ දී යොදන පද පිළිබඳ ව පැහැදිලි කරන්න.

- චෙක්පත් පිටසන් කිරීම හඳුන්වන්න.
- අගරු නිවේදන කිහිපයක් සිසුන්ට ඉදිරිපත් කර, එහි සඳහන් කරුණු විමසා චෙක්පතක් අගරු වීම යන්න හඳුන්වා චෙක්පතක් අගරු වන අවස්ථා පැහැදිලි කරන්න.


**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ජංගම ගිණුම් හිමියකු (අණකරු) විසින් එහි සඳහන් මුදල නම සඳහන් පුද්ගලයාට (ආදායකයාට) හෝ රැගෙන එන අයෙකුට ගෙවන ලෙස බැංකුවට (අණලදුට) කරනු ලබන ලිඛිත නියෝගය චෙක්පතක් ලෙස හැඳින්වේ.

**චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව :**

| | | |
|---|---|---|
| අණකරු | (Drawer ) - | ගිණුම් හිමියා |
| අණලදු | (Drawee ) - | ගිණුම පවත්වා ගෙන යන වාණිජ බැංකුව |
| ආදායකයා | (Payee ) - | චෙක්පතෙහි නම සඳහන් පුද්ගලයා, චෙක්පතෙහි සඳහන් මුදල ලැබීමට හිමිකම ලබන්නා |

**චෙක්පතක මූලික ලක්ෂණ**




1. දිනය
2. බැංකුවේ නම හා ශාඛාවේ නම
3. ආදායකයාගේ නම
4. හෝ රැගෙන එන්නාට යන යෙදුම
5. චෙක්පතේ වටිනාකම අකුරෙන් හා ඉල්කමෙන්
6. ගෙවනු යන පදය
7. අණකරුගේ අත්සන
8. චුම්භක අක්ෂර හැඳුනුම් තීරය (මෙහි පිළිවෙලින් චෙක්පත් අංකය, බැංකුවේ අංකය, ශාඛාවේ අංකය හා ගිණුම් අංකය සඳහන් වේ )
9. චෙක්පතේ පිළිපත

- ප්‍රධාන වශයෙන් චෙක්පත් වර්ග දෙකකි.

**ධාරක චෙක්පත් (හාරක චෙක්පත් )** (Bearer cheques)

චෙක්පතෙහි මුද්‍රිත ව ඇති "හෝ රැගෙන එන්නාට" යන පදය කපා නො හැර ඇති චෙක්පතකි. පිටසන් කිරීමකින් තොර ව හුදු භාර දීමෙන් ධාරක චෙක්පත පැවරිය හැකි අතර බොහෝ දුරට මුදල් නෝට්ටුවකින් ගනුදෙනු කිරීම හා සමාන වේ.

**විධාන චෙක්පත්** (Order cheques )

හෝ රැගෙන එන්නාට යන පදය කපා හැර හෝ ඒ වෙනුවට "විධානයට" යන්න ලියා ඇති චෙක්පත් වේ. මෙවැනි චෙක්පතක් පැවරීමේ දී පිටසන් කිරීම අවශ්‍ය වේ. ධාරක චෙක්පතකට වඩා විධාන චෙක්පත්වල ආරක්ෂාව වැඩි ය.

- චෙක්පතක් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක් පහත දැක්වේ.


    - ලිවීමේ දී නො මැකෙන තීන්ත වර්ගයක් භාවිත කළ යුතු ය.
    - පිළිපතේ අදාළ විස්තර සටහන් කළ යුතු ය.
    - ලිවීමේ දී සිදු වන වැරදි තනි ඉරකින් කපා අණකරුගේ සම්පූර්ණ අත්සන යෙදිය යුතු ය.
    - එක ම භාෂා මාධ්‍යයක් භාවිත කළ යුතු ය.
    - අණකරුගේ අත්සන නියමාකාරයෙන් යෙදිය යුතු ය.
    - චෙක්පතකට යොදන දිනය හා එහි ආරක්ෂාව සඳහා ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.
    - හිස් චෙක්පතකට අත්සන් නො යෙදිය යුතු ය.

- **චෙක්පත් රේඛනය :** (Crossing the cheques)
  චෙක්පතක මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම හෝ වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම චෙක්පත් රේඛනය කිරීම ලෙස හඳුන්වයි. චෙක්පතකට සම්බන්ධ ඕනෑ ම පාර්ශ්වයකට රේඛනයක් සිදු කළ හැකි අතර, යොදන ලද රේඛනයක් අවලංගු කළ හැක්කේ චෙක්පතේ අණකරුට පමණි.

- **චෙක්පත් රේඛනයේ අවශ්‍යතාව :**
    - චෙක්පතට අමතර ආරක්ෂාවක් සැලසීම
    - චෙක්පතෙහි සඳහන් වටිනාකම එහි ආදායකයාට ලැබීම සහතික කිරීම
    - බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීම වැළැක්වීම


    - රේඛන වර්ග දෙකකි.
        - සාමාන්‍ය රේඛනය
        - විශේෂ රේඛනය

**සාමාන්‍ය රේඛනය** (General crossing )
වගන්ති සහිත ව හෝ රහිත ව චෙක්පතේ මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් ඇඳීම සාමාන්‍ය රේඛනය ලෙස හැඳින්වේ.



**විශේෂ රේඛනය : (Special crossing )**

සරල සමාන්තර රේඛා දෙකක් සහිත ව හෝ රහිත ව චෙක්පතක මුහුණත හරහා වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම විශේෂ රේඛනය වේ. මෙවැනි චෙක්පත්, රේඛනයේ නම සඳහන් බැංකුවේ ගිණුමක තැන්පත් කළ යුතු ය.




- චෙක්පතක රේඛනය තුළ "ගනුදෙනු කළ නො හැකි ය " යන පදය යෙදීමෙන් අදහස් වන්නේ මෙවැනි චෙක්පතක් පිටසන් කර පැවරිය හැකි බවත්, එම චෙක්පත පැවරීමේ දී පැවරුම්කරුට තිබූ අයිතියට වඩා වැඩි අයිතියක් පැවරුම්ලාභියාට හිමි නො වන බවත් ය. එම නිසා මෙවැනි රේඛනයක් යෙදූ චෙක්පතක් ලබා ගැනීමේ දී පැවරුම්ලාභියා එම චෙක්පතට පෙර තිබූ අයිතීන් පිළිබඳ සැලකිලිමත් විය යුතු බව ඇඟවේ.

- චෙක්පතක රේඛනය තුළ " ආදායකයාගේ ගිණුමට පමණයි " යන පදය යෙදීමෙන් අදහස් වන්නේ චෙක්පතෙහි නම සඳහන් ආදායකයාගේ ගිණුමට තැන්පත් කිරීමෙන් පමණක් මුදල් කර ගත හැකි බවයි. මෙය පැවරීම සීමා කෙරෙන රේඛනයකි.

- චෙක්පතක රේඛනය තුළ " රු. 5 000 ක් දක්වා පමණයි " යනුවෙන් මුදල් සීමාවක් යෙදීමෙන් අදහස් වන්නේ සඳහන් ව ඇති මුදල් ප්‍රමාණයට වඩා වැඩියෙන් චෙක්පතේ වටිනාකම සඳහන් නො විය යුතු බවයි.

- **චෙක්පත පිටසන් කිරීම** (Endorsement)
  චෙක්පතෙහි මුහුණත සඳහන් වන ආකාරයට ම ආදායකයා සිය නම චෙක්පතෙහි පිටුපස ලිවීම චෙක්පත පිටසන් කිරීම ලෙස හැඳින්වේ. (චෙක්පත දරන ඕනෑ ම අයෙකු චෙක්පත පැවරීමේ දී ඔහුගේ නම ලිවිය යුතු ය. ) චෙක්පත නීත්‍යානුකූල ව පැවරූ බව සනාථ කිරීම පිටසන මගින් සිදු වේ.

- **පිටසන යෙදීම අවශ්‍ය වන අවස්ථා**
  - ආදායකයා විසින් චෙක්පත බැංකුවෙහි තැන්පත් කිරීමේ දී
  - විධාන චෙක්පතක් නම් අන් අයෙකුට පවරන අවස්ථාවේ දී
  - රේඛනය නො කරන ලද චෙක්පත් බැංකු කවුන්ටරයට දී මුදල් ලබා ගැනීමේ දී

- **චෙක්පත් අගරු වීම** (Dishonour of cheques )
  ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කළ චෙක්පතකට මුදල් ගෙවීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කිරීම චෙක්පතක් අගරු වීම ලෙස හැඳින්වේ.

- **චෙක්පතක් අගරු වන අවස්ථා :**
  - ගිණුමේ ප්‍රමාණවත් මුදල් නො මැති වීම
  - අණකරු විසින් ගෙවීම නතර කර තිබීම
  - අණකරු බුන්වත් වීම
  - අණකරු මරණයට පත්වීම හා ඒ බව බැංකුවට දැනුම් දී තිබීම
  - ගානිෂි නියෝගයක් ලැබීම (උසාවි නියෝගයක් )
  - ලිඛිත වැරදි
  - ගිණුම වසා තිබීම

**තක්සේරුකරණය හා ඇගැයීම :**

පහත දී ඇති තොරතුරු හොඳින් කියවන්න

| |
|---|
| චතුර බණ්ඩාර යන අයට රු. 10 000 ක මුදලක් ඔබ විසින් ගෙවිය යුතු ව ඇතැයි උපකල්පනය කරන්න. ඔබගේ ජංගම ගිණුම මහරගම ලංකා බැංකු ශාඛාවේ ද, චතුර බණ්ඩාරගේ ජංගම ගිණුම අනුරාධපුර මහජන බැංකු ශාඛාවේ ද පවත්වා ගෙන යයි. ඉහත මුදල අද දින චෙක්පතකින් ගෙවීමට අදහස් කරයි. චෙක්පතක ආකෘතියක් ඇඳ උපරිම ආරක්ෂාව සැලසෙන පරිදි අදාළ චෙක්පත ලියා දක්වන්න. |

**නිපුණතාව 7** : ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතන දක්වන දායකත්වය අගයයි.

**නිපුණතා මට්ටම 7.7** : විද්‍යුත් මුදල් භාවිතයෙන් ගනුදෙනු පහසු කර ගත හැකි ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ජේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල :**

- විද්‍යුත් මුදල් යන්න පැහැදිලි කරයි.
- භාවිතයේ පවත්නා විද්‍යුත් මුදල් වර්ග පැහැදිලි කරයි.
- විද්‍යුත් මුදල් කාඩ්පතක ලක්ෂණ හා එම කාඩ්පතකට සම්බන්ධ පාර්ශ්ව හඳුන්වයි.
- විද්‍යුත් මුදල් භාවිතයේ වාසි හා අවාසි ලැයිස්තුගත කරයි.
- භාවිත වන එක් එක් විද්‍යුත් මුදල් වර්ගවල සුවිශේෂිතා වගුගත කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- විද්‍යුත් මුදල් කාඩ්පත් කිහිපයක් පන්තියට ප්‍රදර්ශනය කර එම කාඩ්පත් පිළිබඳ ව සිසුන් දන්නා තොරතුරු විමසන්න.
- පහත කරුණු මතුකර ගනිමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  කාඩ්පත් වර්ග, කාඩ්පත්වල ලක්ෂණ, නිකුත් කරන ආයතන
- විද්‍යුත් මුදල් යනු මොනවා දැයි පැහැදිලි කරන්න.

- භාවිතයේ පවත්නා විද්‍යුත් මුදල් වර්ග පැහැදිලි කරන්න.

- විද්‍යුත් මුදල් කාඩ්පතක ලක්ෂණ හඳුනා ගැනීමට සිසු කණ්ඩායම්වලට විද්‍යුත් මුදල් කාඩ්පත බැගින් ලබා දී පහත සඳහන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

> - ඔබට ලැබුණු කාඩ්පත හොඳින් නිරීක්ෂණය කරන්න.
>   - එය අයත්වන කාඩ්පත් වර්ගය
>   - එම කාඩ්පත නිකුත් කර ඇති ආයතනය
>   - එම කාඩ්පතේ අංකය
>   - කාඩ්පත් හිමියාගේ නම
>   - කාඩ්පත කල් ඉකුත් වන දිනය හා
>   - අනෙකුත් වැදගත් ලක්ෂණ හඳුනාගෙන ලියන්න.

- විද්‍යුත් මුදල් කාඩ්පතක ලක්ෂණ පෙන්වා දෙන්න.

- විද්‍යුත් මුදල් හා සම්බන්ධ පාර්ශ්ව හඳුන්වන්න.

- විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමේ වාසි හා අවාසි පෙන්වා දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

**විද්‍යුත් මුදල්** (E - money)
විද්‍යුත් ක්‍රමයට නැතහොත් පරිගණක ජාලයක් හරහා හුවමාරු වන මුදල් විද්‍යුත් මුදල් ලෙස සැලකේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට අරමුදල් මාරුවීමක් සිදු වේ. (Electronic Fund Transfer )

**විද්‍යුත් මුදල් වර්ග**

- ණයපත් - Credit cards
- හරපත් - Debit cards
- පෙර ගෙවුම් කාඩ්පත් - Pre - paid cards
- ස්මාර්ට් කාඩ්පත් - Smart cards
- ක්ෂුද්‍ර පත් - Micro chips

- **ණයපත්**

කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත වෙළෙඳ ආයතනවලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ බැංකුවක් හෝ බලයලත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කාඩ්පත් විශේෂය ණයපත් ලෙස හඳුන්වයි.

ව්‍යාපාරිකයෙකුට ණයපතක් ඉදිරිපත් කළ විට එහි වලංගුභාවය සහ ණය සීමාව පරීක්ෂා කිරීමට විද්‍යුත් සත්‍යාපන ක්‍රම ( Electronic verification systems ) යොදා ගැනේ. ව්‍යාපාරයේ ඇති යන්ත්‍රයට ණයපත ඇතුළත් කළ විට එම තොරතුරු ලබා ගත හැකි ය.

නමුත් විද්‍යුත් වාණිජ්‍යයේ දී ණයපත ඉදිරිපත් කිරීම අවශ්‍ය නො වන අතර අන්තර්ජාලය හරහා ණයපතෙහි තොරතුරු පමණක් ඉදිරිපත් කිරීමෙන් ගණුදෙනුව සිදු කළ හැකි ය.

| | | | |
|---|---|---|---|
| උදා : | සී බෑන්ක් වීසා | - | ලංකා බැංකුව |
| | පීපල්ස් වීසා | - | මහජන බැංකුව |
| | මාස්ටර් කාඩ් | - | සම්පත් බැංකුව |
| | සෙලාන් වීසා | - | සෙලාන් බැංකුව |

- ණයපත් මගින් ගනුදෙනු කිරීමේ වාසි හා අවාසි

**ගනුදෙනුකරුවන්ට අත්වන වාසි**

- ණයපතක් ලබා ගැනීම සඳහා ගිණුමක් තිබීම අවශ්‍ය නො වීම
- යම් කාලසීමාවක් දක්වා පොලී රහිත ණයක් වීම
- අනුමත සීමාව තුළ ATM යන්ත්‍ර මගින් මුදල් ලබා ගත හැකි වීම
- වට්ටම් හා ප්‍රසාද ලකුණු හිමි වීම

**ගනුදෙනුකරුවන්ට අත්වන අවාසි**

- ණයපත සඳහා මුදල් ගෙවීම ප්‍රමාද වීමෙන් දඩ මුදලක් ගෙවීමට සිදු වීම
- සෑම අලෙවිසැලකින් ම ගනුදෙනු සිදු කළ නො හැකි වීම

**ව්‍යාපාරිකයාට අත්වන වාසි**

- ණයට විකුණුම් සඳහා මුදල් ලැබීම ස්ථිර වීම
- පිරිවැටුම වැඩි වීම නිසා ලාභය වැඩි වීම
- නොමිලේ ප්‍රචාරණයක් ලැබීම

**ව්‍යාපාරිකයාට අත්වන අවාසි**

- බැංකුවට කොමිස් මුදලක් ගෙවීමට සිදු වීම
- විශේෂිත යන්ත්‍රයක් ස්ථාපිත කිරීමට සිදු වීම

- **හරපත්**

බැංකු ගිණුම් හිමියෙකුට, තම ගිණුමේ ඇති මුදල් වෙළෙඳසැල් ගෙවීම් පියවීමට පැවරීම සඳහාත්, ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් මුදල් ආපසු ලබා ගැනීම සඳහාත් බැංකුව විසින් නිකුත් කරනු ලබන ප්ලාස්ටික් කාඩ්පත් විශේෂයකි. ගිණුමේ ඇති ශේෂය සඳහා පමණක් හරපත් හිමියාට ගනුදෙනු සිදු කළ හැකි ය.

නිදසුන් :

| | |
|---|---|
| SET | සම්පත් බැංකුව |
| PET | මහජන බැංකුව |
| Catsupper | කොමර්ෂල් බැංකුව |

**හරපත් මගින් ගනුදෙනු කිරීමෙන් ගනුදෙනුකරුවන්ට අත්වන වාසි**

- ගිණුමේ ඇති මුදල් භාවිත කරන නිසා පොළියක් ගෙවිය යුතු නො වීම
- ගනුදෙනුව එම අවස්ථාවේ ම නිම වීම
- ATM යන්ත්‍ර හරහා මුදල් ලබා ගැනීම ද කළ හැකි වීම

**හරපත් මගින් ගනුදෙනු කිරීමෙන් ගනුදෙනුකරුවන්ට අත්වන අවාසි**

- ගිණුමක් තිබීම අනිවාර්ය වීම
- ගිණුමේ ඇති ශේෂය දක්වා පමණක් ගනුදෙනු සිදු කළ හැකි වීම

- **පෙර ගෙවුම් කාඩ්පත්**

කලින් මුදල් ගෙවා ලබා ගත හැකි කාඩ්පත් විශේෂයකි. මුදල් හෝ චෙක්පත් වෙනුවට ආරක්ෂාකාරී මෙන් ම පහසු විද්‍යුත් ගෙවීම් ක්‍රමයකි. බැංකු ගිණුම් නො මැති අයට පවා පෙර ගෙවුම් කාඩ්පත් භාවිතය මගින් විද්‍යුත් ක්‍රමයට ගෙවීම් කළ හැකි ය.

නිදසුන් : දුරකථන කාඩ්පත්
Travell pass

- **ස්මාර්ට් කාඩ්පත්**

මෙය integrated circuit card එකකි. මෙහි මුදල් වටිනාකමක් සහිත chip එකක් අන්තර්ගත ය. මෙය භාවිත කර ගනුදෙනුවක් සිදු කළ විට එම ගනුදෙනුවේ වටිනාකම හර වී ශේෂය අඩු වේ. අදාළ නිකුතු ආයතනයට මුදල් ගෙවා වරින් වර මුදල් ගබඩා කර (Re-Loard ) ගත හැකි ය. ස්මාර්ට් කාඩ්පත මගින් ණයපතක, හරපතක, ATM කාඩ්පතක කාර්යයන් ද සිදු කළ හැකි අතර මෙය විද්‍යුත් මුදල් පසුම්බියක් (E-purse) ලෙස භාවිත කළ හැකි ය.

- විද්‍යුත් මුදල් කාඩ්පත්වල පහත සඳහන් ලක්ෂණ දැකිය හැකි ය.

මුහුණත




පිටුපස




- නිකුත් කරන ආයතනයේ නම හා ලාංඡනය
- කාඩ්පත් වර්ගය
  නිදසුන් : (Debit card, Credit card , ATM card )
- කාඩ්පත් අංකය
- සන්නම් ලාංඡනය (Brand Lago )
  නිදසුන් : VISA , Master
- කල් ඉකුත් වන දිනය
- කාඩ්පත් හිමියාගේ නම
- කාන්දම් පටිය (Magnetic stripe)
- අත්සන් පටිය (Signature stripe)
- කාඩ්පත් ආරක්ෂිත සංකේතය ( card security code )
- ත්‍රිමාන චිත්‍රය (Holo gram)
- නිකුතු ආයතනයේ නම , ලිපිනය හා කොන්දේසි
- ගනුදෙනුකරු සේවා දුරකථන අංකය : (customer service hotline)

- විද්‍යුත් මුදලින් ගනුදෙනු පියවීමේ දී පහත සඳහන් පාර්ශ්ව සම්බන්ධ වේ.

    - කාඩ්පත් හිමියා
    - කාඩ්පත් නිකුත් කරන ආයතනය
    - වෙළෙන්දා හෙවත් විකුණුම්කරු
    - ණයපත් සංගමය
      නිදසුන් :
      වීසා, මාස්ටර්, ඇමරිකන් එක්ස්ප්‍රස් (AMEX)

- විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමේ වාසි හා අවාසි කිහිපයක් පහත දැක්වේ.
  **වාසි :**
    - ගනුදෙනු කිරීමේ දී පිරිවැය අඩු වීම
    - මුදලේ ආරක්ෂාව තහවුරු වීම
    - දවසේ පැය 24 පුරා ම ගනුදෙනු කළ හැකි වීම
    - ගෙවීම් කටයුතු පහසු වීම
    - විවිධ ප්‍රතිලාභ හිමි වීම
    - විදේශ ගනුදෙනු සඳහා ද භාවිත කළ හැකි වීම

  **අවාසි :**
    - පොළී, ප්‍රමාද ගාස්තු වැනි පිරිවැය දැරීමට සිදු වීම
    - වංචනික ක්‍රියා සිදු වීම
    - අනවශ්‍ය පරිභෝජන රටාවකට හුරු වීම
    - තාක්ෂණික දෝෂ නිසා ගනුදෙනුවලට බාධා සිදු වීම
    - සියලු ම ගනුදෙනුකරුවන්ට ගනුදෙනු කිරීමට හැකියාවක් හා ශක්තියක් නො මැති වීම

**තක්සේරුකරණය හා ඇගැයීම :**

- " විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමෙන් ගනුදෙනුකරුටත් වෙළෙන්දාටත් සෑම විට ම වාසි අත්වේ " යන මාතෘකාව යටතේ පන්තිය කණ්ඩායම් දෙකකට වෙන් කර විවාදයක් පවත්වන්න.

**නිපුණතාව 8** : ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 8.1** : ව්‍යාපාරවල පැවැත්මට හේතු වන රක්ෂණ සේවාවේ වැදගත්කම විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් ඵල :**

- අවදානම යන්න පැහැදිලි කරයි.
- ව්‍යාපාරවලට මුහුණ දීමට සිදු විය හැකි අවදානම් ලැයිස්තුවක් පිළියෙල කරයි.
- රක්ෂණය යන්න හඳුන්වයි.
- රක්ෂණය කළ හැකි අවදානම් හා රක්ෂණය කළ නො හැකි අවදානම් ලෙස අවදානම් වර්ග කරයි.
- රක්ෂණය කළ හැකි අවදානම් යන්න පැහැදිලි කර නිදසුන් දක්වයි.
- රක්ෂණය කළ නො හැකි අවදානම් යන්න පැහැදිලි කර නිදසුන් දක්වයි.
- ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව තහවුරු කරයි.
- රක්ෂණ ගිවිසුම යන්න පැහැදිලි කරයි.
- රක්ෂණ ගිවිසුමට සම්බන්ධ පාර්ශ්ව හඳුන්වයි.
- රක්ෂණ ගිවිසුමක ඇතුළත් වන කරුණු ලැයිස්තුගත කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ජීවිතවලට හා දේපළවලට සිදු විය හැකි අවදානම් සිසුන්ගෙන් විමසන්න.
- එම අවදානම් ආවරණය කිරීම සඳහා විවිධ රක්ෂණ ක්‍රම හා ඒ හා සම්බන්ධ වන රක්ෂණ ආයතන පවතින බව පැහැදිලි කරන්න.
- අවදානමක් ආවරණය කර ගැනීම සඳහා රක්ෂණයට භාජනය වන පාර්ශ්ව, රක්ෂණ ආයතනය සමග එකඟතාවක් ඇති කර ගන්නා බව පැහැදිලි කරමින් රක්ෂණය යන්නට නිර්වචනයක් ගොඩනගන්න.

☞

- පහත සඳහන් අවදානම් සිසුන්ට ඉදිරිපත් කරන්න. ඒවා රක්ෂණය කළ හැකි අවදානම් හා රක්ෂණය කළ නො හැකි අවදානම් ලෙස වෙන් කර දැක්වීමට උපදෙස් දෙන්න.
  - නිවසට සොරු ඇතුළු වී රන් භාණ්ඩ රැගෙන යාම
  - ශිෂ්‍යයෙකු අ.පො.ස. (උ.පෙළ) විභාගය අසමත් වීම
  - ඔබ සතු මෝටර් රථය අනතුරකට පත්වීම
  - ඔබගේ මෝටර් රථය ක්ෂය වීම
  - ණයගැතියෙකුගෙන් ලැබිය යුතු ණය මුදල නො ලැබී යාම
  - මිල දී ගත් ලොතරැයි පත සඳහා දිනුමක් නො මැති වීම
  - ඔබට ගුරුවරුන්ගේ ආදරය නො ලැබී යාම
  - වල් අලි ප්‍රහාරයකින් ඔබේ නිවස විනාශ වී යාම
  - ඉදිරි වර්ෂයේ දී ව්‍යාපාරයට අලාභ ලැබීම
  - ව්‍යාපාරයේ පරිගණකය තාක්ෂණික වශයෙන් යල් පැනීම

- සිදු වන සියලු ම අවදානම් රක්ෂණය මගින් ආවරණය කර ගත නො හැකි බව පැහැදිලි කරන්න.

- ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට රක්ෂණය දායක වන ආකාරය පැහැදිලි කරන්න.

- රක්ෂණයට සම්බන්ධ වන පාර්ශ්ව පැහැදිලි කරමින් එම පාර්ශ්ව අතර ඇති කර ගන්නා එකඟතා ගිවිසුම පැහැදිලි කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- රක්ෂණයේ දී මූල්‍යමය වශයෙන් ඇස්තමේන්තු කළ හැකි හානියක් සිදු වීමට ඇති ඉඩකඩ අවදානමක් ලෙස අර්ථ දැක්විය හැකි ය.
- ව්‍යාපාර කටයුතු කර ගෙන යාමේ දී විවිධාකාර අවදානම් සිදු විය හැකි ය.
  නිදසුන්
  - ව්‍යාපාරය ගිනි ගැනීම
  - සොරසතුරු උවදුරු
  - ව්‍යාපාරය පාඩු ලැබීම
  - ව්‍යාපාරයේ දේපළවලට සිදු විය හැකි හානි
- රක්ෂිතයා විසින් වාරික ගෙවීමටත්, රක්ෂිත උපද්‍රව හේතුවෙන් රක්ෂිතයාට සිදු විය හැකි අලාභ සඳහා රක්ෂකයා විසින් වන්දි ගෙවීමටත්, රක්ෂිතයෙකු හා රක්ෂකයෙකු අතර ඇති කර ගන්නා එකඟතාව රක්ෂණය ලෙස හැඳින්විය හැකි ය.

- අවදානම්, රක්ෂණය කළ හැකි අවදානම් හා රක්ෂණය කළ නො හැකි අවදානම් ලෙස වර්ග කළ හැකි ය.
- රක්ෂණය කළ හැකි අවදානම්වල තිබිය යුතු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
  - අවදානම පුරෝකථනය කළ හැකි වීම
  - අනාගතයේ සිදු විය හැකි අවදානම මූල්‍යමය වශයෙන් තක්සේරු කළ හැකි වීම
  - අවදානම නියත නො විය යුතු වීම. එනම් අලාභය සිදු විය යුත්තේ අහඹු ලෙස වීම
  - සම්බන්ධතාවලින් තොර වීම. එනම් සිදු වූ පාඩුව වෙනත් රක්ෂිත අලාභ හා සම්බන්ධ නො විය යුතු ය.
  - සත්‍යාපනය කළ හැකි වීම. එනම් අලාභය සිදු වීමේ හේතුව, ස්ථානය, වේලාව හා ප්‍රමාණය විශ්ලේෂණය කළ හැකි විය යුතු ය.
- රක්ෂණය කළ හැකි අවදානමක් වීම සඳහා ඉහත කරුණු ඉටු වීම අවශ්‍ය වේ.
- ඉහත කරුණු ඉටු නො වන්නේ නම් ඒවැනි අවදානම් රක්ෂණය කළ නො හැකි අවදානම් වේ.
- රක්ෂණය කළ හැකි අවදානම් සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ.
  - ගොඩනැගිලි ගිනි ගැනීම මගින් සිදු වන අවදානම්
  - රථවාහන අනතුරු අවදානම්

- මාර්ගස්ථ මුදල්වලට සිදු වන හානි
- ණයගැතියකුගෙන් ලැබිය යුතු මුදල් නො ලැබීමේ අවදානම

- රක්ෂණය කළ නො හැකි අවදානම් සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ.
  - ව්‍යාපාරය පාඩු ලැබීම
  - ස්වභාවික හේතූන් නිසා ඇති වන අවදානම්
    (ක්ෂයවීම්, යල්පැනීම්, වාෂ්පවීම් )
  - තම හැකියා හා ශක්තිය මත තීරණය වන අවදානම්
    (විභාග අසමත් වීම, ආදරය අහිමි වීම )
  - මෝස්තර වෙනස්වීම් නිසා සිදු වන අවදානම්

- ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණය ඉතා වැදගත් වේ.
  - රක්ෂණය මගින් ව්‍යාපාර අවදානම් ආවරණය කරන නිසා ව්‍යාපාර ආරම්භ කිරීමට ආයෝජකයින් පෙළඹීම
  - ආබාධිත තත්ත්වයක දී හෝ මරණයක දී මූල්‍යමය ආරක්ෂාව ලැබීම (සේවකයන්ට)
  - රක්ෂණ සමාගම් තමන් සතු අරමුදල් නැවත ආයෝජනය කිරීමෙන් රටේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය සැපයීම
  - මුහුදු උවදුරු රක්ෂණය නිසා ජාත්‍යන්තර වෙළෙඳම දියුණු වීමයි

- රක්ෂණ ගිවිසුමක් යනු රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයා ඉදිරිපත් කරන රක්ෂණ යෝජනා පත්‍රයක්, රක්ෂණ ආයතනය විසින් පිළිගැනීමෙන් පසු එම දෙපාර්ශ්වය අතර ඇති කර ගන්නා ලිඛිත එකඟතාවයි.
- රක්ෂණ ඔප්පුව යනු කිසියම් ජීවිතයකට හෝ දේපළකට අදාළ ව රක්ෂණ ගිවිසුමක් ඇති වූ පසු ව ඊට අදාළ ව රක්ෂණ සමාගම විසින් රක්ෂිතයාට දෙනු ලබන ලිඛිත සහතිකයයි.

- රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ පාර්ශ්ව දෙකකි.
  - පළමු පක්ෂය (රක්ෂිතයා )
    රක්ෂණ යෝජනාව ඉදිරිපත් කරන්නා හෙවත් රක්ෂණ ආවරණය ලබා ගන්නා පුද්ගලයා
  - දෙවන පක්ෂය - (රක්ෂකයා )
    රක්ෂණ යෝජනාව පිළිගන්නා පාර්ශ්වය හෙවත් රක්ෂණ සමාගම
- මෙයට අමතර ව තෙවන පක්ෂය නමින් පාර්ශ්වයක් ද සිටිය හැකි ය. තෙවන පක්ෂය යනු ගිවිසුමේ ක්‍රියාකාරිත්වය තුළින් ඇති වන බාහිර පක්ෂ පිළිබඳ සම්බන්ධතාවයි.

- රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා පහත මූලිකාංග පැවතිය යුතු ය.
  - නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස
  - අර්පනය හෙවත් යෝජනාව
  - ප්‍රතිග්‍රහණය හෙවත් පිළිගැනීම
  - නෛතික බව - නීතියට එකඟ බව
  - ඒ ඒ පාර්ශ්වයන්ට නෛතික බැඳීමක් ඇති කර ගැනීමට ඇති හැකියාව

**නිපුණතාව 8** : : ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 8.2** : රක්ෂණයේ ප්‍රායෝගික භාවිතය සඳහා ඉවහල් වන රක්ෂණ මූලධර්ම විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- රක්ෂණ මූලධර්ම ලැයිස්තුගත කරයි.
- රක්ෂ්‍ය හිමිකම නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.
- රක්ෂණ ගිවිසුමක දී උපරිම සද්භාවයෙන් යුතු ව කටයුතු කිරීමේ අවශ්‍යතාව තහවුරු කරයි.
- රක්ෂිත දේපළකට සිදු වූ හානියක් සම්බන්ධ ව වන්දි ගෙවීමේ දී හානිපූර්ණ මූලධර්මයේ බලපෑම පැහැදිලි කරයි.
- ආදේශන මූලධර්මය හඳුන්වා ඒ සඳහා නිදසුන් දක්වයි.
- දායකත්ව මූලධර්මය හඳුන්වා ඒ සඳහා නිදසුන් දක්වයි.
- වන්දි ගෙවන අවස්ථාවක දී ආසන්න ම හේතුව බලපාන ආකාරය පැහැදිලි කරයි.
- රක්ෂණයට, රක්ෂණ මූලධර්ම වැදගත් වන ආකාරය අගය කරයි.
- දෙන ලද සිද්ධි ඇසුරෙන් රක්ෂණ මූලධර්ම පැහැදිලි කරයි.
- ප්‍රතිරක්ෂණය හා ප්‍රාරක්ෂණය යන්න පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- විශාල වෘක්ෂයක පින්තූරයක් පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ පිළිබඳ සිසු අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - ගසේ පැවැත්ම ශක්තිමත් භාවය ගසේ මුල් මත රඳා පවතින බව
    - මුල්වලට හානියක් වුවහොත් ගසේ පැවැත්මක් නො මැති බව
    - රක්ෂණ ව්‍යාපාරයේ පැවැත්ම සඳහා ද රක්ෂණ මූලධර්ම දායක වන බව
    - ඒ අනුව රක්ෂණ ඔප්පුවක් ලබා ගැනීමේ දී, පවත්වා ගෙන යාමේ දී, ප්‍රතිලාභ ගෙවීමේ දී, අවලංගු කිරීමක දී රක්ෂණ මූලධර්ම උපකාරී වන බව

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත සඳහන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත සඳහන් වන්නේ රක්ෂණ ආයතන විසින් කර ඇති ප්‍රකාශ කිහිපයකි. මේවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන ප්‍රකාශ යුගලය කෙරෙහි අවධානය යොමු කරන්න.

**ප්‍රකාශ යුගලය 1**

- සහන්ගේ එක ම නෑයා වැඩිහිටි සොහොයුරා වුවත් ඔහුගේ ජීවිතය සහන්ට රක්ෂණය කළ නො හැකි ය.

- රක්ෂණ ඔප්පුව ලබා ගන්නා විට රංජනී සිය රෝගී තත්ත්වය වසන් කර ඇති නිසා වන්දි ගෙවිය නො හැකි ය.

**ප්‍රකාශ යුගලය 2**

- රු. ලක්ෂ 15 කට රක්ෂණය කර තිබුණු දේවකගේ මෝටර් රථයට රුපියල් ලක්ෂ 2 ක හානියක් සිදු වීමෙන්, හානිය අනුව දීමට හැකි වන්නේ රු. ලක්ෂ 2 ක් පමණි.

- බන්දුල සිය කර්මාන්ත ශාලාව රු. ලක්ෂ 10 බැගින් ආයතන හතරක රක්ෂණය කර ඇතත් සිදු වූ රු. ලක්ෂ 5 හානිය සඳහා රක්ෂණ ආයතන හතරෙන් ම ලැබෙන මුළු වන්දි මුදල රු. ලක්ෂ 5 ක් පමණි.

**ප්‍රකාශ යුගලය 3**

- වන්දි ගෙවීමට පෙර අනතුරෙන් හානියට පත් වූ දිනේෂ්ගේ ලොරියේ සුන්බුන් රක්ෂණ ආයතනයට භාර දිය යුතු ය.

- ගින්න යන උපද්‍රවය පමණක් ආවරණය වන පරිදි ගිනි රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන තිබුණු සුරේෂ්ගේ ව්‍යාපාරය ත්‍රස්තවාදී ක්‍රියා නිසා විනාශයට පත්විය. කැරලි කෝලාහලයකින් අලාභය සිදු වූ නිසා වන්දි ගෙවිය නො හැකි ය.

    - ඔබ කණ්ඩායමට ලැබුණු සිද්ධීන් හඳුනා ගැනීම සඳහා කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයවන්න.

    - සිද්ධිවල අන්තර්ගත කරුණු පිළිබඳ ව ඔබ කණ්ඩායමේ අදහස පැහැදිලි කරන්න.

    - එම ප්‍රකාශවලට අදාළ රක්ෂකයා ඔබ නම් මෙම තීරණ පිළිබඳ ව ඔබේ අදහස ඉදිරිපත් කරන්න.

    - ප්‍රකාශවල සඳහන් රක්ෂකයා ගෙන ඇති තීරණ පිළිබඳ ව ඔබ සෑහීමකට පත්වන්නේ ද ? හේතු පැහැදිලි කරන්න.

- සිසු අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.

- පහත කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න

    - සහන්ට ඔහුගේ වැඩිහිටි සොහොයුරා රක්ෂණය කළ නො හැකි බවත්, එයට හේතුව කෙනෙකුට තවත් අයකු සමග ඇති ඥාති සම්බන්ධය නිසා ම රක්ෂ්‍ය හිමිකමක් නො ලැබෙන බවත්, එයට අදාළ වන්නේ රක්ෂ්‍ය හිමිකම යන මූලධර්මය බවත් පැහැදිලි කර දෙන්න.

    - රංජනී සිය රෝගී තත්ත්වය වසන් කිරීම නිසා විශ්වාසය බිඳ වැටී ඇති හෙයින්, ගිවිසුම අහෝසි වන බවත්, එයට අදාළ වන්නේ උපරිම විශ්වාසය බවත් පැහැදිලි කර දෙන්න.

    - රු.1 500 000 කට රක්ෂණය කර තිබුණ ද හානියේ වටිනාකම රු.200 000 ක් පමණක් බැවින් දේවකගේ මෝටර් රථයට සිදු වූ හානියට වන්දි වශයෙන් ලැබෙන්නේ රු. 200 000 ක් පමණක් බවත් එයට අදාළ වන්නේ හානිපූර්ණ මූලධර්මය බවත් පැහැදිලි කර දෙන්න.

    - බන්දුල ගේ කර්මාන්ත ශාලාවට සිදු වූ හානිය වෙනුවෙන් වන්දි ලෙස ලැබෙන්නේ රු. ලක්ෂ 5 ක් පමණක් බවත්, එම මුදල රක්ෂණ ආයතන හතර ම සමානුපාතික ව දායක වීමෙන් ගෙවන බවත්, එයට අදාළ වන්නේ දායකත්ව මූලධර්මය බවත් පැහැදිලි කර දෙන්න.

    - වන්දි ගෙවීමට පෙර දිනේෂ්ගේ ලොරියේ සුන්බුන් වන්දිය ගෙවූ රක්ෂණ සමාගමට භාර දිය යුතු බවත්, එයට අදාළ වන්නේ ආදේශන මූලධර්මය බවත් පැහැදිලි කර දෙන්න.

    - ගිනි රක්ෂණ ඔප්පුවක් ලබා තිබුණු සුරේෂ්ගේ ව්‍යාපාරය ත්‍රස්තවාදී ක්‍රියාවක් හේතුවෙන් විනාශ වීම නිසා වන්දි ලබා ගත නො හැකි බවත්, එයට අදාළ වන්නේ ආසන්න ම හේතුව යන මූලධර්මය බවත් පැහැදිලි කර දෙන්න. එමෙන් ම කෙනෙකුට අවශ්‍ය නම් ත්‍රස්තවාදී ක්‍රියා වැනි වෙනත් උපද්‍රවයන් ද ඇතුළත් කර අමතර වාරික මුදලක් ගෙවා ගිනි රක්ෂණ ඔප්පුව දීර්ඝ කර ගත හැකි බව ද පැහැදිලි කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් ඃ**

- රක්ෂණ ව්‍යාපාරය ක්‍රමවත් ව පවත්වා ගෙන යාම සඳහා රක්ෂණ මූලධර්ම අනුගමනය කළ යුතු ය.
- රක්ෂණ මූලධර්ම පහත දැක්වෙන ආකාරයට ලැයිස්තුගත කළ හැකි ය.
    - රක්ෂ්‍ය හිමිකම
    - උපරිම විශ්වාසය
    - හානිපූර්ණය
    - ආදේශනය
    - දායකත්වය
    - ආසන්න ම හේතුව

- යම් විෂය වස්තුවක් පැවතීමෙන් ආර්ථිකමය වාසියකුත්, එය අහිමි වීමෙන් ආර්ථිකමය අවාසියකුත් ඇති වන ඕනෑ ම දෙයක් සම්බන්ධව ඇති හිමිකම, රක්ෂ්‍ය හිමිකම වේ.

  නිදසුන් :
  - ස්වාමිපුරුෂයාගේ ජීවිතය පිළිබඳ භාර්යාවටත්, භාර්යාවගේ ජීවිතය පිළිබඳ ව ස්වාමියාටත් රක්ෂ්‍ය හිමිකමත් ඇත.
  - යම් දේපළක නීත්‍යානුකූල අයිතිකරුට එම දේපළ පිළිබඳ ව රක්ෂ්‍ය හිමිකමක් ඇත. (තමාගේ මෝටර් රථය, ඉඩම් වැනි)
  - ණය හිමියෙකුට ණය ගැතියෙකුගේ ජීවිතය තම ණය ප්‍රමාණය දක්වා රක්ෂණය කිරීමට හිමිකමක් ඇත.

- රක්ෂණය කරනු ලබන විෂය වස්තුව සම්බන්ධයෙන් රක්ෂකයා සහ රක්ෂිතයා විසින් හෙළිදරව් කළ යුතු රක්ෂණ ගිවිසුමට අදාළ සියලු තොරතුරු සද්භාවයෙන් යුතු ව හෙළිදරව් කිරීම උපරිම විශ්වාසය වේ.

- යම් රක්ෂිත දේපළකට හානියක් වූ විට එම දේපළ යථා තත්ත්වයට පත්කර ගැනීමට ප්‍රමාණවත් වන්දි මුදලක් පමණක් ගෙවීම හානි පූර්ණය ලෙස හඳුන්වයි.
  නිදසුන් :
  රුපියල් ලක්ෂ 40 ක් වටිනා මෝටර් රථය එම මුදලට ම රක්ෂණය කර ඇති අවස්ථාවක රු. ලක්ෂ 2.5 ක අලාභයක් සිදු වුව හොත් වන්දි වශයෙන් රු. ලක්ෂ 2.5 ක් පමණක් ලැබීම

- යම් දේපළක් රක්ෂණ ආයතන කිහිපයක රක්ෂණය කර ඇති විටක එම දේපළට යම් හානියක් සිදු වූ විටක ඒ සඳහා සියලු ම රක්ෂණ සමාගම් අනුපාතික ව දායක වී වන්දි ගෙවීම දායකත්වය මූලධර්මය ලෙස හඳුන්වයි.
  නිදසුන් :
  රුපියල් ලක්ෂ 10 ක දේපළක් A, B හා C යන රක්ෂණ සමාගම් තුනක අනුපිළිවෙලින් ලක්ෂ 5, ලක්ෂ 3 හා ලක්ෂ 2 බැගින් රක්ෂණය කර ඇති විටක එම දේපළට රු. 100 000 ක හානියක් සිදු වුයේ නම් 5: 3: 2 අනුපාතයට A රු. 50 000 ක් ද B රු. 30 000 ක් ද C රු. 20 000 ක් ද වශයෙන් වන්දියට දායක වේ.

- රක්ෂිත දේපළකට සිදු වූ හානියක දී රක්ෂණ සමාගම වන්දි ගෙවීමෙන් පසු ව බාහිර පාර්ශ්වයන්ගෙන් රක්ෂිතයාට ලබා ගත හැකි වෙනත් වාසි හා අයිතීන් රක්ෂකයා පවරා ගැනීම ආදේශන මූලධර්මය ලෙස හඳුන්වයි.
  නිදසුන් :
  රුපියල් ලක්ෂ 50 කට රක්ෂණය කළ මෝටර් රථයකට සිදු වූ අනතුරකින් එම රථය මුළුමනින් ම විනාශ වුයේ නම්, රක්ෂණ සමාගම රු. ලක්ෂ 50 ම වන්දි වශයෙන් ගෙවන අතර මෝටර් රථයේ සුන්බුන් වටිනාකම පවරා ගනී.

- රක්ෂිත දේපළකට හෝ ජීවිතයකට සිදු වූ හානියක දී එම හානිය සිදු වීමට හේතු කිහිපයක් බලපා ඇති විටෙක, හානිය සිදු වීමට බලපෑ ආසන්න ම හේතුව රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වී ඇත්නම් පමණක් වන්දි ගෙවන බව ආසන්න ම හේතුව මූලධර්මයෙන් දැක්වේ.
  නිදසුන් :
  සොරබිය රක්ෂණ ඔප්පුවක් හිමි පුද්ගලයෙකුට තම නිවසට ගින්නකින් හානියක් සිදු වුව හොත් වන්දි ලබා ගත නො හැකි ය. එයට හේතුව හානිය සිදු වීමට බලපෑ හේතුව වන ගින්න සොරබිය රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වී නො තිබීමයි.

- ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් රක්ෂ්‍ය හිමිකම, උපරිම විශ්වාසය හා ආසන්න ම හේතුව යන මූලධර්ම පමණක් අදාළ වේ. හානිපූර්ණ මූලධර්මය හා එයට අයත් උපමූලධර්ම වන දායකත්වය හා ආදේශනය යන මූලධර්ම ජීවිත රක්ෂණයට අදාළ නො වේ. එයට හේතුව ජීවිතය හානි වීමෙන් හෝ අනතුරට පත් වීමෙන් වන හානිය මුදලින් මැනිය නො හැකි වීමත් එය යථා තත්ත්වයට පත් කළ නො හැකි වීමත් ය. ජීවිත රක්ෂණයේ දී ඔප්පුවේ සඳහන් යම් නිශ්චිත වටිනාකමක් වන්දි වශයෙන් ප්‍රදානය කෙරේ.

- රක්ෂණ සමාගමක් විසින් භාර ගන්නා ලද රක්ෂණ අවදානමක් එම ආයතනය විසින් තවත් රක්ෂණ සමාගමක හෝ කිහිපයක රක්ෂණය කිරීම ප්‍රතිරක්ෂණය ලෙස හඳුන්වයි. ප්‍රතිරක්ෂණය මගින් රක්ෂණ සමාගම්වල වගකීම විතැන් කළ හැකි නිසා රක්ෂිතයාගෙන් අය කරනු ලබන වාරික මුදල අඩු මට්ටමක පවතී.

- විශාල වටිනාකමක් ඇති වත්කමක් සම්බන්ධයෙන් ඇති අවදානමක් කොටස් වශයෙන් වෙන් කර රක්ෂණ සමාගම් කිහිපයකට භාර දීම හා අනතුරක් සිදු වූ විට තමන් භාරගත් අවදානමේ ප්‍රමාණයට ඒ ඒ රක්ෂණ සමාගම් වන්දි ගෙවීම ප්‍රාරක්ෂණය ලෙස හඳුන්වයි.

**නිපුණතාව 8** : : ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 8.3** : ව්‍යාපාරවල විවිධ අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ ඔප්පු වර්ග පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාරයකට ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග ලැයිස්තු ගත කරයි.
- ඒ එක් එක් රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වන අවදානම් පැහැදිලි කරයි.
- ජීවිත රක්ෂණය හා සෙසු රක්ෂණ අතර වෙනස්කම් දක්වයි.
- ගිනි රක්ෂණය යටතේ ආවරණය කෙරෙන හා ආවරණය නො කෙරෙන අවදානම් වෙන් කර දක්වයි.
- මෝටර් රථ රක්ෂණයේ දී ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග විස්තර කරයි.
- සමුද්‍රීය රක්ෂණයේ දී ලබා ගත හැකි විවිධ රක්ෂණ ඔප්පු වර්ග විස්තර කරයි.
- දෙන ලද සිද්ධියක් ඇසුරෙන් ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග පෙන්වා දෙයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පහත සඳහන් දර්ශන දක්වෙන පින්තූර පන්තියට ඉදිරිපත් කරන්න.
    - ගොඩනැගිල්ලක් ගිනි ගන්නා දර්ශනයක්
    - මෝටර් රථ දෙකක් එකට ගැටී ඇති දර්ශනයක්
    - අඩක් මුහුදේ ගිලී ඇති නැවක දර්ශනයක්
    - ව්‍යාපාරයකට සොරු ඇතුල් වන දර්ශනයක්

- පින්තූරවලින් දක්වෙන සිද්ධි පිළිබඳ ව සිසු අදහස් විමසන්න
- එවැනි සිද්ධි සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සිසුන්ගෙන් විමසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

    - විවිධාකාර ස්වරූපයේ අවදානම් ඇති බව
    - මෙම අවදානම් සඳහා ආවරණය, රක්ෂණ ඔප්පු මගින් ලබා ගත හැකි බව
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත සඳහන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

> - පහත සඳහන් වන්නේ සමාජයේ පිළිගත් චරිත තුනක් පිළිබඳ තොරතුරු ය. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන චරිතය කෙරෙහි අවධානය යොමු කරන්න.
>
> මහිලා - ලිපිකාරිනියකි. වයස අවුරුදු 10 ට අඩු දරුවන් තිදෙනෙක් සිටී. ස්වාමියා මිය ගොසිනි. ස්වාමියාගෙන් උරුම වූ නිවස සහ දේපළ ඇත.

ධනපාල - ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාරයක් සහ අලෙවිසැල් කිහිපයක් පවත්වා ගෙන යයි. කැළණි ගඟ ආසන්නයේ ම කර්මාන්ත ශාලාව පිහිටා ඇත. තම නිෂ්පාදන තමන්ට ම අයත් ලොරි දෙකක් මගින් රට පුරා වෙළෙඳුන්ට බෙදා හරී.

ධනවර්ධන - තේ සහ රබර් වතු කිහිපයක හිමිකරුවෙකි. තේ කර්මාන්ත ශාලා දෙකක් ද හිමි ය. සේවකයින්ට වැටුප් ගෙවීම සඳහා වතුවලට හා කර්මාන්ත ශාලාවලට යාම පුරුද්දකි. ඔහුගේ නිෂ්පාදන ඔහු ම අපනයනය කරයි.

- ඔබ කණ්ඩායමට ලැබුණු චරිතයේ කටයුතු හා ජීවන රටාව අධ්‍යයනය කරමින් පහත කරුණු අනාවරණය කරන්න.
- ඔබගේ කණ්ඩායමට ලැබුණු පුද්ගලයාට මුහුණ පෑමට සිදු විය හැකි අවදානම් වෙන වෙන ම ලියා දක්වන්න.
- එම අවදානම් ආවරණය කර ගැනීම සඳහා රක්ෂණ වෙළෙඳපොළෙන් ලබා ගත හැකි ඔප්පු වර්ග පෙන්වා දෙන්න.

- සිසු අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- එක් එක් සිද්ධියට අනුව පුද්ගලයින්ට මුහුණ දීමට සිදු වන අවදානම් හා එම අවදානම් ආවරණය සඳහා ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග පහත පරිදි පෙන්වා දෙන්න.
- මහිලාට තම ජීවිතයට ඇති අවදානම වෙනුවෙන් ජීවිත රක්ෂණයක් ලබා ගත හැකි බවත්, යැපෙන්නන් ලෙස තම දරුවන් නම් කළ හැකි බවත්, නිවස වෙනුවෙන් ගිනි රක්ෂණයක් ද තම දේපළ වෙනුවෙන් දේපළ රක්ෂණයක් ද ලබා ගත හැකි බවත් පැහැදිලි කර දෙන්න.
- ධනපාලට තම ජීවිතයට ඇති අවදානම වෙනුවෙන් ජීවිත රක්ෂණයක් ද, සේවකයන් වෙනුවෙන් සේව්‍ය වගකීම් රක්ෂණයක් ද , තමා නිෂ්පාදනය කරන ගෘහ භාණ්ඩ සඳහා නිෂ්පාදන වගකීම් රක්ෂණයක් ද, කර්මාන්ත ශාලාව වෙනුවෙන් ගිනි රක්ෂණය, මෝටර් රථය සඳහා මෝටර් රථ රක්ෂණය වැනි දේපළ රක්ෂණ ද ලබා ගත හැකි බව පෙන්වා දෙන්න. එමෙන් ම කැලණි ගඟ ආසන්නයේ ම කර්මාන්ත ශාලාව පිහිටීම නිසා ගිනි රක්ෂණ ඔප්පුවට අනුබද්ධ ව ගංවතුර යන උපද්‍රවය ද ඇතුළත් කළ හැකි බව පැහැදිලි කර දෙන්න.
- ධනවර්ධනට තම ජීවිතයට ඇති අවදානම වෙනුවෙන් ජීවිත රක්ෂණයක් ද, තම කර්මාන්ත ශාලාව සඳහා ගිනි, සොරකම වැනි රක්ෂණ ද ලබා ගත හැකි බව පෙන්වා දෙන්න. මීට අමතර ව ඔහුට මාර්ගස්ථ මුදල් රක්ෂණය, මාර්ගස්ථ බඩු තොග රක්ෂණය වැනි රක්ෂණ ද ලබා ගත හැකි බව පැහැදිලි කර දෙන්න.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- රක්ෂණය වර්ග දෙකකට වර්ග කරයි.
  - ජීවිත රක්ෂණය/දිගුකාලීන රක්ෂණය
  - සාමාන්‍ය රක්ෂණය

- ජීවිත රක්ෂණය /දිගුකාලීන රක්ෂණය (**Life Insurance**)
  රක්ෂිතයාගේ මරණය සහ වෙනත් ශාරීරික උපද්‍රව හේතුවෙන් අවදානම්වලට මුහුණ පෑ විට රක්ෂිතයාට හෝ ඔහුගේ යැපෙන්නන්ට මූල්‍යමය ප්‍රතිලාභ ලබා දීම ජීවිත රක්ෂණයේ දී සිදු වේ.

- ජීවිත රක්ෂණයේ අරමුණු වන්නේ මරණය, අකර්මන්‍යතාව හෝ මහලුවියට පත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් පුද්ගලයෙකුට සිදු විය හැකි හානි වෙනුවෙන් ආරක්ෂාව සලසා ගැනීමයි.

- ජීවිත රක්ෂණය යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ලබා ගන්නා අතර, රක්ෂිතයා එකී කාල සීමාව තුළ මිය ගිය හොත් එකඟ වූ මුළු රක්ෂිත වටිනාකම යැපෙන්නන්ට හෝ නම් කළ පුද්ගලයාට හිමි වන අතර, රක්ෂිතයා එකී කාල සීමාව අවසන් වන තෙක් ජීවත් ව සිටිය හොත් කාලසීමාව අවසානයේ රක්ෂණ ඔප්පුවේ වටිනකම හා ප්‍රතිලාභ රක්ෂිතයාට ලබා ගත හැකි ය.

- ජීවිත රක්ෂණය සෙසු රක්ෂණවලින් වෙනස් වන ආකාරය පහත පරිදි දැක්විය හැකි ය .
  නිදසුන් -
  - ජීවිත රක්ෂණයේ අවදානම නිශ්චිත අතර සෙසු රක්ෂණවල අවදානම නිශ්චිත නො මැත.
  - ජීවිත රක්ෂණය සම්බන්ධ ව හානිපූර්ණ මූලධර්මය අදාළ නො වන අතර, සෙසු රක්ෂණ සඳහා මෙම මූලධර්ම ආදාළ වේ.
  - ජීවිත රක්ෂණය ඉතිරි කිරීමකට සමාන වන අතර, සෙසු රක්ෂණ සඳහා වන්දි ලබා ගත හැකි වන්නේ හානියක් සිදු වුවහොත් පමණි.
  - ජීවිත රක්ෂණ ඔප්පුව පැවරිය නො හැකි අතර, සෙසු රක්ෂණ ඔප්පු පැවරුය හැකි ය.

- **සාමාන්‍ය රක්ෂණය** (General Insurance)
- සාමාන්‍ය රක්ෂණ, පහත පරිදි වර්ග කළ හැකි ය.
  - ගිනි රක්ෂණය
  - සොරබිය රක්ෂණය
  - ස්වාභාවික විපත් රක්ෂණය
  - සමුද්‍රීය රක්ෂණය
  - මෝටර් රථ රක්ෂණය
  - වගකීම් රක්ෂණය
  - මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය
  - මාර්ගස්ථ මුදල් රක්ෂණය

- **ගිනි රක්ෂණය** (Fire Insurance)

  කිසියම් පුද්ගලයෙකුට, ගොඩනැගිලි හෝ වෙනත් වත්කම්වලට ගින්නෙන් සිදු විය හැකි හානි ආවරණය කර ගැනීම සඳහා ලබා ගත හැකි රක්ෂණය ගිනි රක්ෂණය වේ.

- ගිනි රක්ෂණය යටතේ ගිනි හානිවලට අමතර ව අතිරේක වාරික මුදල් ගෙවීමෙන් ගිනි රක්ෂණ ඔපුප්ව දීර්ඝ කර, පහත අවදානම් ද ආවරණය කර ගැනීමට හැකියාව ලැබේ.
  - කැරලි කෝලාහල/වැඩ වර්ජන හානි
  - පිපිරීම් හානි
  - විදුලිමය ආපදා හානි
  - භූමි කම්පා /සුනාමි
  - ජල ගැලීම්, සුළි සුළං/ කුණාටු වැනි
  - ගුවන්යානා අනතුරු
  - ගැටීම් හානි
  - ආනුශංගික අලාභ හානි

- **සොරබිය රක්ෂණය** (Theft Insurance)

  ව්‍යාපාරික ස්ථානවල හෝ නිවාසවල සිදු විය හැකි සොරබිය අවදානම ආවරණය කර ගැනීම සඳහා සොරබිය රක්ෂණ ඔප්පු ලබා ගත හැකි ය.

- **ස්වභාවික විපත් රක්ෂණය** (Natural Disaster Insurance)

  කුණාටු වැනි දේවලින් දේපලවලට සිදු වන හානි ආවරණය සඳහා ස්වභාවික විපත් රක්ෂණාවරණයක් ලබා ගැනීමට හැකි ය.

- **සමුද්‍රීය රක්ෂණය** (Marine Insurance)

  මුහුදු මාර්ග ප්‍රවාහනයේ දී නැවට හා නැව් බඩුවලට සිදු විය හැකි හානි සමුද්‍රීය රක්ෂණය මගින් ආවරණය වේ.
  - සමුද්‍රීය රක්ෂණය මූලික කොටස් දෙකකි.
    - නැව්කඳ රක්ෂණය (Hull)
    - නැව් බඩු රක්ෂණය (Cargo)

- නැව්කඳ රක්ෂණය යටතේ විවිධ රක්ෂණ ඔප්පු වර්ග ලබා ගැනීමට හැකියාව තිබේ.
  - සියලු අවදානම් ඔප්පුව
  - පූර්ණ අලාභය පමණක් ගෙවන ඔප්පුව
  - තොටුපල ඔප්පුව
  - අලුත්වැඩියා ඔප්පුව
  - තැනීම් හානි ඔප්පුව

- නැව්බඩු රක්ෂණය යටතේ විවිධ ඔප්පු වර්ග ලබා ගැනීමට හැකියාව තිබේ.
    - ඇගයු ඔප්පුව
    - විවෘත ඔප්පුව/චල ඔප්පුව
    - අනාගත ආවරණ ඔප්පුව

- **මෝටර් රථ රක්ෂණය යනු** - (Motor Traffic Insurance)

  රථවාහන අනතුරුවලින් මෝටර් රථවලට, මෝටර් රථවල ගමන් ගන්නා අයට හා බාහිර පාර්ශ්වයන්ට සිදු විය හැකි හානි සඳහා වන්දි ලබා ගැනීම පිණිස රථවාහන හිමියෙකු හා රක්ෂණ සමාගමක් අතර ඇති කර ගන්නා එකඟතාවයයි.

- මෝටර් රථ වාහන රක්ෂණය යටතේ ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග කිහිපයකි.

    - සම්පූර්ණ වගකීම් සහිත රක්ෂණ ඔප්පුව/විස්තීර්ණ රක්ෂණ ඔප්පුව
    - තෙවන පාර්ශ්ව ගිනි හා සොරබිය රක්ෂණය
    - අවම තෙවන පාර්ශ්ව රක්ෂණය

- සම්පූර්ණ වගකීම් සහිත රක්ෂණ ඔප්පුව මගින් අදාළ වාහනයට, වාහනයේ ගමන් ගන්නා පුද්ගලයින්ට හා දේපළවලට සිදු වන හානි ආවරණය වේ.

- තෙවන පාර්ශ්ව ගිනි හා සොරබිය රක්ෂණය මගින් අදාළ වාහනයට ගින්නෙන් හා සොරකම් කිරීම්වලින් සිදු වන හානිවලට අමතර ව බාහිර පුද්ගලයින්ට හා දේපළවලට, සිදු වන හානි ආවරණය වේ.

- අවම තෙවන පක්ෂ රක්ෂණය මගින් තෙවන පාර්ශ්වයන්ට, දේපලවලට සිදු වන හානි පමණක් ආවරණය වේ. මෝටර් රථයක් මහා මාර්ගයේ ධාවන කිරීම සඳහා අවම වශයෙන් අවම තෙවන පක්ෂ රක්ෂණ ඔප්පුව හෝ ලබා ගත යුතු ය.

- **වගකීම් රක්ෂණය** (The Liability Insurance)

  වගකීම් රක්ෂණය යනු වෙනත් පාර්ශ්වයන්ට සිදු වන පාඩු පිළිබඳ ව ඇති වන වගකීම රක්ෂණය කිරීමයි. මෙම රක්ෂණය නිසා ව්‍යාපාරිකයින්ට ඔවුන් නිසා වෙනත් පාර්ශ්වයන්ට සිදු වන හානි පිළිබඳ වගකීමෙන් ආරක්ෂා වීමට හැකි වේ.

  වගකීම් රක්ෂණය යටතේ ලබා ගත හැකි වගකීම් රක්ෂණ ඔප්පු වර්ග කිහිපයක් පහත දැක්වේ.

    - පොදු (මහජන) වගකීම් රක්ෂණය (General Liability Insurance)

      දේපළ හෝ ව්‍යාපාර කටයුතුවලින් පැන නැගිය හැකි අහඹු සිද්ධීන් නිසා තුන්වන පාර්ශ්වයකට සිදු විය හැකි හානි වෙනුවෙන් එම දේපළ අයිතිකරු විසින් හෝ ව්‍යාපාරිකයින් විසින් ලබා ගන්නා රක්ෂණාවරණයයි.

    - නිෂ්පාදන වගකීම් රක්ෂණය ( Product Liability Insurance)

      ව්‍යාපාරයක් අලෙවි කරන නිෂ්පාදිත පාරිභෝජනය කිරීමෙන් පාරිභෝගිකයින්ට සිදු විය හැකි හානි ආවරණය කිරීම සඳහා ව්‍යාපාරිකයින් විසින් ලබා ගන්නා රක්ෂණාවරණයයි.

- සේව්‍ය වගකීම් රක්ෂණය ( Employer Liability Insurance)

  සේවයේ යෙදී සිටිය දී සේවකයින්ට සිදු වන අනතුරු වෙනුවෙන් වන්දි ගෙවීම සේව්‍යාගේ වගකීමයි. එවැනි අවස්ථාවක වන්දි ගෙවීමේ වගකීම රක්ෂණ ආයතනයකට පැවරිය හැකි ය.

  තමන් යටතේ සේවය කරන අයට සේවයෙහි යෙදී සිටිය දී, සේවයේ යෙදීම නිසා ම ඇතිවන්නා වූ තුවාල හා අසනීප වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා සේව්‍යයන් විසින් ලබා ගන්නා රක්ෂණය සේවා යෝජක වගකීම් රක්ෂණය වේ.

- මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය

  මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණයේ දී ගොඩබිමින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන මාධ්‍යයට භාණ්ඩ පැට වූ අවස්ථාවේ සිට එම භාණ්ඩ ගොඩබෑම දක්වා වූ අවස්ථාව දක්වා සිදු විය හැකි හානි ආවරණය සඳහා ලබාගන්නා රක්ෂණය මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය වේ.

- මාර්ගස්ථ මුදල් රක්ෂණය

  එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට මුදල් රැගෙන යාමේ දී සිදු විය හැකි හානි ආවරණය සඳහා ලබා ගන්නා රක්ෂණය මාර්ගස්ථ මුදල් රක්ෂණයයි.

**නිපුණතාව 9** : ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය සඳහා සන්නිවේදනය සඵලදායී ව යොදා ගැනීමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 9.1** : සන්නිවේදන ක්‍රියාවලියක සාර්ථකත්වයට තුඩු දෙන සාධක විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් ඵල** :

- සන්නිවේදනය යන්න පැහැදිලි කරයි.
- ව්‍යාපාරික කටයුතුවල දී සන්නිවේදනයේ ඇති වැදගත්කම පෙන්වා දෙයි.
- සමාජයීය කටයුතු සඳහා සන්නිවේදනයේ වැදගත්කම පැහැදිලි කරයි.
- සන්නිවේදන ක්‍රියාවලිය රූප සටහනකින් දක්වයි.
- සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග පැහැදිලි කරයි.
- සඵලදායී සන්නිවේදනයක තිබිය යුතු ගුණාංග ලැයිස්තුවක් සකසයි.
- පණිවුඩයක් සකස් කිරීමේ දී අවධානය යොමු විය යුතු කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් අවස්ථාවට උචිත පණිවුඩයක් සකස් කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පන්තියේ මුලින් සිටින සිසුවා කැඳවා කිසියම් පණිවුඩයක් රහසින් ඔහුට පවසන්න.
- එය ලඟ සිටින සිසුවාට දන්වන ලෙසට උපදෙස් දෙන්න.
- එ ලෙස සියලු ළමුන්ට පණිවුඩය ලබා දුන් පසු අවසාන සිසුවා ලවා පණිවුඩය ලෑල්ලේ ලියවන්න.
- මුලින් සිටි සිසුවාට දුන් පණිවුඩය ම අවසාන සිසුවාට ලැබුණා ද යන්න විමසන්න.
- පණිවුඩය වෙනස් වුයේ නම් එයට බලපෑ හැකි හේතු අනාවරණය කර ගැනීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.

    - පණිවුඩය දුන් තැනැත්තා පණිවුඩය පැහැදිලි ව නො දීම
    - පණිවුඩය ලබාගත් තැනැත්තා පැහැදිලි ව අසා නො ගැනීම
    - පණිවුඩය අපැහැදිලි වීම
    - පණිවුඩය තුළ තිබූ වචන අවබෝධ කර ගත නො හැකි වීම

- සඵලදායී සන්නිවේදනයක් සඳහා නිවැරදි ව පණිවුඩ හුවමාරු කර ගත යුතු බව පැහැදිලි කරන්න.

- සන්නිවේදනය යන්න හඳුන්වා, ව්‍යාපාරික කටයුතු සඳහා සහ සමාජයීය කටයුතු සඳහා සන්නිවේදනයේ වැදගත්කම පෙන්වා දෙන්න.

- සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග පැහැදිලි කර දීමට සිසුන් පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත සිද්ධිය සිසුන්ට ලැබීමට සලස්වන්න.

  ආයතනය විසින් 20xx දෙසැම්බර් මස 02 දින පවත්වනු ලබන සේවක පුහුණු වැඩ සටහන සඳහා ඒ ඒ අංශවල සියලු ම සේවකයින් සහභාගී කරවන ලෙස ප්‍රධාන විධායක නිලධාරී විසින් සියලු ම කළමනාකරුවන් වෙත ලිපියක් මගින් දැනුම් දුන් අතර, තම අංශවල සියලු ම සේවකයින් ඒ පිළිබඳ ව දැනුවත් කර අවශ්‍ය කටයුතු සූදානම් කළ බව, සියලු ම කළමනාකරුවන් විසින් ප්‍රධාන විධායකනිලධාරී වෙත E - mail පණිවුඩ මගින් දැනුම් දෙන ලදී.

- මෙම සිද්ධිය හොඳින් අධ්‍යයනය කරන්න.

  මෙම සිද්ධියේ සඳහන් ,
  - පණිවුඩය යැවූ පුද්ගලයා
  - යවන ලද පණිවුඩය
  - පණිවුඩය යැවූ සන්නිවේදන මාධ්‍ය
  - එම පණිවුඩය ලැබූ පුද්ගලයින්
  - පණිවුඩය සම්බන්ධයෙන් ඔවුන් ක්‍රියා කළ ආකාරය හා
  - ඔවුන් ගත් ක්‍රියාමාර්ග, නැවත පණිවුඩය දුන් පුද්ගලයාට දැනුම් දුන් ආකාරය පන්තියට ඉදිරිපත් කරන්න.

- සිසුන්ගේ පිළිතුරු ඇසුරෙන් එක් එක් සන්නිවේදන මූලිකාංගය පැහැදිලි කර දෙන්න.
  - පණිවුඩය යවන්නා - ප්‍රධාන විධායක නිලධාරී බවත්,
  - පණිවුඩය - 20 xx දෙසැම්බර් 02 දින පැවැත්වෙන සේවක පුහුණු වැඩ සටහනට සියලු ම සේවකයින් සහභාගී කරවන්න යන්න බවත්,
  - මාධ්‍ය - ලිඛිත මාධ්‍ය බවත් ,
  - ලබන්නා - සියලු ම කළමනාකරුවන් බවත්
  - ප්‍රතිචාරය - පණිවුඩය ලැබීමෙන් පසු කළමනාකරුවන් ඒ පිළිබඳ ව සේවකයින්ට දැනුම් දී අවශ්‍ය කටයුතු සූදානම් කිරීම බවත්
  - ප්‍රතිපෝෂණය - අවශ්‍ය කටයුතු සූදානම් කළ බව E - mail පණිවුඩයක් ලබා දීම මගින් ප්‍රධාන විධායක නිලධාරී දැනුවත් කිරීම බවත් පැහැදිලි කරන්න.

  - සන්නිවේදන ක්‍රියාවලිය රූප සටහනකින් දක්වා එක් එක් සන්නිවේදන මූලිකාංගය පැහැදිලි කරන්න.

  - සඵලදායී සන්නිවේදනයක තිබිය යුතු ගුණාංග හා පණිවුඩයක් සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කිරීමට සිසුන් පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත දැක්වෙන්නේ සන්නිවේදනයක් සිදු කළ යුතු අවස්ථා කිහිපයකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන අවස්ථාව කෙරෙහි අවධානය යොමු කරන්න.
    - පාසල් වේලාවෙන් පසු ව සියලු ම අංශ ප්‍රධානීන්ගේ රැස්වීමක් විදුහල්පතිතුමා විසින් පවත්වන බව අදාළ අංශ ප්‍රධානීන්ට දැනුම් දීම
    - හදිසියේ අසනීප වූ ආයතනයේ සේවකයකු සේවයට වාර්තා කළ නො හැකි බව ආයතනයට දැනුම් දීම
    - ආයතනය විසින් තීරණය කළ විශේෂිත නිවාඩු දිනයක් පිළිබඳ ව රටපුරා පිහිටි සියලු ශාඛාවන්ට දැනුම් දීම
- ඔබ කණ්ඩායමට ලැබුණු පණිවුඩය යවන්නා හා ලබන්නා කණ්ඩායම් සාකච්ඡාවක් මගින් හඳුනා ගන්න.
- යවන්නා විසින් යැවිය යුතු පණිවුඩය කණ්ඩායම් සාකච්ඡාවක් මගින් සකස් කරන්න.
- එම පණිවුඩය යැවිය හැකි ආකාර යෝජනා කරන්න.
- ඔබ සකස් කළ පණිවුඩය යවන්නාගේ සිට ලබන්නා දක්වා යැවීමේ දී සිදු වූ ක්‍රියාදාමය රූප සටහනකින් පෙන්වන්න.
- ඉහත ඔබ කණ්ඩායම විසින් සකස් කළ පණිවුඩය සකස් කිරීමේ දී අවධානය යොමු කළ කරුණු පෙළගස්වන්න.
- සන්නිවේදනය පහත සඳහන් කාර්ය සඳහා වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න.
    - ව්‍යාපාරික කටයුතු සඳහා
    - සමාජීය කටයුතු සඳහා

- සිසු අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**


- එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට හෝ පාර්ශ්ව කිහිපයකට තොරතුරු යැවීම, ලැබීම, තොරතුරු තේරුම් ගැනීම හා බෙදා ගැනීම සන්නිවේදනය ලෙස හැඳින්විය හැකි ය.

- සන්නිවේදනය ව්‍යාපාරික කටයුතු සඳහා මෙන් ම සාමාජයීය කටයුතු සඳහා ද වැදගත් වේ.

- ව්‍යාපාරික කටයුතු සඳහා සන්නිවේදනයේ ඇති වැදගත්කම
    - වෙළෙඳ ගනුදෙනුවල දී අදාළ පාර්ශ්ව අතර අදහස් හුවමාරු කර ගැනීම සඳහා
    - සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා
    - මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය කිරීම සඳහා
    - අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා

- සාමාජයීය කටයුතු සඳහා සන්නිවේදනයේ  වැදගත්කම
    - සාමාජයීය වශයෙන් අදහස් හා පණිවුඩ හුවමාරු කර ගැනීම සඳහා
    - ජාත්‍යන්තර වශයෙන් සිදු වන සිදු වීම් පිළිබඳ ව ක්ෂණික ව දැන ගැනීම සඳහා
    - අධ්‍යාපනික කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා
    - තාක්ෂණයේ දියුණුවත් සමග ඇති වන නව සොයාගැනීම් දැනගැනීම සඳහා
    - දේශීය හා විදේශීය  වශයෙන් සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා

- සන්නිවේදන ක්‍රියාවලිය පහත සඳහන් රූප සටහන මගින් දැක්විය හැකි ය.




- **සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග**
    - යවන්නා (sender)
      පණිවුඩය යවන පාර්ශ්වය වේ.  වාචික ව නම් කථකයා, දේශකයා ආදී වශයෙන්  ද ලිඛිත ව නම් එහි අත්සන යොදන්නා හෝ ආයතනය හැඳින්විය හැකි ය.
    - පණිවුඩය (Message )
      පණිවුඩය යවන්නා, පණිවුඩය ලබන්නාට සපයන තොරතුරු වේ.
    - මධ්‍යය  (Media)
      තොරතුරු ලබා දෙන්නේ කෙසේ ද ? තොරතුරු ලබා දීම සඳහා යොදා ගන්නා සන්නිවේදන මාධ්‍ය
      නිදසුන් : වාචික මාධ්‍ය, ලිඛිත මාධ්‍ය
    - ලබන්නා (Receiver )
      පණිවුඩය ග්‍රහණය කර ගන්නා පුද්ගලයා වේ.  ඔහු පාඨකයෙක්, ශ්‍රාවකයෙක්, ප්‍රේක්ෂකයෙක් විය හැකි ය.
    - ප්‍රතිචාරය ( Response)
      පණිවුඩය ලබන්නා විසින් ඇසුණ  හෝ කිය වූ පණිවුඩය පිළිබඳ ව ක්‍රියා කරන ආකාරය
    - ප්‍රතිපෝෂණය (Feedback)
      පණිවුඩය ලැබුණ බව, එය තේරුම් ගත් බව තහවුරු කරමින් පණිවුඩය ලබන්නාගෙන් පණිවුඩය යවන්නාට ලැබෙන ප්‍රතිචාරයයි.

- සඵලදායී සන්නිවේදනයක තිබිය යුතු ගුණාංග
  - නිවැරදි බව
  - සංක්ෂිප්ත බව
  - පූර්ණ බව
  - පැහැදිලි බව
  - ආචාරශීලී බව
  - නිශ්චිත බව
  - සැලකිලිමත් බව
  - පිරිවැය අවම බව
  - වේගවත් බව

- පණිවුඩයක් සකස් කිරීමේ දී පහත දැක්වෙන කරුණු කෙරෙහි සැලකිලිමත් විය යුතු ය.

  - පණිවුඩයේ ස්වභාවය
  - පූර්ණත්වය
  - නිවැරදි බව
  - ආචාරශීලී බව
  - ග්‍රාහකයාට තේරුම් ගැනීමේ හැකියාව
  - සංක්ෂිප්ත බව
  - නිශ්චිත බව

**නිපුණතාව 9** : ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය සඳහා සන්නිවේදනය සඵලදායී ව යොදා ගැනීමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 9.2** : විවිධ සන්නිවේදන ක්‍රම විමසමින් ඵලදායී ව සන්නිවේදනයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් ඵල** :

- සන්නිවේදන මාධ්‍ය හඳුන්වයි.
- එක් එක් සන්නිවේදන මාධ්‍ය සඳහා සන්නිවේදන ක්‍රම ඉදිරිපත් කරයි.
- නවීන විද්‍යුත් සන්නිවේදන ක්‍රම පැහැදිලි කරයි.
- විද්‍යුත් නො වන සන්නිවේදන ක්‍රම පැහැදිලි කරයි
- ව්‍යාපාර ආයතන යොදා ගන්නා අභ්‍යන්තර හා බාහිර සන්නිවේදන ක්‍රම ලැයිස්තුගත කරයි.
- සඵලදායී සන්නිවේදනයට ඇති බාධා පෙන්වා දෙයි.
- සන්නිවේදනයට ඇති බාධා පිටු දැකීමට ක්‍රමෝපාය යෝජනා කරයි.
- විවිධ සන්නිවේදන මාධ්‍යවල වාසි අවාසි සාකච්ඡා කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පාසලේ විදුහල්පතිතුමා උදේ රැස්වීම ඇමතීම, කාලච්ඡේද වෙනස්වීම දැක්වීම, සිසුන්ගේ ප්‍රගතිය දෙමව්පියන්ට දැන්වීම සඳහා යොදා ගන්නා සන්නිවේදන ක්‍රම සිසුන්ගෙන් විමසන්න.
- පහත කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - විදුහල්පතිතුමා උදේ රැස්වීම ඇමතීම වාචික ව සිදු කරන බව
  - කාලච්ඡේද වෙනස්වීම දැක්වීමට සංඥාවක් භාවිත කරන බව
  - සිසු ප්‍රගතිය දෙමව්පියන්ට දැන්වීමට ලිඛිත මාධ්‍ය භාවිත කරන බව

- මෙ ලෙස ව්‍යාපාර ද සන්නිවේදනය සඳහා විවිධ මාධ්‍ය භාවිත කරන බවත් එම සන්නිවේදන මාධ්‍ය යටතේ විවිධ සන්නිවේදන ක්‍රම භාවිත කරන බවත් පහදන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත සඳහන් මාතෘකා අතුරෙන් ඔබ කණ්ඩායමට ලැබෙන මාතෘකාව පිළිබඳ අවධානය යොමු කරන්න.
  - වාචික සන්නිවේදන මාධ්‍යය
  - ලිඛිත සන්නිවේදන මාධ්‍යය
  - සංඥා සන්නිවේදන මාධ්‍යය

- ඔබ කණ්ඩායමට ලැබුණු මාතෘකාවට අදාළ සන්නිවේදන ක්‍රම හැකිතාක් ලියන්න.
- එම සන්නිවේදන ක්‍රම අභ්‍යන්තර සන්නිවේදන ක්‍රම හා බාහිර සන්නිවේදන ක්‍රම වශයෙන් වෙන් කර දක්වන්න.

- ඔබට ලැබුණු මාතෘකාවට අදාළ සන්නිවේදන ක්‍රම යොදා ගැනීමේ වාසි හා අවාසි දක්වන්න.
- එම සන්නිවේදන ක්‍රම ප්‍රායෝගික ව භාවිතයේ දී ඇති වන බාධා පෙන්වා දෙන්න.
- එම බාධා අවම කිරීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.

- සිසු අනාවරණ නිර්මාණශීලී ව පන්තියට ඉදිරිපත් කරවන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- සන්නිවේදන මාධ්‍ය පහත පරිදි වර්ග කෙරේ.
  - වාචික මාධ්‍යය
  - ලිඛිත මාධ්‍යය
  - සංඥා හා සංකේත මාධ්‍ය

- ව්‍යාපාර ආයතනයක සන්නිවේදනය සිදු වන ආකාරය අනුව පහත ආකාරයට ද වර්ග කළ හැකි ය.
  - අභ්‍යන්තර සන්නිවේදනය
  - බාහිර සන්නිවේදනය

- අභ්‍යන්තර සන්නිවේදනය යනු ව්‍යාපාර ආයතනය තුළ විවිධ පාර්ශ්ව අතර තොරතුරු හුවමාරු කර ගැනීමය.
- අභ්‍යන්තර සන්නිවේදනයේ දී ,
  - අයිතිකරුවන් - කළමනාකරුවන් අතර
  - සේවකයින් - සේවකයින් අතර
  - දෙපාර්තමේන්තු - දෙපාර්තමේන්තු අතර විවිධ තොරතුරු හුවමාරු වීම සිදු වේ.

- බාහිර සන්නිවේදනය යන්නෙන් අදහස් වන්නේ ව්‍යාපාර ආයතනයක් ව්‍යාපාර ආයතනයෙන් බාහිර පාර්ශ්ව හා ආයතන සමග තොරතුරු හුවමාරු කර ගැනීමයි.

- බාහිර සන්නිවේදනයේ දී
  - ව්‍යාපාරය - ගනුදෙනුකරුවන් සමග
  - ව්‍යාපාරය - වෙනත් ව්‍යාපාර, සැපයුම්කරුවන් අතර තොරතුරු හුවමාරු වීම සිදු වේ.

- විවිධ සන්නිවේදන මාධ්‍යය මගින් සන්නිවේදනය සිදු කරන ආකාරවලට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| වාචික මාධ්‍ය | අභ්‍යන්තර | විද්‍යුත් | ඉන්ටර්කොම් |
| | | විද්‍යුත් නො වන | සම්මුඛ සාකච්ඡා, සම්මන්ත්‍රණ, අභ්‍යන්තර රැස්වීම් |
| | බාහිර | විද්‍යුත් | දුරකථන, ජංගම දුරකථන, ශබ්ද විකාශ යන්ත්‍ර හඬ තැපෑල |
| | | විද්‍යුත් නො වන | අඬබෙරය, මහජන රැස්වීම් |
| ලිඛිත මාධ්‍ය | අභ්‍යන්තර | විද්‍යුත් | විද්‍යුත් දැන්වීම් පුවරු, E-mail |
| | | විද්‍යුත් නො වන | මෙමෝ පත්‍ර, නිවේදන, දැන්වීම් පුවරු ,වාර්තා |
| | බාහිර | විද්‍යුත් | Fax, E-mail ,විද්‍යුත් දැන්වීම් පුවරු, SMS සේවාව |
| | | විද්‍යුත් නො වන | ලිපිය, පුවත්පත්, සඟරා, බැනර්, පෝස්ටර්, ගැසට් පත්‍ර |
| සංඥා හා සංකේත | අභ්‍යන්තර | විද්‍යුත් | විදුලි සීනුව, අභ්‍යන්තර අනතුරු ඇඟවීමේ සංඥා |
| | | විද්‍යුත් නො වන | සීනුව, මඟ සලකුණු , ආයතනයේ පිහිටීම දක්වෙන සැලැස්ම, වම දකුණ හඳුනා ගැනීමේ පා සලකුණු |
| | බාහිර | විද්‍යුත් | අනතුරු හඟවන නලා, විදුලි සංඥා (colour light) ගිලන් රථ සංඥා |
| | | විද්‍යුත් නො වන | ඇසුරුම් සංකේත, දුම්රිය හා මහාමාර්ග සංඥා, බිහිරි අය සඳහා භාවිත වන සංඥා, ක්‍රීඩා විනිසුරුවාගේ තීරණ ලබා දීම, රථ වාහන හසුරුවන්නන්ගේ අංග චලන |

- **විද්‍යුත් සන්නිවේදනය**
  - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සංවර්ධනය සමඟ බිහි වූ සන්නිවේදනය විද්‍යුත් සන්නිවේදනය වේ.
  - නවීන විද්‍යුත් සන්නිවේදන ක්‍රම කිහිපයක් පහත දැක්වෙන අයුරින් පැහැදිලි කළ හැකි ය.

**අන්තර්ජාලය** - (Internet)
පුළුල් පරාසයක් ආවරණය කරන පරිගණක ජාලයක් හෙවත් අන්තර්ජාතික වශයෙන් ඇති පරිගණක ජාලයකි. ජාලයන්ගේ ජාලය ලෙස ද අන්තර්ජාලය විස්තර කළ හැකි ය. මෙහි දී විවිධ ස්ථානවලින් ඇතුළත් කෙරෙන තොරතුරු පෞද්ගලික පරිගණක ආශ්‍රයෙන් ලබා ගත හැකි ය.

**විද්‍යුත් තැපෑල** - (E- Mail)
පරිගණකයකින් පරිගණකයකට අන්තර්ජාලය මගින් පණිවුඩ හුවමාරු කිරීම විද්‍යුත් තැපෑල ලෙස හඳුන්වයි. විද්‍යුත් ව සකසන ලද පණිවුඩය වෙනත් අයකුට යැවීමට නම් යවන්නාට හා ලබන්නාට අන්තර්ජාල පහසුකම් මෙන් ම E- Mail ලිපින ද තිබිය යුතු ය.

**ඉන්ට්‍රානෙට්**- (Intranet)
අන්තර්ජාලය පදනම් කර ගනිමින් ව්‍යාපාර ආයතනය තුළ ඇති දත්තවලට ළඟාවීමට සලසා ඇති ආයතනමය ජාලයකි. මෙය පුද්ගලයෙකු හෝ ආයතනයක පාලනය යටතේ පවතින ජාලයක් වන අතර මෙ මගින් සපයන සේවා අවසරලත් අයට පමණක් ලබා දිය හැකි ය.

**හඬ තැපෑල** - ( Voice mail )
යවන්නා විසින් දුරකථන මාර්ගයෙන් වාචික ව දෙනු ලබන පණිවුඩය, ජාල මාර්ගයෙන් පරාවර්ථනය වී පසු ව ලබා ගැනීම පිණිස තැටියක ගබඩා කිරීමේ හෙවත් පටිගත කිරීමේ ක්‍රියා පද්ධතියකි.

**ෆැක්ස් යන්ත්‍ර** - ( Fax)
සාමාන්‍ය දුරකථන පද්ධතියක් මගින් ලිපි හා චිත්‍ර අඩංගු ලියවිලි ක්ෂණික ව යැවීමට හැකියාව ඇති විද්‍යුත් උපකරණය ෆැක්ස් යන්ත්‍රය වේ. ෆැක්ස් ක්‍රමයේ දී පණිවුඩය යවනු ලබන ෆැක්ස් යන්ත්‍රය මගින් අදාළ ලියවිලිවල ඡායා පිටපත් ඩිජිටල් තාක්ෂණය මගින් ලබා ගෙන ඒවා ලබා ගන්නා ෆැක්ස් යන්ත්‍රය වෙත පරිවර්තනය කරයි.

**ජංගම දුරකථන** - ( Mobile phones )
වර්තමානයේ සන්නිවේදන තාක්ෂණයේ දියුණුව නිසා චන්ද්‍රිකා තාක්ෂණය ඇසුරෙන් විවිධ ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා ජංගම දුරකථන උපයෝගී කර ගැනේ.

**ඉන්ටර්කොම්** - (Intercom)
දුරකථන ජාලයක් ආශ්‍රයෙන් ආයතනය තුළ තොරතුරු හුවමාරු කර ගැනීමට පෞද්ගලික වශයෙන් ස්ථාපනය කර ගනු ලබන දුරකථන ජාලයකි.

- සඵලදායී සන්නිවේදනයට ඇති බාධා කිහිපයක් පහත දැක්වේ.
    - නව තාක්ෂණ ක්‍රම භාවිතය පිළිබඳ ඇති දැනුම දුර්වල වීම
    - සන්නිවේදන උපකරණ භාවිතයේ දී සිදු වන බාහිර බාධා
    - පැරණි සන්නිවේදන ක්‍රම භාවිතයට ගැනීම
    - සන්නිවේදන ගලායාමේ මාර්ගයේ දී ඇති වන බාධා
    - සන්නිවේදන සැලසුම්වල ඇති දුර්වලතා
    - භාෂා ප්‍රශ්න, දැනුම, ආකල්ප වැනි දෑ
    - බාහිර පරිසරයේ ඇති වන බාධා

- සන්නිවේදනයට ඇති වන බාධා පිටු දැකීමට ගත හැකි විවිධ ක්‍රම උපාය කිහිපයක් පහත දැක්වේ.
    - නව සන්නිවේදන උපකරණ භාවිත කිරීම
    - සන්නිවේදනය පිළිබඳ විවිධ නීති රීති පැනවීම
    - සන්නිවේදන කුළුණු පිහිටුවීමේ කටයුතු ව්‍යාප්ත කිරීම
    - ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීම
    - සන්නිවේදන ක්‍රම අවභාවිතය පිළිබඳ නව නීති රීති සම්පාදනය කිරීම

- විවිධ සන්නිවේදන මාධ්‍යවල වාසි හා අවාසි කිහිපයක් පහත දැක්වේ.

**වාචික සන්නිවේදන මාධ්‍යයේ වාසි :**

- ගැටලුවක් වඩාත් විස්තරාත්මක ව ඉදිරිපත් කොට, සාකච්ඡා කොට ඉදිරිපත් කළ හැකි වීම
- තොරතුරු දෙන්නා හා ලබන්නා සම්මුඛ වීම
- තොරතුරු ඉතා ඉක්මණින් හා රහසිගත ව ඉදිරිපත් කළ හැකි වීම

**වාචික සන්නිවේදන මාධ්‍යයේ අවාසි :**

- භාෂාමය ගැටලු ඇති වීම
- වාචිකමය දුර්වලතා ඇති පාර්ශ්ව සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ ගැටලු ඇති වීම
- තොරතුරු සන්නිවේදනය කළ බවට සාක්ෂියක් නො මැති වීම

**ලිඛිත සන්නිවේදන මාධ්‍යයේ වාසි :**

- වඩාත් විස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කළ හැකි වීම
- තොරතුරු සන්නිවේදනය කළ බවටත්, ලැබුණු බවටත් සාක්ෂියක් ලෙස භාවිත කළ හැකි වීම
- දත්ත, සටහන්, වගු යනාදිය පහසුවෙන් සන්නිවේදනය කළ හැකි වීම

**ලිඛිත සන්නිවේදන මාධ්‍යයේ අවාසි :**

- තොරතුරු අවබෝධ කර ගැනීමේ දී ගැටලු ඇති වීම
- කියවීමේ හැකියාව නො මැති නම් තොරතුරු සන්නිවේදනය කිරීම අපහසු වීම
- තොරතුරු සන්නිවේදනය කිරීමේ දී විකෘති වීම

**සංඥා හා සංකේත මාධ්‍යයේ වාසි :**

- තොරතුරු කෙටියෙන් පැහැදිලි ව ඉදිරිපත් කළ හැකි වීම
- තොරතුරුවල නිරවද්‍යතාව ඉහළ මට්ටමක පැවතීම
- තොරතුරු පහසුවෙන් අවබෝධ කර ගත හැකි වීම

**සංඥා හා සංකේත මාධ්‍යයේ අවාසි :**

- දෘෂ්ටි ගැටලු හා ඌණතා ඇති පාර්ශ්ව සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ ගැටලු ඇති වීම
- සංඥා හා සංකේත විකෘති වී යාමෙන් තොරතුරු සන්නිවේදනයට බාධා ඇති වීම
- සමහර සංඥා හා සංකේත අවබෝධ කර ගැනීමට අපහසු වීම
- සංඥා හා සංකේත අවබෝධ කර ගැනීමට ඒවා පිළිබඳ පෙර දැනුම අවශ්‍ය වීම

**නිපුණතාව 10** : ප්‍රවාහන හා සැපයුම් සේවා (Logistics) ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා දායක වන ආකාරය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 10.1** : ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ප්‍රවාහනය සඵලදායී ව දායක කර ගන්නා ආකාරය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වයට අවශ්‍ය සේවාවක් ලෙස ප්‍රවාහනය හඳුන්වයි.
- ප්‍රවාහන මූලිකාංග විස්තර කරයි.
- එක් එක් ප්‍රවාහන මූලිකාංගය සඳහා නිදසුන් සපයයි.
- විකල්ප ප්‍රවාහන ක්‍රම විස්තර කරයි.
- එක් එක් ප්‍රවාහන ක්‍රමය අනුව ඊට අදාළ ප්‍රවාහන මූලිකාංග සඳහා නිදසුන් වගු ගත කරයි.
- එක් එක් ප්‍රවාහන ක්‍රමයේ සාපේක්ෂ වාසි හා අවාසි සසඳයි.
- ප්‍රවාහන සේවාවේ වැදගත්කම විස්තර කරයි.
- ප්‍රවාහන සේවාව කාර්යක්ෂම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- කොළඹ නගරයේ සිට යාපනයට ගමන් කළ හැකි ආකාර සිසුන්ගෙන් විමසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  කොළඹ සිට යාපනයට බසයෙන්, වෑන් රථයකින්, දුම්රියෙන්, ගුවන් යානයකින්, නැවකින්, බෝට්ටුවකින්, ආදී විවිධ ක්‍රම මගින් ගමන් කළ හැකි බව පෙන්වා දෙන්න.
- ඒ අනුව ප්‍රවාහනය සඳහා පහත ක්‍රම යොදා ගන්නා බව පැහැදිලි කරන්න.
  - මහා මාර්ග ප්‍රවාහනය
  - දුම්රිය මාර්ග ප්‍රවාහනය
  - ගුවන් මාර්ග ප්‍රවාහනය
  - ජල මාර්ග ප්‍රවාහනය

- ප්‍රවාහනයේ මූලිකාංග හඳුනා ගැනීමට, සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත සඳහන් වන්නේ ප්‍රවාහන ක්‍රම හතරකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන ප්‍රවාහන ක්‍රමය කෙරෙහි අවධානය යොමු කරන්න.
    - මහා මාර්ග ප්‍රවාහනය
    - දුම්රිය මාර්ග ප්‍රවාහනය
    - ගුවන් මාර්ග ප්‍රවාහනය
    - ජල මාර්ග ප්‍රවාහනය

- මාතෘකාව කෙටියෙන් හඳුන්වන්න.
- මාතෘකාවට අදාළ ව භාවිත වන මාර්ග කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් හඳුනා ගන්න.
- එම මාර්ගවල ධාවනය වන වාහන ලැයිස්තුවක් සකස් කරන්න.
- එම වාහන ධාවනය සඳහා යොදා ගත හැකි ඉන්ධන වර්ගය වෙන් වෙන් වශයෙන් දක්වන්න.
- එම වාහන නවතා තබන නැවතුම්පොළවල් කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් මතුකර ගන්න.
- එම ප්‍රවාහන ක්‍රමය පහත සඳහන් එක් එක් පාර්ශ්වයට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.
    - පුද්ගලයින්ට
    - ව්‍යාපාරිකයින්ට

- ඔබට ලැබුණු ප්‍රවාහන ක්‍රමය, ප්‍රවාහන කටයුතු සඳහා වඩාත් සුදුසු වන්නේ කුමන අවස්ථාවල දී දැයි පැහැදිලි කරන්න.
- අදාළ ප්‍රවාහන ක්‍රමයේ වාසි හා අවාසි කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් මතුකර ගන්න.
- එම ප්‍රවාහන ක්‍රමය කාර්යක්ෂම කිරීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.
- සිසු අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.

- සිසු අනාවරණ ඇසුරෙන් ප්‍රවාහන මූලිකාංග නිදසුන් සහිත ව පැහැදිලි කර දෙන්න.

☞

- එක් එක් ප්‍රවාහන ක්‍රමයේ පවතින වාසි හා අවාසි සන්සන්දනාත්මක ව පෙන්වා දී එම එක් එක් ප්‍රවාහන ක්‍රමයේ කාර්යක්ෂමතාව සඳහා සිසුන් යෝජනා කළ යෝජනා ද සැලකිල්ලට ගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.

☞

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට විවිධ මාධ්‍ය භාවිත කරමින් පුද්ගලයින් හෝ ද්‍රව්‍ය ගෙන යාමේ ක්‍රියාවලිය ප්‍රවාහනයයි.
- ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වයට ප්‍රවාහනය අත්‍යවශ්‍ය උපකාරක සේවාවකි.
- ප්‍රවාහනය හුදෙක් මාධ්‍යයක් පමණක් නොව මූලිකාංග කිහිපයකින් සමබර ව සංවර්ධනය වීමෙන් සැකසුණු පද්ධතියකි.

- ප්‍රවාහනයේ තුලිත සංවර්ධනයක් සඳහා ප්‍රවාහන මූලිකාංගවල වර්ධනයක් හෙවත් සුලභතාවක් අවශ්‍ය වේ.

- ප්‍රවාහන පද්ධතියක මූලිකාංග පහත සඳහන් ලෙස විස්තර කළ හැකි ය.

  - මාර්ගය (Way) - ප්‍රවාහනය සඳහා භාවිත කරන විවිධ මාර්ග වේ.
    නිදසුන් - මහා මාර්ග, දුම්රිය මාර්ග, ජල මාර්ග, ගුවන් මාර්ග

  - මාධ්‍යය (Mode ) - විවිධ මාර්ගවල ධාවනය වන වාහන වේ.
    නිදසුන් - මෝටර් රථ, දුම්රිය, නැව්, ගුවන් යානා

  - බලය (Power ) - එක් එක් මාධ්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ඉන්ධන වර්ගය හෝ ශක්තිය වේ.
    නිදසුන් - ගල් අඟුරු, ඛණිජ තෙල්, විදුලිය, ගෑස්

  - පර්යන්තය (Terminal ) - ප්‍රවාහන මාධ්‍ය, ප්‍රවාහන කාර්යයේ දී නවතා තබන නැවතුම්පොළවල් වේ.
    නිදසුන් - බස් නැවතුම්පොළ, දුම්රිය ස්ථානය, ත්‍රී රෝද රථ නැවතුම්පොළ

- ප්‍රවාහන මූලිකාංග හා නිදසුන් පහත සටහන මගින් ද දැක්විය හැකි ය.

| මාර්ගය<br>Way | මාධ්‍ය<br>Mode | බලය<br>Power | පර්යන්තය<br>Terminal |
|---|---|---|---|
| මහා මාර්ග<br>High Ways | කරත්ත, මෝටර් රථ, බයිසිකල්, ලොරි, බස් රථ | මිනිස් ශ්‍රමය, සත්ව ශ්‍රමය, ඩීසල්, පෙට්‍රල්, ගෑස්, විදුලිය | බස් නැවතුම්පොළ<br>Bus Stand |
| දුම්රිය මාර්ග<br>Rail Ways | දුම්රිය<br>ඩක්කුව | ගල් අඟුරු<br>ඩීසල්, විදුලිය | දුම්රිය ස්ථානය<br>Railway Station |
| ගුවන් මාර්ග<br>Air Ways | ගුවන් යානා<br>හෙලිකොප්ටර් | පෙට්‍රල් | ගුවන් තොටුපොළ<br>Airport |
| ජල මාර්ග<br>Water Ways | නැව්<br>බෝට්ටු<br>ඔරු | සුළඟ<br>ඩීසල්<br>මිනිස් ශ්‍රමය | වරාය<br>Harbour<br>තොටුපොළ<br>port |

- එක් එක් ප්‍රවාහන ක්‍රමයේ වාසි හා අවාසි පහත පරිදි දැක්විය හැකි ය.

- **මහා මාර්ග ප්‍රවාහන ක්‍රමයේ වාසි**
    - අවශ්‍යතාවට ගැලපෙන සේ මාධ්‍යයක් තෝරාගත හැකි වීම
    - රට පුරා ව්‍යාප්ත ව පැවතීම
    - අවශ්‍ය ඕනෑ ම විටක මහා මාර්ග භාවිත කළ හැකි වීම
    - බොහෝ විට ගමනාන්තය දක්වා ම එක ම ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගත හැකි වීම

- **මහා මාර්ග ප්‍රවාහන ක්‍රමයේ අවාසි**
    - විශාල තොග එකවර ප්‍රවාහනයට අපහසු වීම
    - මහාමාර්ග නඩත්තු පිරිවැය අධික වීම
    - ප්‍රමාදය හා අනතුරු ඉහළ වීම
    - කාලගුණික තත්ත්ව මත බාධා ඇති වීම

- **දුම්රිය ප්‍රවාහන ක්‍රමයේ වාසි**
    - විශාල භාණ්ඩ තොග හා මගීන් විශාල සංඛ්‍යාවක් එකවර ප්‍රවාහනය කළ හැකි වීම
    - මහාමාර්ග ප්‍රවාහනයට වඩා ආරක්ෂාකාරී වීම
    - භාණ්ඩවල ස්වභාවය අනුව මැදිරි යොදා ගත හැකි වීම
    - සෙසු ප්‍රවාහන මාධ්‍ය හා සසඳන කල ගාස්තු අඩු වීම
    - ආපනශාලා, නිදන මැදිරි, නිරීක්ෂණ මැදිරි ආදී විවිධ පහසුකම් ලබා ගත හැකි වීම

- **දුම්රිය ප්‍රවාහන ක්‍රමයේ අවාසි**
    - දුම්රිය මාර්ග දිවයින පුරා ව්‍යාප්ත ව නො තිබීම
    - අවශ්‍ය ඕනෑ ම වේලාවක දී සේවය ලබා ගත නො හැකි වීම
    - ගමනාන්තය දක්වා යොදා ගත නො හැකි නිසා වෙනත් ප්‍රවාහන ක්‍රම ද යොදා ගැනීමට සිදු වීම
    - විදුලි සංඥා ඇණ හිටීම, දුම්රිය මාර්ග අබලන් වීම ආදිය නිසා ප්‍රමාද ඇති වීම

- **ජලමාර්ග ප්‍රවාහන ක්‍රමයේ වාසි**
    - අන්තර්ජාතික වෙළෙඳාමට සහාය වීම
    - භාණ්ඩ විශාල ප්‍රමාණයක් එකවර රැගෙන යා හැකි වීම
    - භාණ්ඩ වර්ගවල ස්වභාවය අනුව යාත්‍රා තෝරාගත හැකි වීම

- **ජලමාර්ග ප්‍රවාහන ක්‍රමයේ අවාසි**
    - නැව් සේවාව සුලභ නො වීම
    - වැඩි කාලයක් ගත වීම

- **ගුවන් ප්‍රවාහන ක්‍රමයේ වාසි**
    - වේගවත් බව අතින් ඉහළ වීම
    - ඉක්මණින් නෂ්‍ය වන භාණ්ඩ සඳහා යෝග්‍ය වීම
    - මාර්ග නඩත්තු පිරිවැයක් නො මැති වීම

- **ගුවන් ප්‍රවාහන ක්‍රමයේ අවාසි**
    - විශාල හා බරින් අධික භාණ්ඩ ප්‍රවාහනය සඳහා යෝග්‍ය නො වීම
    - ප්‍රවාහන පිරිවැය අධික වීම
    - අනතුරු වීමට ඇති ප්‍රවණතාව වැඩි වීම
    - අවශ්‍ය වේලාවට සපයා ගැනීමට නො හැකි වීම

- ආර්ථික හා සමාජ සංවර්ධනයේ සහ ගෝලීයකරණයේ ප්‍රධාන ම උපාංගය වනුයේ ප්‍රවාහනයයි. නිෂ්පාදිතවල නිෂ්පාදනය හා පාරිභෝජනය වෙනස් ස්ථානයන්හි සිදු වන්නේ ප්‍රවාහනය නිසා ය. ප්‍රවාහනය වෙළෙඳාමේ ව්‍යාප්තියටත්, පුද්ගලයින්ගේ පැතිරීමටත් විශාල වශයෙන් හේතු වේ. මේ අනුව විවිධ පාර්ශ්වවලට ප්‍රවාහනය වැදගත් වන ආකාරය පහත පරිදි දැක්විය හැකි ය.

- **ප්‍රවාහනය ව්‍යාපාරිකයාට වැදගත් වන ආකාරය**
    - අමු ද්‍රව්‍ය කලට වේලාවට සපයා ගැනීමට
    - නිමි ද්‍රව්‍ය කලට වේලාවට වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට
    - සේවකයින් නියමිත වේලාවට ගෙන්වා ගැනීමට
    - ව්‍යාපාරික සබඳතා පැවැත්වීමට
    - වෙළෙඳපොළ ව්‍යාප්තියට

- **ප්‍රවාහනය පුද්ගලයන්ට වැදගත් වන ආකාරය**
    - සමාජ සබඳතා ඇති කර ගැනීමට හා පවත්වා ගෙන යාමට
    - රැකීරක්ෂා හා සංචරණය සඳහා
    - විනෝදාස්වාදය සඳහා
    - පර්යේෂණ, ගවේෂණ හා අධ්‍යාපන කටයුතු සඳහා

- **ප්‍රවාහනය ආර්ථිකයට වැදගත් වන ආකාරය**
    - සේවා නියුක්තිය වර්ධනය වීම
    - ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීම
    - විදේශ වෙළෙඳාම වර්ධනය වීම

**නිපුණතාව 10** : ප්‍රවාහන හා සැපයුම් සේවා (Logistics) ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා දායක වන ආකාරය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 10.2** : අවස්ථාවට උචිත ප්‍රවාහන ක්‍රමයක් හා මාධ්‍යයක් තෝරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් ඵල** :

- ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු ලැයිස්තුගත කරයි.
- ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු අධ්‍යයනයෙන් උචිත ප්‍රවාහන මාධ්‍යයක් තෝරයි.
- කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක තිබිය යුතු ගුණාංග විස්තර කරයි.
- ප්‍රවාහනයේ ප්‍රවණතා පෙන්වා දෙයි.
- ප්‍රවාහන ක්ෂේත්‍රයේ අනාගතය පුරෝකථනය කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- තම ප්‍රදේශයට ඛණිජ තෙල් ලැබෙන ආකාරය සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

  - ප්‍රදේශයට ඛණිජ තෙල් ලැබෙන්නේ ඛණිජ තෙල් ප්‍රවාහනය සඳහා ම යොදා ගන්නා විශේෂිත බවුසර් මගින් බව
  - එය මහා මාර්ගවල හෝ දුම්රිය මාර්ගවල ධාවනය වන මාධ්‍යයක් බව
  - එම මාධ්‍ය ඉතා ආරක්ෂාකාරී වන අතර ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකට ම ලඟා විය හැකි ප්‍රවාහන මාර්ග ඔස්සේ ධාවනය වන බව
  - ඛණිජ තෙල් ප්‍රවාහනය සඳහා එම මාධ්‍ය තෝරා ගැනීමේ දී ධාරිතාව, ආරක්ෂාකාරී බව යනා දී සාධක සලකා බලා ඇති බව

- සාකච්ඡාවෙන් ලද තොරතුරු යොදා ගනිමින් ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු එකින් එක නිදසුන් සහිත ව පැහැදිලි කර දෙන්න.

☞

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

  - පහත සඳහන් වන්නේ ප්‍රවාහන සේවාව උපකාර කර ගැනීමට සිදු වන අවස්ථා හතරකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන අවස්ථාව කෙරෙහි අවධානය යොමු කරන්න.

- අනුරාධපුර රෝහලේ සිට කොළඹ ජාතික රෝහලට රෝගියකු රැගෙන යාම
- බණ්ඩාරවෙල මල්වත්තක සිට කොළඹ නගරයේ පිහිටි මල් ශාලාවකට ස්වභාවික මල් රැගෙන ඒම
- කොළඹ සිට කන්කසන්තුරේට සහල් තොගයක් ප්‍රවාහනය කිරීම
- හම්බන්තොට සිට බදුල්ල නගරයේ වෙළෙඳ සැලකට මීකිරි ප්‍රවාහනය කිරීම

- අදාළ කාර්යය සඳහා යොදා ගත හැකි සියලු ම ප්‍රවාහන ක්‍රම (මාර්ග) කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් මතු කර ගන්න.
- ඒ එක් එක් මාර්ගයේ ධාවනය වන මාධ්‍යවලින් ඔබට අදාළ කාර්යය සඳහා වඩාත් සුදුසු මාධ්‍ය කණ්ඩායම් සාකච්ඡාවක් මගින් තීරණය කරන්න.
- එම මාර්ගය මාධ්‍ය තෝරා ගැනීම සඳහා ඔබ කණ්ඩායම විසින් සලකා බැලූ කරුණු පෙළගස්වන්න.
- ඔබ තෝරාගත් මාර්ගයේ හා මාධ්‍යයේ නව ප්‍රවණතා හඳුන්වා දෙන්න.
- ප්‍රවාහන ක්ෂේත්‍රයේ අනාගතය පිළිබඳ ව ඔබට ඉදිරිපත් කළ හැකි පුරෝකථන කණ්ඩායම් සාකච්ඡාවක් මගින් තීරණය කරන්න.

- සිසු අනාවරණ නිර්මාණශීලී ව පන්තියට ඉදිරිපත් කරවන්න.
- සිසු අනාවරණ සැලකිල්ලට ගනිමින්, එක් එක් අවස්ථාව අනුව වඩාත් උචිත ප්‍රවාහන ක්‍රමය හා මාධ්‍යය හේතු සහිත ව පෙන්වා දෙන්න.
- තාක්ෂණයේ දියුණුව, දැඩි තරගකාරිත්වය ආදී හේතු නිසා ප්‍රවාහන ක්ෂේත්‍රය සීග්‍රයෙන් වර්ධනය වන බවත් ඒ අනුව මෙම ක්ෂේත්‍රයේ අනාගතය කෙසේ වේ දැයි සිසුන් ඉදිරිපත් කළ පුරෝකථන ද ඇසුරු කර ගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- උචිත ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු කිහිපයක් පහත දැක්වේ.
- භාණ්ඩයේ ස්වභාවය -
  මෙහි දී භාණ්ඩයේ ස්වරූපය, කල්පැවැත්ම, බර, වටිනාකම ආදී සාධක මත තෝරා ගන්නා ප්‍රවාහන මාධ්‍යය වෙනස් වේ.

නිදසුන් ඃ

- බණිජ තෙල් ප්‍රවාහනය සඳහා බවුසර් යොදා ගැනීම
- ද්‍රව ප්‍රවාහනය සඳහා ලොරි රථ යොදා ගැනීම
- මාළු ප්‍රවාහනය සඳහා ශීතාගාර සහිත ලොරි රථ යොදා ගැනීම

- පිරිවැය -
  ප්‍රවාහනය සඳහා දැරීමට සිදු වන මුළු වියදම පිරිවැය වේ. ප්‍රවාහන පිරිවැය වැඩි වීම භාණ්ඩයේ මිල වැඩි වීමට ද හේතු වන නිසා ඒ පිළිබඳ ව වඩාත් සැලකිලිමත් විය යුතු වේ.

- වේගය -
  සමහර අමුද්‍රව්‍ය හා භාණ්ඩ ඉක්මණින් ප්‍රවාහනය කිරීම අවශ්‍ය වේ. නෂ්‍ය වීම, ගුණත්වය අඩු වීම එයට හේතුවයි. වේගවත් ප්‍රවාහනය තුළින් වැය වන කාලය අවම වේ. ඒ තුළින් ප්‍රවාහන කටයුතු කාර්යක්ෂම කර ගැනීමට අවස්ථාව ලැබේ.
  නිදසුන් - මාලු, එළවළු, පළතුරු, මී කිරි

- දුර ප්‍රමාණය -
  දුර ප්‍රමාණය අනුව ද තෝරා ගන්නා මාධ්‍ය වෙනස් වේ. දුර ප්‍රමාණය අනුව මාධ්‍ය සඳහා වැය වන පිරිවැය ද වෙනස් වේ.

- ධාරිතාව -
  ප්‍රවාහන මාධ්‍යයක් මගින් වරකට ගෙන යා හැකි භාණ්ඩ හා මගීන් ප්‍රමාණය ධාරිතාව වේ. ප්‍රවාහනය කිරීමට බලාපොරොත්තු වන ප්‍රමාණය අනුව සුදුසු මාධ්‍යයක් තෝරා ගත යුතු ය.
  නිදසුන් -
  විශාල තොග ලොරි රථ මගින් ද කුඩා භාණ්ඩ තොගයක් බෙදාහැරීමේ වෑන් රථ මඟින් ද ප්‍රවාහනය කිරීම

- සුරක්ෂිත බව -
  ප්‍රවාහනය කරන භාණ්ඩය හෝ මගීන් ආරක්ෂාකාරී ව ගමනාන්තය දක්වා ම ගෙන යාමට හැකි විය යුතු ය.
  නිදසුන් -
  - ඇපල්, මිදි වැනි පළතුරු ආනයන - අපනයන කාර්යයේ දී ගුවන් යානා යොදා ගැනීම
  - රෝගීන් ප්‍රවාහනය සඳහා ගිලන් රථ යොදා ගැනීම

- ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රවණතා වර්ධනය වෙමින් පවතින අතර ඒවාට පහත නිදසුන් ඉදිරිපත් කළ හැකි ය
  - උමං මාර්ග ප්‍රවාහය
  - ගුවන් පාලම් ඉදි කිරීම
  - අධිවේගී මාර්ග ඉදි කිරීම
  - විදුලි මෝටර් රථ යොදා ගැනීම
  - පරිසර හිතකාමී ශක්ති ප්‍රභේද භාවිත කිරීමට පෙළඹවීම
    නිදසුන් -
    එළවළු , පලතුරුවලින් ඉන්ධන නිපදවීම
  - තමන් සිටින ස්ථානයට ම ප්‍රවාහන මාධ්‍යය ගෙන්වා ගත හැකි වීම

- ප්‍රවාහන ක්ෂේත්‍රයේ අනාගතය පුරෝකථනය කිරීමට නිදසුන් කිහිපයක් පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.
  - හයිපර්ලූප් සංකල්පය
    අනාගත ලොව ප්‍රවාහන පද්ධතිය ලෙස හඳුනා ගන්නා මෙම බ්‍රිතාන්‍ය ජාතික ඉලොන් මයික් ගේ සංකල්පයකි. ප්‍රධාන වශයෙන් බටයක් දිගේ ඇති කරන රික්තයක් යොදා ගෙන භාණ්ඩ හා මිනිසුන් ප්‍රවාහය කරයි.
  - Walkcar, Air Wheel
    පයින් ගමන් කිරීමට විකල්පයක් ලෙස යොදා ගත හැකි ඉතා ම කුඩා උපකරණයකි.

**නිපුණතාව 10** : ප්‍රවාහන හා සැපයුම් සේවා (Logistics) ව්‍යාපාර වල සාර්ථකත්වය සඳහා දායක වන ආකාරය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 10.3** : ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ගබඩාකරණය ඵලදායී ව දායක කර ගන්නා ආකාරය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් ඵල** :

- ගබඩාකරණය යන්න හඳුන්වයි.
- ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු ලැයිස්තුගත කරයි.
- ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු වෙන වෙන ම පැහැදිලි කරයි.
- ගබඩාවක් ස්ථානගත කිරීම පිළිබඳ තීරණය නිවැරදි ව ගත යුතු බව තහවුරු කරයි.
- ගබඩාවක භාණ්ඩ ඇසිරීම කළ යුතු ආකාරය පැහැදිලි කරයි.
- අසුරනු ලබන භාණ්ඩයේ ස්වභාවය අනුව ගබඩාවක භාණ්ඩ අසුරන ආකාරය පෙන්වා දෙයි.
- ගබඩාවක භාණ්ඩ එහා මෙහා කිරීම කළ යුතු ආකාරය පැහැදිලි කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පාසලේ විද්‍යාගාරයේ උපකරණ, රසායන ද්‍රව්‍ය ආදිය තබා ඇති ආකාරය පිළිබඳ ව සිසුන් ලවා අධ්‍යයනය කරවන්න.
- සාකච්ඡාවක් තුළින් පහත කරුණු මතුකර ගන්න.
  - විද්‍යාගාරයේ විවිධ වර්ගයේ උපකරණ ඇති බව,
  - විවිධ නම්වලින් හඳුන්වන රසායනික ද්‍රව්‍ය ඇති බව, ඒවා වෙන වෙන ම ස්ථානවල විවිධ ඇසුරුම්වල, විවිධ ආකාරයෙන් අසුරා ඇති බව,
  - ඇසිරීමේ දී ප්‍රමාණය, ආරක්ෂාව පහසුවෙන් ආපසු ලබා ගත හැකි වීම ආදී කරුණු පිළිබඳ ව සැලකිළිමත් වී ඇති බව
  - එසේ විවිධ ද්‍රව්‍ය, විවිධ ස්ථානවල, විවිධ ආකාරයෙන් ගබඩා කර තබා ගැනීමට විවිධ හේතු බලපා ඇති බව

- සාකච්ඡාවෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් ගබඩාකරණය යනු කුමක් දැයි හඳුන්වා දෙන්න.

- ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු රාශියක් ඇති බවත්, ගබඩාවක් ස්ථානගත කිරීම පිළිබඳ තීරණය ආයතනයට ඉතා වැදගත් බවත් පැහැදිලි කර දෙන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත දැක්වෙන භාණ්ඩ වර්ග හතර අතුරෙන් ඔබේ කණ්ඩායමට ලැබෙන භාණ්ඩ වර්ගය සඳහා ගබඩාවක් ස්ථාපනය කිරීමට අවශ්‍ය ව ඇතැයි සිතන්න.
    - පොහොර
    - මාළු
    - ඖෂධ වර්ග
    - වී
- ඔබට ලැබුණු භාණ්ඩය අනුව අවශ්‍ය වන ගබඩාවේ ප්‍රමාණය තීරණය කිරීමේ දී සැලකිය යුතු කරුණු සාකච්ඡා කරන්න.
- ගබඩාව ස්ථානගත කිරීමේ දී ඔබේ සැපයුම්කරුවන් පිළිබඳ ව අවධානය යොමු කළ යුතු කරුණු ලැයිස්තුවක් ලියන්න.
- ගබඩාව ස්ථානගත කිරීමේ දී ඔබේ පාරිභෝගිකයින් පිළිබඳ ව අවධානය යොමු කළ යුතු කරුණු ලැයිස්තුවක් ලියන්න.
- ගබඩාව ස්ථානගත කිරීමේ දී ඔබගේ භාණ්ඩයේ ස්වභාවය අනුව අවධානය යොමු කළ යුතු වෙනත් කරුණු මොනවා ද ?
- ඔබ සලකා බැලූ කරුණු අනුව ගබඩාවක් ස්ථානගත කිරීමට වඩාත් උචිත යයි ඔබ තීරණය කළ ස්ථානය කෙටියෙන් සඳහන් කරන්න.

- ගබඩාවක් ස්ථානගත කිරීමෙන් පසු එම ගබඩාවේ භාණ්ඩ ඇසිරීම ද ක්‍රමානුකූල ව සිදු කළ යුතු බවත් එය සිදු කළ යුතු ආකාරයත් සිසුන් සමග සාකච්ඡා කරන්න.
    - භාණ්ඩයේ ස්වභාවය අනුව
    - භාණ්ඩ වර්ග අනුව
    - ආපසු ලබා ගැනීමට ඇති පහසුව ආදී වශයෙන්
- ගබඩාවක භාණ්ඩ එහා මෙහා කිරිම සිදු වන බවත් එහි දී බොහෝ විට ඒ සඳහා විශේෂිත වූ උපකරණ භාවිත කරන බවත් පෙන්වා දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ගබඩාකරණය (Warehousing ) යනු තොගයක් මිල දී ගත් අවස්ථාවේ හෝ නිෂ්පාදනය කළ අවස්ථාවේ සිට ඒවා අලෙවි කරන තෙක් හෝ භාවිතයට ගන්නා තෙක් හෝ බෙදාහරින තෙක් රැස් කර තබා ගැනීමේ ( Storing ) හෝ කල්තබා ගැනීමේ (preserving) ක්‍රියාවලියකි.

මෙම ක්‍රියාවලිය ,

- තොග ලැබීම (receiving)
- හඳුනා ගැනීම (identification)
- පරීක්ෂා කිරීම (inspection)
- නිවැරදි බව තහවුරු කර ගැනීම (verification)
- ගුණත්වය තහවුරු කර ගැනීම (ensuring quality)
- ඉවතින් තැබීම/පසෙකින් තැබීම (putting away)
- නිකුත් කිරීම සඳහා නැවත ලබා ගැනීම (retrieving for issue) යනාදියෙන් සමන්විත වේ.

- එසේ තොග රැස්කර තබා ගැනීම හෝ කල්තබා ගැනීම සඳහා භාවිත කරන ස්ථානය ගබඩාව (warehouse) ලෙස හැඳින්වේ.

- ගබඩාවක් ස්ථානගත කිරීමේ දී පහත කරුණු සලකා බැලිය යුතු ය.

- **ගොඩනැගිල්ලේ පිරියත සැලැස්ම හා ගොඩනැගිල්ල තුළ චලනය කිරීමේ ඉඩකඩ** (Layout and flow of the building)

  ගබඩාව සඳහා භාවිත කරන ගොඩනැගිල්ලේ ප්‍රශස්ත වූ පිරියත සැලැස්ම (දොරවල්වල පිහිටීම, වර්ග ප්‍රමාණය, සිවිලිමේ උස, ද්‍රව්‍ය ඇසිරීමේ පිළිවෙත් ආදිය) එම ගොඩනැගිල්ල තුළ කෙරෙන මෙහෙයුම් කාර්යය (ද්‍රව්‍ය ගබඩා කර තැබීම, බෙදාහැරීම, පැකට් කිරීම, ලේබල් කිරීම ආදී ) කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරයි. භාණ්ඩ අසුරා තැබිය හැකි තීරු ගණන, භාණ්ඩ තැබීමට ඇති ඉඩකඩ සිවිලිමේ උස යනාදිය එම ගොඩනැගිල්ල තුළ භාණ්ඩ අසුරා තැබීම සඳහා භාවිත කරන උපකරණ හා භාණ්ඩ එහා මෙහා කිරීමේ උපකරණ භාවිතයේ දී සීමා පනවයි. එසේ ම ගබඩාව තුළට අමු ද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ ලබා ගැනීම මෙන් ම ඉන් පිටතට එම ද්‍රව්‍ය නිකුත් කිරීම කෙරෙහි ද බලපෑම් ඇති කරයි.

  එබැවින් තෝරා ගන්නා ගොඩනැගිල්ල තුළ ඇති ඉඩකඩ ව්‍යාපාරිකයා බලාපොරොත්තු වන ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ සැලසුමට අනුව ගැලපේ ද යන්න ගැඹුරින් පරීක්ෂා කර බලා ගබඩාව සඳහා සුදුසු ගොඩනැගිල්ලක් තෝරා ගත යුතු ය.

- **ද්‍රව්‍ය භාවිතයේ වේගවත් බව හා ගබඩාව තුළ කලාප වෙන් කිරීමේ අවශ්‍යතාව (Zoning and intensity of use)**

  ගබඩාව තුළ කෙරෙන මෙහෙයුම් කාර්යය කොතරම් වේගවත් ද යන්න එනම්, ගබඩාවේ භාණ්ඩ ඇසිරීම හා ආපසු ලබා ගැනීම කොතරම් වේගයෙන් සිදු වන්නේ ද යන්න හා ඉදිරියේ දී කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් මොනවා ද යන්න ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සලකා බැලිය යුතු ය. ගබඩාව තුළ කෙරෙන කාර්යය සමන්විත වන්නේ ගබඩා කර කාලයක් සුරක්ෂිත ව තබා ගැනීම නම් හෝ සරල එකලස් කිරීමේ කාර්යයක් නම් අඩු වේගවත් බවකින් යුක්ත ව ද්‍රව්‍ය එහා මෙහා කිරීම සිදු කළ හැකි ස්ථානයක් උචිත වේ.

දවසේ පැය 24 පුරා ම මෙහෙයුම් ක්‍රියාත්මක වන්නේ නම්, ඉතා වේගයෙන් ද්‍රව්‍ය ලබා ගැනීම හා බෙදා හැරීම සඳහා පහසුකම් සහිත ස්ථානයක් තෝරා ගත යුතු වේ.

තව ද, පිටවන ශබ්දය, පිට කරන ද්‍රව්‍යය හා එළිමහන් ගබඩා කිරීම්වල අවශ්‍යතාව යන කරුණු ද සැලකිල්ලට ගෙන කුමන ප්‍රදේශවල ගබඩාව ස්ථාපිත කළ යුතු ද යන්න තීරණය කළ යුතු ය.

- **ප්‍රධාන සම්බන්ධතාවලට ආසන්න බව** (Proximity to major linkages)

  ගබඩා කර ඇති භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ම ප්‍රවාහන ක්‍රමය කුමක් ද යන්න එනම් දුම්රිය මාර්ග, ගුවන් මාර්ග හෝ ජල මාර්ග ද, යන්න මත ගබඩාව ස්ථානගත කළ යුතු ය.

  අධිවේගී මාර්ගයකින් පිටවීමට හෝ ගුවන් තොටුපලකට ඉක්මණින් ලඟා වීමට හෝ හැකි ස්ථානයක ගබඩාව ස්ථානගත කිරීම වඩාත් යෝග්‍ය වේ.

  ඊට අමතර ව සැලකිලිමත් විය යුතු වැදගත් සාධකයක් වන්නේ පාරිභෝගිකයාට ආසන්න වීමයි. එනම් නිෂ්පාදිතයෙන් වැඩි කොටසක් අපනයනය කරන්නේ නම්, හා ඉතිරිය රට තුළ සිල්ලර වෙළෙඳුන්ට බෙදාහරින්නේ නම්, ගබඩාව ස්ථානගත කිරීමේ තීරණය ගැනීමේ දී වරායට මෙන් ම, අධිවේගී මාර්ගවලට හා දුම්රිය මාර්ගවලට පහසුවෙන් ළගා විය හැකි ස්ථානයක් තෝරා ගත යුතු ය.

  භාණ්ඩයක පිරිවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් සමන්විත වන්නේ ප්‍රවාහන වියදම්වලිනි. එබැවින් අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ හෝ ප්‍රවාහනය සඳහා දැරීමට සිදු වන පිරිවැය පිළිබඳ ව දැඩි සැලකිල්ලක් යොමු කරමින් ගබඩාව ස්ථානගත කළ යුතු ස්ථානය තීරණය කළ යුතු ය.

- **ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ හැකියාව** (Material handling capabilities)
  ද්‍රව්‍ය ඇසිරීමේ පහසුකම් හා ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ උපකරණ හැසිරවීමේ පහසුකම් සහිත වීම ද ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණකි. භාණ්ඩ එහා මෙහා කිරීමේ ට්‍රක් රථ, භාණ්ඩ එසවීමේ උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩ පැටවීමේ හා බෑමේ වේදිකා සහිත වීම අවශ්‍ය වේ. භාණ්ඩ බෙදාහැරීම ඉතා වේගයෙන් සිදු වන්නේ නම් මෙවැනි පහසුකම් සහිත වීම අත්‍යවශ්‍ය ය.

- **ගබඩා කරන ද්‍රව්‍යයේ ස්වභාවය :**
  පුපුරණ ද්‍රව්‍ය, ගිනි ඇවිලෙන සුළු ද්‍රව්‍ය, ආහාර ද්‍රව්‍ය, ඉක්මණින් නෂ්‍ය වන ද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය යනා දී වශයෙන් ගබඩා කරන ද්‍රව්‍යයේ ස්වභාවය අනුව වඩාත් සුදුසු ගබඩාවක් තෝරා ගත යුතු ය. මෙහි දී පාරිසරික සාධක ද සැලකිල්ලට ගෙන නියමිත උෂ්ණත්වය, තෙතමනය රැකෙන පරිදි හා ගින්නෙන් වර්ෂාවෙන් ආදියෙන් හානි නො වන පරිදි ද්‍රව්‍යයන්ගේ ස්වභාවය අනුව සුදුසු ගබඩාවක් තෝරා ගත යුතු වේ.

නිදසුන් ඃ ගබඩා කරනුයේ ගිනි ඇවිලෙන සුළු ද්‍රව්‍යයක් නම් ජලාශයක් හෝ ජලය පහසුවෙන් සපයා ගැනීමට හැකියාවක් ආසන්නයේ පවතී ද යන්න පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

- **පිරිවැය** -
  කර්මාන්තශාලාව වෙත අමුද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා පිරිවැය මෙන් ම, නිෂ්පාදිත භාණ්ඩ අවසාන පාරිභෝගිකයාට බෙදා හැරීම දක්වා වන ප්‍රවාහන ගාස්තු. බෑමේ හා පැටවීමේ ගාස්තු ගණනය කර ප්‍රවාහන පිරිවැය අවම වන ස්ථානයක ගබඩාව ස්ථානගත කළ යුතු ය.
  මෙහි දී,
  - ගබඩා කුලිය ( Rent )
  - ඇප තැන්පතු (Security deposits )
  - රක්ෂණ ගාස්තු (Insurance rates)
  - වාහන නවතා තැබීමේ ඉඩකඩ හා සම්බන්ධ වියදම් (Parking location related expences)

  යනා දී වියදම් පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.

- ගබඩාවක භාණ්ඩ ඇසිරීම කළ යුතු ආකාර කිහිපයක් පහත දැක්වේ.

  - **තට්ටු ඇසුරුම් ක්‍රමය** - Pallet racking
    පහසු හා ලාභදායී භාණ්ඩ ඇසිරීමේ ක්‍රමයකි. එහා මෙහා කළ හැකි භාණ්ඩ අසුරන ලද තට්ටු (pallets) ගණනාවක් රාමුවක් තුළ එක මත එක තැබීමෙන් භාණ්ඩ අසුරනු ලැබේ. ඕනෑ ම අවස්ථාවක ඕනෑ ම තට්ටුවක් වෙත ලගා වීමේ හැකියාව ඇත. පුද්ගලයින්ට ඉනිමගක ආධාරයෙන් හෝ ෆෝක්ලිෆ්ට් ට්‍රක්වලට (forklift truck ) හෝ ගබඩාවේ ඕනෑ ම තැනක භාණ්ඩ අසුරා ඇති තට්ටුවක් වෙත ලගා විය හැකි ය.

  - **භාණ්ඩ ගොඩවල් වශයෙන් ඇසිරීම**
    Block Stacking / Bulk Storage
    එක ම වර්ගයේ භාණ්ඩ ගබඩාවේ බිම එක් ස්ථානයක එක මත එක ඇසිරීම මෙහි දී සිදු වේ. මේ අනුව විවිධ භාණ්ඩ වර්ග ගබඩාවේ විවිධ ස්ථානවල ගොඩවල් වශයෙන් අසුරා තැබීම සිදු කෙරේ. මෙම ක්‍රමයට භාණ්ඩ ඇසිරීමට රාක්කයක් හෝ භාජනයක් වැනි භෞතික මාධ්‍යයක් අවශ්‍ය නො වේ.
    නිදසුන් ඃ සහල්, සීනි, පිටි, කලුගල්, ගඩොල්

  - **එහා මෙහා කළ හැකි තට්ටු සහිත රාමු** Pallet flow
    මෙම ඇසුරුම් මාධ්‍ය තට්ටු ( pallet racks) ගණනාවකින් සැදුම්ලත් පීලි හෝ එහා මෙහා කිරීමේ පටිවලින් සමන්විත වේ. මෙහි දී නිෂ්පාදිත ගබඩා කිරීමත් නැවත ලබා ගැනීමත් එක ම පැත්තකින් සිදු කෙරෙන පරිදි (Drive - in ) හෝ නිෂ්පාදිත ගබඩා කිරීම එක් පැත්තකින් ද ඒවා ආපසු ලබා ගැනීම ඊට විරුද්ධ පැත්තකින් ද සිදු කෙරෙන පරිදි (Drive- Thru ) සවි කළ හැකි ය. මෙම ක්‍රමයට භාණ්ඩ ඇසිරීමේ දී ඝණත්වය ඉතා ඉහළ නිසා ඉඩකඩ ඉතා ප්‍රශස්ත ව භාවිත කළ හැකි ය. පිරිවැය ඉතා ඉහළ ශීතාගාර සහිත ගබඩාවල භාණ්ඩ ඇසිරීම සඳහා මෙම ක්‍රමය යෝග්‍ය වේ. භාණ්ඩවලට සිදු වන හානි වීම් වැලැක්වීම සඳහා එහා මෙහා වීමේ වේගය පාලනය කරන උපකරණ සවි කළ හැකි ය.

- **පසුපසට තල්ලු කරන රාක්ක** (Push - Back Racks)
  තට්ටු සහිත රාක්කවලට කුඩා කුඩ සවි කර ඇති ක්‍රමයකි. කුඩ එකක් මත එකක් වන පරිදි තට්ටු කිහිපයක් අඩුක්කළ හැකි ය. එක තට්ටුවක් මත නිෂ්පාදිත තැන්පත් කළ පසු එය පසු පසට තල්ලු කර එය ඉදිරියෙන් ඊළඟ තට්ටුව ස්ථානගත කෙරේ.

- **තට්ටු දෙකක් අතර ඇති අමතර තට්ටුව** ( Mezzanine )
  ගබඩාවක ඇති තට්ටු දෙකක් අතර අමතර තට්ටුවක් නිර්මාණය කර ද්‍රව්‍ය ගබඩා කිරීම මෙහි දී සිදු කෙරේ. මෙම අමතර තට්ටුව මත ඇසිරීම සඳහා ඉහත විස්තර කළ ඕනෑ ම ක්‍රමයක් අනුගමනය කළ හැකි ය. මෙ මගින් ඉඳි කරන ලද ගොඩනැගිල්ලේ පවතින ඉඩකඩ දෙගුණ කරයි.

- **ස්වයංක්‍රීය ඇසුරුම් ක්‍රමය** (Automated Storage System)
  පරිගණක තාක්ෂණය මගින් පාලනය කරනු ලබන යාන්ත්‍රික අතක ආකාරයේ උපාංගයකින් (Mechanical Arm Divice) ගබඩාවේ ද්‍රව්‍ය ගබඩා කිරීම මෙන් ම ආපසු ලබා ගැනීම සිදු කෙරේ. මෙම ක්‍රමය ගබඩා කර ඇති ඉතා කුඩා අයිතම පහසුවෙන් ආපසු ලබා ගැනීම සඳහා ඉතා යෝග්‍ය වේ. එමෙන් ම දහස් ගණනක් වූ පොත්පත් හා ලිපි ලේඛන ගබඩා කරන ලේඛණාගාරයක අදාළ අයිතම ඇසිරීම හා ආපසු ලබා ගැනීම සඳහා මෙම ක්‍රමය යෝග්‍ය වේ.

- ගබඩාවක භාණ්ඩ එහා මෙහා කිරීමේ දී විවිධ උපකරණ යොදා ගනියි.
  නිදසුන් :
  - ෆෝක්ලිෆ්ට් - Forklift
  - පැලට් ජැක්ස් - Pallet jacks
  - භාණ්ඩ එහා මෙහා කිරීමේ පටි - Conveyor belts
  - ෆෝක්ලිෆ්ට් ට්‍රක් - Forkfilt Truck

- විධිමත් ව භාණ්ඩ ඇසිරීමෙන් සහ ගබඩාව තුළ භාණ්ඩ එහා මෙහා කිරීමේ උපකරණ භාවිත කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන කිහිපයක් පහත දැක්වේ.

  - **ගබඩාව වඩාත් සංවිධානාත්මක වීම**
    ගබඩාවක විධිමත් ව භාණ්ඩ ඇසිරීම මගින් හා භාණ්ඩ එහා මෙහා කිරීම සඳහා උචිත ක්‍රමවේද හා උපකරණ භාවිත කිරීමෙන් ගබඩාව වඩාත් සංවිධානාත්මක වේ. මෙ මගින් සේවකයන්ට හා ගබඩාවේ අයිතිකරුට ගබඩාව නඩත්තු කිරීම හා කළමනාකරණය පහසු වේ.

  - **අසුරන ලද නිෂ්පාදිතවලට හා සේවකයන්ට ආරක්ෂාකාරී වීම**
    සේවකයන් සේවය කරන අතරතුර දී ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ තර්ජනයක් ඇති නොවන අතර, ගබඩාව තුළ අවුල්සහගත බවක් ද ඇති නොවේ. එමෙන් ම විධිමත් ව භාණ්ඩ ඇසිරීම නිසා නිෂ්පාදිත ඒවාට නියමිත ස්ථානවල ස්ථානගත කෙරෙන බැවින් එම නිෂ්පාදිත ආරක්ෂා වේ.

- **දැරිය යුතු පරිශ්‍රමය හා කාලය ඉතිරි වීම**
  විශේෂයෙන් ම භාණ්ඩ ඇසිරීම හා ආපසු ගැනීම අත්හුරු ක්‍රමයට (manual system) සිදු කරන්නේ නම් ගබඩාවක් නඩත්තු කිරීම කාලය ගත වන කටයුත්තකි. නමුත් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරමින් ගබඩාවේ භාණ්ඩ අසුරා තිබේ නම් එය භාණ්ඩ ඇසිරීම හා ආපසු ගැනීම සඳහා දරණ පරිශ්‍රමය හා කාලය ඉතිරි කරයි.

- **ගබඩාවේ ඉඩකඩ ඉතිරි වීම**
  විධිමත් ව භාණ්ඩ අසුරා තිබීම නිසා ගබඩාව විධිමත් ව සංවිධාන වී පවතී. එමගින් එක් ස්ථානයක සියල්ල ම ගොඩ ගසා ගබඩාව තුළ තදබදයක් ඇති කිරීම වෙනුවට භාණ්ඩ ඉහළට ඉහළට තැන්පත් කෙරෙන බැවින් (stack) ගබඩාවේ ඉඩකඩ ඉතිරි වේ.

- **තක්සේරුකරණය හා ඇගැයීම :**
  ප්‍රදේශයේ ඇති ගබඩාවක් නිරීක්ෂණය කර පහත කරුණු ඇතුළත් වන සේ වාර්තාවක් සැපයීමට උපදෙස් දෙන්න.
  - ඔබ නිරීක්ෂණය කළ ගබඩාවේ ගබඩා කර ඇති භාණ්ඩ වර්ග
  - එම එක් එක් භාණ්ඩ වර්ගය අසුරා තිබූ ආකාරය
  - භාණ්ඩ ඇසිරීම සඳහා භාවිත කර තිබූ ස්ථාන, උපකරණ හා ද්‍රව්‍ය
  - ඇසිරීමේ දී අවධානය යොමු කර තිබූ විශේෂ කරුණු
  - භාණ්ඩ එහා මෙහා කරන ආකාරය
  - භාණ්ඩ එහා මෙහා කිරීම සඳහා භාවිත කළ උපකරණ

  - සිසුන්ගේ වාර්තා පන්තියට ඉදිරිපත් කර, සුදුසු පරිදි ඇගැයීමට ලක් කරන්න.

**නිපුණතාව 10** : ප්‍රවාහන හා සැපයුම් සේවා (Logistics) ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා දායක වන ආකාරය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 10.4** : ප්‍රවාහන හා සැපයුම් සේවා පිළිබඳ ව අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් ඵල** :

- ප්‍රවාහන හා සැපයුම් සේවා හඳුන්වයි.
- ප්‍රවාහන හා සැපයුම් සේවාවල අවශ්‍යතාව පෙන්වා දෙයි.
- ප්‍රවාහන හා සැපයුම් සේවාවේ ප්‍රයෝජන ලැයිස්තුගත කරයි.

**පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ප්‍රදේශයේ ඇති කර්මාන්තශාලාවක් මතකයට නගා ගන්නා ලෙස සිසුන්ට පවසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

    - කර්මාන්ත ශාලාවක් තුළ භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම, ඒවා නිසි පරිදි ගබඩා කිරීම, බෑමේ හා පැටවීමේ කටයුතු, නිමි භාණ්ඩ ගබඩා කිරීම යනා දී කටයුතු රාශියක් සිදු වන බව,

    - අමු ද්‍රව්‍ය කර්මාන්ත ශාලාවට ගෙන ඒමටත්, නිමි භාණ්ඩ වෙළෙඳපොළට බෙදා හැරීමටත්, විවිධ වාහන යොදා ගන්නා බව,

      නිදසුන් : ලොරි රථ, කන්ටේනර්, ට්‍රක් රථ, අත්ට්‍රැක්ටර්

    - අමු ද්‍රව්‍ය හා නිමි භාණ්ඩ නිසි පරිදි ගබඩා කරන බව

    - නිමි භාණ්ඩ වෙළෙඳපොළට අඛණ්ඩ ව බෙදා හැරීම සිදු කරන බව

    - අමුද්‍රව්‍ය හා නිමි භාණ්ඩ බෑමට, පැටවීමට, එහා මෙහා කිරීමට මිනිසුන් හා ඊට උචිත උපකරණ යොදා ගන්නා බව.
      නිදසුන් : Fork-lift , Crane (දොඹකර), Pallet jacks, Bins

- මෙසේ ආයතනයකට අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබා ගැනීම, නිෂ්පාදනය සිදු කිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම වැනි එකිනෙක සම්බන්ධ කටයුතු සැලසුම් සහගත ව සිදු කළ යුතු බවත්, ඊට අදාළ ක්‍රියාවලිය ප්‍රවාහන හා සැපයුම් සේවා ලෙස හඳුන්වන බවත් පෙන්වා දෙන්න.

- ප්‍රවාහන හා සැපයුම් සේවා යන්න නිර්වචනය කර ඊට අයත් කාර්යයන් නිදසුන් සහිත ව පැහැදිලි කර දෙන්න.

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත දැක්වෙන්නේ නිෂ්පාදිත වර්ග හතර කි.
  - ජෑම්
  - පානීය ජල බෝතල්
  - ගඩොල්
  - පලතුරු බීම

- ඔබට ලැබෙන නිෂ්පාදිතය කෙරෙහි අවධානය යොමු කරන්න.

- කණ්ඩායම් සාකච්ඡාවක් මගින් ඔබගේ නිෂ්පාදිතයට අදාළ ව පහත කරුණු රැස් කරන්න.

  - අමුද්‍රව්‍ය මිල දී ගන්නා ආකාරය හා ප්‍රවාහනය කරන ආකාරය
  - යෙදවුම් නිමැවුම් ක්‍රියාවලිය
  - අමු ද්‍රව්‍ය හා නිමි ද්‍රව්‍ය තොග ගබඩා කරන ආකාරය හා ඒ සඳහා අවශ්‍ය උපකරණ
  - නිෂ්පාදිත වෙළෙඳපොළට බෙදාහැරීම සඳහා යොදා ගන්නා මාධ්‍යය හා බෙදාහැරීම සිදු කරන ආකාරය
  - අපද්‍රව්‍ය කළමනාකරණය කරන ආකාරය හා අවශ්‍ය උපකරණ

- ඔබගේ අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- ඔබට ලැබෙන ආයතනය කෙරෙහි අවධානය යොමු කරන්න.
  - ජෑම් නිෂ්පාදන ආයතනයක්
  - සිල්ලර වෙළෙඳසැලක්
  - සුවඳ විලවුන් නිෂ්පාදන ආයතනයක්
  - ගෑස් නියෝජිත ආයතනයක්

- කණ්ඩායම් සාකච්ඡාවක් මගින් පහත තොරතුරු රැස් කරන්න.

- අමු ද්‍රව්‍ය/නිමි ද්‍රව්‍ය සැපයුම්කරුවන්ගෙන් මිල දී ගැනීමේ සිට නිෂ්පාදන අවස්ථාව දක්වා කළ යුතු කාර්යයන් ලැයිස්තුවක් ලියන්න.

- නිෂ්පාදන ක්‍රියාවලිය අවසන් වූ අවස්ථාවේ සිට අවසන් නිෂ්පාදිත හෝ තොග අවසාන පාරිභෝගිකයා දක්වා සැපයීමේ දී කළ යුතු කාර්යයන් ලැයිස්තුවක් ලියන්න.

- ප්‍රවාහන හා සැපයුම් සේවා විධිමත් ව සැලසුම් කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන ලැයිස්තුවක් ලියන්න.

- ඔබේ අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.

- ආයතනයක ප්‍රවාහන හා සැපයුම් සේවාවල අවශ්‍යතාව හා ප්‍රයෝජන පිළිබඳ ව පැහැදිලි කර දෙන්න.


**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ප්‍රවාහන හා සැපයුම් සේවා (Logistics) යනු පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීම තහවුරු කිරීමේ අරමුණින් භාණ්ඩ, සේවා හා අදාළ තොරතුරු ඉදිරියට හා පසුපසට ගලා යාම, ඒවායේ ආරම්භක අවස්ථාවේ (point of origin) සිට පරිභෝජන අවස්ථාව (point of consumption) දක්වා කාර්යක්ෂම ව හා සඵලදායී ව සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකි.

- ආයතනයක මෙහෙයුම් කටයුතු සුමට ව ගලා යාම සඳහා සැලසුම් කරන ලද ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතියක් අත්‍යවශ්‍ය වේ. එවැනි ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතියක මූලික ක්‍රියාවලි දෙකක් ඇත.

    - අමු ද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ සැපයුම්කරුවන්ගෙන් මිල දී ගැනීමේ සිට නිෂ්පාදන අවස්ථාව දක්වා වූ චලනයන් (Inbound Logistics)

    - නිෂ්පාදන ක්‍රියාවලිය අවසාන වූ අවස්ථාවේ සිට නිෂ්පාදිත හෝ අදාළ තොරතුරු අවසාන පාරිභෝගිකයා තෙක් සැපයීම දක්වා වූ චලනයන් (Outbound Logistics)




- ආයතනවල ස්වරූපය, නිෂ්පාදිතවල ස්වරූපය අනුව විවිධ ආකාරයේ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති පැවතිය හැකි ය. ඒවා පහත පරිදි දැක්විය හැකි ය.

    - සමබර වූ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති Balanced Logistics Systems
      එනම් අමුද්‍රව්‍ය හෝ නිෂ්පාදිත, ආයතන තෙක් ප්‍රවාහය හා නිෂ්පාදනයෙන් පසු නිෂ්පාදිත පාරිභෝගිකයා දක්වා ප්‍රවාහය සමාන පද්ධති
      නිදසුන් : නෙස්ලේ, යුනිලිවර් වැනි පාරිභෝගික භාණ්ඩ සපයන ආයතන

    - නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා ප්‍රවාහය සංකීර්ණ වූ පද්ධති Heavy Inbound Logistics Systems
      නිදසුන් :
      ගුවන් යානා නිෂ්පාදන ආයතන
      ගුවන්යානා නිපදවීමට අවශ්‍ය ද්‍රව්‍ය හා සේවා සපයා ගැනීමට විවිධ ආයතන හා රටවල් සම්බන්ධ වීම නිසා ක්‍රියාවලිය සංකීර්ණ වන නමුත් ගුවන්යානා අලෙවි කිරීමේ ක්‍රියාවලිය එතරම් සංකීර්ණ නො වේ.

- නිෂ්පාදනයෙන් පසු අවසන් පාරිභෝගිකයා අතට පත් කිරීම දක්වා ප්‍රවාහය සංකීර්ණ වූ පද්ධති.
  Heavy Outbound Logistics Systems
  
  නිදසුන් ඃ රසායනික ද්‍රව්‍ය සමාගම්
  රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීම, ඇසිරීම හා ප්‍රවාහනය විශේෂ අවධානයකින් සිදු කළ යුතු බැවින් මෙම ක්‍රියාවලිය සංකීර්ණ වේ.

- නිෂ්පාදිත අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහය සහිත පද්ධති
  Reverse Logistics Systems
  
  නිදසුන් ඃ ගෑස් සිලින්ඩර් වැනි ආපසු භාර දෙන ඇසුරුම්
  භාවිත කළ ද්‍රව්‍ය ඉවත ලෑම
  පරිසරයට සිදු වන බලපෑම්

- ප්‍රවාහන හා සැපයුම් සේවාවල අවශ්‍යතාව පහත පරිදි පෙන්වා දිය හැකි ය.

  - නිවැරදි නිෂ්පාදිතය, නිවැරදි ප්‍රමාණයෙන්, නිවැරදි වේලාවට, නිවැරදි ස්ථානයේ දී, නිවැරදි මිලට, හොඳ තත්ත්වයෙන්, නිවැරදි පාරිභෝගිකයාට සැපයීමට ප්‍රවාහන හා සැපයුම් සේවා අවශ්‍ය වේ.

  - තොග පාලනය, නිෂ්පාදන සැලසුම්කරණය, ද්‍රව්‍ය මිල දී ගැනීම, ප්‍රවාහනය, ගබඩාකරණය ආදී කාර්යයන් විධිමත් ව සිදු කිරීමට ප්‍රවාහන හා සැපයුම් සේවා අවශ්‍ය වේ.

  - සෑම යන්ත්‍රයකට ම, සෑම වැඩ මධ්‍යස්ථානයකට ම, නියමිත ද්‍රව්‍ය, නියමිත ප්‍රමාණයෙන්, නියමිත ගුණත්වයෙන්, නියමිත වේලාවට ලැබෙන්නේ ද යන්න සහතික කර ගැනීමට ප්‍රවාහන හා සැපයුම් සේවා අවශ්‍ය වේ.

  - වෙළෙඳපොළ පර්යේෂණ, අවශ්‍යතා සැලසුම් කිරීම, නිපදවන්නේ ද මිල දී ගන්නේ ද (make-or-buy) තීරණය කිරීම ආදිය තුළින් පිරිවැය අවම කර ගැනීමටත් සැලසුම් දාමය අඛණ්ඩ ව පවත්වා ගැනීමටත් ප්‍රවාහන හා සැපයුම් සේවා අවශ්‍ය වේ.

- ප්‍රවාහන හා සැපයුම් සේවයේ ප්‍රයෝජන පහත පරිදි දැක්විය හැකි ය.

  - නිෂ්පාදිත අඛණ්ඩ ව වෙළෙඳපොළට සැපයීම තුළින් පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම
  - සියලු ම කාර්යයන් සැලසුම් සහගත ව සිදු කිරීම නිසා නාස්තිය හා අපතය අවම වීම තුළින් පිරිවැය අවම කර ගත හැකි වීම
  - තරගකාරිත්වයට ශක්තිමත් ව මුහුණ දීමට හැකි වීම
  - යන්ත්‍ර සූත්‍ර, සේවකයන් වෙනුවෙන් දැරීමට සිදු වන අක්‍රීය පිරිවැය අවම කර ගත හැකි වීම
  - නිෂ්පාදිතවල ගුණත්වය ආරක්ෂා කර ගත හැකි වීම
  - අපද්‍රව්‍ය කළමනාකරණය නිසි පරිදි සිදු වීමෙන් ගැටලු මතු නො වීම
  - කර්මාන්තය තුළ නායකයා බවට පත් විය හැකි වීම

**නිපුණතාව 11** : නිෂ්පාදිත බෙදාහැරීම සඳහා වෙළෙඳාම දායක වන අයුරු විමසයි.

**නිපුණතා මට්ටම 11.1** : වෙළෙඳාමේ ප්‍රභේද පිළිබඳ ව විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : **06**

**ඉගෙනුම් ඵල** :

- වෙළෙඳාම යන්න හඳුන්වයි.
- වෙළෙඳාම ප්‍රභේද කොට දක්වයි.
- බෙදාහැරීමේ ක්‍රියාවලිය සිදු වන විවිධ ආකාර විස්තර කරයි.
- බෙදාහැරීමේ ක්‍රියාවලිය සිදු වන විවිධ ආකාර රූප සටහනකින් දක්වයි.
- දෙන ලද භාණ්ඩයක බෙදා හැරීමේ ක්‍රියාවලිය රූප සටහනකින් දක්වයි.
- වෙළෙඳ අතරමැදියන් හඳුන්වයි.
- වෙළෙඳ අතරමැදියන්ගේ කාර්යභාරය අගයයි.
- නියෝජිතයන් ඔවුන් සපයන සේවා අනුව වර්ග කරයි.
- වෙළෙඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි හා අවාසි සඳහන් කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පහත දැක්වෙන ආකාරයේ වෙළෙඳ දැන්වීමක් සිසුන්ට ඉදිරිපත් කරන්න.

| |
|---|
| ගම්පහ නගර සීමාව තුළ කුඩා නිවසක් සහිත පර්චස් 10 ක ඉඩමක් ලක්ෂ 25 කට විකිණීමට තිබේ. වාහන මාරුවකට ද සලකා බැලේ. විමසීම් : 03322 --- --- |

- පහත කරුණු මතු කර ගනිමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

    - ඉඩම සඳහා වාහනයක් හුවමාරු කර ගැනීමට හෝ ලක්ෂ 25 කට ඉඩම විකිණීමට හෝ හැකි බව පෙන්වන්න.

    - ඉඩම වාහනයකට හුවමාරු කිරීමේ දී දෙපාර්ශ්වය අතර එම භාණ්ඩවල අයිතිය හුවමාරු වුව ද ගැණුම්කරු සහ විකුණුම්කරු පැහැදිලි ව වෙන් කර හඳුනා ගත නො හැකි බවත් මුදලට වෙළෙඳාමේ දී විකුණුම්කරු හා ගැනුම්කරු වෙන් කර හඳුනාගත හැකි බවත් පහදන්න.

- ඉහත තොරතුරු ඇසුරෙන් වෙළෙඳාම අර්ථ දක්වන්න.
  ☞

- වෙළෙඳාම විවිධ ආකාරයෙන් සිදු වන අතර එසේ වෙළෙඳාම ප්‍රභේද කළ හැකි ආකාරය ගැලීම් සටහනක් ඇසුරෙන් ඉදිරිපත් කරන්න.

- වෙළෙඳාම දේශීය වශයෙන් මෙන් ම විදේශීය වශයෙන් ද සිදු වන බව සිසුන්ට පැහැදිලි කරන්න.

- දේශීය වෙළෙඳාම, සිල්ලර වෙළෙඳාම හා තොග වෙළෙඳාම වශයෙන් ද, විදේශීය වෙළෙඳාම ආනයන වෙළෙඳාම හා අපනයන වෙළෙඳාම වශයෙන් ද සිදු වන බව පැහැදිලි කරන්න.

- නිෂ්පාදිත පාරිභෝගිකයා අතට පත් කිරීමේ ක්‍රියාවලිය විවිධාකාරයෙන් සිදු වන බව තහවුරු කරමින් සටහනක් අඳින්න.

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත දැක්වෙන ආයතන අතුරෙන් ඔබේ කණ්ඩායමට ලැබුණු ආයතනය කෙරෙහි අවධානය යොමු කරන්න.
    - මෝටර් රථ නිෂ්පාදන ආයතනයක්
    - බේකරි නිෂ්පාදන ආයතනයක්
    - සහල් නිෂ්පාදන ආයතනයක්

- ඔබේ කණ්ඩායමට ලැබුණු ආයතනය මඟින් බෙදාහරිනු ලබන භාණ්ඩය නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා බෙදාහැරිය හැකි ආකාර හැකිතාක් හඳුනා ගන්න.

- එම භාණ්ඩ බෙදාහැරීමේ ආකාර අතුරෙන් වඩාත් ම සුදුසු යැයි ඔබ තීරණය කරන ආකාරය කුමක් ද ? ඊට හේතු මොනවා ද ?

- එම ක්‍රමය සඳහා අතරමැදියන් සම්බන්ධ වූයේ නම් ඔවුන් කවුරුන් ද ?

- එම අතරමැදියන් සම්බන්ධ කර ගැනීමෙන් අත්වන වාසි හා අවාසි මොනවා ද ?

- සිසු අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.


- බෙදාහැරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වන අතරමැදියන් හඳුන්වා දෙන්න.

- වෙළෙඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි හා අවාසි පැහැදිලි කර දෙන්න.

**විෂයය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්:**

- ගැණුම්කරුවෙකු හා විකුණුම්කරුවෙකු අතර කිසියම් ප්‍රතිෂ්ඨාවකට නිෂ්පාදිත භාණ්ඩ හා සේවාවල අයිතිය හුවමාරු වීමේ ක්‍රියාවලිය වෙළෙඳාම ලෙස අර්ථ දැක්විය හැකි ය.

- වෙළෙඳාම ප්‍රභේද කරන ආකාරය පහත දැක්වෙන ගැලීම් සටහන මගින් ඉදිරිපත් කළ හැකි ය.




- දේශීය වෙළෙඳාම (Home Trade) යනු යම් රටක දේශ සීමාව තුළ සිදු වන වෙළෙඳාම වේ.

- දේශීය වෙළෙඳාම ප්‍රභේද දෙකකින් යුක්ත වේ.
  - තොග වෙළෙඳාම
  - සිල්ලර වෙළෙඳාම

- විදේශ වෙළෙඳාම (Foreign Trade) යනු යම් රටක් වෙනත් රටක් හෝ රටවල් සමග සිදු කරන වෙළෙඳාම වේ.

- විදේශ වෙළෙඳාම ප්‍රභේද දෙකකින් යුක්ත වේ.
  - ආනයන වෙළෙඳාම
  - අපනයන වෙළෙඳාම

- **පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීමේ මාර්ග**

(1) නිෂ්පාදකයා → පාරිභෝගිකයා

(2) නිෂ්පාදකයා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා

(3) නිෂ්පාදකයා → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා

(4) නිෂ්පාදකයා → නියෝජිතයින් → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා

- නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා භාණ්ඩ බෙදා හැරීමේ මාර්ග රාශියක් ඇති බව ඉහත සටහනින් පැහැදිලි වේ.

- අංක (1) න් පෙන්නුම් කරන්නේ නිෂ්පාදකයා කෙළින් ම පාරිභෝගිකයා වෙත භාණ්ඩ බෙදා හැරීමයි. (ඍජු බෙදාහැරීම )

- අංක (2) (3) (4) බෙදා හැරීමේ ක්‍රියාවලීන්හි දී අතරමැදියන් සම්බන්ධ වී ඇත.

- අතරමැදියන් යනු නිෂ්පාදිත බොදාහැරීමේ දී නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර සිටින බෙදාහැරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වන පාර්ශ්ව වේ.

- අතරමැදියන් ලෙස පහත පාර්ශ්ව හැඳින්විය හැකි ය.
  තොග වෙළෙන්දා
  සිල්ලර වෙළෙන්ඳා
  නියෝජිතයින්

- නැවත විකිණීම සඳහා නිෂ්පාදිත අලෙවි කරන්නන් තොග වෙළෙඳුන් ලෙස හැඳින්වේ.

- අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා අලෙවි කරන්නන් සිල්ලර වෙළෙඳුන් ලෙස හැඳින්වේ.

- කිසියම් ප්‍රධානියකුගේ බලය පිට යම් කාර්යයක නිරත වන්නන් නියෝජිතයින් ලෙස හැඳින්වේ. නියෝජිතයා තමාගේ ප්‍රධානියා වෙනුවෙන් වගකීම් භාරගනී. ඒ වෙනුවෙන් ඔහුට කොමිස් මුදලක් හිමි වේ.

- නියෝජිතයින් ඔවුන් සපයන සේවා අනුව පහත දැක්වෙන ආකාරයට වර්ග කළ හැකි ය.

**නියෝජිතයින්**

- කොමිස් නියෝජිතයා
- බ්‍රෝකර්වරු/ තැරැව්කරු
- සාධ්‍යකයා
- කැපකරු නියෝජිතයා
- වෙන්දේසිකරු

- ප්‍රධානියාට වාසිදායක වන ලෙස තම අභිමතය පරිදි ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලට ගැනීමක් හෝ විකිණීමක් සිදු කරමින් ඒ මත කොමිස් මුදලක් ලබා ගන්නා නියෝජිතයා කොමිස් නියෝජිතයා වේ.

- ගනුදෙනුවට අදාළ ගැනුම්කරු හා විකුණුම්කරු සම්මුඛ කරමින් ගනුදෙනුව සිදු වීමට අවශ්‍ය තොරතුරු සපයා සමහර විට විකුණුම්කරුගෙන් ද සමහර විට ගැනුම්කරුගෙන් ද සමහර විට දෙපාර්ශ්වයෙන් ම ද තම සේවය වෙනුවෙන් තැරැව් ගාස්තුවක් ලබා ගන්නා නියෝජිතයා තැරැව්කරු වේ.

- ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිල දී ගැනීමේ දී හෝ විකිණීමේ දී එම ගනුදෙනු තම පෞද්ගලික නමින් ම සිදු කරනු ලබන නියෝජිතයා සාධ්‍යකයා වේ.

- ප්‍රධානියා වෙනුවෙන් ණයට භාණ්ඩ විකිණීම සිදු කර, එම ණය මුදල් අදාළ පාර්ශ්වයන්ගෙන් එකතු කර දීමට ද කැප වෙමින් කටයුතු කරන නියෝජිතයා කැපකරු නියෝජිතයා වේ. ඔහුට සාමාන්‍ය කොමිස් මුදල්වලට අමතර ව කැපකරු කොමිස් මුදල් ද හිමි වේ.

- විකුණනු ලබන භාණ්ඩ වෙනුවෙන් විවෘත ව හා වාචික ව ඉහළ ගණන් ඉදිරිපත් කළ ගැනුම්කරුවන්ට ප්‍රධානියාගේ භාණ්ඩ අලෙවි කරමින් එම කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන පාර්ශ්වය වෙන්දේසිකරු වේ. මේ සඳහා ඔහුට වෙන්දේසි ගාස්තුවක් හිමි වේ.

☞

- වෙළෙඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි හා අවාසි පහත දැක්වේ.

වාසි :

- විවිධ නිෂ්පාදකයින් නිපදවන භාණ්ඩ හා සේවා ලබා ගෙන අවශ්‍ය වේලාවට පහසු ස්ථානයක දී පාරිභෝගිකයාට ලබා දීමට කටයුතු කිරීම
- නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීම පහසු වීම
- වෙළෙඳපොළ තොරතුරු අදාළ පාර්ශ්වයන්ට පහසුවෙන් ලබා ගත හැකි වීම
- හුවමාරු ක්‍රියාවලිය සරල වීම

අවාසි :

- වෙළෙඳපොළේ අනවශ්‍ය භාණ්ඩ හිඟයක් ඇති විය හැකි වීම
- භාණ්ඩවල මිල ගණන් ඉහළ යා හැකි වීම

**නිපුණතාව 11** : නිෂ්පාදිත බෙදාහැරීම සඳහා වෙළෙඳාම දායක වන අයුරු විමසයි.

**නිපුණතා මට්ටම 11.2** : සිල්ලර වෙළෙඳාම සිදු වන ආකාරය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් ඵල :**

- සිල්ලර වෙළෙඳාම අර්ථ දක්වයි
- සිල්ලර වෙළෙඳාමේ ලක්ෂණ පැහැදිලි කරයි.
- ප්‍රදේශයේ ඇති සිල්ලර වෙළෙඳසැල් ලැයිස්තුගත කරයි.
- සිල්ලර වෙළෙඳුන්ගෙන් නිෂ්පාදකයාට, තොග වෙළෙන්දාට හා පාරිභෝගිකයාට ඉටු වන සේවා වෙන වෙන ම ලැයිස්තුගත කරයි.
- සිල්ලර වෙළෙඳාමේ ප්‍රවණතා අනාවරණය කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සිල්ලර වෙළෙඳාම අර්ථ දක්වා, සිල්ලර වෙළෙඳාමේ ලක්ෂණ පැහැදිලි කර දෙන්න.

☞

- ප්‍රදේශයේ ඇති සිල්ලර වෙළෙඳසැල් කිහිපයක නම් විමසා එම නම් හුණු පුවරුවේ ලියන්න.

- සිසුන්ගේ පිළිතුරු සැලකිල්ලට ගනිමින් පහත කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

  - එම වෙළෙඳසැල් සිල්ලර වෙළෙඳසැල් ලෙස නම් කිරීමට හේතු
  - එම වෙළෙඳසැල්වලින් සේවා සැපයන පාර්ශ්ව
  - එම එක් එක් පාර්ශ්වයට ඉටු වන සේවා

- සිල්ලර වෙළෙඳුන්ගෙන් නිෂ්පාදකයාට, තොග වෙළෙන්දාට හා පාරිභෝගිකයාට ඉටු වන සේවා පැහැදිලි කරන්න.

- සිල්ලර වෙළෙඳාමේ ප්‍රවණතා නිදසුන් ඇසුරෙන් පැහැදිලි කර දෙන්න.

☞

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- අවසාන පාරිභෝගිකයාට භාණ්ඩ විකිණීම සිල්ලර වෙළෙඳාම ලෙස හැඳින්වෙන අතර එසේ විකුණන්නා සිල්ලර වෙළෙන්දා ලෙස හැඳින්වේ.

- සිල්ලර වෙළෙඳාමේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
    - අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හෝ සේවා අලෙවි කිරීම
    - විවිධ වර්ගයේ භාණ්ඩ රැසක් අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම
    - පාරිභෝගිකයාට අවශ්‍ය ද්‍රව්‍ය, අවශ්‍ය ප්‍රමාණයෙන්, අවශ්‍ය ස්ථානයේ දී ලබා ගැනීමට ඉඩකඩ සලසා තිබීම
    - බොහෝ විට ණය පදනම මත භාණ්ඩ අලෙවි කිරීම.
    - පාරිභෝගිකයා සමග සමීප සම්බන්ධතාවක් පවත්වා ගෙන යාම

**සිල්ලර වෙළෙඳුන්ගෙන් ඉටු වන සේවා :**

- නිෂ්පාදකයාට
    - නිෂ්පාදකයාගේ නව නිෂ්පාදිත පාරිභෝගිකයාට හඳුන්වා දීම
    - ප්‍රදර්ශන පුවරු හෝ පෝස්ටර් ප්‍රදර්ශනය, සාම්පල් බෙදා දීම යනාදිය මගින් භාණ්ඩ ප්‍රවර්ධනයට සහාය වීම
    - භාණ්ඩ අලෙවියෙන් පසු නිෂ්පාදිත පිළිබඳ පාරිභෝගික අදහස් හා අනෙකුත් අදාළ තොරතුරු නිෂ්පාදකයාට සැපයීම

- **තොග වෙළෙන්දාට**
    - තොග වෙළෙන්දා රැස් කර ගත් භාණ්ඩ පාරිභෝගිකයා වෙත බෙදා හැරීම
    - පාරිභෝගික රුචි අරුචිකම් හා වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු සැපයීම
    - තොග වෙළෙඳ කටයුතු ප්‍රවර්ධනය සඳහා දායක වීම

- **පාරිභෝගිකයාට :**
    - අවශ්‍ය ද්‍රව්‍ය අවශ්‍ය ප්‍රමාණයෙන් අවශ්‍ය වේලාවට සැපයීම
    - ණය පදනම මත භාණ්ඩ සැපයීම
    - නව භාණ්ඩ හඳුන්වා දීම හා අවශ්‍ය අවස්ථාවල දී උපදෙස් ලබා දීම
    - පාරිභෝගික අවශ්‍යතා අනුව විවිධ වර්ගයේ භාණ්ඩ සැපයීම
    - පාරිභෝගිකයාට විවිධ පහසුකම් සැපයීම (නිද : ප්‍රවාහන පහසුකම්, විද්‍යුත් ගෙවීම් ක්‍රම )

- **සිල්ලර වෙළෙඳාමේ ප්‍රවණතා :**
    - සුපිරි වෙළෙඳසැල් රටපුරා ව්‍යාප්ත වීම
      අතීතයේ නගරබද ප්‍රදේශවලට පමණක් සීමා වූ සුපිරි වෙළෙඳසැල් වර්තමානයේ ගම්බද ප්‍රදේශවල ද ව්‍යාප්ත වීම
    - නව තාක්ෂණය භාවිත කරමින් සිල්ලර වෙළෙඳසැල් ක්‍රියාත්මක වීම

| | | | |
|---|---|---|---|
| නිද : | මිල සටහන් කිරීම | - | විද්‍යුත් මිල දර්ශන |
| | තීරු සංකේත ක්‍රම | - | Bar code |
| | කිරුම් මිනුම් ක්‍රම | - | විද්‍යුත් තරාදි/Digital scale |
| | ගෙවීම් ක්‍රම | - | ණයපත් / හරපත් භාවිතය |
| | නිරීක්ෂණ ක්‍රම | - | CCTV Camera system |

- විවෘත ව තබන කාල සීමාව දීර්ඝ කිරීම
  නිදසුන් : රාත්‍රී කාලය හා නිවාඩු දිනවල ඕනෑ ම අවස්ථාවක ගනුදෙනු
  කළ හැකි වීම

- සේවා සැපයුම් සමග සිල්ලර වෙළෙඳසැල් සංයෝග වීම
  නිදසුන් : ලාෆ් ඉන්ධන පිරවුම්හල් සමග සුපිරි වෙළෙඳසැල්
  Commercial mini Bank සමග Cargils සුපිරි වෙළෙඳසැල්

-

- වෙළෙඳසැල් රහිත සිල්ලර වෙළඳාම (Non store Retailing)
  භාණ්ඩ මිල දී ගැනීමට පාරිභෝගිකයා වෙළෙඳසැල වෙත නො ගොස් දුරකථන, ෆැක්ස්, අන්තර්ජාලය, කැටලොග් භාවිතයෙන් භාණ්ඩ ඇණවුම් කර ලබා ගැනීමයි. මෙහි ආකාර දෙකකි.

  - අන්තර්ජාල වෙබ් අඩවි හරහා සිදු වන විද්‍යුත් සිල්ලර වෙළෙඳාම
    Online Retailing
  - ඍජු අලෙවිකරණය - Direct Marketing
    අතරමැදියන් නො මැති ව නිෂ්පාදිත කෙලින් ම පාරිභෝගිකයා අතට පත් කිරීම
    නිද : ඍජු තැපෑල - direct mail
    කැටලොග් - Catalogues
    දුරකථන හා රූපවාහිනිය මගින්

- ස්වයංක්‍රීය විකුණුම් යන්ත්‍ර
  රසකැවිලි - චොක්ලට් - සිසිල්බීම

- නව කළමනාකරණ ශිල්ප ක්‍රම භාවිත කිරීම

**නිපුණතාව 11** : නිෂ්පාදිත බෙදාහැරීම සඳහා වෙළෙඳාම දායක වන අයුරු විමසයි.

**නිපුණතා මට්ටම 11.3** : තොග වෙළෙඳාම සිදු වන ආකාරය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් ඵල** -

- තොග වෙළෙඳාම අර්ථ දක්වයි.
- තොග වෙළෙඳාමේ ලක්ෂණ විස්තර කරයි.
- ප්‍රදේශයේ ඇති තොග වෙළෙඳසැල් ලැයිස්තුගත කරයි.
- තොග වෙළෙඳුන්ගෙන් නිෂ්පාදකයාට හා සිල්ලර වෙළෙන්දාට ඉටු වන සේවා වෙන වෙන ම දක්වයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- තොග වෙළෙඳාම අර්ථ දක්වා තොග වෙළෙඳාමේ ලක්ෂණ පැහැදිලි කර දෙන්න.

- ඔබ ප්‍රදේශයේ ඇති තොග වෙළෙඳසැල්වල නම් ලැයිස්තුවක් හුණු පුවරුවේ ගොඩනගන්න.
- සිසුන්ගේ පිළිතුරු සැලකිල්ලට ගනිමින් පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

    - එම වෙළෙඳසැල් තොග වෙළෙඳසැල් ලෙස නම් කිරීමට හේතු
    - එම වෙළෙඳසැල්වලින් සේවා සැපයෙන පාර්ශ්ව
    - එම එක් එක් පාර්ශ්වයට ඉටු වන සේවා

**විෂයය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- නැවත විකිණීමේ චේතනාවෙන් මිල දී ගන්නා ගැණුම්කරුවන් වෙත නිෂ්පාදිත අලෙවි කිරීම තොග වෙළෙඳාම ලෙස හැඳින්වේ. එසේ නිෂ්පාදිත අලෙවි කරන්නා තොග වෙළෙන්දා වේ.

**තොග වෙළෙඳාමේ පහත ලක්ෂණ දැකිය හැකි ය.**

- නැවත විකිණීමේ අරමුණින් භාණ්ඩ මිලට ගැනීම
- භාණ්ඩ තොග වශයෙන් අලෙවි කිරීම
- වෙළෙඳ වට්ටම් ලබා දීම
- භාණ්ඩ තොග වශයෙන් ගබඩා කොට තිබීම
- අලෙවි ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම
- වෙළෙඳපොළ පිළිබඳ පර්යේෂණ කිරීම
- තොග ප්‍රවාහනය කර දීම

**තොග වෙළෙන්දාගෙන් ඉටුවන සේවා**

**නිෂ්පාදකයාට**

- නිෂ්පාදකයාගේ නිෂ්පාදිත තොග වශයෙන් ලබා ගැනීම
- වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු ලබා දීම
- නිෂ්පාදකයාට විවිධ සේවාවන් සැපයීම
  නිද : මූල්‍ය පහසුකම්, අමුද්‍රව්‍ය ලබා දීම

**සිල්ලර වෙළෙන්දාට**

- භාණ්ඩ තොග වශයෙන් සැපයීම
- සිල්ලර වෙළෙඳසැලට ම භාණ්ඩ ගෙනැවිත් දීම
- ණය පහසුකම් සැපයීම
- භාණ්ඩ තේරීම, ඇසිරීම, මිශ්‍ර කිරීම ආදී සේවාවන්හි නිරත වීම

**නිපුණතාව 11** : නිෂ්පාදිත බෙදාහැරීම සඳහා වෙළෙඳාම දායක වන අයුරු විමසයි.

**නිපුණතා මට්ටම 11.4** : විදේශ වෙළෙඳාම හා ඒ ආශ්‍රිත ප්‍රතිලාභ හා බාධක විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල** :

- විදේශ වෙළෙඳාම හඳුන්වයි.
- විදේශ වෙළෙඳාමට පදනම් වූ සාධක විස්තර කරයි.
- විදේශ වෙළෙඳාමේ ප්‍රභේද වෙන වෙන ම විස්තර කරයි.
- විදේශ වෙළෙඳාමේ ප්‍රතිලාභ අගයයි.
- නිදහස් වෙළෙඳාම යන්න අර්ථ දක්වයි.
- නිදහස් වෙළෙඳාමට ඇති බාධක තීරු බදු හා තීරු බදු නො වන ලෙස වර්ග කර, ඒවා පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සිසුන් උදෑසන අවදි වූ අවස්ථාවේ සිට පාසලට පැමිණෙන තෙක් පරිහරණය කළ ද්‍රව්‍ය පිළිබඳ විමසා එම ද්‍රව්‍ය ලැයිස්තුවක් හුණු පුවරුවේ ගොඩනගන්න.

- හුණු පුවරුවේ සඳහන් කළ ද්‍රව්‍ය, දේශීය නිෂ්පාදිත හා විදේශීය නිෂ්පාදිත වශයෙන් කොටස් දෙකකට වෙන් කිරීමට උපදෙස් දෙන්න.

- විදේශීය නිෂ්පාදිත වශයෙන් නම් කළ නිෂ්පාදිත මෙරටට ගෙන් වූ රටවල් පිළිබඳ විමසමින් රටකට අවශ්‍ය සියලු ම දේ නිෂ්පාදනය කිරීමට සෑම රටකට ම නො හැකි නිසා විදේශ රටවල් සමග ගනුදෙනු කිරීමට සිදු වන බව තහවුරු කරන්න.

- ඉහත තොරතුරු ඇසුරෙන් විදේශ වෙළඳාම අර්ථ දක්වා විදේශ වෙළෙඳාම බිහි වීමට පදනම් වූ සාධක නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

- විදේශ වෙළෙඳාමේ ප්‍රභේද වෙන වෙන ම විස්තර කරන්න.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

  - "රටකට විදේශ වෙළෙඳාම අවශ්‍ය වේ". යන මාතෘකාවට පක්ෂ ව හා විපක්ෂ ව කරුණු ඉදිරිපත් කිරීමට විවාදයක් සංවිධානය කරන්න.

  - විවාදයට සම්බන්ධ නො වන සිසුන් ලවා විවාදයේ දී විදේශ වෙළෙඳාම රටකට අවශ්‍යය යන්නට පක්ෂ ව හා විපක්ෂ ව ඉදිරිපත් වන වැදගත් කරුණු සටහන් කරවන්න.

- සටහන් කළ කරුණු ඇසුරෙන් සාකච්ඡාවක් මෙහෙයවා විදේශ වෙළෙඳාමේ ප්‍රතිලාභ පෙන්වා දෙන්න.

- නිදහස් වෙළෙඳාම අර්ථ දක්වා නිදහස් වෙළෙඳාමට ඇති බාධක තීරුබදු හා තීරුබදු නො වන ලෙස වර්ග කර ඒවා පැහැදිලි කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- යම් රටක් වෙනත් රටක් හෝ රටවල් සමග සිදු කරන වෙළෙඳාම විදේශ වෙළෙඳාම වේ.

- විදේශ වෙළෙඳාම සඳහා පදනම් වී ඇති සාධක කිහිපයකි.
    - **ස්වභාවික සම්පත් බෙදී යාමේ විෂමතාව**
      යම් යම් රටවලට සමහර ස්වභාවික සම්පත් උරුම වී ඇති ආකාරය විෂම වීම නිසා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සිදු කළ හැක්කේ එම රටවලට පමණි

      නිද : මැද පෙරදිග - ඛණිජ තෙල්
      ද. අප්‍රිකාව - රත්තරන්
      ශ්‍රී ලංකාව - තේ

    - **සාපේක්ෂ පිරිවැය වාසිය**
      රටක් භාණ්ඩ ආනයනය කිරීමට සාපේක්ෂ ව අඩු පිරිවැයකින් නිපදවිය හැකි නම් එම භාණ්ඩ නිපදවා අපනයනය කළ යුතු බවත්, භාණ්ඩය නිපදවීමට සාපේක්ෂව අඩු පිරිවැයකින් ආනයනය කළ හැකි නම් එම භාණ්ඩ ආනයනය කළ යුතු බවත් මින් අදහස් වේ.
      නිද : ශ්‍රී ලංකාව - ඇගළුම් නිෂ්පාදනය

    - **සමහර නිෂ්පාදිත සම්බන්ධ ව සමහර රටවල නීතිමය ඒකාධිකාරයක් තිබීම**
      ( patant & copyright )
      සමහර නිෂ්පාදන සඳහා අවශ්‍ය නිපුණතාව හා තාක්ෂණය සෑම රටකට ම නො මැති වීම හෝ සීමා වීම
      නිද : රොබෝ තාක්ෂණය
      මෝටර් රථ තාක්ෂණය

    - **භාණ්ඩ ප්‍රවර්ධනය**
      තම නිෂ්පාදිත ලොව පුරා අලෙවි කර ගැනීම සඳහා විවිධ ප්‍රවර්ධන උපක්‍රම භාවිත කිරීම

    - **වෙළෙඳ බාධක අවම වීම**
      වෙළෙඳාම සඳහා තිබූ තීරු බදු සහ තීරු බදු නො වන සම්බාධක බොහොමයක් ඉවත් වීම

- විදේශ වෙළෙඳාමේ ප්‍රභේද කිහිපයකි.

    - ආනයන වෙළෙඳාම - Imports
    - අපනයන වෙළෙඳාම - Exports
    - ප්‍රති අපනයන - Re Exports
    - අන්තරාල වෙළෙඳාම - Entrepot Trade

- කිසියම් රටක් විදේශ රටකින් හෝ රටවලින් භාණ්ඩ හා සේවා ගෙන්වීම ආනයන වෙළෙඳාම වේ.
  නිදසුන් : ශ්‍රී ලංකාවට ජපානයෙන් මෝටර් රථ ගෙන්වීම

- කිසියම් රටක් විදේශ රටකට හෝ රටවලට භාණ්ඩ හා සේවා යැවීම අපනයන වෙළෙඳාම වේ.
  නිද : ශ්‍රී ලංකාවෙන් ඉරාකයට තේ යැවීම

- කිසියම් රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට ගෙනැවිත් වෙනසකට භාජනය කර හෝ නො කර නැවත වෙනත් රටකට හෝ රටවලට යැවීම ප්‍රති අපනයන වෙළෙඳාම වේ. මෙහි දී ආනයන අවස්ථාවේ දී ගෙවූ තීරු බදු අපනයනය කරන විට ආපසු අය කර ගත හැකි ය.
  නිදසුන් : රෙදිපිළි සහ අනෙකුත් ද්‍රව්‍ය ආනයනය කර ඇඟළුම් සකස් කර වෙනත් රටකට අපනයනය කිරීම

- විදේශ රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට නො ගෙන වරාය තුළ නැවත සකසා හෝ සැකසීමකින් තොර ව නැවත වෙනත් රටකට හෝ රටවලට අපනයනය කිරීම අන්තරාල වෙළෙඳාම ලෙස හැඳින්වේ. මෙම ක්‍රියාවලිය වරාය තුළ සිදු වන නිසා තීරු ගාස්තු අය කිරීමක් සිදු නො වේ.
  නිදසුන් : ශ්‍රී ලංකාවට ඉන්දියාවෙන් තේ ආනයනය කර ඉරානයට අපනයනය කිරීම

    - රටක් විදේශ වෙළෙඳාමේ නිරත වීමෙන් ප්‍රතිලාභ අත් කර ගත හැකි ය.

        - අතිරික්ත නිෂ්පාදිත අපනයනය කළ හැකි වීම
        - රටේ නිපදවිය නො හැකි නිෂ්පාදිත ආනයනය කළ හැකි වීම
        - විදේශ විනිමය උපයා ගත හැකි වීම
        - ආර්ථික පිරිමැසුම් අත් කර ගත හැකි වීම
          විදේශ වෙළෙඳාම නිසා දේශීය වෙළෙඳපොළට පමණක් නොව ගෝලීය වෙළෙඳපොළ සඳහා ද නිෂ්පාදනය කෙරේ. මෙසේ පුළුල් වෙළෙඳපොළක් සඳහා නිෂ්පාදනය මහා පරිමාණ ව සිදු කිරීම නිසා ආර්ථික පිරිමැසුම් ඇති කර ගත හැකි වේ.
        - ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා හා ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය වීම
        - නව තාක්ෂණික හා කළමනාකරණ නිපුණතා වර්ධනය වීම
        - ආර්ථික සංවර්ධනයට පිටුවහලක් වීම

නිදසුන් ඃ

- රැකියා උත්පාදනය
- ජනතාවගේ ජීවන මට්ටම උසස් වීම
- සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම

- කිසිඳු බාධාවකින් තොර ව විවිධ පාර්ශ්වයන්ට නිදහසේ භාණ්ඩ ආනයනය හා අපනයනය කිරීමට අවකාශයක් පැවතීම නිදහස් වෙළෙඳාම වේ.

- නිදහස් වෙළෙඳාමට ඇති බාධක තීරුබදු හා තීරුබදු නො වන බාධක ලෙස වර්ග කෙරේ.

- රටවල් අතර වෙළෙඳාමේ දී තීරු බදු පැනවීම නිදහස් වෙළෙඳාමට බාධාවක් වේ.

- තීරු බදු අය කිරීමට අමතර ව නිදහස් වෙළෙඳාමට බලපාන අනෙකුත් බාධා තීරු නො වන බාධා ලෙස හැඳින්වේ.

  නිදසුන් ඃ

  ආනයන සීමා කිරීම් / පංගු කිරීම්
  අපනයන සීමා කිරීම් / පංගු කිරීම්
  ආනයන/අපනයන තහනම් කිරීම්
  වෙළෙඳ ගිවිසුම්
  දැඩි විනිමය ප්‍රතිපත්ති

**නිපුණතාව 11** : නිෂ්පාදිත බෙදාහැරීම සඳහා වෙළෙඳාම දායක වන අයුරු විමසයි.

**නිපුණතා මට්ටම 11.5** : ආනයන හා අපනයන ක්‍රියා පටිපාටිය විමසමින් විදේශ වෙළෙඳාමට ප්‍රවේශ වීමේ සූදානම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල :**

- ආනයන හා අපනයන ක්‍රියා පටිපාටිය විස්තර කරයි.
- ආනයන හා අපනයන වෙළෙඳාමේ දී භාවිත වන ලියවිලි ලැයිස්තුගත කරයි
- ආනයන හා අපනයන වෙළෙඳාමේ දී සම්බන්ධ වන ආයතන ලැයිස්තුගත කරයි.
- ආනයන හා අපනයන ක්‍රියා පටිපාටියේ එක් එක් අවස්ථාවේ දී සම්බන්ධ වන ආයතන, එහි දී භාවිත කෙරෙන ලියවිලි සහ එම ලියවිලිවල අවශ්‍යතාව යන තොරතුරු වගු ගත කරයි.
- විදේශ වෙළෙඳාමේ දී මුදල් ගෙවීම සිදු වන ආකාර වෙන වෙන ම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ආනයන හා අපනයන ක්‍රියාපටිපාටිය විස්තර කර දෙන්න.

  ☞

- ආනයන හා අපනයන වෙළෙඳාමේ දී භාවිත වන ලියකියවිලි එම ලියවිලිවල අවශ්‍යතාව හා ඒවා නිකුත් කරන ආයතන පැහැදිලි කර දෙන්න.

  ☞

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

ආනයන හා අපනයන වෙළෙඳ ගනුදෙනු බොහෝ විට සිදු වන්නේ නියෝජිතයකු මාර්ගයෙනි. නමුත් සෘජුව ම ඇණවුම් කර ගනුදෙනු සිදු වන අවස්ථා ද දක්නට ලැබේ. කුමන ක්‍රමය අනුගමනය කළ ද ආනයන හා අපනයන ක්‍රියාපටිපාටියේ දී අවශ්‍ය වන ලියවිලිවල වෙනසක් සිදු නො වේ.

- **ආනයන ක්‍රියාපටිපාටිය**
  - විදේශ සැපයුම්කරුවෙකු තෝරා ගැනීම
    සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු, වාණිජ මණ්ඩල සඟරා හා ප්‍රකාශන, තානාපති කාර්යාල, වෙළෙඳ ප්‍රදර්ශන හා අන්තර් ජාල වෙබ් අඩවි තුළින් ලබා ගෙන සුදුසු විදේශීය සැපයුම්කරුවෙකු තෝරා ගැනීම

  - මිල විමසුමක් යැවීම
    සැපයුම්කරුවෙකු තෝරා ගැනීමෙන් අනතුරුව තමන් ආනයනය කිරීමට අදහස් කරන භාණ්ඩවල මිල ගණන් විමසීම සිදු කෙරේ. ඒ සඳහා තෝරා ගත් සැපයුම්කරු වෙත මිල විමසුමක් යැවේ.

- මිල කියුමක් ලැබීම
  සැපයුම්කරු (අපනයනකරු ) භාණ්ඩ සැපයීමට එකඟ වන මිල ගණන් හා කොන්දේසි ඇතුළත් කර මිල විමසුමට පිළිතුරු ලෙස මිල කියුමක් ආනයනකරු වෙත එවනු ලබයි.

- ආනයන බලපත්‍ර ලබා ගැනීම
  සමහර නිෂ්පාදිත ආනයනය කිරීමේ දී ආනයන බලපත්‍රයක් ලබා ගත යුතු වේ. මෙය ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබේ. ආනයන බලපත්‍ර අවශ්‍ය භාණ්ඩ තීරණය කරනු ලබන්නේ ආනයන හා අපනයන පාලක විසිනි.

- ඇණවුම (ඉන්ඩෙන්ටුව) ඉදිරිපත් කිරීම
  සැපයුම්කරුගේ මිල කියුමට ආනයනකරු එකඟ වන්නේ නම් ඇණවුමක් ඉදිරිපත් කළ යුතු වේ. මෙම ඇණවුම ඉන්ඩෙන්ටුව නමින් ද හඳුන්වයි.

- අපනයනකරුට ගෙවීම පිළිබඳ කටයුතු කිරීම
  බොහෝ විට අපනයනකරුට ගෙවීම සඳහා ණයවර ලිපි සහ ණයපත් යොදා ගනී.

- භාණ්ඩ නිදහස් කර ගැනීම
  අදාළ ගෙවීම් කිරීමෙන් පසු ව, නියමිත ලියවිලි ඉදිරිපත් කර භාණ්ඩ නිදහස් කර ගත හැකි ය.

  සැ.යු. අවශ්‍ය වන ලියවිලි පසු ව විස්තර කෙරේ.

- **අපනයන ක්‍රියාපටිපාටිය**
  - අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීම
  - විදේශ ගැනුම්කරුවා සොයා ගැනීම
  - අවශ්‍ය වන්නේ නම් අපනයන බලපත්‍ර ලබා ගැනීම
  - ආනයනකරුගෙන් ලැබුණු මිල විමසුමට ප්‍රතිචාරයක් වශයෙන් මිල කියුමක් යැවීම
  - ආනයනකරුගෙන් ඉන්ඩෙන්ටුව ලබා ගැනීම
  - භාණ්ඩ තොගය නැව්ගත කිරීම සඳහා අවශ්‍ය ඉඩ වෙන්කර ගැනීම හා අවශ්‍ය ලියවිලි සකස් කර ගැනීම
  - නැව්ගත කිරීමට සුදුසු වන ආකාරයට භාණ්ඩ ඇසුරුම් කිරීම
  - අපනයන භාණ්ඩ තොගය රක්ෂණය කිරීම
  - භාණ්ඩ නැව්ගත කර නෞභාරපත ලබා ගැනීම
  - මුදල් ලබා ගැනීමට අදාළ කටයුතු කිරීම

- ආනයන හා අපනයන වෙළෙඳාමේ දී භාවිත වන ලියකියවිලි පහත පරිදි කෙටියෙන් හැඳින්විය හැකි ය.

- **ආනයන /අපනයන බලපත්‍ර :**

  ආනයනයේ දි හා අපනයනයේ දී  බලපත්‍ර අවශ්‍ය වන භාණ්ඩ ආනයන හා අපනයන පාලක විසින් ප්‍රසිද්ධියට පත් කරයි.  මේ සඳහා සම්බන්ධ වන ආයතන කිහිපයක් පහත දැක්වේ.

  නිදසුන් :

  | | | |
  |---|---|---|
  | තේ | - | ශ්‍රී ලංකා තේ මණ්ඩලය |
  | මැණික් හා ස්වර්ණාභරණ | - | රාජ්‍ය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය |
  | එළවළු , කුළුබඩු හා බුලත් | - | ආනයන අපනයන පාලක දෙපාර්තමේන්තුව |

- **ඉන්ඩෙන්ටුව/ඇණවුම** (Indent /Order)

  සැපයුම්කරුවෙකුගේ මිල කියුම අනුව, ඔහුගෙන් භාණ්ඩ ලබා ගැනීමට ආනයනකරුවෙකු එකඟ  වන්නේ නම්, ඒ සඳහා ඇණවුමක් අදාළ සැපයුම්කරු වෙත යැවිය යුතු ය. විදේශ වෙළෙඳාමේ දී මෙම ඇණවුම හැඳින්වෙන්නේ ඉන්ඩෙන්ටුව නමිනි.  මෙම ඇණවුම් කිරීම අන්තර්ජාලය හරහා සිදු කළ හැකි ය. ආනයනකරුවෙකු විසින් විදේශීය සැපයුම්කරුවෙකු වෙත යවනු  ලබන  මෙම ඇණවුමෙහි ආනයනකරුට අවශ්‍ය භාණ්ඩ පිළිබඳ විස්තර, මිල, නැව්ගත කිරීමට අදාළ තොරතුරු ඇතුළත් කෙරේ.

- **නෞභාරපත :** Bill of Lading (B/L)

  නැව් සමාගමක් වෙනුවෙන් නැව්පති හෝ ඔහුගේ නියෝජිතයකු විසින් අපනයනකරු වෙත නිකුත් කෙරේ.  නෞභාරපත්‍රයේ සඳහන් භාණ්ඩ තොගය නැවට භාරගත් බවටත්,  එම භාණ්ඩ අදාළ රටේ වරායට ගෙන ගොස්  භාර දෙන බවටත් නැව් සමාගම මෙයින් පොරොන්දු වේ.  අපනයනකරු විසින් ආනයනකරුට මෙහි පිටපතක් යවන අතර භාණ්ඩ රැගත් නැව නියමිත වරායට ළඟා වූ විට ආනයනකරුට එම භාණ්ඩවල අයිතිය තහවුරු කිරීමට මෙය අවශ්‍ය වේ. භාණ්ඩ පිළිබඳ විස්තර, අපනයනකරුගේ නම, ආනයනකරුගේ නම, නැවේ නම, භාණ්ඩ යවන වරාය යනා දී විස්තර මෙහි ඇතුළත් වේ.

- **ඉන්වොයිසිය** (Invoice )

  අපනයනය කරනු ලබන භාණ්ඩවල විස්තර, මිළ ගණන්, ගෙවීම් කොන්දේසි, ගමන් මාර්ගය, ප්‍රතික්ෂේප කිරීමේ කොන්දේසි ආදී විස්තර ඇතුළත් ලේඛනයකි.

- **ප්‍රභවස්ථාන සහතිකය** ( Letter of Origin)

  නැව්ගත කරන භාණ්ඩ අපනයනය කරන  රටේ නිපදවා ඇති බව සහතික කරමින් පිළිගත් වෙළෙඳ මණ්ඩලයකින් හෝ රාජ්‍ය ආයතනයකින් නිකුත් කරනු ලබන ලියවිල්ලකි.  තීරුබදු සහන ලබා ගැනීමේ දී මෙම ලියවිල්ල වැදගත් වේ.

  නිදසුන් :  ශ්‍රී ලංකාවෙන් යුරෝපා සංගමයට භාණ්ඩ අපනයනය කරන විට එම භාණ්ඩ ශ්‍රී ලංකාවේ නිපද වූ බවට  ආයෝජන මණ්ඩලය හෝ කර්මාන්ත අමාත්‍යාංශය ප්‍රභවස්ථාන සහතිකය නිකුත් කරයි.

- **ණයවර ලිපිය** - (Letter of Credit (L/C)

  ආනයන අපනයන වෙළෙඳාමේ දී අපනයනකරුට මුදල් ගෙවීම සඳහා බහුල ව භාවිත කෙරෙන මාධ්‍යයකි.  ආනයනකරුගේ ඉල්ලීම මත, ආනයනකරු වෙනුවෙන්, ඔහුගේ බැංකුව විසින් අපනයනකරුගේ බැංකුව වෙත ණයවර ලිපිය නිකුත් කෙරේ.  අපනයනකරු විසින් ආනයනකරුවකු වෙත අපනයනය කරනු  ලබන භාණ්ඩවලට මුදල් ගෙවීම තහවුරු කිරීම සඳහා ආනයනකරුගේ බැංකුව නිකුත් කරන ලියවිල්ලකි.

- **ආනයන සටහන්කරය** (Import entry)
  ආනයනකරු වෙනුවෙන් වරායට ලැබී ඇති භාණ්ඩ පිළිබඳ අයිතිය ප්‍රකාශ කිරීම සඳහා ආනයනකරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් රේගුව වෙත ඉදිරිපත් කළ යුතු ලියවිල්ල යි. නෞභාරපත හෝ ඉන්වොයිසිය ඇසුරෙන් මෙය පිළියෙල කෙරේ.

- **අපනයන සටහන්කරය** (export entry)
  අපනයනකරු අපනයනය කිරීමට අපේක්ෂා කරන භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් කර අපනයනකරු විසින් අපනයන රටේ රේගුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල යි.

- **රක්ෂණ සහතිකය** ( Insurance Certificate)
  අපනයනයට අදාළ භාණ්ඩ තොගය අපනයනය කිරීමේ දී , එම භාණ්ඩ තොගය රක්ෂණය කර අපනයනකරු හෝ ආනයනකරු ලබා ගන්නා රක්ෂණ සහතිකයයි. විකුණුම් ගිවිසුම අනුව රක්ෂණ සහතිකය ලබා ගැනීම අපනයනකරු හෝ ආනයනකරු විසින් සිදු කරනු ලබයි.

- **වේදිකා කුවිතාන්සිය** /**වාප්පුකාර කුවිතාන්සිය** (Wharfinger's Receipt)
  රේගුවට භාණ්ඩ භාරදුන් පසු එම භාණ්ඩ භාරගත් බව සඳහන් කරමින් රේගුව විසින් අපනයනකරුට නිකුත් කරන ලියවිල්ලයි.

- **හානිරක්ෂණ ලිපිය** (Letter of Indemnity)
  දූෂ්‍ය නෞභාරපත්‍රයක් නිකුත් කිරීමේ තත්ත්වයක් ඇති අවස්ථාවක දී කැඩී බිඳීම් හෝ පලුදු වීම් ඇති එම භාණ්ඩ තොගයේ අනාගත සියලු අවදානම් අපනයනකරු භාර ගන්නා බව සඳහන් කරමින් පාරිශුද්ධ නෞභාරපතක් ලබා ගැනීම සඳහා අපනයනකරුවකු විසින් නැවේ කපිතාන් වෙත නිකුත් කරන ලියවිල්ලයි.

  නැවට පටවන ලද භාණ්ඩ හොඳ තත්ත්වයේ පවතින විට නිකුත් කරන නෞභාරපත පාරිශුද්ධ නෞභාරපත වේ. නැවට පටවන යම් යම් භාණ්ඩ හෝ මුළු තොගය ම හෝ කැඩීම් බිඳීම් හෝ පලුදු සහිත වේ යැයි සඳහන් කර නිකුත් කරන ලියවිල්ල දූෂ්‍ය නෞභාරපත වේ.

- **සනීපාරක්ෂක සහතිකය** /**සෞඛ්‍යය සහතිකය** (Sanitary Certificate/Health Certificate )
  ආනයන රටේ අවශ්‍යතාව මත යම් රටක් අපනයනය කරන ඇතැම් කෘෂි නිෂ්පාදිතවල පාරිභෝජන යෝග්‍යතාව තහවුරු කරමින් එම රටේ පිළිගත් ආයතනයක් මඟින් නිකුත් කරන ලියවිල්ලකි.

  නිදසුන් : කෘෂි නිෂ්පාදන සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
  මත්ස්‍ය නිෂ්පාදන සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

- **ගුදම් බලපත්‍රය :**
  වරාය ආශ්‍රිත ගබඩා ගුදම් (Warehouse) ලෙස හැඳින්වේ. ගුදමක භාණ්ඩ තැන්පත් කළ විට ගුදම් අධිකාරීන් ඒ බව සහතික කරමින් ආනයනකරු වෙත නිකුත් කරන ලියවිල්ල ගුදම් බලපත්‍රය වේ.

  ගුදමේ තිබිය දී ම භාණ්ඩවල අයිතිය වෙනත් කෙනෙකුට පවරන්නේ නම්, ගුදම් බලපත්‍රය පැවරීමෙන් එය කළ හැකි ය. එම නිසා ගුදම් බලපත්‍රය පැවරිය හැකි ලියවිල්ලකි.

- විදේශ වෙළෙඳාමේ දී මුදල් ගෙවීම සඳහා යොදා ගන්නා ක්‍රම පහත සඳහන් ආකාරයට පැහැදිලි කළ හැකි ය.

  - ණයවර ලිපි විවෘත කිරීම මගින්

  - බැංකු අණකර මගින්

    යම් පුද්ගලයකු විසින් සිය බැංකුවට අදාළ මුදල හා නියමිත ගාස්තු ගෙවා, දෙන ලද උපදෙස් පරිදි නම් කරනු ලැබූ මුදල් ප්‍රමාණයක් ලැබිය යුතු තැනැත්තාට ගෙවන ලෙස අණ කරමින් මුදල් යවන්නාගේ බැංකුව විසින් මුදල් ලැබිය යුතු තැනැත්තාගේ බැංකුවට හෝ නියෝජිත බැංකුවට නිකුත් කරන ලියවිල්ලයි. මෙය විදේශීය ගෙවීම් සඳහා මෙන් ම දේශීය ගෙවීම් සඳහා ද භාවිත කරයි.

  - විද්‍යුත් ගෙවීම් ක්‍රම මගින්
    වර්තමානයේ අන්තර්ජාල සබඳතා උපයෝගී කර ගෙන මුදල් ගෙවිය හැකි ක්‍රම මෙයට අයත් වේ.
    නිදසුන් : ණයකාඩ්පත - (credit card)
    මුදල් ගෙවීම් සඳහා බහුල ව මෙම ක්‍රමය භාවිත කරයි. visa, Master,Americam Express වැනි කාඩ්පත් බැංකුවක් හරහා ලබා ගත හැකි අතර අන්තර්ජාලය හරහා ගෙවීම් මාධ්‍යයක් ලෙස භාවිත කරයි.

    - අන්තර්ජාල පෙර-ගෙවුම් කාඩ්පත් : (Internet pre-paid card )
      අවශ්‍ය මුදල් ප්‍රමාණය අදාළ කාඩ්පතට තැන්පත් කර අවශ්‍ය ගෙවීම් සිදු කිරීම සඳහා තාවකාලික ව භාවිත කරන කාඩ්පතකි.

    - අන්තර්ජාල පෙර-ගෙවුම් පහසුකම් : (Internet pre-paid facility )
      තමන්ගේ බැංකු ගිණුමක් මගින් ගෙවීම් සිදු කරන අතර ගෙවීම් සඳහා විධානය දීමට අන්තර්ජාල බැංකු පහසුකම් (Internet banking) භාවිත කරයි. වර්තමානයේ බොහෝ බැංකු තම ගිණුම් හිමියන්ට මෙම පහසුකම් ලබා දෙන අතර සේවාව අවශ්‍ය අය ලියාපදිංචි වී තමන්ට ලැබෙන ගිණුම් හිමියාගේ නම හා මුරපදය (user name/ password ) භාවිත කර අදාළ වෙබ් අඩවියට පිවිස ගෙවීම් කළ හැකි ය.

- විද්‍යුත් ගෙවීම් සේවා ආයතන හරහා ගෙවීම ( Electronic pay ment systems)
  යම් ගෙවීමක් කිරීමේ දී අදාළ භාණ්ඩය හෝ සේවාව ලබා ගත් ආයතනයට සෘජු ව ම ගෙවීම් නො කර පිළිගත් ගෙවීම් ආයතනයක් හරහා ගෙවීම් කිරීමේ ක්‍රමයකි.
  නිදසුන් : www paypal.com

  මෙම ක්‍රමයට ගෙවීම් කිරීමේ දී ප්‍රථමයෙන් paypal පද්ධතිය තුළ ලියාපදිංචි වී, බැංකු ගිණුම් හෝ ණයපත් තොරතුරු paypal ආයතනයට ලබා දී paypal පද්ධතිය හරහා ගෙවීම් කළ හැකි ය. මෙහි දී ගිණුම පිළිබඳ තොරතුරු බාහිර පාර්ශ්වයන්ට ලබා දීමක් සිදු නො වේ.

**නිපුණතාව 11** : නිෂ්පාදිත බෙදාහැරීම සඳහා වෙළෙඳාම දායක වන අයුරු විමසයි.

**නිපුණතා මට්ටම 11.6** : ජාත්‍යන්තර සංගම්, වෙළෙඳ ගිවිසුම් හා සංවිධානවල ක්‍රියාකාරිත්වය විදේශ වෙළෙඳාමේ උන්නතියට දායක වන ආකාරය විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් ඵල :**

- විදේශ වෙළෙඳාමට දායක වන වෙළෙඳ සංගම්, වෙළෙඳ ගිවිසුම් හා ජාත්‍යන්තර සංවිධාන සඳහා නිදසුන් සපයයි.
- වෙළෙඳ සංගම් (වෙළෙඳ කලාප) විදේශ වෙළෙඳාමේ උන්නතියට දක්වන දායකත්වය අගයයි.
- වෙළෙඳ ගිවිසුම් හා ජාත්‍යන්තර සංවිධාන විදේශ වෙළෙඳාමට ඇති කරන බලපෑම විග්‍රහ කරයි.
- විදේශ වෙළෙඳාමේ ප්‍රවණතා විමසා බලයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- පහත සඳහන් සැණපත් එකින් එක සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

| |
|---|
| ආනයනික වාහන සඳහා තීරු බදු ඉහළට |

| |
|---|
| G S P + සහනය නැවතත් ශ්‍රී ලංකාවට |

| |
|---|
| ලෝක වෙළෙඳපොළේ තෙල් මිල ඉහළට |

| |
|---|
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ශ්‍රී ලංකාවට අඩු පොළියට ණය |

- පහත කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - තීරුබදු වැඩි වීම ආනයනයට බාධාවක් බව
    - G S P + සහනය ලැබීමෙන් අපනයන වර්ධනය වන බව
    - ජාත්‍යන්තර ආයතන වෙළෙඳාමට මූල්‍ය පහසුකම් සපයන බව
    - ලෝක වෙළෙඳපොළේ සිදු වීම් ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළට ද බලපාන බව

- ගැටලු මගහරවා ගැනීමටත්, ජාත්‍යන්තර වෙළෙඳාම වර්ධනය කර ගැනීමටත්, රටවල් අතර සහයෝගීතාව වර්ධනය කර ගැනීමටත්, ජාත්‍යන්තර සංවිධාන හා ගිවිසුම් ඇති කර ගත යුතු බව පැහැදිලි කර දෙන්න.

- එවැනි සංගම් සංවිධාන හා ගිවිසුම් සඳහා නිදසුන් සාකච්ඡා කරන්න.
- එවැනි සංගම්, සංවිධාන හා ගිවිසුම් විදේශ වෙළෙඳාමට ඇති කරන බලපෑම පෙන්වා දී විදේශ වෙළෙඳාමේ ප්‍රවණතා සාකච්ඡා කරන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- රටවල් කිහිපයක් විසින් බදු, තීරු ගාස්තු සහ වෙළෙඳාම පිළිබඳ ව ගිවිසුමකට එළඹී කටයුතු කරන නිදහස් වෙළෙඳ ප්‍රදේශයක්, වෙළෙඳ කලාපයක් (Trade Bloc) ලෙස හඳුන්වයි.

- වෙළෙඳ කලාප නිදහස් වෙළෙඳ ප්‍රදේශ (Free trade areas), වෙළෙඳ හවුල්, වෙළෙඳ සංගම් යන නම්වලින් ද හඳුන්වයි.

**වෙළඳ කලාප :**

- වෙළෙඳ කලාපවලට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.
  - යුරෝපීය සංගමය (EU )
  - ආසියන් සංගමය (ASEAN )
  - රටවල් අටේ කණ්ඩායම (G8)

**යුරෝපීය සංගමය** European Union (EU)

යුරෝපයේ පිහිටි රටවල් 26 කින් මෙය සමන්විත වේ. 1957 දී යුරෝපීය රටවල් 6 ක් විසින් අත්සන් තබන ලද රෝම ගිවිසුම (Treaty of Rome) මගින් පිහිටුවන ලද යුරෝපීය ආර්ථික ප්‍රජාව (Eropean Economic Community) මෙහි මූලාරම්භයයි.

මෙහි සාමාජික රටවල් පොදු වෙළෙඳ ප්‍රතිපත්තියක්, කෘෂි හා ධීවර ප්‍රතිපත්තියක්, ප්‍රාදේශීය සංවර්ධන ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යන අතර, 1999 දී EU විසින් යූරෝ (Euro) නමින් පොදු මුදල් ඒකකයක් හඳුන්වා දී ඇත.

EU සාමාජික රටවල් :

- ඔස්ට්‍රියා
- සෙච් රිපබ්ලික් (Czech Republic)
- ඉතාලිය
- මෝල්ටා
- රුමේනියාව
- ස්වීඩන්
- බෙල්ජියම
- ඩෙන්මාක්
- ලිතුවේනියා
- නෙදර්ලන්තය
- සොල්වේකියා
- බල්ගේරියා
- එස්ටෝනියා
- ලැට්වියා
- පෝලන්තය
- සොල්වේනියා
- පින්ලන්තය
- ප්‍රංශය
- ජර්මනිය
- ග්‍රීසිය
- හංගේරියාව
- සයිප්‍රස්
- අයිස්ලන්තය
- ලක්සම්බර්ග්
- පෘතුගාලය
- ස්පාඤ්ඤය

- **අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංවිධානය (ආසියන් සංගමය)**
  (Association of South East Asian Nations (ASEAN)
  ඈත පෙරදිග ආසියාවේ රටවල් 10 ක දේශපාලනික හා ආර්ථික සහයෝගීතා සංගමයකි. 1961 දී පිලිපීනය, මැලේසියාව, තායිලන්තය, යන රටවල් තුන එක් ව පිහිට වූ ඈත පෙරදිග ආසියානු සංගමය (Association of Southeast Asia ) මෙහි මූලාරම්භයයි. ඉහත රටවල් තුන 1967 දී ඉන්දුනීසියාව හා සිංගප්පූරුව සමග එකතු වී ASEAN සංවිධානය පිහිටුවන ලදී.

ASEAN සාමාජික රටවල් :

- පිලිපීනය
- ඉන්දුනීසියාව
- වියට්නාමය
- කාම්බෝජය
- මැලේසියාව
- සිංගප්පූරුව
- ලාඕසය
- තායිලන්තය
- බෲනායි
- මියන්මාරය

**රටවල් අටේ කණ්ඩායම** Group of Eight (G8)

ලෝකයේ ප්‍රධාන පෙළේ රටවල් 08 ක් විසින් පිහිටුවාගත් ජාත්‍යන්තර සංගමයකි. 1973 දී ඇති වූ තෙල් අර්බුදයත් , ගෝලීය ආර්ථික ප්‍රපාතනයත් මෙම සංසදය බිහිවීමට බලපෑ අතර, 1974 දී ඇමරිකා එක්සත් ජනපදය, බටහිර ජර්මනිය, ජපානය සහ ප්‍රංශය යන රටවල් නිල නො වන කණ්ඩායමක් වශයෙන් එක් වීම මෙහි මූලාරම්භයයි. 1997 දී රුසියාව නිල වශයෙන් G7 සමූළුවට සම්බන්ධ වීමත් සමග මෙය G8 ලෙස නම් කෙරිණි.

G8 සාමාජික රටවල්

- ඇ.එ.ජ. (USA)
- බටහිර ජර්මනිය
- කැනඩාව
- එක්සත් රාජධානිය (UK)
- ඉතාලිය
- රුසියාව
- ප්‍රංශය
- ජපානය

**වෙළෙඳ ගිවිසුම් :**

රටවල් දෙකක් හෝ කිහිපයක් අතර යම් කාලපරිච්ඡේදයක් තුළ වෙළෙඳ ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම සඳහා ඇති කර ගන්නා එකඟතාව වෙළෙඳ ගිවිසුම් ලෙස හැඳින්වේ. රටවල් දෙකක් අතර ඇති වන ගිවිසුම් ද්වි පාර්ශ්වීය ගිවිසුම් ලෙසත්, රටවල් කිහිපයක් අතර ඇති වන ගිවිසුම් බහු පාර්ශ්වීය ගිවිසුම් ලෙසත් හැඳින්වේ.

වෙළෙඳ ගිවිසුම්වලට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA)
- දකුණු ආසියානු නිදහස් වෙළෙඳ කලාපය (SAFTA)
- ආසියා පැසිපික් වෙළෙඳ ගිවිසුම (APTA)

**උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම**

North American Free Trade Agreement (NAFTA)

ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව හා මෙක්සිකෝව යන රටවල් තුන සාමාජිකත්වය දරන මෙම ගිවිසුම ආරම්භ වූයේ 1994 ජනවාරි පළමුවන දා සිටයි. මෙම රටවල් තුන අතර වෙළෙඳ බාධා ඉවත් කිරීම, තීරු බදු ඉවත් කිරීම, ශ්‍රමය හුවමාරු කර ගැනීම සම්බන්ධ කොන්දේසි ගිවිසුමෙහි ඇතුළත් වේ. මෙම ගිවිසුමෙහි ඇති විශේෂ ලක්ෂණය වන්නේ ඉහත රටවල් තුනෙහි නිෂ්පාදිතවලට පමණක් ගිවිසුම සීමා වීමයි.

වෙනත් රටක නිපද වූ භාණ්ඩ මෙම රටවල් තුන අතර හුවමාරු වීමේ දී තීරු ගාස්තු ක්‍රියාත්මක වේ. තීරු ගාස්තු නිදහස් වනුයේ ඇමරිකා එක්සත් ජනපදයේ නිපදවන ලදී (Made in USA), කැනඩාවේ නිපදවන ලදී (Made in Canada) හෝ මෙක්සිකෝවේ නිපදවන ලදී (Made in Mexico) යනුවෙන් සඳහන් නිෂ්පාදිත සඳහා පමණි.

**දකුණු ආසියානු නිදහස් වෙළෙඳ කලාපය**
South Asian Free Trade Area (SAFTA)

සාක් කලාපීය වෙළෙඳ සහයෝගීතාව ව්‍යාප්ත කිරීමටත්, දකුණු ආසියාව තුළ නිදහස් වෙළෙඳ ප්‍රදේශයක් ඇති කර ගැනීමටත්, සාක් කලාපීය රටවල ආර්ථික පිළිවෙත් ගෝලීයකරණයට අනුගත කිරීමටත් ඇති කර ගත් එකඟතාවයි.

2004 වර්ෂයේ ඉස්ලාමාබාද්හි දී පැවති 12 වන SAARC සමුළුවේ දී මෙම ගිවිසුම අත්සන් කරන ලදී.

සෆ්තා (SAFTA) ගිවිසුමට එළැඹීමෙන් එම ගිවිසුමට එළැඹි රාජ්‍යයන් අතර ආනයන සඳහා කිසිඳු බාධාවකින් තොර ව තීරු බදු ඉවත් කිරීම, වරාය හා ප්‍රවාහන පහසුකම් ඇති කිරීම, වෙළෙඳාමට සම්බන්ධ සේවා සැපයීම යනාදිය සම්බන්ධයෙන් සාමූහික එකඟතා ඇති කර ගන්නා ලදී.

**ආසියා පැසිපික් වෙළෙඳ ගිවිසුම**
Asia - Pacific Trade Agreement (APTA)

1975 වර්ෂයේ බැංකොක් ගිවිසුම නමින් ආරම්භ වූ මෙම ගිවිසුම 2005 නොවැම්බර් 02 වන දින සිට ආසියා- පැසිපික් වෙළෙඳ ගිවිසුම යනුවෙන් නම් කරන ලදී. මෙහි සාමාජික රටවල් වනුයේ බංගලාදේශය, චීනය, ඉන්දියාව, ලාඕසය, මොංගෝලියාව, ශ්‍රී ලංකාව හා දකුණු කොරියාව ය. ආසියා - පැසිපික් කලාපයේ ඇති පැරණි ම වරණීය වෙළෙඳ ගිවිසුම වන්නේ මෙම ගිවිසුමයි.

සාමාජික නො වන රටවලින් භාණ්ඩ හා සේවා ආනයනය කිරීමට වඩා සහනදායී ලෙස සාමාජික රටවලින් භාණ්ඩ හා සේවා ආනයනය කිරීමට හැකි වන පරිදි වෙළෙඳ බාධක හැකිතාක් අවම කරමින් සාමාජික රටවල් අතර ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම මෙම ගිවිසුමේ අරමුණ වේ.

**ජාත්‍යන්තර සංවිධාන :**
විදේශ වෙළෙඳාමට එරෙහි වන තීරු බදු, විනිමය පාලන නීතිරීති, රේගු නීතිරීති වැනි විවිධ බාධා අවම කර ගැනීමට පිහිටුවා ගෙන ඇති සංවිධාන ජාත්‍යන්තර සංවිධාන ලෙස හැඳින්වේ.

එවැනි ජාත්‍යන්තර සංවිධානවලට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- ලෝක වෙළෙඳ සංවිධානය (WTO)
- සාර්ක් සංවිධානය (SAA RC)
- ආසියානු සංවර්ධන බැංකුව (ADB)
- ලෝක බැංකුව (IBRD)
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)

**ලෝක වෙළෙඳ සංවිධානය**
World Trade Organization - (WTO)

ජාත්‍යන්තර වෙළෙඳාම ලිහිල් කිරීමට හා සුපරීක්ෂණය සඳහා ස්ථාපිත කරන ලද ජාත්‍යන්තර සංවිධානයකි. 1995 ජනවාරි 01 දින ආරම්භ වූ මෙම සංවිධානය ගෝලීය මට්ටමින් ජාතීන් අතර වෙළෙඳ නීතිරීති සම්බන්ධව කටයුතු කරයි. WTO හි ප්‍රධාන කාර්යාලය ස්විස්ටර්ලන්තයේ ජිනීවා හි පිහිටුවා ඇත. වෙළෙඳාමේ ප්‍රවර්ධනය සඳහා ජාතීන් අතර සාකච්ඡා පැවැත්වීමට අවකාශ සැලසීමත්, වෙළෙඳ බාධා පහත හෙලීමත්, සාමාජික රටවල ජනතාවගේ සුබසාධනය නංවාලීමටත් WTO වල ප්‍රධාන ඉලක්කයයි.

**දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමය**
South Asian Association for Regional Co-operation (SAARC)

දකුණු ආසියාතික රටවල් අට ක ආර්ථික හා දේශපාලනික සංගමයකි. 1985 දෙසැම්බර් මස 08 වන දින මෙම සංවිධානය ස්ථාපිත කරන ලදී.

SAARC සංවිධානයේ සහයෝගීතා කටයුතු ක්ෂේත්‍ර පහක් යටතේ සිදු වේ.
එනම් :

- කෘෂිකර්මාන්තය හා ග්‍රාමීය සංවර්ධනය
- විදුලි සංදේශ, විද්‍යාව, තාක්ෂණය හා දේශගුණික විද්‍යාව
- සෞඛ්‍යය හා ජනගහන කටයුතු
- ප්‍රවාහනය
- මානව සම්පත් සංවර්ධනය

SAARC සාමාජික රටවල්

- ශ්‍රී ලංකාව
- බංගලාදේශය
- භූතානය
- ඉන්දියාව
- නේපාලය
- ඇෆ්ගනිස්ථානය
- පාකිස්ථානය
- මාලදිවයින

**ආසියානු සංවර්ධන බැංකුව**
Asian Development Bank (ADB)

1966 දෙසැම්බර් 19 වනදා ආසියානු සංවර්ධන බැංකුව ආරම්භ විය. පිලිපීනයේ මැනිලා නුවර මෙහි මූලස්ථානය පිහිටා ඇත. වර්තමානයේ රටවල් 67 ක් මෙහි සාමාජිකත්වය ලබා ඇති අතර ඉන් රටවල් 48 ක් ආසියා කලාපයෙන් ද රටවල් 19 ක් පැසිපික් කලාපයෙන් ද වේ. සාමාජික රටවල සමාජයීය හා ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණ වේ. ඒ සඳහා සාමාජික රටවලට ණය හා ප්‍රතිපාදන සපයමින් එම රටවල දුප්පත්කම නැති කිරීමට මෙම බැංකුව කටයුතු කරයි.

**ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව (ලෝක බැංකුව)**
International Bank for Reconstruction and Development (IBRD)

දෙවන ලෝක යුද්ධයෙන් විනාශයට පත් වූ යුරෝපා ආර්ථිකය ගොඩ නැංවීම උදෙසා වූ බ්‍රෙට්න් වුඩ්ස් (Bretton Woods ) ගිවිසුම මගින් 1945 දෙසැම්බර් 27 දින ආරම්භ විය.

සංවර්ධනය වන රටවල දුප්පත්කම පහත හෙලීමේ අරමුණින් එම රටවල සංවර්ධන වැඩසටහන් සඳහා ණය සපයන බැංකුව ලෙස මෙම බැංකුව හඳුන්වයි.

තිරසර සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සහ දුප්පත්කම තුරන් කිරීම ලෝක බැංකුවේ ප්‍රධාන ඉලක්ක වේ.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදල**
International Monitary Fund (IMF)

මූල්‍ය හා තාක්ෂණික ආධාර ලබා දීමේත් විනිමය අනුපාත හා ගෙවුම් ශේෂ නිරීක්ෂණය කිරීමේත් ජාත්‍යන්තර සංවිධානය ලෙස IMF හැඳින්විය හැකි ය. මෙහි ප්‍රධාන කාර්යාලය ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් නගරයේ පිහිටුවා ඇත.

මෙය ගෝලීය මූල්‍ය සහයෝගීතාව දියුණු කිරීම, මූල්‍ය ස්ථායීතාව සහතික කිරීම, ජාත්‍යන්තර වෙළෙඳාමට පහසුකම් සැලසීම, රැකීරක්ෂා පුළුල් කිරීම, තිරසර ආර්ථික සංවර්ධනය හා දුප්පත්කම අඩු කිරීම අරමුණු කර ගෙන ආරම්භ කර ඇත.

- වෙළෙඳ සංගම්, වෙළෙඳ ගිවිසුම් හා ජාත්‍යන්තර සංවිධාන විදේශ වෙළෙඳාමට විවිධ බලපෑම් ඇති කරයි.

  නිදසුන් :
  - නිදහස් වෙළෙඳාමට එරෙහි තීරුබදු හා තීරුබදු නො වන බාධා ඉවත් වීම
  - රටවල් අතර සහයෝගීතාව වර්ධනය වීම
  - වෙළෙඳ ගිවිසුම් හරහා තම රටේ නිෂ්පාදිත සඳහා ස්ථිර වෙළෙඳපොළක් හිමි වීම
  - ස්ථිර මිලක් ලැබීම නිසා මිල උච්චාවචනවලින් අවාසි සිදු වීම අවම වීම
  - සාමාජික සෑම රටකට ම සමාන වරප්‍රසාද හිමි වීම
  - ගෝලීය මූල්‍ය සහයෝගීතාව වර්ධනය වීම හා මූල්‍ය ස්ථායීතාව සහතික වීම
  - රැකී රක්ෂා පුළුල් වීම හා තිරසර ආර්ථික සංවර්ධනය සහ දුප්පත්කම අඩු වීම

- විදේශ වෙළෙඳාමේ ප්‍රවණතා කිහිපයක් පහත දැක්වේ.
    - විද්‍යුත් වාණිජ්‍ය හරහා විදේශ වෙළෙඳාම ලොව පුරා ම ව්‍යාප්ත වීම
    - ආර්ථික වර්ධනය වේගවත් කර ගැනීමටත්, ආර්ථික අර්බුදවලට ශක්තිමත් ව මුහුණ දීමටත්, නව වෙළෙඳ කලාප හා වෙළෙඳ හවුල් ඇති වීම
    - සාම්ප්‍රදායික අපනයනවලට සීමා නො වී ඉහළ තාක්ෂණයකින් යුතු නිෂ්පාදිත විවිධාංගීකරණය කෙරෙහි යොමු වීම
    - ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදිත දිරිගැන්වීම සඳහා විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියට යොමු වීම
    - ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ පැස පිළිබඳ වර්තමානයේ අවධානය යොමු වෙමින් පැවතීම

**තක්සේරුකරණය හා ඇගැයීම :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

පහත දැක්වෙන්නේ ජාත්‍යන්තර වෙළෙඳ සංගම්, වෙළෙඳ ගිවිසුම් හා සංවිධාන ඇතුළත් කාණ්ඩ තුනකි.

| | | | |
|---|---|---|---|
| A | සංගම් | - | EU |
| | | - | ASEAN |
| | | - | G8 |
| B | ගිවිසුම් | - | NAFTA |
| | | - | SAFTA |
| | | - | APTA |
| C | සංවිධාන | - | WTO |
| | | - | IBRD |
| | | - | IMF |

- ඔබේ කණ්ඩායමට ලැබෙන කාණ්ඩය කෙරෙහි අවධානය යොමු කරන්න.
- එම කාණ්ඩයේ ඇතුළත් සංගම්/ගිවිසුම්/සංවිධාන සඳහා පහත තොරතුරු කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් රැස් කරන්න.
    - හැඳින්වෙන සම්පූර්ණ නාමය
    - මූලාරම්භය
    - අයත් රටවල්
    - අරමුණු හා කාර්යය සැකෙවින්
    - විදේශ වෙළෙඳාමේ උන්නතියට ඇති කරන බලපෑම
- ඔබ රැස් කර ගත් තොරතුරු ඇසුරෙන් නිර්මාණාත්මක ව පොත් පිංචක් සකස් කරන්න.

- සිසුන්ගේ නිර්මාණ කණ්ඩායම් අතර හුවමාරු කර ගෙන ඒවායේ ඇතුළත් තොරතුරු අධ්‍යයනය කරන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.

**නිපුණතාව 11** : නිෂ්පාදිත බෙදාහැරීම සඳහා වෙළෙඳාම දායක වන අයුරු විමසයි.

**නිපුණතා මට්ටම 11.7** : විද්‍යුත් වාණිජ්‍ය වෙළෙඳාමේ උන්නතියට දායක වන ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල :**

- විද්‍යුත් ව්‍යාපාර සහ විද්‍යුත් වාණිජ්‍ය හඳුන්වයි.
- විද්‍යුත් වෙළෙඳාම අර්ථ දක්වයි.
- විද්‍යුත් වෙළෙඳාමේ ක්‍රියාපටිපාටිය විස්තර කරයි.
- විද්‍යුත් වෙළෙඳාමේ වාසි හා අවාසි ලැයිස්තුගත කරයි.
- විද්‍යුත් වෙළෙඳාම සිදු වන ආකාර වෙන වෙන ම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- නවීනතම ආභරණයක් මිල දී ගැනීමට අවශ්‍ය නම් එම මිල දී ගැනීම සිදු කළ හැකි ආකාර පිළිබඳ ව සිසුන්ගෙන් විමසමින් ඒවා හුණු පුවරුවේ ලියන්න.
  (ආභරණ සාප්පුවකින් මිල දී ගැනීම, ආභරණ ප්‍රදර්ශනයකින් මිල දී ගැනීම, විදේශ රටක සංචාරය කර මිල දී ගැනීම, අන්තර්ජාලය හරහා ඇණවුම් කර මිල දී ගැනීම ආදී වශයෙන් )

- පහත කරුණු මතුකරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

  - සිසුන්ගේ පිළිතුරු අනුව භාණ්ඩයක් හෝ සේවාවක් විකිණීම හෝ මිල දී ගැනීම සිදු කළ හැකි විවිධ ආකාර පවතින බව

  - භාණ්ඩ හා සේවා විකිණීම හා මිලදී ගැනීමට අදාළ කටයුතු වෙළෙඳාම ලෙස හඳුන්වන අතර වෙළෙඳ කටයුතු අන්තර්ජාලය හරහා සිදු වන්නේ නම් එම වෙළෙඳාම විද්‍යුත් වෙළෙඳාම ලෙස හඳුන්වන බව

  - වෙළෙඳ කටයුතු සඳහා මෙන් ම වෙළෙඳාම සඳහා සහාය වන සන්නිවේදනය, ප්‍රවාහනය, ගබඩාකරණය වැනි උපකාරක සේවා කටයුතු සඳහා ද අන්තර්ජාලය භාවිත කරයි නම් එය විද්‍යුත් වාණිජ්‍ය ලෙස හඳුන්වන බව

  - අලෙවිකරණය, බෙදාහැරීම, මූල්‍ය කටයුතු, පරිපාලන කටයුතු ආදී සියලු ම ව්‍යාපාර කටයුතු අන්තර්ජාලය යොදා ගනිමින් සිදු කරයි නම් එවැනි ව්‍යාපාර විද්‍යුත් ව්‍යාපාර ලෙස හඳුන්වන බව

  - සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- පහත දැක්වෙන්නේ නිෂ්පාදිත වර්ග හතරක් හා ඒවා නිෂ්පාදිත රටවල් ය.

| නිෂ්පාදිතය | නිෂ්පාදිත රට |
|---|---|
| ලැප්ටොප් පරිගණකයක් | ජපානය |
| ක්‍රීඩා සපත්තු යුගලයක් | සිංගප්පූරුව |
| ආභරණ කට්ටලයක් | මැලේසියාව |
| අත්බෑගයක් | ප්‍රංශය |


- ඔබට ලැබෙන නිෂ්පාදිතය කෙරෙහි අවධානය යොමු කරන්න.
- ඔබට ලැබෙන නිෂ්පාදිතය අදාළ රටෙන් ආනයනය කළ යුතු යැයි උපකල්පනය කරන්න.
- ගනුදෙනුව සිදු කිරීමට අදාළ තොරතුරු කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් රැස් කර පහත ශීර්ෂ යටතේ ගොනු කරන්න
    - සැපයුම්කරුවකු සොයා ගන්නා ආකාරය.
    - වෙළෙඳ ගනුදෙනුව සංවිධානය කර ගන්නා ආකාරය
    - භාණ්ඩ මිලට ගැනීමේ හා විකිණීමේ කටයුතු සිදු වන ආකාරය
    - ගනුදෙනුවට අදාළ ව ගෙවීම් කටයුතු පියවීම සිදු වන ආකාරය
- විද්‍යුත් ක්‍රමයට ගනුදෙනුව සිදු කළේ නම් ඒ තුළින් ඔබට ලැබෙන ප්‍රතිලාභ ලැයිස්තුවක් ලියන්න.
- ඔබගේ අනාවරණ නිර්මාණශීලී ව පන්තියට ඉදිරිපත් කරන්න.

- සිසු ක්‍රියාකාරකමෙන් ඉදිරිපත් වූ තොරතුරු සැලකිල්ලට ගනිමින් විද්‍යුත් වෙළෙඳාමේ ක්‍රියාපටිපාටිය විස්තර කර දෙන්න.
- විද්‍යුත් වෙළෙඳාම තුළින් අත්කර ගත හැකි වාසි හා ඒ තුළින් ඇති විය හැකි අවාසි ද සිසුන් සමග සාකච්ඡා කරන්න.
- විද්‍යුත් වෙළෙඳාම සිදු වන ආකාර නිදසුන් සහිත ව සිසුන්ට පැහැදිලි කර දෙන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- වෙළෙඳ කටයුතුවලට අමතර ව නිෂ්පාදන, අලෙවිකරණ, ගිණුම්කරණ, මානව සම්පත්, කළමනාකරණ කටයුතු ආදී සියලු ම අභ්‍යන්තර ක්‍රියාවලීන් පරිගණක ජාල භාවිත කරමින් සිදු කරන ව්‍යාපාර විද්‍යුත් ව්‍යාපාර ලෙස හැඳින්වේ. විද්‍යුත් ව්‍යාපාරයක පවතින අංශ අතර සිදු වන තොරතුරු හුවමාරුව සහ සමායෝජන කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කරයි.
- විද්‍යුත් වාණිජ්‍ය යනු විද්‍යුත් ව්‍යාපාරවල එක් කොටසක් පමණි. එනම් වෙළෙඳ කටයුතු හා වෙළෙඳාම සඳහා සහාය වන ප්‍රවාහන, සන්නිවේදන, බැංකු වැනි උපකාරක සේවා කටයුතු ද විද්‍යුත් ජාල ඔස්සේ සිදු කිරීමයි.

විද්‍යුත් ව්‍යාපාර හා විද්‍යුත් වාණිජ්‍යය පහත සටහන මගින් ද දැක්විය හැකි ය.




- විද්‍යුත් වෙළෙඳාම යනු භාණ්ඩ හා සේවා මිල දී ගැනීම හා විකිණීමේ කටයුතු අන්තර්ජාලය ප්‍රමුඛ පරිගණක ගත තොරතුරු පද්ධති හරහා සිදු කිරීමයි.
- විද්‍යුත් වෙළෙඳාමේ ක්‍රියාපටිපාටිය පහත පරිදි දැක්විය හැකි ය.

  - අන්තර්ජාලය ඔස්සේ ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්මුඛ වීම
  - වෙළෙඳ ගනුදෙනුව සංවිධානය කර ගැනීම
  - භාණ්ඩ විකිණීමේ හා මිලට ගැනීමේ කටයුතු සිදු වීම
  - ගනුදෙනුවට අදාළ ගෙවීම් කටයුතු පියවීම

- විද්‍යුත් වෙළෙඳාමෙන් ව්‍යාපාරිකයාට, ගනුදෙනුකරුවාට හා සමාජයීය වශයෙන් ලැබෙන වාසි පහත පරිදි දැක්විය හැකි ය.

  - ව්‍යාපාරිකයාට ලැබෙන වාසි
    - වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබා දිය හැකි නිසා කීර්තිනාමය හා ලාභය වැඩි වීම

    - පිරිවැය වාසි අත්වීම

      නිදසුන් : තොග සම්බන්ධ පිරිවැය අවම වීම<br>ලිපි ද්‍රව්‍ය හා සන්නිවේදනය සඳහා පිරිවැය අවම වීම<br>අතරමැදියන් අවම වීම නිසා පිරිවැය අවම වීම

    - භූගෝලීය සීමා නො මැති වීම නිසා වෙළෙඳපොළ පුලුල් වීම

  - පාරිභෝගිකයාට ලැබෙන වාසි
    - භාණ්ඩ තෝරා ගැනීමට පුළුල් ඉඩකඩක් පැවතීම
    - පහසුවෙන් හා ඉක්මණින් ඇණවුම් කළ හැකි වීම
    - දවසේ පැය 24 පුරා ම ගනුදෙනු කළ හැකි වීම
    - නිෂ්පාදිතයේ මිල මට්ටම සාපේක්ෂව අඩු වීම

- සමාජයීය වශයෙන් ලැබෙන වාසි
  - පාරිභෝගිකයින්ගේ ජීවන තත්වය ඉහළ යාම
  - නව භාණ්ඩ පරිහරණයට ඉඩකඩ සැලසීම
  - නව වෙළෙඳපොළවල්, සහ රැකියා අවස්ථා උදා වීම

- විද්‍යුත් වාණිජ්‍යයේ සීමා කිහිපයක් පහත දැක්වේ.
  - අන්තර්ජාල පහසුකම් සෑම ප්‍රදේශයක ම ව්‍යාප්ත නො වීම
  - භාවිතය පිළිබඳ ව පාරිභෝගිකයින්ගේ දැනුම මදිකම
  - ගෙවීම් ක්‍රමවල පවතින ගැටලු
  - බදු අයකිරීම් වැනි නීතිමය සීමා
  - විද්‍යුත් ක්‍රම පිළිබඳ ව විශ්වාසය නො මැතිකම
  - පරිගණක පද්ධති ආශ්‍රිත ව වංචා හා දූෂණ සිදු වීම

- විද්‍යුත් වෙළෙඳාම සිදු වන ආකාර පහත පරිදි දැක්විය හැකි ය.

  - B2B- ව්‍යාපාරිකයාගෙන් ව්‍යාපාරිකයාට
    ව්‍යාපාරයක් තවත් ව්‍යාපාරයක් සමග සිදු කරන ගනුදෙනු වේ.
    නිදසුන් : ව්‍යාපාරයකින් ව්‍යාපාරයකට අන්තර්ජාලය හරහා ඇණවුම් ලැබීම
  - B2C- ව්‍යාපාරිකයාගෙන් පාරිභෝගිකයාට
    ව්‍යාපාරයක් යම් භාණ්ඩයක් හෝ සේවාවක් අන්තර්ජාලය හරහා පාරිභෝගිකයින්ට අලෙවි කිරීම. මෙය විද්‍යුත් සිල්ලර වෙළෙඳාම E-tailing ලෙස ද හැඳින්වේ.
  - C2C- පාරිභෝගිකයාගෙන් පාරිභෝගිකයාට
    යම් පාරිභෝගිකයෙකු විසින් තවත් පාරිභෝගිකයෙකුට භාණ්ඩ හෝ සේවා අන්තර්ජාලය හරහා අලෙවි කිරීමයි.
    නිදසුන් : ebay වෙබ් අඩවිය හරහා සිදු වන ගනුදෙනු
  - G2C- රජයෙන් පුරවැසියන්ට
    රාජ්‍ය සේවා සඳහා යම් යම් ගෙවීම් සිදු කිරීම හා සේවා ලබා ගැනීමයි.
    නිදසුන් :
    බස්නාහිර පළාතේ ජනතාවට තම වාහන බලපත්‍ර අලුත් කර ගැනීම www. motortraffic.wp.govilk වෙබ් අඩවිය හරහා සිදු කළ හැකි වීම
  - B2G- ව්‍යාපාරිකයාගෙන් රජයට
    ව්‍යාපාරිකයින් විසින් රජයට අන්තර්ජාලය හරහා යම් යම් ගෙවීම් සිදු කිරීම හා සේවා සැපයීමයි.
    නිදසුන් : සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් කිරීම
  - G2B- රජයෙන් ව්‍යාපාරිකයාට
    නිදසුන් : අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS)
  - C2G- පුරවැසියන්ගෙන් රජයට
    නිදසුන් :
    බිල්පත්, විභාග ගාස්තු, බලපත්‍ර ගාස්තු ආදිය ගෙවීම
    විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීම